# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1851/22 - 2014 පෙබරවාරි මස 26 වැනි බදාදා - 2014.02.26**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

**1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත**

4 (2) උපවගන්තිය යටතේ කරනු ලබන පළකිරීම්

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය (මෙහි මින්මතු ‘ආයතනය’ යනුවෙන් සඳහන් කරනු ලබන) වෙත පැවරී ඇති බලතල අනුව, ආයතනය විසින් මේ සමග පළකර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්, SLFRS 10 : ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන, SLFRS 11: බද්ධ සැකසුම්, SLFRS 12 : වෙනත් අස්තිත්තයන්හි හිමිකම් හෙළිදරව් කිරීම, සහ SLFRS 13 : සාධාරණ අගය මැනීම, සම්මත කර ඇති අතර, 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනතේ අරමුණු සඳහා මෙම ප්‍රමිතීන් වර්ෂ දෙදහස් දාහතර ජනවාරි මස පළමු වැනි දින හෝ ඊට පසුව ආරම්භ වන කාල පරිච්ඡේද ආවරණය කෙරෙන මූල්‍ය ප්‍රකාශන සඳහා බලාත්මක වේ.

ආයතනයේ පාලක සභාවේ අණ පරිදි,

අරුණ අල්විස්,
ලේකම්.

2014 පෙබරවාරි මස 26 වැනි දින,
කොළඹ 07,
මලලසේකර මාවත,
අංක 30 ඒ,
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ දී ය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

# SLFRS 10

# ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

| පටුන | ඡේද |
|---|---|
| ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත 10 | |
| ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන | |
| අරමුණ | 1 - 3 |
| අරමුණු ළඟාකර ගැනීම | 2 - 3 |
| විෂය පථය | 4 |
| පාලනය | 5 - 19 |
| බලය | 10 - 14 |
| ප්‍රතිලාභ | 15 - 16 |
| බලය සහ ප්‍රතිලාභ අතර සම්බන්ධය | 17 - 18 |
| ගිණුම්කරණ අවශ්‍යතාවයන් | 19 - 26 |
| පාලනය නොවන හිමිකම් | 22 - 24 |
| පාලනය අහිමිවීම | 25 - 26 |
| පරිශිෂ්ඨ | |
| අ නිර්වචිත පද | |
| ආ ව්‍යවහාර කිරීමේ මඟපෙන්වීම් | ආ1 - ආ99 |
| පාලනය තක්සේරු කිරීම | ආ2 - ආ85 |
| ආයෝජිතයකුගේ අරමුණු හා සැලසුම | ආ5 - ආ8 |
| බලය | ආ9 - ආ54 |
| ආයෝජිතයකුගෙන් විචල්‍ය ප්‍රතිලාභවලට විවෘත | |
| කර තැබීම/නිරාවරණය කිරීම | |
| හෝ හිමිකම් | ආ55 - ආ57 |
| බලය සහ ප්‍රතිලාභ අතර සම්බන්ධය | ආ58 - ආ73 |
| වෙනත් පාර්ශ්ව සමග සම්බන්ධතාවය | ආ73 - ආ85 |
| නිශ්චය කරන ලද වත්කම් පාලනය | ආ76 - ආ79 |
| අඛණ්ඩ ඇගයීම | ආ8 - ආ85 |
| ගිණුම්කරණ අවශ්‍යතාවයන් | ආ86 - 99 |
| ඒකාබද්ධ කිරීමේ ක්‍රියාපටිපාටිය | ආ86 |
| ඒකාකාර ගිණුම්කරණ ප්‍රතිපත්තීන් | ආ87 |
| මැනීම | ආ88 |
| විභව්‍ය ඡන්දය දීමේ අයිතිය | ආ88 - ආ89 |
| වාර්තාකරණ දිනය | ආ92 - ආ93 |
| පාලනය නොවන හිමිකම් | ආ94 - ආ96 |
| පාලනය අහිමි වීම | ආ97 - ආ99 |
| ඇ බලපවත්වන දිනය සහ සංක්‍රාන්තිය | |

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - **SLFRS 10**

*ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන*

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - SLFRS 10 *ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන* මෙහි 1 – 33 සහ අ - ඇ පරිශිෂ්ඨ වල පැහැදිලි කරදේ. සියළුම ඡේදවලට එක හා සමාන අධිකාරියක් ඇත. තද අකුරෙන් දක්වා ඇති ඡේදවලින් ප්‍රධාන මූලධර්ම සඳහන් වේ. අ පරිශිෂ්ඨයේ නිර්වචනය කර ඇති පද මෙම ප්‍රමිතයේ ප්‍රථම වරට යෙදෙනවිට ඒවා ඇල අකුරෙන් දක්වා ඇත. අනෙත් පද සඳහා වන නිර්වචන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සඳහා වූ පාරිභාෂික ශබ්ද මාලාවේ ඇත. SLFRS 10 එහි අරමුණු සහ නිගමන සඳහා වූ පදනම *ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට වූ පූර්විකාව සහ මූල්‍ය ප්‍රකාශන වාර්තා කිරීම සඳහා වූ සංකල්පමය ආකෘතිමය රාමුවද* සම්බන්ධ කොටගෙන කියවිය යුතුය. පැහැදිලි මඟපෙන්වීමක් නොමැති අවස්ථාවලදී LKAS 8 *ගිණුම්කරණ ප්‍රතිපත්ති ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස් වීම් සහ වැරදි* මගින් ගිණුම් කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ ඒවා ව්‍යවහාර කිරීම සඳහා පදනමක් සපයයි.

*අරමුණ*

1. මෙම SLFRS හි අරමුණ වන්නේ අස්තිත්වයක් විසින් එකක් හෝ ඊට වැඩි ගණනක වෙනත් අස්තිත්වයන් පාලනය කරන විට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා මූලධර්ම ස්ථාපිත කිරීමය.

*අරමුණ ඉටු වීම*

2 1 ඡේදයේ අරමුණ ඉටුවීමට, මෙම SLFRS ය.

(*අ*) එකක් හෝ ඊට වැඩි ගණනක වෙනත් අස්තිත්වයන් *(පරිපාලිත)* පාලනය කරන අස්තිත්වය *(පරිපාලකයා)* ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම අවශ්‍ය කෙරේ.

(*ආ*) ඒකාබද්ධ කිරීමේ පදනම ලෙස පාලනය යන්නෙහි මූලධර්මය නිර්වචනය කර පාලනය ස්ථාපිත කිරීම.

(*ඇ*) ආයෝජකයා විසින් ආයෝජිතයා පාලනය කරන්නේද යන්න හඳුනා ගැනීම සඳහා පාලනය කිරීමේ මූලධර්මය ව්‍යවහාර කරන්නේ කෙසේද පැහැදිලි කිරීම සහ ඒ නිසා ආයෝජිතයාව ඒකාබද්ධ කල යුතු වීම.

(*ඈ*) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා ගිණුම්කරණ අවශ්‍යතාවය පැහැදිලි කිරීම.

(*ඉ*) ආයෝජන අස්තිත්වයක් නිර්වචනය කර ආයෝජන අස්තිත්වයක විශේෂිත පරිපාලිතයන් ඒකාබද්ධ කිරීමට වන ව්‍යතිරේඛ නියම කරයි.

3. ව්‍යාපාර සංයෝජනයේදී පැනනගින කීර්තිනාමය ඇතුළුව (SLFRS 3 *ව්‍යාපාර සංයෝජනය බලන්න*) ව්‍යාපාර සංයෝජනය සහ ඒකාබද්ධ කරනයට වන බලපෑම සඳහා වන ගිණුම්කරණ අවශ්‍යතාවයන් සඳහා මෙම SLFRS කටයුතු නොකෙරේ.

*විෂය පථය*

4. පරිපාලකයක් වන අස්තිත්වය ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය. පහත දැක්වෙන පරිදි හැර සියළු අස්තිත්වයන් සඳහාම මෙම SLFRS ව්‍යවහාර වේ.

(*අ*) පහත සඳහන් කොන්දේසි සියල්ලම ඉටු වන්නේ නම් පරිපාලකයන් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

(i) එය සම්පූර්ණයෙන්ම අයිති පරිපාලිතයක් හෝ වෙනත් අස්තිත්වයකට අර්ධ වශයෙන් අයිති පරිපාලිතයක් සහ අන්වශයෙන් ඡන්දය ප්‍රකාශ කිරීමට හිමිකමක් නැති අයිතිකරුවන් ඇතුළු එහි අන් සියළුම අයිතිකරුවන් පරිපාලකය ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකරන බව දන්වා හා එයට ඒ අය විරුද්ධ නොමැති වීම.

(ii) පොදු වෙළඳපළ එහි ණය හෝ ස්කන්ධ සාධන පත්‍ර අලෙවි නොකිරීම (දේශීය හෝ විදේශීය කොටස් හුවමාරුවක හෝ දේශීය හෝ ප්‍රාදේශීය වෙළෙඳපළවල් ඇතුළුව අත්පිට විකුණුම් කරන කවුලුවකින්)

(iii) පොදු වෙළඳපළක් සඳහා ඕනෑම පන්තියකට අයත් සාධනපත්‍ර නිකුත් කිරීමේ අරමුණ සඳහා සුරකුම් පත් කොමිසමක හෝ වෙනත් නියාමන ආයතනයක එහි මූල්‍ය ප්‍රකාශන ගොනු කර නොමැති වීම හෝ ගොනු කිරීමේ ක්‍රියාවලියේ නිරත නොවීම.

(iv) එහි අවසාන හෝ අන්තර්මධ්‍ය පරිපාලකය පොදු මහජනතාවගේ භාවිතය සඳහා ලබාගතහැකි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඒවා SLFRS සමග අනුකූල වීම.

(*ආ*) LKAS 19 *සේවක ප්‍රතිලාභ* ව්‍යවහාර වන පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් හෝ වෙනත් දිගුකාලීන සේවක ප්‍රතිලාභ සැලසුම්.

(*ඇ*) මෙම SLFRS හි 31 වන ඡේදය ප්‍රකාරව ආයෝජන අස්තිත්වයක එහි සියලුම පරිපාලිත වල සාධාරණ අගය ලාභ හෝ අලාභ හරහා මැනීමට එය එසේ කිරීම අවශ්‍ය කරන්නේ නම් ආයෝජන අස්තිත්වයක් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

*පාලනය*

5. ආයෝජකයෙක් අස්තිත්වයක් (ආයෝජිතයා) සමග එහි සම්බන්ධයේ ස්වභාවය සැලැකිල්ලට නොගෙන එය ආයෝජිතයාව පාලනය කරන්නේද යන්න තක්සේරු කිරීමෙන් එය පරිපාලකයක්ද යන්න නිර්ණය කළ යුතු වේ.

6. ආයෝජිත සමග සහභාගිත්වය තුළින් (ආයෝජනයකට) එයට ලැබෙන විචල්‍ය ප්‍රතිලාභ විවෘතව තිබෙන කල්හි හෝ එයට හිමිකම තිබෙන විට, ආයෝජකයකු විසින් ආයෝජිත පාලනය කරනු ලබන අතර, ආයෝජිත මත එයින් පැවැත්වෙන බලය හරහා එකී ප්‍රතිලාභ කෙරෙහි බලපෑමේ හැකියාවද තිබේ.

7. ඒ අනුව ආයෝජකට පහත සඳහන් සියළුම දෑ තිබේනම් පමණක් ආයෝජකයකු විසින් ආයෝජිත පාලනය කරනු ලැබේ.

(අ) ආයෝජිත මත පවත්වන බලය (10 - 14 ඡේද බලන්න)

(ආ) ආයෝජිතයා සමග එහි සහභාගිත්වයට විචල්‍ය ප්‍රතිලාභ සඳහා විවෘතව තිබීම හෝ හිමිකම

(ඇ) ආයෝජකයාගේ ප්‍රතිලාභවල වටිනාකම වෙත බලපෑම් කිරීමට ආයෝජිතයා මත එහි බලය යෙදවීමට ඇති හැකියාව

8. ආයෝජකයා විසින් ආයෝජිතයා පාලනය කරන්නේද යන්න තක්සේරු කිරීමේදී ආයෝජකයා සියළු කරුණු සහ තත්ත්වයන් සැලකිල්ලට ගත යුතුය. 7 වන ඡේදයේ සඳහන් කර ඇති මූලිකාංග තුනෙන් එකක් හෝ ඊට වැඩි ගණනක් වෙනස් වී ඇතැයි කරුණු සහ තත්ත්වයට ඉගියක් කරන්නේ නම් එහි ආයෝජිතයාව පාලනය කරන්නේ ද යන්න ආයෝජකයා යලි තක්සේරු කළ යුතුය. (ආ 80 - ආ 85 ඡේද බලන්න)

9. ආයෝජකයන් දෙදෙනෙකු හෝ ඊට වැඩි ගණනක් අදාල ක්‍රියාකරකම් මෙහෙයවීමට ඔවුන් එක්ව ක්‍රියා කළ යුතු වන විට ආයෝජිතයෙක් සාමූහිකව පාලනය වේ. එවැනි අවස්ථාවලදී අනෙක් අයගේ සහයෝගය නොමැතිව ක්‍රියාකාරම් මෙහෙයවීමට ආයෝජකයෙකුට නොහැකිවීමේ හේතුව නිසා, ආයෝජිකයෙකුට, ආයෝජිතයාව තනිව පාලන කළ නොහැකිය. එක් එක් ආයෝජකයා, ඔවුන්ගේ ආයෝජිතයාගේ ඇති හිමිකම අදාල SLFRS අනුව ගිණුම්ගත කරනු ඇත. *බද්ධ සැලසුම් එකගවීම්* SLFRS 11 *ආශ්‍රිත සහ බද්ධ ව්‍යාපාරවල ආයෝජන* LKAS 28 හෝ *මූල්‍ය සාධනපත්‍ර* SLFRS 9 වැනි දෑ.

*බලය*

10. *අදාල ක්‍රියාකාරිත්වයන්* මෙහෙය වීම සඳහා ප්‍රවර්තන හැකියාව ලබාදෙන හිමිකම ආයෝජික වෙත පවත්නා කල් හී ආයෝජකයකුට ආයෝජිත මත බලය පැවැත්විය හැකිය.

උදාහරණ:- ආයෝජිතයාගේ ප්‍රතිලාභ වලට සැලකිය යුතු අන්දමින් බලපාන ක්‍රියාකාරකම්.

11. හිමිකම් වලින් බලය පැනනගී. ආයෝජිතයා මත සෘජුව බලය ලබාගන්නා විට සහ කොටස් වැනි ස්කන්ධ සාධන පත්‍ර මඟින් තනිකරම ඡන්දය දීමේ අයිතිය ප්‍රදානය කිරීම සහ එම කොටස් දැරීමෙන් වන ඡන්ද අයිතිය සැලකිල්ලට ගැනීමෙන් තක්සේරු කළ හැකි වීම වැනිදෑ වලින් බලය තක්සේරු කිරීම සමහර අවස්ථාවලදී සරල වේ. අනෙක් අවස්ථාවලදී තක්සේරු කිරීම වඩා සංකීර්ණ විය හැකි අතර එක සාධකයකට වඩා වැඩි සාධක ගණනක් සලකා බැලීම අවශ්‍ය කෙරේ. උදාහරණ වශයෙන් බලය එකක් හෝ ඊට වැඩි ගණනක් ගිවිසුම් ගත විධිවිධාන වල ප්‍රතිඵලයක් වන විට.

12. අදාල ක්‍රියාකාරකම් මෙහෙයවීමට වර්තමාන හැකියාව සහිත ආයෝජකයෙක් හට එහි මෙහෙයවීමට ඇති අයිතිය මෙතෙක් ක්‍රියාත්මක නොකර ඇතත් බලය තිබේ. අදාල ක්‍රියාකාරකම් ආයෝජකයා විසින් මෙහෙයවන බවට සාක්ෂි ආයෝජකයා හට බලය තිබේද යන්න නිර්ණය කිරීමට උපකාරි විය හැකිය. එහෙත් එවැනි සාක්ෂි ආයෝජිතයා මත ආයෝජකයාහට බලය තිබුනා දැයි නිර්ණය කිරීමේදී එයම තීරණාත්මක නොවේ.

13. දෙදෙනෙකු හෝ ඊට වැඩි ගණනක ආයෝජකයන්ගෙන් ඔවුන්ගෙන් සෑම කෙනෙක් හටම වෙනස් අදාල ක්‍රියාකාරකම් මෙහෙයවීමට ඒකපාර්ශ්වික හැකියාව ලබා දෙන පවත්නා අයිතීන් තිබේනම්, ආයෝජිතයාගේ ප්‍රතිලාභවලට වඩාත් සැලකිය යුතු ලෙස බලපෑම් කිරීමට ක්‍රියාකාරකම් මෙහෙයවීමට ප්‍රවර්තන හැකියාව ඇති ආයෝජකයාහට ආයෝජිතයා මත බලය තිබේ.

14. වෙනත් අස්තිත්වයන් හට ප්‍රවර්තන අයිතීන් මගින් අදාල ක්‍රියාකාරකම් මෙහෙයවීමට සහභාගිවීමේ ප්‍රවර්තන හැකියාව ලබාදී තිබුණා විය හැකි වුවත් ආයෝජිතයා මත බලයක් ආයෝජකයකු හට තිබිය හැකිය, උදාහරණ වශයෙන් වෙනත් අස්තිත්වයකට සැලකිය යුතු බලපෑමක් ඇතිවිටක. කෙසේ වෙතත් ආරක්‍ෂක හිමිකමක් පමණක් දරණ ආයෝජකයකුට ආයෝජිතයාට ඉහළින් බලයක් නොතිබේ. (ආ 26 - ආ 28 ඡේද බලන්න) සහ ඒ නිසාවෙන් ආයෝජිතයාව පාලනය නොකෙරේ.

*ප්‍රතිලාභ*

15. ආයෝජිත සමග සහභාගිත්වය තුලින් ආයෝජක ලබන ප්‍රතිලාභ ආයෝජිතගේ කාර්ය සාධනයේ ප්‍රතිඵලයක් ලෙස වෙනස්වීමේ විභව්‍යතා ඇති කල්හි ආයෝජක ආයෝජිත සමග සහභාගිත්වයෙන් ලබන විචල්‍ය ප්‍රතිලාභ සඳහා විවෘතව තබනු ලබන්නේය හෝ හිමිකම් ලබන්නේය. ආයෝජකයාගේ ප්‍රතිලාභ විය හැක්කේ ධන පමණක්, හෝ ඍණ පමණක් හෝ ධන සහ ඍණ යන දෙකම වේ.

16. එක ආයෝජකයකුට පමණක් ආයෝජිතයෙක් පාලනය කළ හැකිවුවත් ආයෝජිතයකුට ප්‍රතිලාභ පාර්ශ්ව එකකට වඩා වැඩි ගණනකට බෙදා ගත හැකිය. උදාහරණයක් ලෙස, ආයෝජිතයකුට ලාභ හෝ බොදා හැරීම් පාලන නොවන හිමිකම දරන්නන් අතර බෙදා ගත හැකිය.

*බලය සහ ප්‍රතිලාභ අතර සම්බන්ධය*

17. ආයෝජකයාට ආයෝජිතයා මත බලය තිබීම සහ ආයෝජිතයා සමඟ එහි සහභාගිත්වය නිසා විචල්‍ය ප්‍රතිලාභ වලට හිමිකම හෝ විවෘතව තැබීම පමණක් නොව එමෙන්ම ආයෝජිතයා සමග සහභාගිත්වය නිසා ආයෝජකගේ ප්‍රතිලාභ වලට බලපෑම් කිරීමේ එහි බලය පාවිච්චි කිරීමේ හැකියාවද තිබෙන්නේ නම් ආයෝජකයකු ආයෝජිතයෙක් පාලනය කරයි.

18. ඒ අනුව තීරණ ගැනීමේ අයිතිය ඇති ආයෝජකයකු එය ප්‍රධානියකුද නියෝජිතයකුද යන්න නිර්ණය කළ යුතුය.

ආ 58 - ආ 72 ඡේද අනුව නියෝජිතයකු වන ආයෝජකයෙක් එයට පවරනලද තීරණ ගැනීමේ අයිතිය ක්‍රියාත්මක කරන විට ආයෝජිතයෙක්ව පාලනය නොකරයි.

*ගිණුම්කරණ අවශ්‍යතාවයන්*

**19. පරිපාලකය සමාන ගණුදෙනු සහ සමාන සේ පෙනෙන තත්තවයන්හිදී වෙනත් සිද්ධීන් සඳහා ඒකාකාර ගිණුම් ප්‍රතිපත්තීන් භාවිත කරමින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය.**

20. ආයෝජිතයකු ඒකාබද්ධ කිරීම ආරම්භකළ යුත්තේ ආයෝජක ආයෝජිතගේ පාලනය ලබාගත් දින සිට වන අතර ආයෝජිතගේ පාලනය ආයෝජක හට අහිමිවූ විට ඒකාබද්ධ කරනය නවතී.

21. ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳව උපදේශන ආ 86 - ආ 93 ඡේදවල පැහැදිලි කරදේ.

**පාලනය නොවන හිමිකම්**

22. පරිපාලකයක් විසින් ඒකාබද්ධ මූල්‍ය තත්ත්වය දක්වෙන ප්‍රකාශනයේ ස්කන්ධය තුල, පරිපාලකයේ අයිතිකරුවන්ගේ ස්කන්ධයෙන් වෙන්ව පාලනය නොවන හිමිකම් ඉදිරිපත් කළ යුතුය.

23. පරිපාලකයකට, පරිපාලිතයේ පාලනය අහිමි වීම ප්‍රතිඵලයක් නොවන පරිපාලිතයේ, පරිපාලකයේ අයිතියේ හිමිකම වෙනස්වීම ස්කන්ධ ගණුදෙනු වේ. (අයිතිකරුවන්ගේ තත්ත්වයේ සිට අයිතිකරුවන් සමඟ කරන ගණුදෙනු)

24. ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල පාලනය නොවන හිමිකම් සඳහා ගිණුම් කරනය ආ 94 - ආ 96 ඡේදවල පැහැදිලි කරදේ.

**පාලනය අහිමි වීම**

25. පරිපාලිතයක පාලනය පරිපාලකයකට අහිමි වූවොත්, පරිපාලකය විසින් ;

(අ) කලින් පරිපාලිතයේ වත්කම් සහ වගකීම් ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙන් හඳුනාගැනීම ඉවත් කිරීම

(ආ) පාලනය අහිමිවූවිට කලින් පරිපාලිතයේ රඳවාගත් යම් ආයෝජනයක් එහි සාධාරණ අගයට හඳුනා ගැනීම සහ කලින් පරිපාලිතයෙන් අයවිය යුතු හෝ ඊට ගෙවිය යුතු යම් වටිනාකමක් අදාල SLFRS අනුව පසුව ගිණුම් ගත කිරීම, එම සාධාරණ අගය SLFR 9 අනුව මූල්‍ය වත්කමක මුල් හඳුනාගැනීමේදී සාධාරණ අගය ලෙස සැලකිය යුතු හෝ උචිත වන විට ආශ්‍රිතයක හෝ බද්ධ ව්‍යාපාරයක ආයෝජනයක මුල් හඳුනාගැනීමේ පිරිවැය වේ.

(ඇ) කලින් පාලනය වූ හිමිකමට ආරෝපිත පාලනය නොවන හිමිකම් සමඟ වන ප්‍රතිලාභ හෝ අලාභ හඳුනාගැනීම.

26. පාලනය අහිමිවීම සඳහා ගිණුම් කරනය ආ 97 - ආ 99 ඡේදවල පැහැදිලි කරදේ.

*අස්තිත්වයක් ආයෝජන අස්තිත්වයන් දැයි නිර්ණය කිරීම*

**27. අස්තිත්වය ආයෝජන අස්තිත්වයක් යන්න පරිපාලකය නිර්ණය කල යුතුය. ආයෝජන අස්තිත්වයක් යනුඃ**

**(අ) ආයෝජක(යන්) හට ආයෝජන කළමනාකරණ සේවා සැලසීමේ අරමුණු සඳහා එක් හෝ ඊට වැඩි ආයෝජකයන්ගෙන් අරමුදල් ලබාගන්නා ;**

**(ආ) එහි ව්‍යාපාරික අරමුණු වන්නේ ප්‍රාග්ධන අගය වැඩිවීම, ආයෝජන ආදායම් හෝ දෙකම මගින් වන ප්‍රතිලාභ සඳහා පමණක් අරමුදල් ආයෝජනය කිරීමට එහි ආයෝජක(යන්) හට බැඳෙන ; සහ**

**(ඇ) බොහෝදුරට එහි සියලුම ආයෝජනයන්හි කාර්ය සාධනය සාධාරණ අගය පදනම මත මිණුම්කරන සහ අගය කරන අස්තිත්වයකි.**

**ආ85 අ - ආ85 අඅ සම්බන්ධිත ව්‍යවහාර කිරීමේ මගපෙන්වීම් ලබාදෙයි.**

28. 27 වන ඡේදයේ විස්තර කර ඇති නිර්වචනය ආයෝජන අස්තිත්වයක් සපුරාලන්නේද යන්න තක්සේරු කිරීමේදී ආයෝජන අස්තිත්වයක වන පහත සඳහන් අපේක්ෂිත ගති ලක්ෂණ තිබේද යන්න අස්තිත්වයක් සලකා බැලිය යුතුය.

(අ) එයට එක් ආයෝජනයකට වඩා ඇත. (අ85 අඇ - අ85අඈ ඡේද බලන්න).

(ආ) එයට එක් ආයෝජයකයෙකුට වඩා ඇත. (අ85 අඉ - අ85අළ ඡේද බලන්න).

(ඇ) එයට සම්බන්ධිත පාර්ශ්ව නොවන ආයෝජකයෙක් ඇත (අ85අළු - අඑ ඡේද බලන්න) සහ

(ඈ) එයට හිමිකමේ අයිතිය ස්කන්ධය හෝ ඒ හා සමාන අයිතීන්ගේ ස්වරූපයෙන් ඇත (ආ85අඒ - ආ85 අඔ ඡේද බලන්න)

මෙම අපේක්ෂිත ගතිලක්ෂණ වලින් යම් ගති ලක්ෂණයක් දක්නට නොලැබීම අස්තිත්ත්වයක් ආයෝජන අස්තිත්ත්වයක් ලෙස වර්ගීකරණය කිරීමට අත්‍යවශ්‍යයෙන් නුසුදුසුකමක් නොවේ. මෙම සියළු අපේක්ෂිත ගතිලක්ෂණ නොමැති ආයෝජන අස්තිත්වයක් SLFRS 12 *වෙනත් අස්තිත්ත්වයන් හි ඇති අයිතීන් හෙළිදරව් කිරීම්* හි 9 අ ඡේදයෙන් අවශ්‍ය කරන අතිරේක හෙළිදරව් කිරීම් ලබාදෙයි.

29. 27 වන ඡේදයෙන් විස්තර කළ පරිදි ආයෝජන අස්තිත්ත්වය නිර්වචනය සම්පූර්ණ කරන මූලිකාංග තුනෙන් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ 28 වන ඡේදයෙන් විස්තර කළ පරිදි ආයෝජන අස්තිත්වයක අපේක්ෂිත ගතිලක්ෂණ වෙනස් වී ඇතැයි ඇඟවෙන කරුණු සහ සිද්ධීන් වේ නම් පරිපාලකය විසින් එය ආයෝජන අස්තිත්වයක් ද යන්න යළි තක්ස්රු කළ යුතුය.

30. පරිපාලකයක් එක්කෝ ආයෝජන අස්තිත්ත්ව තත්ත්වයෙන් නවතින විට හෝ ආයෝජන අස්තිත්වය තත්ත්වයට පත්වූ විට, එම තත්ත්වය වෙනස් වූ දින සිට අනාගතයේදී බලාපොරොත්තු විය හැකි පරිදි එහි තත්ත්වය වෙනස්වීම සඳහා ගිණුම් තැබිය යුතුය. (අ 100 - අ 101 ඡේද බලන්න).

*ආයෝජන අස්තිත්ත්වඃ ඒකාබද්ධකරණයට ව්‍යතිරේඛ*

**31. 32 වන ඡේදයේ විස්තර කර ඇති පරිදි හැර ආයෝජන අස්තිත්ත්වයක් වෙනත් අස්තිත්වයක පාලනය ලබාගත් විට ආයෝජන අස්තිත්වය එහි පරිපාලිතයන් ඒකාබද්ධ කිරීම හෝ SLFRS 3 ව්‍යවහාර කිරීම, නොකළ යුතුය. ඒ වෙනුවට ආයෝජන අස්තිත්වය, පරිපාලිතයේ ආයෝජන SLFRS 9[1] ප්‍රකාරව ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයට මැනිය යුතුය.**

32. ආයෝජන අස්තිත්වයක ආයෝජන ක්‍රියාකාරකම්වලට සම්බන්ධ (ඡේද ආ85 ඇ - ආ85 ඉ බලන්න). සේවාවන් සපයන පරිපාලිතයක් ආයෝජන අස්තිත්වයකට ඇත්නම් 31 වන ඡේදයේ අවශ්‍යතාවයන් කෙසේ වෙතත් මෙම SLFRS හි 19 - 26 ඡේද ප්‍රකාරව ආයෝජන අස්තිත්ත්වය එම පරිපාලනය ඒකාබද්ධ කළයුතු අතර එවැනි යම් පරිපාලිතයක් අත්පත් කරගැනීමට SLFRS 3 හි අවශ්‍යතාවයන් ව්‍යවහාර කළ යුතුය.

33. පරිපාලකයද ආයෝජන අස්තිත්වයක් වන්නේ නම් හැර ආයෝජන අස්තිත්වයක පරිපාලිතයක් හරහා පාලනය කරන අස්තිත්ත්වය ද ඇතුළුව එය පාලනය කරන සියලුම අස්තිත්වයක් ආයෝජන අස්තිත්වය පරිපාලකය ඒකාබද්ධ කළ යුතුය.

1. "යම් අස්තිත්වයක් මෙම SLFRS ව්‍යවහාර කරයි නම් සහ මේ වනතුරු SLFRS 9 ව්‍යවහාර නොකරයි නම් මෙම SLFRS හි" SLFRS 9 ට කෙරෙන යම් යොමුකිරීමක් LKAS 39 "*මූල්‍ය සාධන පත්‍ර*" හඳුනාගැනීම සහ මැනීමට කෙරෙන යොමුකිරීමක්" ලෙස යොමුවිය යුතුයැයි SLFRS 10 "*ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන* හි ඇ 7 ඡේදයේ සඳහන් වේ.

**අ පරිශිෂ්ඨය**

**නිර්වචිත පද**

*මෙම පරිශිෂ්ඨය SLFRS හි සංකලිත කොටසකි.*

| | |
|---|---|
| **ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන** | තනි ආර්ථික අස්තිත්ත්වයක මූල්‍ය ප්‍රකාශන පරිද්දෙන් **පරිපාලකයක** හා එහි **පරිපාලිත**වල වත්කම් වගකීම් ස්කන්ධය ආදායම් වියදම් හා මුදල් ප්‍රවාහ ඉදිරිපත් කරනු ලබන **සමූහයක** මූල්‍ය ප්‍රකාශනවේ. |
| **ආයෝජිතයෙක් පාලනය කිරීම** | ආයෝජිත සමඟ සහභාගිත්වය තුලින් (ආයෝජනයකට) එයට ලැබෙන විචල්‍ය ප්‍රතිලාභ විවෘතව තිබෙන කල්හි, හෝ එයට හිමිකම් තිබෙනවිට, ආයෝජකයකු විසින් ආයෝජිත පාලනය කරනු ලබන අතර, ආයෝජිත මත එයින් පැවත්වෙන බලය වේ. |
| **තීරණගන්නා** | තීරණ ගැනීමේ අයිතිය සහිත අස්තිත්ත්වයක් එනම් එක්කෝ ප්‍රධානියා හෝ වෙනත් පාර්ශ්ව සඳහා නියෝජිතයෙක්. |
| **සමූහය** | **පරිපාලකය සහ එහි පරිපාලිතය** |
| **ආයෝජන අස්තිත්වය** | *(අ)* ආයෝජකයන් හට ආයෝජන කළමනාකරණ සේවා සැලසීමේ අරමුණු සඳහා එක් හෝ ඊට වැඩි අයෝජකයන්ගෙන් අරමුදල් ලබා ගන්නා ;<br>*(ආ)* එහි ව්‍යාපාරික අරමුණු වන්නේ ප්‍රාග්ධන අගය වැඩිවීම ආයෝජන ආදායම් හෝ දෙකම මගින් වන ප්‍රතිලාභ සඳහා පමණක් අරමුදල් ආයෝජනය කිරීමට එහි ආයෝජකයා(යන්) හට බැඳෙන ; සහ<br>*(ඇ)* බොහෝදුරට එහි සියළුම ආයෝජනයන්හි කාර්යී සාධනය සාධාරන අගය පදනමක මිණුම් කරන සහ අගය කරන අස්තිත්වයකි, |
| **පාලනය නොවන හිමිකම්** | **පරිපාලකයකට** සෘජුව හෝ වක්‍රව ආරෝපණය නොවන **පරිපාලිතයක** ස්කන්ධය. |
| **පරිපාලකය** | එකක් හෝ ඊට වැඩි ගණනක් අස්තිත්තවයන් **පාලනය** කරන අස්තිත්තවයක් |
| **බලය** | **අදාල ක්‍රියාකාරකම්** මෙහෙයවීමට ප්‍රවර්තන හැකියාව ලබා දෙන පවත්නා අයිතීන් |
| **ආරක්ෂාකාරී හිමිකම්** | අදාළ හිමිකම් අස්තිත්තවයේ බලයට ඉහළින් එම පාර්ශවයට ලබානොදෙන එහි හිමිකම දරණ පාර්ශ්වයේ අයිතිය ආරක්ෂාවන ලෙස සැලසුම් කළ හිමිකම්. |
| **අදාල ක්‍රියාකාරකම්** | මෙම SLFRS හි අර්ථය සඳහා අදාල ක්‍රියාකාරකම් වනුයේ ආයෝජිතයාගේ ප්‍රතිලාභ සඳහා සැලකිය යුතු අන්දමින් බලපාන ආයෝජිතගේ ක්‍රියාකාරකම්ය. |
| **ඉවත් කිරීමේ හිමිකම්** | සිය තීරණ ගැනීමේ අධිකාරියෙන් තීරණ ගන්නකු වලක්වාලීමේ හිමිකම |
| **පරිපාලිතය** | වෙනත් අස්තිත්තවයක් විසින් පාලනය කරනු ලබන අස්තිත්තවයක්. |

පහත සඳහන් පද SLFRS 11, SLFRS 12 *වෙනත් අස්තිත්තවයන් හි හිමිකම හෙළිදරව් කිරීම*, LKAS 28 හෝ LKAS 24 *සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම්* හි නිර්වචනය කර ඇති අතර මෙම SLFRS හිදි එම SLFRS වල පැහැදිලිව සඳහන් කර ඇති තේරුමම භාවිතා කරනු ඇත.

* ආශ්‍රිතය
* වෙනත් අස්තිත්වයක හිමිකම
* බද්ධ ව්‍යාපාර
* ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයන්
* සම්බන්ධිත පාර්ශ්ව
* සැලකිය යුතු බලපෑම්

**ආ පරිශිෂ්ඨය**

**ව්‍යවහාර කිරීමේ මගපෙන්වීම්**

*මෙම පරිශිෂ්ඨය මෙම SLFRS හි සංකලිත කොටසකි. එය 1 - 26 දක්වා වන ඡේදයන් ව්‍යවහාරකරනය විස්තර කරන අතර මෙම SLFRS හි වෙනත් කොටස්වල ඇති හා සමාන අධිකාරියක් ඇත.*

ආ1. මෙම පරිශිෂ්ඨයේ උදාහරණ කල්පිත තත්තවයන් නිරූපණය කෙරේ. උදාහරණ වල සමහර පැතිකඩ සත්‍යකරුණු වල රටාව ඉදිරිපත් විය හැකි නමුත් යම් විශේෂ කරුණු රටාවක සියළුම කරුනු සහ තත්ත්වයන් SLFRS 10 ව්‍යවහාර කරන විට අගය කිරීමට අවශ්‍ය වනු ඇත.

**පාලනය තක්සේරු කිරීම**

ආ2. එය ආයෝජිතයෙක් පාලනය කරන්නේද යන්න නිර්නය කිරීමට ආයෝජකයකුහට පහත සඳහන් සියළු දෑ තිබේදැයි ආයෝජක ඇස්තමේන්තු කළ යුතුය.

(අ) ආයෝජිතයා මත පවත්වන බලය

(ආ) ආයෝජිත සමඟ සහභාගිත්වයෙන් ලැබෙන විචල්‍ය ප්‍රතිලාභ සඳහා විවෘතව තිබීම හෝ හිමිකම සහ

(ඇ) ආයෝජකයාගේ ප්‍රතිලාභවල වටිනාකම වෙත බලපෑම් කිරීමට ආයෝජිතයා මත එහි බලය යෙදවීමට ඇති හැකියාව

ආ3. එම නීර්ණය කිරීමේදී පහත සඳහන් සාධකයන් සලකා බැලීම උපකාරී විය හැකිය.

(අ) ආයෝජිතයකුගේ අරමුණු හෝ සැකසුම (ඡේද ආ 5 - ආ 8 බලන්න)

(ආ) අදාළ ක්‍රියාකාරකම් මොනවාද එම ක්‍රියාකාරකම් පිළිබඳව තීරණ ගන්නේ කෙසේද (ආ 11 - ආ 13 ඡේද බලන්න)

(ඇ) අදාළ ක්‍රියාකාරකම් මෙහෙයවීමට ආයෝජකගේ හිමිකම් ප්‍රවර්තන හැකියාව ඊට ලබාදේද

(ඈ) ආයෝජක ආයෝජිත සමඟ සහභාගිත්වයෙන් ලබන විචල්‍ය ප්‍රතිලාභ සඳහා විවෘතව තබන්නේද හෝ හිමිකම් ලබන්නේද.

(ඉ) ආයෝජකයාගේ ප්‍රතිලාභවල සහ වටිනාකම වෙත බලපෑම් කිරීමට ආයෝජිතයා මත බලය යෙදවීමට ආයෝජකයාට හැකියාවක් තිබේද (ආ 58 - ආ 72 ඡේද බලන්න)

ආ4. ආයෝජිතයාගේ පාලනය තක්සේරු කරන විට, ආයෝජකයා අනෙක් පාර්ශ්වයන් සමඟ එහි ඇති සබඳතාවයේ ස්වභාවය සලකා බැලිය යුතුය (ආ 73 - ආ 75 ඡේදයන් බලන්න)

**ආයෝජිතයකුගේ අරමුණ සහ සැකසුම**

ආ5. ආයෝජිතයකුගේ පාලනය ඇස්තමේන්තු කිරීමේදී, අදාල ක්‍රියාකාරකම් පිළිබඳ තීරණ ගන්නේ කෙසේද, එම ක්‍රියාකාරකම් මෙහෙය වීම සඳහා ප්‍රවර්තන හැකියාවන් ඇත්තේ කාටද සහ එම ක්‍රියාකාරකම් වලින් ප්‍රතිලාභ ලබන්නේ කවුරුන්ද යන්න හඳුනාගැනීම පහසුවීම සඳහා ආයෝජක, ආයෝජිතයාගේ අරමුණු සහ සැකසුම සලකා බැලිය යුතුය.

ආ6. ආයෝජිතයකුගේ අරමුණු සහ සැකසුම සලකා බලන වේලාවේදී ආයෝජිතයාගේ සාමාන්‍ය කොටස් වැනි දරන්නන්ට සමානුපාතික ඡන්ද අයිතියක් ලබාදෙන ස්කන්ධ සාධනපත්‍ර වැනි විධියකින් ආයෝජිතයාව පාලනය කරන බව ඉන් පැහැදිලි විය හැකිය. මේ අවස්ථාවේදී, යම් අතිරේක එකඟවීමක් එනම් තීරණගැනීම වෙනස් කිරීමට නොමැතිවීම නිසා පාලනය තක්සේරු කිරීම අවධානය යොමු කරන්නේ ආයෝජිතයගේ මෙහෙයුම් සහ මූල්‍යකරණ ප්‍රතිපත්ති නිර්නය කිරීමට ප්‍රමාණවත් ඡන්ද හිමිකමක් ක්‍රියාත්මක කිරීමට, යම් වෙතොත්, කුමන පාර්ශ්වයකට යන්නය. (ආ34 - ආ 35 ඡේද බලන්න) වෙනත් සාධක නොමැතිවීම හේතු කොටගෙන ඉතා සරල අවස්ථාවකදී එම ඡන්ද හිමිකමෙන් වැඩි කොටසක් දරණ ආයෝජකයා, ආයෝජිතයාව පාලනය කරයි.

ආ7. වඩා සංකීර්ණ අවස්ථාවන්හිදී ආයෝජකයා ආයෝජිතයාව පාලනය කරන්නේද යන්න නිර්ණය කිරීමට ආ 3 ඡේදයේ සාධක සමහරක් හෝ සියල්ලම සලකා බැලීම අවශ්‍ය විය හැකිය.

ආ8. ආයෝජිතයාව පාලනය කරන්නේ කවුරුන්ද යන්න නිර්ණය කිරීමට ඡන්ද බලය බලගතු සාධකයක් නොවන ලෙසට ආයෝජිතයෙක් සැකසුම් කළ හැකිය. උදාහරණයක් ලෙස යම් ඡන්ද අයිතියක් පරිපාලනමය කාර්යයන් සඳහා පමණක් සම්බන්ධවන විට හා අදාල ක්‍රියාකාරකම් ගිවිසුම්ගත එකඟතා විධි මඟින් මෙහෙයවීමෙන් එබඳු අවස්ථාවලදී ආයෝජිතයේ අරමුණු සහ සැලසුම් සම්බන්ධයෙන් ආයෝජකයකු විසින් සැලකිල්ලට ගැනීමේදී කුමන අවදානම් වලට ආයෝජිත විවෘත කර තැබීමට සැලසුම් කරන ලද්දේද ආයෝජිතයකු සමඟ සහභාගිත්වය දරණ පාර්ශ්වයන්ට පැවරීමට සැලසුම් කරනලද අවදානම් කවරේද සහ අවදානම් සමහරකට හෝ සියල්ලටම ආයෝජක විවෘතව තැබේද යන කරුණුද සැලකිල්ලට ගැනීම ඇතුලත්කළ යුතු වන්නේය. අවදානම් සැලකිල්ලට ගැනීමට පහළ පැත්තේ අවදානම් පමණක් නොව ඉහළ පැත්තේ වීමේ විභව්‍යතාවයන් ඇතුලත් වන්නේය.

බලය

ආ9. ආයෝජිතයකුට ඉහළින් බලය තිබීමට, ආයෝජකයකු හට අදාල ක්‍රියාකාරකම් මෙහෙයවීම සඳහා ප්‍රවර්තන හැකියාව ලබාදෙන පවත්නා හිමිකම් තිබිය යුතුය. බලය ඇස්තමේන්තු කිරීමේ අරමුණු සඳහා ආරක්ෂාකාරී හිමිකම් නොව ස්ථිර පදනමක් සහිත බලය පමණක් සලකා බැලිය යුතුය. (ආ 22 - ආ 28 ඡේද බලන්න)

ආ10. ආයෝජකයාහට බලය තිබේද යන්න සම්බන්ධයෙන් නිර්ණය කිරීම රඳාපවත්නේ අදාල ක්‍රියාකාරකම්, අදාල ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් තීරණ ගැනීමේ ක්‍රියාමාර්ගය සහ ආයෝජිතයා සම්බන්ධයෙන් ආයෝජක සහ වෙනත් පාර්ශ්වව වලට ඇති හිමිකම මතය.

අදාළ ක්‍රියාකාරකම් සහ අදාළ ක්‍රියාකාරකම් මෙහෙයවීම

ආ11. බොහෝ ආයෝජිතයන්හට ඔවුන්ගේ ප්‍රතිලාභ සඳහා මෙහෙයුම් සහ මූල්‍ය කරණ ක්‍රියාකාරකම් රැසක් සැලකිය යුතු ලෙස බලපායි. තත්ත්වයන් අනුව රඳා පවතින අදාළ ක්‍රියාකාරකම් වලට ඇතුලත් එහෙත් ඒවාට පමණක් සීමා නොවන ක්‍රියාකාරකම් සඳහා උදාහරණ ;

(අ) භාණ්ඩ හෝ සේවා විකිණීම සහ මිලට ගැනීම

(ආ) ඒවායේ ජීවිත කාලය තුල මූල්‍ය වත්කම් කළමනාකරණය කිරීම (පැහැර හැරීම් දක්වා ඇතුළුව)

(ඇ) වත්කම් තෝරා ගැනීම, අත්පත්කර ගැනීම හෝ බැහැර කිරීම

(ඈ) නව නිෂ්පාදන හෝ ක්‍රියාවලියන් පර්යේෂණය සහ සංවර්ධනය

(ඉ) අරමුදල් ව්‍යුහය නිර්ණය කිරීම හෝ අරමුදල් ලබාගැනීම

ආ12. අදාල ක්‍රියාකාරකම් සඳහා වන තීරණ වලට ඇතුලත් එහෙත් ඒවාට පමණක් සීමා නොවන තීරණයන් සඳහා උදාහරණ ;

(අ) අයවැය ලේඛණ ඇතුළුව ආයෝජිතයේ මෙහෙයුම් සහ ප්‍රාග්ධන තීරණ ස්ථාපිත කිරීම සහ

(ආ) ආයෝජිතයාගේ ප්‍රධාන කළමනාකරණ පිරිස් හෝ සේවා සපයන්නන් බඳවා ගැනීම ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම ඔවුන්ගේ සේවාවන් හෝ සේවා නියුක්තිය සමාප්ත කිරීම.

ආ13. සමහර අවස්ථාවලදී විශේෂ තත්ත්වයන් කට්ටලයක් පැනනැඟීම හෝ සිදුවූ සිද්ධියකට පෙර සහ පසුව යන දෙකටම වන ක්‍රියාකාරකම් අදාල ක්‍රියාකාරකම් විය හැකිය. ආයෝජකයන් දෙදෙනෙක් හෝ ඊට වැඩි ගණනකට අදාළ ක්‍රියාකාරකම් මෙහෙයවීමට ප්‍රවර්තන හැකියාව ඇතිවිට සහ එම ක්‍රියාකාරකම් වෙනස් වේලාවන්හිදී සිදුවනවිට සමගාමී තීරණ ගැනීමේ අයිතිය සැලකිල්ලට ගැනීමේදී එම ප්‍රතිලාභවලට සංගතව වඩාත් සැලකිය යුතු ලෙස බලපෑම් වන ක්‍රියාකාරකම් මෙහෙයවීමට කුමන ආයෝජකයාගේ ක්‍රියාකාරකම්වලට හැකිද යන්න ආයෝජකයා විසින් තීරණය කළ යුතුය. (13 ඡේදය බලන්න) අදාළ කරුණු හෝ තත්ත්වයන් වෙනස් වන්නේ නම් ආයෝජකයන් විසින් මෙම තක්සේරුව කාලය හරහා යළි සලකා බැලිය යුතුය.

| ව්‍යවහාරකරණ උදාහරණ |
|---|
| **1 වන උදාහරණය**<br><br>වෛද්‍ය නිෂ්පාදනයක් සංවර්ධනය කර අලෙවි කිරීමට ආයෝජකයන් දෙදෙනෙකු ආයෝජිතයෙක් පිහිටුවයි. වෛද්‍ය නිෂ්පාදනය සංවර්ධනයකර ඒ සඳහා නියාමන අනුමැතිය ලබා ගැනීමට එක් ආයෝජකයෙක් වගකිව යුතුවේ. නිෂ්පාදනය සංවර්ධනය කිරීම සහ නියාමන අනුමැතිය ලබා ගැනීම සම්බන්ධ සියළුම තීරණ ගැනීමේ ඒක පාර්ශවික හැකියාව තිබීම එම වගකීමට ඇතුළත් වේ. නිෂ්පාදනය සඳහා නියාමන අනුමැතිය දුන් විට, අනෙක් ආයෝජකයා නිෂ්පාදනය, නිෂ්පාදනය කර අලෙවි කරනු ඇත.<br><br>නිෂ්පාදනය සැලසුම් කර නිෂ්පාදනය කර අලෙවි කිරීම පිළිබඳ සියළු තීරණ ගැනීමට ඒක පාර්ශ්විකව හැකියාවක් මෙම ආයෝජක හට ඇත.<br><br>සියළුම ක්‍රියාකාරකම් - වෛද්‍ය නිෂ්පාදනය සංවර්ධනය කිරීම සහ නියාමන අනුමැතිය ලබාගැනීම මෙන්ම නිෂ්පාදනය කර බෙදාහැරීම - අදාල ක්‍රියාකාරකම් නම් ආයෝජිතයාගේ ප්‍රතිලාභ වලට වඩාත් සැලකිය යුතු ලෙස බලපාන අන්දමට ක්‍රියාකාරකම් මෙහෙයවීමට හැකිද යන්න එක් එක් ආයෝජකයා විසින් නිර්ණය කිරීම අවශ්‍යවේ.<br><br>එම නිසා ආයෝජකයාගේ ප්‍රතිලාභයට වඩාත් සැලකිය යුතු අන්දමින් බලපාන ක්‍රියාකාරකම් වන්නේ වෛද්‍ය නිෂ්පාදනය සංවර්ධනය කිරීම සහ නියාමන අනුමැතිය ලබාගැනීමද නිෂ්පාදනය කර අලෙවි කිරීමද යන්න සහ එයට එම ක්‍රියාකාරකම මෙහෙයවීමට හැකිද යන්න සෑම ආයෝජකයකු විසින්ම සලකා බැලීම අවශ්‍ය වේ. |

කුමන ආයෝජකහට බලය තිබේදැයි නිර්ණය කිරීමේදී ආයෝජක විසින් සලකා බැලිය යුතු වන්නේ.

(අ) ආයෝජිතයකුගේ අරමුණු හා සැකසුම

(ආ) වෛද්‍ය නිෂ්පාදනවල වටිනාකම මෙන්ම ලාභආන්තික, අයභාරය සහ ආයෝජිතයාගේ වටිනාකම නිර්ණය කරන සාධක

(ඇ) (ආ) හි සඳහන් සාධක සම්බන්ධයෙන් සෑම ආයෝජකයාගේම තීරණ ගැනීමේ අධිකාරියේ ප්‍රතිඵලයක් වශයෙන් ආයෝජිතයාගේ ප්‍රතිලාභ මත නම් බලපෑම් සහ

(ඈ) ප්‍රතිලාභ වල විචල්‍යතාවයට ආයෝජකයාගේ විවෘත වීම.

මෙම විශේෂ උදාහරණයේදී ආයෝජකයා විසින් එසේම සලකා බැලිය යුතුය.

(ඉ) නියාමන අනුමැතිය ලබාගැනීමේදී දැරීමට අවශ්‍ය කරන ප්‍රයත්නය සහ අවිනිශ්චිතතාවය (වෛද්‍ය නිශ්පාදන සංවර්ධනය කිරීම සහ නියාමන අනුමැතිය ලබාගැනීම් ආයෝජකගේ සාර්ථකභාවයේ වාර්තා සලකා බැලීමෙන්ත සහ

(ඊ) සංවර්ධිත අදියර සාර්ථක වූ පසු වෛද්‍ය නිෂ්පාදන පාලනය කරන්නේ කුමන ආයෝජකද?

**ව්‍යවහාරකරණ උදාහරණ**

**උදාහරණ 2**

ආයෝජන මාධ්‍යයක් (ආයෝජිතයා) ඇතිකර එය ණය සාධන පත්‍ර දරන ආයෝජකයෙක් (ණය ආයෝජක) සහ ස්කන්ධ සාධණ පත්‍ර දරන වෙනත් ආයෝජකයන් ගණනාවක් සමඟ මූල්‍යනය කර ඇත. ස්කන්ධ කොටස සැලසුම් කර ඇත්තේ මුලින්ම පාඩු අවශෝෂණය කරගැනීමට සහ ආයෝජිතයෙක්ගෙන් යම්කිසි අවශේෂ ප්‍රතිලාභයක් ලැබීමටය. ස්කන්ධයෙන් සියයට තිහක් දරණ එක් ආයෝජකයෙක් වත්කම් කළමනාකරුද වේ. වත්කම්වල පොලිය සහ මුල් මුදල ගෙවීම පැහැර හැරීම සිදුවිය හැකි ආශ්‍රිත ණය අවදානමට ආයෝජිත අනාවරණය කරමින් එහි ලැබූ මුදල් මූල්‍ය වත්කම් කළඹක් මිලදී ගැනීමට ආයෝජිත භාවිතා කරයි. මෙම වත්කම් වල ස්වභාවය සහ ස්කන්ධ කොටස මුලින්ම ආයෝජනයේ පාඩු අවශෝෂණය කරගැනීමට සැලසුම් කර තිබීමේ හේතුව නිසා කළඹේ ඇති වත්කම්වලට විය හැකි පැහැර හැරීම ආශ්‍රිත ණය අවදානමේ අවම අනාවෘතය සහිතව ණය ආයෝජකයන්හට ආයෝජනයක් ලෙස ගණුදෙනුව අලෙවි කරනු ලැබේ. වත්කම් තෝරාගැනීම, අත්පත් කරගැනීම, බැහැර කිරීම සම්බන්ධයෙන් කළඹ තුළ ඇති උපදේශන ඇතුළුව තීරණයන් ගැනීම සහ වත්කම් කළඹේ යම් පැහැර හැරීමක් උඩ කළමනාකරණය කිරීම ඇතුලත් ආයෝජකයාගේ ආයෝජන කළඹ කළමනාකරණය මගින් ආයෝජිතයාගේ ප්‍රතිලාභ වලට සැලකිය යුතු අන්දමේ බලපෑම් ඇති වේ. පැහැර හැරීම් ආයෝජන කළඹේ වටිනාකමින් නිශ්චිත සමානුපාතිකයක් කරා එළඹෙන තුරු එම සියළුම ක්‍රියාකාරකම් කළමනාකරණය කරනුයේ වත්කම් කළමනාකරුය (කළඹෙහි වටිනාකම ආයෝජනයේ ස්කන්ධ කොටස ක්ෂය වී තිබෙන තරමට ඇති කල්හී)

එම අවස්ථාවේ සිට තුන්වන පාර්ශ්වයක භාරකාරයෙක් ණය ආයෝජකයාගේ උපදෙස් අනුව වත්කම් කළමනාකරණය කරයි. ආයෝජිතයාගේ වත්කම් කළඹ කළමනාකරණය කිරීම ආයෝජිතයාගේ අදාල ක්‍රියාකාරකමයි. පැහැර හැරි වත්කම් කළඹේ වටිනාකමෙන් නිශ්චිත සමානුපාතිකයක් කරා ළඟා වනතෙක් අදාල ක්‍රියාකාරකම් මෙහෙය වීමට වත්කම් කළමනාකරුට හැකියාව ඇත. පැහැරහැරි වත්කම් වල වටිනාකම කළඹේ වටිනාකමින් නිශ්චිත සමානුපාතිකයක් ඉක්මවූවිට අදාල ක්‍රියාකාරකම් මෙහෙයවීම සඳහා ණය ආයෝජකයා හට හැකියාව ඇත.

ආයෝජිතගේ අරමුණු සහ සැකසුම මෙන්ම, එක් එක් පාර්ශ්වයේ ප්‍රතිලාභවලට ඇති විචල්‍යතාවයේ විවෘතවීම සලකා බැලීම ඇතුළුව ආයෝජිතයාගේ ප්‍රතිලාභවලට වඩාත්ම සැලකිය යුතු අන්දමින් බලපාන ලෙස ක්‍රියාකාරකම් මෙහෙය වීමට වත්කම් කළමනාකරු සහ ණය ආයෝජක යන අයගෙන් සෑම කෙනෙකු හටම හැකියාව තිබේදැයි නිර්ණය කළ යුතුය.

**ආයෝජිතයෙකු මත ආයෝජකයකු හට බලය ලැබෙන හිමිකම්**

ආ14. බලය පැන නඟිනුයේ හිමිකම්වලිනි. ආයෝජිතයකු මත බලය තිබීමට අදාල ක්‍රියාකාරකම් මෙහෙයවීමේ වර්තමාන හැකියාව ආයෝජකයා හට ලබාදෙන පවත්නා හිමිකම් ආයෝජකයා හට තිබිය යුතුය.

ආයෝජකයකුට බලය ලබා දිය හැකි හිමිකම් ආයෝජිතයන් අතර වෙනස් විය හැකිය.

ආ15. එක්කෝ වෙන් වෙන් වශයෙන් හෝ සංයෝජනයක් ලෙස ආයෝජකයකුට බලය ලබාදිය හැකි හිමිකම් සඳහා (එහෙත් ඒවාට පමණක් සීමා නොවන) උදාහරණ වනුයේ ;

(අ) ආයෝජිතයකුගේ ඡන්දය දීමේ අයිතියේ (හෝ භව්‍ය ඡන්දය දීමේ අයිතිය ) හිමිකම (ආ 34 - ආ 50 ඡේද බලන්න)

(ආ) අදාල ක්‍රියාකාරකම් මෙහෙයවීමට හැකියාව ඇති ආයෝජිතගේ කළමනාකාරීත්වයේ ප්‍රධාන සේවක මණ්ඩලයේ සාමාජිකයන් පත් කිරීම, යලි පත් කිරීම හෝ ඉවත් කිරීමේ හිමිකම්

(ඇ) අදාල ක්‍රියාකාරකම් මෙහෙයවන වෙනත් අස්තිත්තවයක් පත් කිරීම හෝ ඉවත් කිරීමේ හිමිකම්

(ඈ) ආයෝජකයාගේ වාසිය සඳහා වන ගණුදෙනු තුලට ආයෝජිතයාව ඇතුලත් කිරීම, හෝ නිෂේධ කිරීම, යම් වෙනස්කම් කිරීමේ හිමිකම් සහ

(ඉ) අදාල ක්‍රියාකාරකම් මෙහෙයවීමට දරන්නාට හැකියාව ලබාදෙන වෙනත් හිමිකම් (කළමනාකරණ ගිවිසුම් නිශ්චය කර ඇති තීරණ ගැනීමේ හිමිකම් වැනි)

ආ16. සාමාන්‍යයෙන් ආයෝජිතයෙක් හට, ආයෝජිතයාගේ ප්‍රතිලාභ වලට සැලකිය යුතු අන්දමින් බලපාන මෙහෙයුම් සහ මූල්‍ය ක්‍රියාකාරකම් පෙළක් ඇතිවිටක සහ මෙම ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ස්වාධීන තීරණ ගැනීම අඛණ්ඩව අවශ්‍ය වනවිටක වෙනත් එකඟවීම් සමඟ එක්කෝ තනි තනිව හෝ සංයෝජිතව ආයෝජකයකුහට බලය ලබාදෙන හිමිකම විය යුත්තේ ඡන්දය දීමේ හෝ වෙනත් සමාන හිමිකම්ය.

ආ17. ඡන්ද අයිතිය පරිපාලනමය කර්තව්‍යක් සඳහා පමණක් සම්බන්ධවන විට සහ අදාල ක්‍රියාකාරකම් මෙහෙයවීම ගිවිසුම්ගත එකඟවීම් නිර්ණය කරන විට වැනි ඡන්ද අයිතීන්ට ආයෝජිතයාගේ ප්‍රතිලාභවලට සැලකිය යුතු අන්දමේ බලපෑමක් නොතිබෙන විට ආයෝජිතයා මත බලය ලබාදීමට එයට ප්‍රමාණවත් හිමිකමක් තිබේදැයි නිසිලෙස වැඩ කෙරෙන බව නිර්ණය කිරීමට ආයෝජක එම ගිවිසුම්ගත එකඟවීම් තක්සේරු කිරීම අවශ්‍යවේ. එයට බලය දීමට ආයෝජකයකුහට ප්‍රමාණවත් හිමිකමක් තිබේදැයි නිර්ණය කිරීමට ආයෝජකයෙක්, ආයෝජිතයාගේ අරමුණ සහ සැකසීම (ආ 5 - ආ 8 ඡේද බලන්න) සහ ආ 18 - ආ 20 ඡේදයන් සමඟ ආ 51 - ආ 54 ඡේදයන්හි අවශ්‍යතා සලකා බැලිය යුතුය.

ආ18. සමහර අවස්ථාවලදී ආයෝජිතයකු මත පවත්නා බලය ලබාදීමට ආයෝජකයෙකුගේ හිමිකම් ප්‍රමාණවත් දැයි නිර්ණය කිරීම අපහසු විය හැකිය. එවැනි සිද්ධීන් හිදී දියයුතු බලය තක්සේරු කිරීමේ හැකියාව ලබාදීමට ආයෝජක විසින් අදාල ක්‍රියාකාරකම් ඒක පාර්ශවිකව මෙහෙයවීමට එයට ප්‍රායෝගිකව හැකියාවක් තිබේද යන්න පිළිබඳ සාක්ෂි සලකා බැලිය යුතුය. සැලකිල්ලට භාජනය වේ. එහෙත් පහත සඳහන් දෑට, එනම් එහි හිමිකම් සහ ආ 19 ඡේදයේ දක්වෙන දර්ශක සමඟ එකට සැලකිල්ලට ගනුලබන කල්හි, ආයෝජිතමත බලය පැවැත් වීමට ආයෝජකගේ හිමිකම් ප්‍රමාණවත් බවට සාක්ෂි සැපයිය හැකිය යන්නට සීමා නොවේ.

(අ) එසේ කිරීමට ගිවිසුම් ගත හිමිකමක් නොමැතිව අදාල ක්‍රියාකාරකම් මෙහෙයවීමට හැකියාව ඇති ආයෝජිතගේ ප්‍රධාන කළමනාකාරිත්වයේ සේවක පිරිස් පත්කිරීමට හෝ අනුමත කිරීමට ආයෝජකට පුළුවන.

(ආ) එසේ කිරීමට ගිවිසුම් ගත හිමිකමක් නොමැතිව ආයෝජකයාගේ වාසිය සඳහා වන සැලකිය යුතු අන්දමේ ගණුදෙනුවලට ආයෝජිතයාව ඇතුලත් කිරීම හෝ නිෂේධ කිරීමට යම් වෙනස් කිරීමට ආයෝජකහට පුළුවන.

(ඇ) එක්කෝ ආයෝජිතයාගේ පාලක මඩුල්ලේ සාමාජිකයන් තෝරාගැනීමේ නාම යෝජනා ක්‍රියාවලියේදී හෝ ඡන්ද අයිතිය දරන වෙනත් අයගෙන් පෙරකලාසි ලබා ගැනීමට ආයෝජකහට ආධිපත්‍ය පවත්වා ගෙන යාමට පුළුවන.

(ඈ) ආයෝජිතගේ ප්‍රධාන කළමනාකාරීත්ව සේවක පිරිස් ආයෝජිතයාගේ සම්බන්ධිත පාර්ශ්ව වීම, (උදාහරණ වශයෙන් ආයෝජිතයාගේ ප්‍රධාන විධායක නිලධාරී සහ ආයෝජකයාගේ ප්‍රධාන විධායක නිලධාරී යන දෙදෙනාව එකම පුද්ගලයෙක් වීම)

(ඉ) ආයෝජිතගේ පාලක මඩුල්ලේ සාමාජිකයන්ගෙන් බහුතරය ආයෝජකගේ සම්බන්ධිත පාර්ශ්ව වීම.

ආ19. සමහර අවස්ථාවල ආයෝජක ආයෝජිත සමඟ විශේෂ සබඳතාවයක් පවතින බවට හැඟවීම් තිබිය හැකි අතර මෙමඟින් ආයෝජක හට ආයෝජිත කෙරෙහි අක්‍රීය ඇල්මකට වඩා වැඩියමක් ඇතිබව ඉඟ කෙරේ. ඕනෑම තනි ඇඟවීමක් හෝ එක්තරා අන්දමක ඇඟවීම් සංයෝජනයක පැවැත්ම මඟින් බලය පිළිබඳ නිර්ණායකයන් ඉටුවූවා යයි අත්‍යවශ්‍යයෙන්ම අදහස් නොවේ. කෙසේවෙතත් ආයෝජිතයා කෙරෙහි අක්‍රිය ඇල්මකට වඩා යමක් තිබීම ආයෝජකයාට ඉහතින් පවතින බලයට සාක්ෂි සැපයීම ඇඟවීමක් විය හැකිය.

ආයෝජක හට අක්‍රීය ඇල්මකට වඩා වැඩි ඇල්මක් ආයෝජිත කෙරෙහි ඇති බව හා වෙනත් හිමිකම් සංයෝජනයකින් බලය ඉඟි කල හැකි බව පහත දී ඇති උදාහරණ වලින් යෝජනා කෙරේ.

(අ) අදාල ක්‍රියාකාරකම් මෙහෙයවීමට හැකියාව ඇති ආයෝජිතගේ ප්‍රධාන කළමනාකාරීත්වයේ සේවක පිරිස් ආයෝජකගේ වර්තමාන හෝ පෙර සිටි සේවකයන් වීම.

(ආ) පහත සඳහන් අවස්ථාවන්හිදී වැනි ආයෝජිතගේ මෙහෙයුම් ආයෝජක මත රඳා පැවතීම.

(i) එහි මෙහෙයුම් වලින් සැලකිය යුතු කොටසකට මුදල් සපයා ගැනීමට ආයෝජිත, ආයෝජක මත විශ්වාසය තැබීම.

(ii) ආයෝජිතගේ බැඳීම් වලින් සැලකිය යුතු කොටසක් සඳහා ආයෝජකයා ඇපවීම.

(iii) තීරනාත්මක සේවාවන්, තාක්‍ෂණය, සැපයීම් හෝ අමුද්‍රව්‍ය සඳහා ආයෝජිත, ආයෝජක මත යැපීම

(iv) ආයෝජිතයාගේ මෙහෙයුම්වලට තීරනාත්මක වන බලපත්‍රහිමියා හෝ වෙළඳ ලකුණු වැනි වත්කම් ආයෝජක පාලනය කිරීම.

(v) ආයෝජිතගේ මෙහෙයුම් කෙරෙහි විශේෂඥ දැනුමක් ඇති පිරිස් ආයෝජකයා ලඟ සේවය කරන විට ආයෝජිතයාගේ ප්‍රධාන කළමනාකාරීත්ව පිරිස් පිළිබඳව ආයෝජකයා මත යැපීම.

(ඇ) ආයෝජිතයාගේ ක්‍රියාකාරකම් වලින් සැලකිය යුතු කොටසක් එක්කෝ ආයෝජකව සම්බන්ධ කරගෙන හෝ ඔහු වෙනුවෙන් සිදු කිරීම.

(ඈ) ආයෝජකයා ආයෝජිතයාව සම්බන්ධකරගත් ප්‍රතිලාභ ආයෝජකයේ අනාවරණය හෝ හිමිකම් එහි ඡන්ද හෝ වෙනත් සමාන අයිතීන් වලට සමානුපාතික නොවන අන්දමට වැඩිවීම. උදාහරණ ලෙස ආයෝජකයෙක් ආයෝජිතයාගේ ප්‍රතිලාභවලින් සියයකට පනහකට වඩා හිමිකමක් හෝ විවෘතභාවය තිබිය හැකි වුවද ඔහු ආයෝජිතයාගේ ඡන්ද අයිතියෙන් සියයට පනහකට වඩා අඩු ප්‍රමාණයක් දරණ අවස්ථාවන් තිබිය හැකිය.

ආ20. ආයෝජිතයාව සම්බන්ධකර ගැනීමෙන් වන ප්‍රතිලාභ වල විචල්‍යතාවය ආයෝජකයාගේ විවෘතභාවය හෝ හිමිකම විශාල වන විට ආයෝජක හට එයට බලය ලබාදීමට ප්‍රමානවත් හිමිකම් ලබාගැනීමට ඇති දිරිගැන්වීමත් විශාල වේ. එමනිසා ප්‍රතිලාභ වල විචල්‍යතාවයට විශාල විවෘතභාවයක් තිබීම ආයෝජකහට බලය ඇතැයි යන්නට හැඟවීමක් වේ. කෙසේ වෙතත් ආයෝජකයාගේ විවෘතභාවයේ ප්‍රමාණය මගින් පමණක්ම ආයෝජකයාහට ආයෝජිතයා මත පවත්නා බලය තිබේ යයි නිර්ණය නොකෙරේ.

ආ21. ආ 18 ඡේදයේ පිහිටුවා ඇති සාධක සහ අ 19 සහ අ 20 යන ඡේදවල පිහිටුවා ඇති ඉඟියන් ආයෝජකගේ හිමිකම් සමග එකටගත් කල, විශාල බරතැබීමක් ආ 18 ඡේදයේ විස්තර කර ඇති බලය පිළිබඳව වූ සාක්ෂිවලට දිය යුතුය.

*ස්ථාවර හිමිකම්*

ආ22. ආයෝජකයෙක්, එයට බලය තිබේදැයි තක්සේරුකිරීමේදී ආයෝජිතයාට අදාල ස්ථාවර හිමිකම් පමණක් සැලකිල්ලට ගනී. (ආයෝජක හා වෙනත් අය දරණ) හිමිකමක් ස්ථාවර වීමට දරන්නා හට එම හිමිකම ක්‍රියාත්මක කිරීමේ ප්‍රායෝගික හැකියාවක් තිබිය යුතුය.

අ23. සියළු කරුනු සහ තත්වයන් සැලකිල්ලට ගැනීමෙන් හිමිකම් ස්ථාවර දැයි නිර්ණය කිරීම විචාර බුද්ධිය අවශ්‍යවේ. එම නිර්ණය කිරීමේ දී ඒවාට පමණක් සීමානොවී සැලකිල්ලට ගත යුතු කරුනු වනුයේ.

(අ) දරන්නාව (හෝ දරන්නන්) එම හිමිකම් ක්‍රියාත්මක කිරීමේ කාර්යයෙන් වලක්වාලන යම් බාධකයන් (ආර්ථික හෝ වෙනත් අන්දමේ) තිබේද. එවැනි බාධකයන්ට ඒවාට පමණක් සීමා නොවී ඇතුල් වන දෑ වනුයේ.

(i) දරන්නාට එහි හිමිකම් ක්‍රියාත්මක කිරීම වලක්වා ලන (අධෛර්යමත් කරන) මූල්‍ය දඩුවම් හෝ දිරිගැන්වීම්.

(ii) ක්‍රියාත්මක කිරීමේ හෝ පරිවර්තන මිල මඟින් ඇතිකරන මූල්‍යමය බාධකයන් දරන්නාහට එහි අයිතීන් ක්‍රියාත්මක කිරීම වලක්වාලීම (අධෛර්යමත් කිරීම) හැකි වීම.

(iii) නියමයන් සහ කොන්දේසි මඟින් එම හිමිකම් ක්‍රියාත්මක කිරීම අපේක්‍ෂාකල නොහැකි තත්වයකට පත් කිරීම උදාහරණ වශයෙන් ඒවායේ ක්‍රියාත්මක කිරීමේ කාල සීමාවන් ඉතා සියුම් ලෙස සීමා කිරීමේ කොන්දේසි

(iv) අදාල නීතිවල හෝ රෙගුලාසි වල හෝ ආයෝජිතගේ ප්‍රාරම්භක ලිපිලේඛණවල ප්‍රකාශිත සාධාරණ යාන්ත්‍රනයක් නොමැතිවිට එය විසින් දරන්නාට එහි අයිතීන් ක්‍රියාත්මක කිරීමට ඉඩදේ.

(v) හිමිකම් දරන්නාට එහි අයිතීන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය තොරතුරු ලබාගැනීමේ නොහැකියාව.

(vi) දරන්නාට එහි හිමිකම් ක්‍රියාත්මක කිරීම වලක්වාලන (හෝ අධෛර්යමත් කරන) මෙහෙයුම් බාධක හෝ දිරිගැන්වීම් (පදවිය දරණ කළමණාකරු විසින් දරණ වෙනත් උනන්දුකිරීම් භාරගැනීමට සහ විශේෂඥ සේවා සැපයීමට හෝ සේවා සැපයීමට අනෙක් කළමණාකරුවන්ගේ හැකියාව හෝ කැමැත්ත දක්නට නොලැබීම)

(vii) දරන්නා එහි හිමිකම් ක්‍රියාත්මක කිරීම වළක්වාලන නීතිමය හෝ නියාමන අවශ්‍යතාවයන් (උදා:- විදේශීය ආයෝජකයකු හට එහි හිමිකම් ක්‍රියාත්මක කිරීම තහනම්ය)

(ආ) හිමිකම් ක්‍රියාත්මක කිරීම ඒක පාර්ශ්වයකට වඩා වැඩි ගණනක එකගතාවය අවශ්‍යවන විටදී හෝ හිමිකම් ඒක පාර්ශ්වයකට වඩා වැඩිගණනක් දරණ විටදී, ඔවුන්ගේ හිමිකම් සාමූහිකව ක්‍රියාත්මක කිරීමට ඔවුන් තෝරාගත හොත් එසේ ක්‍රියාත්මක කිරීම සඳහා ඔවුන්හට ප්‍රායෝගික හැකියාවන් හැකියාවක් සපයන යාන්ත්‍රනයක් සලසා තිබේද? එවැනි යාන්ත්‍රණයක අඩුව හිමිකම් ස්ථිර නොවිය හැකි බව ඇඟවීමකි. හිමිකම් ක්‍රියාත්මක කිරීමට පාර්ශ්ව ගණනාවක් එකඟවීමේ අවශ්‍යතාවය එම හිමිකම් ස්ථිර වීමට ඇති හැකියාව අඩුවීමකි. කෙසේ වෙතත් විවිධ ආයෝජකයන් ඔවුන්ගේ හිමිකම සාමූහිකව ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් තීරණ ගන්නන්ගේ ස්වාධීන අධ්‍යක්‍ෂ මණ්ඩලයක සාමාජිකයකු යාන්ත්‍රනයක් ලෙස සේවය කළ හැකිය. ස්වාධීන අධ්‍යක්‍ෂ මණ්ඩලයක් විසින් ක්‍රියාත්මක කළ හැකි ඉවත් කිරීමේ හිමිකම විශාල සංඛ්‍යාවක ආයෝජකයන් එම හිමිකම් තනිතනිව ක්‍රියාත්මක කිරීමකට වඩා බොහෝ ස්ථාවර විය හැකිය.

(ඇ) එම හිමිකම් ක්‍රියාත්මක කිරීමෙන් හිමිකම් දරණ පාර්ශ්වය හෝ පාර්ශ්වයන්ට ප්‍රතිලාභයක් වන්නේද උදාහරණ වශයෙන් ආයෝජිතයකුගේ (ආ 47 - ආ 50 ඡේද බලන්න) හව්‍ය ඡන්ද අයිතිය දරන්නකු විසින් සාධන පත්‍රයේ ක්‍රියාත්මක හෝ පරිවර්තන මිල සලකා බැලිය යුතුයි. සාධන පත්‍රය මුදල් තුල හෝ සාධන පත්‍රය ක්‍රියාත්මක කිරීමෙන් හෝ පරිවර්තනය කිරීමෙන් වෙනත් හේතුනිසා ආයෝජකහට ප්‍රතිලාභ වන්නේනම් (උදා: සහ ක්‍රියාකාරකම් උපලබ්ධිවීමෙන්) හව්‍ය ඡන්ද බලයේ නියමයන් හා කොන්දේසි බොහෝදුරට ස්ථාවර විය හැකිය.

ආ24. අදාල ක්‍රියාකාරකම් වල මෙහෙයුම් පිළිබඳ තීරණයන් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වූවිට ස්ථාවර වීමට හිමිකම්ද ඊට අමතරව ක්‍රියාත්මක කිරීම අවශ්‍ය කෙරේ. හිමිකම් වර්තමානයේදී ක්‍රියාත්මක කළ නොහැකි වුවත් සමහර අවස්ථාවලදී හිමිකම් ස්ථාවර විය හැකිය.

**ව්‍යවහාර කරන උදාහරන**

**3 වන උදාහරණය**

ආයෝජිතයන්ට කොටස් හිමියන්ගේ වාර්ෂික සභාරැස්වීමක් ඇති අතර එහිදී අදාල ක්‍රියාකාරකම් මෙහෙයවීමට අදාල තීරණගනු ඇත. මීළගට නියමිත කොටස් හිමියන්ගේ රැස්වීම තවමාස 8 කින් පැවැත්වේ. තනි තනිව හෝ සාමූහිකව අඩුතරමින් සියයකට 5ක ඡන්ද අයිතිය දරණ කොටස් හිමියනට අදාල ක්‍රියාකාරකම් සඳහා පවතින ප්‍රතිපත්ති වෙනස් කිරීම සඳහා විශේෂ රැස්වීමක් කැඳවීමට අයිතිය ඇතත් එවැනි රැස්වීමක් අඩුතරමින් දින 30 කින් පැවැත්විය නොහැකි අතර ඒ සඳහා අනෙක් කොටස් හිමියනට දැන්විය යුතු වීමේ අවශ්‍යතාවයක් ඇත. අදාල ක්‍රියාකාරකම් වලට උඩින් ප්‍රතිපත්තීන් වෙනස් කල හැක්කේ විශේෂ හෝ නියමිත කොටස් හිමියන්ගේ රැස්වීමකදී පමණි.

මෙයට වැදගත් වත්කම් විකිණීම මෙන්ම සැලකිය යුතු අන්දමේ ආයෝජන අත්පත් කර ගැනීම බැහැර කිරීම සඳහා අනුමැතියද ඇතුලත් වේ.

ඉහත විස්තර කර ඇති කරුනු රටාව පහත විස්තර කර ඇති උදාහරණ 3 අ - 3 ඇ ට අදාල වේ. සෑම උදාහරණයක්ම සලකාබලනු ලබන්නේ තනි තනි වශයෙනි.

**3අ උදාහරණය**

ආයෝජිතයකුගේ ඡන්ද අයිතියෙන් බහුතරය ආයෝජකයකු දරයි. අදාල ක්‍රියාකාරකම් කිරීමට අවශ්‍ය වන අවස්ථාවලදී ඒවා මෙහෙයවීම පිළිබඳ අවශ්‍ය තීරණ ගැනීමේ හැකියාව ඇති නිසා ආයෝජිතගේ ඡන්ද අයිතිය ස්ථාවර වේ. ආයෝජක කොටස් දැරීම අත්පත් කරගත් මොහොතේ සිටම අදාල ක්‍රියාකාරකම් මෙහෙය වීමේ වර්තමාන හැකියාව තිබීම මඟින් ඡන්ද බලය ක්‍රියාත්මක කිරීමට ආයෝජකට දින 30 ක් ගත වේ යන කරුණ මඟින් නවත්වනු නොලැබේ.

**3ආ උදාහරණය**

ආයෝජිතයකුගේ කොටස්වලින් බහුතරය අත්පත් කර ගැනීමේ ඉදිරි ගිවිසුමක ආයෝජකයෙක් පාර්ශ්ව කරුවෙක් වේ. ඉදිරි ගිවිසුමේ නිරවුල් කළ යුතු කාලය වනුයේ දින 25 කින්ය. අදාල ක්‍රියාකාරකම් පිළිබඳව පවතින ප්‍රතිපත්ති වෙනස් කිරීමට දැනට සිටින කොටස් හිමියන්ට දින 30 ක් යනතුරු විශේෂ රැස්වීමක් පැවැත්විය නොහැකිය නිසා නොහැකි වන අතර ඒ අවස්ථාව වන

විට ඉදිරි ගිවිසුම නිරවුල් කර හමාරය. ඒ අනුව ආයෝජකහට 3 අ උදාහරණයේ දක්වෙන බහුතර කොටස් හිමියකුට අත්‍යවශයෙන් සමාන වන හිමිකම්ක මෙහිදි ඇත. (උදා: කිරීම අවශ්‍ය වු විට ඉදිරි ගිවිසුමක් දරණ ආයෝජකයකුහට අදාල ක්‍රියාකාරකම් පිළිබඳ මෙහෙයවීම් තීරණ ගත හැක) ඉදිරි ගිවිසුම නිරවුල් කිරීමට පවා පෙර අදාල ක්‍රියාකාරකම් මෙහෙයවීමට ආයෝජකහට වර්තමාන හැකියාව ලබාදෙන ආයෝජකයේ ඉදිරි ගිවිසුම ස්ථාවර හිමිකමක්.

3ඈ *උදාහරණය*

ආයෝජකයෙක් ආයෝජිතයකුගේ කොටස් වලින් බහුතරය අත්කර ගැනීමට දින 25 කින් ක්‍රියාත්මක කළ යුතු ස්ථාවර විකල්පයක් දරණ අතර එය අතිශයින්ම මුදල් තුළ පවතින.

උදාහරණ 3 ආ හි ඇති හා සමාන නිගමනයකට එළඹිය හැකිය.

3ඈ *උදාහරණය*

ආයෝජිතයකුගේ කොටස් වලින් බහුතරය අත්කර ගැනීමට වන ඉදිරි ගිවිසුමක ආයෝජකයකු පාර්ශ්වව කරුවන අතර ආයෝජකයාට ඉහළින් වෙනත් සම්බන්ධිත හිමිකම් නොමැත. ඉදිරි ගිවිසුම් නිරවුල් කිරීමේ දිනය තව මාස 6කිනි. ඉදිරි ගිවිසුම නිරවුල් කිරීමට පෙර දැනට සිටින කොටස් හිමියනට අදාල ක්‍රියාකාරකම් පිළිබඳ පවත්නා ප්‍රතිපත්ති වෙනස් කළ හැකි නිසා දැනට සිටින කොටස් කරුවනට අදාල ක්‍රියාකාරකම් මෙහෙයවීමට වර්තමාන හැකියාව ඇත.

ආ.25. ස්ථාවර හිමිකම ක්‍රියාත්මක කළ හැකි වෙනත් පාර්ශ්වයකට එම හිමිකම් වලට අදාලව ආයෝජකයෙක් ආයෝජිතයෙක්ව, පාලනය කිරීම වලක්වාලිය හැකිය. එවැනි ස්ථාවර හිමිකම් දරන්නන් හට තීරණ මුල පිරීම සඳහා වන හැකියාව තිබීම අවශ්‍ය නොවේ. හිමිකම යම්තම් ආරක්‍ෂාකාරී වනතාක්කල් (ආ 26 - ආ 28 ඡේද බලන්න) එම හිමිකම් දරන්නාට අදාල ක්‍රියාකාරකම් පිළිබඳ තීරණ අවහිර කිරීම හෝ අනුමැතියට පමණක් වර්තමාන හැකියාව දුන් විටකදී වුවද ස්ථාවර හිමිකම දරන වෙනත් පාර්ශ්වයනට ආයෝජකයෙකුට ආයෝජිතයකු පාලනය කිරීම වලක්වාලිය හැකිය.

*ආරාක්ෂාකාරී හිමිකම්*

ආ26. හිමිකමක් මඟින් ආයෝජකයකු මත පවතින බලය ලැබෙනවාද යන්න අගය කිරීමේදී ආයෝජක විසින් එහි හිමිකම් සහ අන් අය දරන හිමිකම් ආරක්‍ෂාකාරී හිමිකම්දැයි තක්සේරු කළ යුතුය. ආරක්ෂණ හිමිකම් අදාල වන්නේ ආයෝජිතයකුගේ ක්‍රියාකාරකම්වල මූලික වෙනස්කම් වලට හෝ විශේෂ තත්තවයනහිදී යොදා ගැනීමටය. එසේවුවත් අසාමාන්‍ය අවස්ථාවලදී අදාල කෙරෙන හිමිකම් සියල්ල හෝ සිදුවීම් මත අවිනිශ්චිත වන දැ ආරක්‍ෂක නොවේ.

ආ27. ආරක්‍ෂාකාරී හිමිකම් සැලසුම් කර ඇත්තේ එම හිමිකම් සම්බන්ධවන අයට ආයෝජිතයාට ඉහළින් බලයක් එම පාර්ශ්වයට නොදී ඔවුන්ගේ දරන්නන් ආරක්‍ෂා කිරීමේ හේතුව නිසා ආරක්‍ෂාකාරී හිමිකමක් පමණක් දරන ආයෝජකයකුහට ආයෝජිතයකු මතපවතින බලය තිබිය නොහැකිව මෙන්ම හෝ වෙනත් පාර්ශ්වයක් ආයෝජිතයකු මතපවතින බලය තිබීම වලක්වාලියද නොහැක. (14 ඡේදය බලන්න)

ආ28. ආරක්‍ෂාකාරී හිමිකම් වල ඇතුලත් එහෙත් ඒවාට පමණක් සීමා නොවන දැ සඳහා උදාහරණ

(අ) ණය දෙන්නාට අවාසියක් වන ලෙස ණය ගන්නාගේ ණය අවදානම සැලකිය යුතු ලෙස වෙනස් විය හැකි ක්‍රියාකාරකම් වලින් ණය ගන්නාගේ වගකීම සීමා කිරීමට ණය දෙන්නාගේ හිමිකම

(ආ) ආයෝජිතයකුගේ පාලනය නොවන හිමිකම දරණ පාර්ශ්වයකට සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී අවශ්‍ය කරන ප්‍රමාණයට වඩා විශාල ප්‍රාග්ධන වියදම් අනුමත කිරීමට හෝ ස්කන්ධ හෝ ණය සාධන පත්‍ර අනුමත කිරීමට ඇති හිමිකම.

(ඇ) ණය ගන්නා ණය යලි ගෙවීමේ නිශ්චය කරන ලද කොන්දේසි සපුරාලීමට අපොහොසත් වන්නේ නම් ණය ගන්නාගේ වත්කම් තම භාරයට ගැනීමට ණය දෙන්නාගේ හිමිකම.

**බලයලත් අයිතිය**

ආ29. බලයලත් අයිතීන් ගිවිසුමක ආයෝජිත බලයලත් අයිතීන් ගැණුම් කරුවන් අතර බොහෝවිට බලයලත් අයිතිය දිමනාකරුට බලයලත් අයිතියේ සන්නම් නාමයේ අයිතිය ආරක්‍ෂා කිරීම සැලසුම් කළ හිමිකමක් ලැබේ. බලයලත් අයිතීන් ගිවිසුමක දර්ශියව බලයලත් අයිතීන් ගැණුම් කරුගේ මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් වන බලයලත් අයිතිය දීමනා කරුගේ තීරණ ගැනීමේ සමහර හිමිකම් බලයලත් අයිතිය ගැණුම්කරුට ලබාදේ.

ආ30. සාමාන්‍යයෙන් බලයලත් අයිතීන් දීමනා කරුගේ හිමිකම් මඟින් බලයලත් අයිතීන් ගැණුම්කරුගේ ප්‍රතිලාභ වලට සැලකිය යුතු අන්දමේ බලපෑමක් ඇතිවන බලයලත් අයිතීන් දීමානාකරුගේ තීරණ හැර වෙනත් පාර්ශ්වයන්ගේ හැකියාවන් සීමා නොකෙරේ.

බලයලත් ගිවිසුම්වල ඇතුලත් බලයලත් හිමිකම් හිමිකරුවාගේ හිමිකම්වලින් බලයලත් හිමිකම් දීමනා කරුගේ ප්‍රතිලාභ කෙරෙහි වැදගත් ආකාරයෙන් බලපාන ක්‍රියාකාරකම් මෙහෙයවීම සඳහා ප්‍රවර්තන හැකියාව බලයලත් හිමිකම් හිමියාට අවශ්‍යයෙන්ම ලබාදීම නොකෙරේ.

ආ31. බලයලත් අයිතිය ගැණුම් කරුගේ ප්‍රතිලාභවලට සැලකිය යුතුලෙස බලපාන තීරණ ගැනීමේ වර්තමාන හැකියාව තිබීම සහ බලයලත් අයිතිය ගැණුම්කරුගේ සන්නම් නාමය ආරක්ෂාකිරීමට තීරණ ගැනීමේ හැකියාව යන දෙක අතර වෙනස හඳුනාගැනීම අවශ්‍යවේ. බලයලත් අයිතිය ගැනුම්කරුගේ අදාල ක්‍රියාකාරකම් මෙහෙයවීමට අනෙකුත් පාර්ශ්වවහට වර්තමාන හැකියාව ලබාදෙන පවත්නා හිමිකම් තිබේනම් බලයලත් අයිතීන් දීමනාකරුට, බලයලත් අයිතීන් ගැණුම්කරුට ඉහළින් බලයක් නොමැත.

ආ32. බලයලත් අයිතීන් ගිවිසුමක නියමයන් පරිදි ඔහුගේම යහපත සඳහා එහි ව්‍යාපාරය මෙහෙයවීමට බලයලත් අයිතීන් ගිවිසුමට ඇතුල් වීමෙන් බලයලත් අයිතීන් ගැණුම්කරුවෙක් ඒක පාර්ශ්වවිකව තීරණයක් ගෙන ඇත.

ආ33. බලයලත් අයිතීන් ගැනුම්කරුගේ එවැනි මූලික තීරණවලට ඉහළින් පාලනය සහ එහි මූල්‍ය ව්‍යුහය නිර්ණය කරනු ලැබිය හැකි වනුයේ බලයලත් අයිතිය ගැනුම්කරු හැර වෙනත් පාර්ශ්වවනම් බලයලත් අයිතිය ගැණුම්කරුගේ ප්‍රතිලාභ සැලකිය අන්දමින් වෙනස් විය හැකිය. බලයලත් අයිතියේ ගැණුම්කරු සපයන මූල්‍ය සහායේ මට්ටම අඩුවන තරමට සහ බලයලත් අයිතිය දීමනාකරුගේ ප්‍රතිලාභවල විචල්‍යතාවයට බලයලත් අයිතිය ගැණුම්කරුගේ විවෘතභාවය අඩුවන තරමට, බොහෝ දුරට විය හැක්කේ බලයලත් අයිතිය ගැණුම්කරුහට ආරක්ෂක හිමිකම් තිබීම පමණකි.

### ඡන්ද බලය

ආ34. ඡන්ද හෝ සමාන අයිතීන් මගින් බොහෝවිට ආයෝජකයකුහට අදාල ක්‍රියාකාරකම් මෙහෙයවීමට වර්තමාන හැකියාව තිබේ.

ආයෝජිතයකුගේ අදාල ක්‍රියාකාරකම් මෙහෙයවන්නේ ඡන්ද අයිතිය හරහානම් ආයෝජකයෙක් මෙම කොටසේ (ආ 35 - ආ 50 දක්වා ඡේදයෙන්) අවශ්‍යතාවය සලකාබලයි.

*බහුතර ඡන්ද අයිතිය සමග වන බලය*

ආ35. ආ36 හෝ ආ37 ඡේදයන් ව්‍යවහාර වන්නේ නම්හැර ආයෝජිතයකුගේ ඡන්ද බලයෙන් අඩකට වඩා දරණ ආයෝජකයකුහට පහත සඳහන් අවස්ථාවන්හිදී බලය තිබේ.

(අ) අදාල ක්‍රියාකාරකම් මෙහෙයවන්නේ බහුතර ඡන්ද බලය දරන්නගේ ඡන්ද බලයෙන් වීම හෝ

(ආ) අදාල ක්‍රියාකාරකම් මෙහෙයවන පාලක මණ්ඩලයේ බහුතර සාමාජිකයන් පත්කරන්නේ බහුතර ඡන්ද අයිතිය දරන්නන්ගේ ඡන්දයෙනි.

*බලය නොමැති එහෙත් බහුතර ඡන්ද අයිතිය*

ආ36. ආයෝජිතයකුගේ ඡන්ද අයිතියෙන් අඩකට වඩා දරණ ආයෝජකයකුහට ආයෝජකයකු මත බලය තිබීමට ආ 22 - ආ 25 ඡේදයන් අනුව ආයෝජිතයාගේ ඡන්ද අයිතිය ස්ථාවර විය යුතුය සහ බොහෝවිට මෙහෙයවීම් සහ මූල්‍යකරණ ප්‍රතිපත්තීන් නිර්ණය කිරීම හරහා අදාල ක්‍රියාකාරකම් මෙහෙයවීමට වර්තමාන හැකියාව ආයෝජකහට ලබාදිය යුතුය. වෙනත් අස්තිත්වයක පවතින හිමිකම අදාල ක්‍රියාකාරකම් මෙහෙයවීමට එම අස්තිත්වය වෙත හිමිකම එය සලසනවිට සහ එම අස්තිත්වය ආයෝජකයේ නියෝජිතයකු නොවනවිට ආයෝජකයාහට ආයෝජිතයා මත බලයක් නොමැත.

ආ37. එම ඡන්ද අයිතිය ස්ථාවර නොවන විට ආයෝජිතගේ ඡන්ද බලයෙන් බහුතරය ආයෝජක දරුවේ වුවද ආයෝජකහට ආයෝජිත මත බලය නොමැත. උදාහරණ වශයෙන් ආයෝජිතයකුගේ ඡන්ද බලයන් අඩකට වඩා ඇති ආයෝජකයකුගේ අදාළ ක්‍රියාකාරකම් රජයේ, අධිකරණයේ, අද්මිනිස්ත්‍රාත්කරුවෙකුගේ, ඇවරකරුවෙකුගේ හෝ නියාමකයකුගේ මෙහෙයවීමට යටත් වන්නේ නම් බලය තිබිය නොහැකිය.

*බහුතර ඡන්ද අයිතිය නොමැතිවන බලය*

ආ38. ආයෝජකයකුට, ආයෝජිතයකුගේ ඡන්ද අයිතියෙන් බහුතරයකට වඩා අඩුවෙන් දරන්නේ වුවද බලය තිබිය හැකිය. ආයෝජකයකුට ආයෝජිතයකුගේ ඡන්ද අයිතියෙන් බහුතරයකට වඩා අඩුවෙන් දරණ විට බලය තිබිය හැක්කේ උදාහරණ වශයෙන්

(අ) ආයෝජක සහ වෙනත් ඡන්ද දරන්නන් අතර ගිවිසුම් ගත එකගවීමක් (ආ 39 ඡේදය බලන්න)

(ආ) වෙනත් ගිවිසුම්ගත එකගවීම්වලින් පැනනගින එකගවීම් (ආ 39 ඡේදය බලන්න)

(ඇ) ආයෝජකයේ ඡන්ද හිමිකම් (ආ 41 - ආ 45 ඡේද බලන්න)

(ඈ) භව්‍ය ඡන්ද අයිතීන් (ආ 47 - ආ 50 ඡේද බලන්න) හෝ

(ඊ) (අ) - (ආ) දක්වා වූ සංයෝජනයක් හරහාය.

*වෙනත් ඡන්ද දරන්නන් සමග එකඟවීම්*

ආ39. ගිවිසුම් ගත එකඟතාවයක් නොමැති නිසා එයට බලය දීමට ප්‍රමාණවත් ඡන්ද අයිතියක් ආයෝජකට නොමැත්තේ වුවද, ආයෝජකයා සහ වෙනත් ඡන්ද දරන්නන් අතර ගිවිසුම්ගත එකඟතාවයකින් ආයෝජකහට බලයදීටම ප්‍රමාණවත් ඡන්ද අයිතිය ක්‍රියාත්මක කිරීමේ අයිතිය ආයෝජකහට දිය හැකිය.

කෙසේ වෙතත් අදාල ක්‍රියාකාරකම් පිළිබඳව තීරණ ගැනීමට ආයෝජකයකුට හැකියාව ලැබෙනපරිදි ප්‍රමාණවත් අනෙක් ඡන්ද දරන්නන් ඡන්දය දිය යුතු ආකාරය පිළිබඳව ආයෝජකට මෙහෙයවීමට ගිවිසුම් ගත එකඟතා මගින් සහතික විය හැකිය.

*වෙනත් ගිවිසුම් ගත එකඟතා මගින් වන හිමිකම්*

ආ40. ඡන්ද අයිතිය සහ වෙනත් තීරණ ගැනීමේ හිමිකම් හා සංයෝජිතව ආයෝජකයකුහට අදාල ක්‍රියාකාරකම් මෙහෙයවීමට ප්‍රවර්තන හැකියාව ලබාදිය හැකිය උදාහරණ වශයෙන් ගිවිසුම්ගත එකඟතාවය නිශ්චය කර ඇති හිමිකම් ඡන්ද අයිතීන් හා සංයෝජිතවීමෙන් ආයෝජිතයකුගේ නිෂ්පාදන ක්‍රියාවලිය මෙහෙයවීමට ආයෝජකයාට ප්‍රවර්තන හැකියාව දීමට හෝ ආයෝජිතයේ ප්‍රතිලාභවලට සැලකිය යුතු අන්දමින් බලපාන වෙනත් මෙහෙයුම් හෝ මූල්‍යන ක්‍රියාකාරකම් මෙහෙයවීමට ප්‍රමාණවත් විය හැකිය. කෙසේ වුවද වෙනත් හිමිකම් නොමැති වීම මත ආයෝජිතගේ ආර්ථික යැපෙනභාවය, (ප්‍රධාන ගණුදෙනු කරහා සැපයුම් කරුවෙක් අතර ඇති සම්බන්ධතාවය) ආයෝජිතට ඉහළින් ආයෝජකය බලය පවතින බවට මඟපෙන්වීමක් කෙරේ.

*ආයෝජකගේ ඡන්ද අයිතීන්*

ආ41. ඡන්ද අයිතියෙන් බහුතරයට අඩු ඡන්ද අයිතිය හිමි ආයෝජකයකුහට, අදාල ක්‍රියාකාරකම් ඒක පාර්ශ්වවිකව මෙහෙයවීමට ප්‍රායෝගික හැකියාවක් ආයෝජකයකුහට ඇතිවිට බලයදීමට ප්‍රමාණවත් වන හිමිකම් ඇත.

ආ42. ආයෝජකයකුගේ ඡන්ද අයිතීන් එයට බලය දීමට ප්‍රමාණවත් දැයි තක්සේරුකිරීමේදී ආයෝජක පහත දේ ඇතුළුව සියළු කරුණු සහ තත්තවයන් සලකා බලයි.

(අ) පහත දෑ අවධානය කරමින් ඡන්දය දරණ අන් අයගේ ඡන්දය දරණ ප්‍රමාණය හා ව්‍යාප්තියට සාපේක්ෂව ආයෝජකයේ ඡන්ද අයිතිය දරණ ප්‍රමාණය.

(i) ආයෝජකයෙක් දරණ ඡන්ද අයිතිය වැඩි වන විට, අදාල ක්‍රියාකාරකම් මෙහෙයවීමේ ප්‍රවර්තන හැකියාව ලබාදෙන පවත්නා හිමිකම් ආයෝජකට වඩාත් තිබිය හැකිය.

(ii) අනෙක් ඡන්ද දරන්නන්ට සාපේක්ෂව ආයෝජකයෙක් දරණ ඡන්ද අයිතිය වැඩි වන විට, අදාල ක්‍රියාකාරකම් මෙහෙය වීමේ ප්‍රවර්තන හැකියාව ලබාදෙන පවත්නා හිමිකම් ආයෝජකට වඩාත් තිබිය හැකිය.

(iii) ආයෝජකව ඡන්ද බලයෙන් ඉවත් කිරීමට පාර්ශ්ව ගණනාවක් එකට එකතු වී ක්‍රියා කිරීම අවශ්‍ය වූ විට, අදාළ ක්‍රියාකාරකම් මෙහෙයවීමේ ප්‍රවර්තන හැකියාව ලබාදෙන පවත්නා හිමිකම් ආයෝජකට වඩාත් තිබිය හැකිය.

(ආ) ආයෝජක, වෙනත් ඡන්දය දරන්නන්, හෝ වෙනත් පාර්ශ්වයන් දරන විභව්‍ය ඡන්ද අයිතිය (ආ47 - ආ50 ඡේද බලන්න.)

(ඇ) වෙනත් ගිවිසුම්ගත එකඟවීම් වලින් පැන නගින හිමිකම් (අ40 ඡේදය බලන්න) ; සහ

(ඈ) අදාල ක්‍රියාකාරකම් මෙහෙයවීමට තීරණ ක්‍රියාත්මක කළයුතුව තිබූ අවස්ථාවලදී ආයෝජකයාට ප්‍රවර්තන හැකියාව තිබේද හෝ නොතිබේද යන්න අඟවන කලින් කොටස් හිමියන්ගේ රැස්වීමේ ඡන්දය දීමේ රටාව ඇතුළුව යම් අතිරේක කරුණු සහ තත්ත්වයන්,

ආ43. අදාළ ක්‍රියාකාරකම් මෙහෙය වීම නිර්නය කරන්නේ බහුතර ඡන්දයෙන් වනවිට වෙනත් යම් ඡන්දය දරන්නකුගේ හෝ සංවිධානය වූ ඡන්දය දරන සමූහයකට වඩා සැලකිය යුතු ඡන්ද අයිතියක් ආයෝජක දරන විට සහ අනෙක් කොටස් දරන්නන් පුළුල් ලෙස විසිර ඇතිවිට ආ 42 (අ) - (ඈ) ඡේදවල ලැයිස්තුගත කර ඇති කරුණු පමණක් සලකා බැලීමෙන් ආයෝජකයාට ආයෝජිත මත බලය ඇති බව පැහැදිලි විය හැකිය.

**ව්‍යවහාරකරන උදාහරණ**

**උදාහරණ 4**

ආයෝජකයෙක් ආයෝජිතයකුගේ ඡන්ද අයිතියෙන් සියයට 48 ක් අත්කර ගනී. ඉතිරි ඡන්ද අයිතීන් දරනු ලබන්නේ දහස් ගණනක් වන කොටස් හිමියන් වන අතර, කිසිවෙක් තනි තනිව ඡන්ද අයිතියෙන් සියයකට 1කට වඩා නොදරයි. කිසිම කොටස්හිමියෙකුට අන්අයගෙන් කෙනෙක්ගෙන් තොරතුරු විමසා බැලීමට හෝ සාමූහික තීරණ ගැනීමට වැඩ පිළිවෙලක් නොමැත. අත්පත් කර ගැනීමට ඡන්ද අයිතියේ සමානුපාතිකය තක්සේරු කිරීමේදී වෙනත් කොටස් දරන්නන්ගේ සාපේක්ෂ තරමේ පදනම මත සියයට 48 ක හිමිකම එහි පාලනය ලබාගැනීමට ප්‍රමාණවත් වියහැකි බව ආයෝජක නීර්ණය කරයි. මෙම අවස්ථාවේදී එහි දරන නිරපේක්ෂක තරම සහ වෙනත් කොටස් දරන්නන්ගේ සාපේක්ෂ තරම පදනම මත බලය පිළිබඳ වෙනත් සාධක සලකා බැලීමේ අවශ්‍යතාවයකින් තොරව එයට ප්‍රමාණවත් ප්‍රමුඛ ඡන්ද අයිතියේ බලය පිළිබඳ නිර්නායක සපුරාලීමට ඇතිබව ආයෝජක නිගමනය කරයි.

**5 වන උදාහරණය**

ආයෝජිතයකුගේ ඡන්ද අයිතියෙන් සියයට 40 ක් A ආයෝජිත දරන අතර, වෙනත් ආයෝජිතයන් දොළොස් දෙනෙකු එම ආයෝජිතයාගේ කොටස්වලින් සියයට පහක් බැගින් දරයි. A කොටස්හිමි ගිවිසුම මගින් ආයෝජක A හට අදාළ ක්‍රියාකාරකම් මෙහෙයවීමේ සඳහා වගකිවයුතු කළමනාකාරිත්වය පත් කිරීම, ඉවත් කිරීම සහ පාරිශ්‍රමික නියම කිරීමේ හිමිකම දී ඇත. ගිවිසුම වෙනස් කිරීමට තුනෙන් දෙකකට වඩා බහුතර කොටස්හිමියන්ගේ ඡන්දය අවශ්‍ය වේ. මෙම අවස්ථාවේදී ආයෝජක දරන නිරපේක්ෂ තරම සහ වෙනත් කොටස් දැරීමේ සාපේක්ෂ තරම පමණක් ආයෝජකහට එයට බලයදීමට ප්‍රමාණවත් හිමිකමක් තිබේදැයි නිර්ණය කිරීමේදී තීරණාත්මක නොවන බව A නිගමනය කරයි. කෙසේ වෙතත් කළමනාකාරිත්වය පත්කිරීමට ඉවත්කිරීමට පාරිශ්‍රමික නියම කිරීමට හැකි, එහි ගිවිසුගත අයිතිය ආයෝජිත මත එයට බලයඇතිබව නිගමනයකිරීමට ප්‍රමාණවත් බව A නිර්ණය කරයි. මෙහිදී කරුණ වන්නේ ආයෝජක A ඔහුගේ මෙම හිමිකම ක්‍රියාත්මක නොකළා විය හැකි වීම හෝ කළමනාකාරිත්වය තෝරාගැනීමට, පත්කිරීමට, ඉවත් කිරීමට ආයාජක A ගේ හිමිකම ක්‍රියාත්මක කිරීමේ හැකියාව ආයෝජක A හට බලය තිබේදැයි තක්සේරු කිරීමේදී සලකා බැලිය යුතු නැත.

ආ44. වෙනත් තත්වයන්හිදී ඡේද ආ42 (අ) - (ඇ) හි ලැයිස්තු ගතකර ඇති සාධක පමණක් සලකා බැලීමෙන් පසු ආයෝජක හට බලයක් නොමැති බව එයින් පැහැදිලි විය හැකිය.

**ව්‍යවහාරකරණ උදාහරණ**

**6 වන උදාහරණය**

ආයෝජක A ආයෝජිතයකුගේ ඡන්ද අයිතියෙන් සියයට 45 ක් දරයි. තවත් ආයෝජකයන් දෙදෙනෙක් එක් අයෙකු සියයට 26 බැගින් ආයෝජිතගේ ඡන්ද අයිතියදරයි. ඉතිරි ඡන්ද අයිතිය ආයෝජකයන් තිදෙනෙක් එක් අයෙක් සියයට 1 බැගින් දරයි. තීරණ ගැනීමේදී වෙනත් එකගතාවයන් නොමැත. මෙම අවස්ථාවේදී ආයෝජක A ගේ ඡන්ද අයිතිය එහි තරම අනෙක් කොටස දරන්නන්ට සාපේක්ෂව ආයෝජක A හට බලයනොමැති බව නිගමනය කිරීමට ප්‍රමාණවත් වේ. ආයෝජිතගේ අදාළ ක්‍රියාකාරකම් A ආයෝජක මෙහෙයවීම වළක්වාලීමට අවශ්‍ය වන්නේ වෙනත් ආයෝජකවරු දෙදෙනෙකු සහයෝගයෙන් කටයුතු කිරීම පමණි.

ආ45. කෙසේ වෙතත් ඡේද ආ42 (අ) - (ඇ) දක්වා ලැයිස්තුගත කර ඇති සාධක පමණක් තීරණාත්මක විය නොහැකිය. ආයෝජකයෙක් එම සාධක සලකා බැලීමෙන් පසු එයට බලය තිබේද යන්න පැහැදිලි නැත්නම් පසුගිය කොටස් හිමියන්ගේ රැස්වීමේදී අනෙකුත් කොටස්හිමියන්ගේ ඡන්දය දීමේ රටාව විරෝධය නොපාන ස්වභාවයක් ප්‍රදර්ශනය කිරීම වැනි අමතර කරුණු සහ තත්ත්වයන් එය සලකා බැලිය යුතුය. මෙයට ආ18 ඡේදයේ නියමකර ඇති සාධකයන් සහ ආ19 සහ ආ20 නිදර්ශකයන් තක්සේරු කිරීමද ඇතුළත් වේ. ආයෝජක දරන ඡන්ද අයිතිය සුළු නම් සහ ආයෝජක ඡන්ද බලයෙන් ඉවත්කිරීමට අවශ්‍ය වන්නේ පාර්ශ්ව සුලුප්‍රමාණයන් එක්ව ක්‍රියා කිරීමේ අවශ්‍යතාවය නම් එයට බලය දීමට ආයෝජකගේ හිමිකම ප්‍රමාණවත්දැයි තක්සේරු කිරීමට අමතර කරුණු සහ තත්ත්වයන් කෙරෙහි වැඩි විශ්වාසයක් තැබිය යුතුය. ආ18 - ආ20 ඡේදවල කරුණු සහ තත්ත්වයන් ආයෝජකගේ හිමිකම් සමග එකට සලකා බලන විට ආ19 සහ ආ20 ඡේදවල ඇති බලයේ දර්ශකයනට වඩා වැඩි බරතැබීමක් ආ18 ඡේදයේ ඇතිබලයේ සාක්ෂිවලට දිය යුතුය.

**ව්‍යවහාර කරන උදාහරණ**

**7 වන උදාහරණය**

ආයෝජකයෙක් ආයෝජිතයකුගේ ඡන්ද අයිතියෙන් සියයට 45 ක් දරයි. තවත් වෙනත් කොටස් හිමියන් එකොළොස් දෙනෙක් ආයෝජිතයාගේ ඡන්ද අයිතියෙන් සියයට 5 බැගින් දරයි. කිසිම කොටස් හිමියෙකු හට අන්අයගෙන් කිසිම කෙනෙකුගෙන් විමසා බැලීමට හෝ සාමූහික තීරණ ගැනීමට ගිවිසුම්ගත එකඟතා නොමැත. මෙම අවස්ථාවේදී ආයෝජක දරන නිරපේක්ෂ තරම හෝ වෙනත් කොටස්දරන්නන්ගේ සාපේක්ෂ තරම පමණක් ආයෝජිත මත ආයෝජක හට බලයදීමට ප්‍රමාණවත් හිමිකම් තිබේදැයි නිර්ණයකිරීමට තීරණාත්මක නොවේ. ආයෝජකට බලය තිබේද, නොතිබේද යන්න පිළිබඳව සාක්ෂි සැපයිය හැකි අතිරේක කරුණු හෝ තත්ත්වයන් සලකා බැලිය යුතුය.

**8 වන උදාහරණ**

ආයෝජකයෙක් ආයෝජිතයෙකුගේ ඡන්ද අයිතියෙන් සියයට 35 ක් දරයි. තවත් කොටස් හිමියන් තිදෙනෙකු ආයෝජිතගේ ඡන්ද අයිතියෙන් සියයට 5 බැගින් දරයි. ඉතිරි ඡන්ද අයිතිය වෙනත් විවිධ කොටස් හිමියන් දරන අතර, එක් අයෙක්වත් තනිව ඡන්ද අයිතියෙන් සියයට 1 කට වඩා නොදරයි. කිසිම කොටස්හිමියෙක් එකිනෙකා සමග විමසා බැලීමට හෝ සාමූහික තීරණ ගැනීමට එකඟවී නොමැත. ආයෝජිතයේ අදාළ ක්‍රියාකාරකම් පිළිබඳ තීරණ සඳහා අදාළ කොටස් හිමියන්ගේ රැස්වීමේ ප්‍රකාශ කරන ඡන්දවල බහුතරයෙන් අනුමැතිය අවශ්‍ය වේ. මෑතකදී පැවති අදාළ කොටස්හිමියන්ගේ රැස්වීමේදී ඡන්ද අයිතියෙන් සියයට 75 ඡන්දය ප්‍රකාශ කර ඇත. ආයෝජක ඡන්දය ප්‍රකාශ කරන ආකාරය හා සමාන ආකාරයටම වෙනත් කොටස්හිමියන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ඡන්දය භාවිත කිරීමේ හේතුව නිසා ආයෝජක අදාළ ක්‍රියාකාරකම් මෙහෙයවීමට කටයුතු කළාද යන්න නොසලකා මෙම අවස්ථාවේදී මෑතකදී පැවති කොටස් හිමියන්ගේ රැස්වීමේදී අනෙක් කොටස්හිමියන්ගේ ක්‍රියාකාරී සහභාගිත්වයෙන් ඇඟවෙන්නේ අදාළ ක්‍රියාකාරකම් ඒකපාර්ශ්විකව මෙහෙයවීමට ආයෝජක හට ප්‍රායෝගික හැකියාවක් තිබිය හැකි බවය.

ආ46. ආ 42 (අ) - (ඇ) ඡේදයේ ලැයිස්තුගත සාධක සලකා බැලීමේදී ආයෝජකයට බලය තිබෙන බව පැහැදිලි නොවන්නේ නම් ආයෝජක ආයෝජිත පාලනය කරන්නේ නැත.

*භව්‍යඡන්ද අයිතීන්*

ආ47. පාලනය තක්සේරු කිරීමේදී භව්‍ය ඡන්ද අයිතීන්ට බලයක් තිබේදැයිකටයි නිර්ණය කිරීමට ආයෝජිත භව්‍ය ඡන්ද අයිතීන් සහ වෙනත් අය දරන භව්‍යඡන්ද අයිතීන් සලකා බලයි. ඉදිරි ගිවිසුම් ඇතුළත්ව විකල්පයන් සහ පරිවර්ත්‍ය සාධන පත්‍රවලින් පැනනගින ආයෝජිතගේ ඡන්ද අයිතිය ලබාගැනීමේ හිමිකම් භව්‍ය ඡන්ද අයිතීන් වේ. එම භව්‍ය ඡන්ද අයිතීන් සලකාබලනුයේ එම අයිතීන් ස්ථාවර වන්නේ නම් පමණි. (ආ22 - ආ25 ඡේද බලන්න.)

ආ48. භව්‍ය ඡන්ද අයිතීන් සලකාබැලීමේදී ආයෝජකයකු විසින් සාධන පත්‍රයේ සැලැස්ම සහ අරමුණ මෙන්ම ආයෝජක ආයෝජිත සමග ඇති යම් වෙනත් සම්බන්ධතාවයන් ගැන සලකා බැලිය යුතුය. සාධන පත්‍රයේ විවිධ නියමයන් හා කොන්දේසි මෙන්ම ආයෝජකගේ පැහැදිලිව පෙනෙන අපේක්ෂාවන්, චේතනාවන් සහ එම නියමයන් සහ කොන්දේසි වලට එකතුවීමට හේතූන් තක්සේරු කිරීමද මෙයට ඇතුළත් වේ.

ආ49. ආයෝජකට, ආයෝජිතගේ ඡන්ද සහ ක්‍රියාකාරකම් හා අදාළව වෙනත් තීරණ ගැනීමේ හිමිකම් තිබෙනම් එම හිමිකම් භව්‍ය ඡන්ද අයිතීන් සමග සංයෝජිතව ආයෝජිකහට බලය දේ ද යන්න ආයෝජක ඇස්තමේන්තු කරයි.

ආ50. ස්ථාවර ඡන්ද අයිතීන් වලින් පමණක් හෝ වෙනත් හිමිකම් සමග සංයෝජිතව අදාළ ක්‍රියාකාරකම් මෙහෙයවීමට ආයෝජකහට ප්‍රවර්ථන හැකියාවය ලබාදිය හැකිය. උදාහරණ වශයෙන් මේ සම්බන්ධයෙන් වියහැකි සිද්ධියක් වන්නේ ආයෝජක ආයෝජිතගේ ඡන්ද බලයෙන් සියයට 40 ක් දැරීම සහ ආ23 ඡේදය ප්‍රකාරව ඡන්ද අයිතියෙන් තවත් සියයට 20ක් අත්කරගැනීමට හැකි විකල්ප වලින් පැනනගින ස්ථාවර හිමිකම් දැරීමය.

**ව්‍යවහාර කරන උදාහරණ**

**9වන උදාහරණය**

ආයෝජක A ආයෝජිතයකුගේ ඡන්ද අයිතියෙන් සියයට 70 ක් දරයි. ආයෝජක B ආයෝජිතයාගේ ඡන්ද අයිතියෙන් සියයට 30 ක් දරන අතර එමෙන්ම ආයෝජක A ගේ ඡන්ද අයිතියෙන් අඩක් අත්කර ගැනීමට විකල්පයක් දරයි. විකල්පය හි අතිශයින්ම මුදලින් ඉවත පවතින සහ ස්ථාවර මිලකට ඉදිරි වර්ෂ දෙකක කාලය සඳහා ක්‍රියාත්මක කල හැකිය.

(එම වර්ෂ දෙකක කාලය තුළ රැඳී පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.) A සිය ඡන්ද ක්‍රියාත්මක කරමින් සිටින අතර, ක්‍රියාකාරී බලය ආයෝජිතගේ අදාල ක්‍රියාකාරකමින් මෙහෙයවයි. මෙම අවස්ථාවේදී ආයෝජිත A හට අදාළ ක්‍රියාකාරකම් මෙහෙයවීමට ප්‍රවර්තන හැකියාව ඇති බව පෙනෙන නිසා බලය පිළිබඳ නිර්නායක සමහර විට සපුරාලිය හැකිය. ආයෝජක ඊට අතිරේක ඡන්ද අයිතීන් මිලදී ගැනීමට දැනට ක්‍රියාත්මක කළහැකි විකල්පයන් ඇති නමුත් (එය ක්‍රියාත්මක කළහොත් ආයෝජිත හට බහුතර ඡන්දබලය ලබාදිය හැකිය) එම විකල්ප සඳහා ආශ්‍රිත කොන්දේසි සහ නියමයන් විකල්පයන් ස්ථාවර ලෙස සැලකිය හැකිතරම් නොවේ.

| උදාහරණ 10 |
|---|
| ආයෝජක A සහ වෙනත් ආයෝජිකයන් දෙදෙනෙකුට ආයෝජිතගේ ඡන්ද අයිතියෙන් තුනෙන් එක බැගින් දරයි. ආයෝජිතගේ ව්‍යාපාර ක්‍රියාකාරකම් ඉතා සමීපව ආයෝජක A ට සම්බන්ධිත වේ. එහි ස්කන්ධ සාධන පත්‍රවලට අමතරව ආයෝජක A ආයෝජිතගේ සාමාන්‍ය කොටස්වලට ඕනෑම වේලාවක ස්ථිර මිලකට පරිවර්ත්‍ය කලහැකි මුදලින් ඉවත පවතින ණය සාධන පත්‍රද දරයි. (එහෙත් අතිශයින්ම මුදලින් ඉවත පවතින නොමැත). ණය පරිවර්ත්‍ය කරන්නේ නම් ආයෝජක A ආයෝජිතගේ ඡන්ද අයිතියෙන් සියයට 60ක් දරයි. ණයසාධන පත්‍ර සාමාන්‍ය කොටස් වලට පරිවර්තනය කළහොත් ආයෝජිත A සහ ක්‍රියාකාරකම් උපලබ්ධි වීමෙන් වාසි ලබයි. අදාළ ක්‍රියාකාරකම් මෙහෙයවීමට එයට ප්‍රවර්තන හැකියාව ලබාදෙන ස්ථාවර භව්‍ය ඡන්ද අයිතීන් සමග ආයෝජිතගේද ඡන්ද අයිතිය දරන නිසාත් ආයෝජක හට ආයෝජිත මත බලය ඇත. |

**ඡන්ද හෝ වෙනත් අයිතීන්ට ආයෝජිතගේ ප්‍රතිලාභ වලට සැලකිය අන්දමේ බලපෑමක් නොමැතිවිට බලය.**

ආ51. ආයෝජිතයකුගේ අරමුණ සැකසුම තක්සේරු කිරීමේදී (අ5 - අ8 ඡේද බලන්න) එහි සැලසුම් සහ ඇගැයීමේ කොටසක් වන ගනුදෙනු නියමයන්, සහභාගිත්ව ලක්ෂණ ආයෝජකට බලය දීමට ප්‍රමාණවත් හිමිකම් සලසා තිබේදැයි ආයෝජක විසින් ආයෝජිතගේ පටන්ගැන්මේ සිට කරන ලද සහභාගිත්ව සහ ගන්නා ලද තීරණ සලකා බැලිය යුතුය. ආයෝජිතයෙක් සැකසීමට සම්බන්ධ වූ පමණින්ම එය ආයෝජකයකුට පාලනය දීමට ප්‍රමාණවත් නොවේ. කෙසේවෙතත් සැකසුම් කිරීමේ සහභාගිත්වය මගින් ආයෝජක මත බලය දීමට ප්‍රමාණවත් හිමිකම් ලබාගැනීමට ආයෝජක හට අවස්ථාවක් ලැබීම පිළිබඳ ඉඟියක් විය හැකිය.

ආ52. මෙයට අමතරව ආයෝජිතයකුගේ පටන්ගැන්මේදී ස්ථාපිත කරන ලද විකුණුම් හිමිකම්, ගැනුම් හිමිකම් සහ ඈවර කිරීමේ හිමිකම් වැනි ගිවිසුම්ගත එකඟවීම් ආයෝජක සලකාබැලිය යුතුය. මෙම ගිවිසුම්ගත එකඟවීම් ආයෝජකගේ සමීපතම සම්බන්ධිත ක්‍රියාකාරකම්වලට සම්බන්ධව ගත්විට මෙම ක්‍රියාකාරකම් ඒවා ආයෝජිතගේ නීතිමය වපසරි වලින් බාහිරව සිදුවිය හැකි වුවත් හරයක් වශයෙන් ආයෝජිතගේ සමස්ථ ක්‍රියාකාරකම්වල සංකලිත කොටසක් වේ.
එම නිසා ආයෝජිතට සමීපව සම්බන්ධවන ගිවිසුම්ගත එකඟවීම් වල ඇතුළත් ඉතා පැහැදිලි සහ ව්‍යංග තීරණ ගැනීමේ අයිතීන් ආයෝජිතට ඉහලින් ආයෝජනයේ බලය නිර්ණය කිරීමේදී අදාළ ක්‍රියාකාරකම් ලෙස සලකා බැලීම අවශ්‍ය වේ.

ආ53. සමහර ආයෝජිතයනට අදාළ ක්‍රියාකාරකමක් සිදුවන්නේ විශේෂ තත්ත්වයන් පැන නැගුණ විට හෝ සිද්ධියක් සිදුවූවිට පමණි.

එම විශේෂ අවස්ථා පැන නැගුණේ හෝ තත්ත්වයන් හටගැනුනේ නැතොත් මිස සහ පැනනැගීම හා හටගැනීම දක්වා, ඒවායේ ක්‍රියාකාරකම් මෙහෙයවීම සහ ප්‍රතිලාභ කළින් නිර්ණය කෙරෙන අයුරින් ආයෝජිත සැලසුම් කරගත හැකි වන්නේය.

මෙම අවස්ථාවේදී එම තත්ත්වයන් හෝ සිදුවීම් සිදුවනවිට ආයෝජිතගේ ක්‍රියාකාරකම් පිළිබඳව තීරණ පමණක් එහි ප්‍රතිලාභවලට සැලකිය යුතු ලෙස බලපෑ හැකි බැවින් ඒ අනුව අදාළ ක්‍රියාකාරකම්ය. බලය තිබීමට එම තීරණ ගැනීමට හැකියාව ඇති ආයෝජකයකු සඳහා එම තත්ත්වයන්ගේ සිද්ධීන් සිදුවීම අවශ්‍ය නොවේ. තීරණ ගැනීමට ඇති අයිතිය යන කරුණු පැනනගින තත්වයන් වන අසම්භාව්‍යයක් හෝ සිද්ධියක් සිදුවීම මගින් පමණක්ම එම හිමිකම් ආරක්ෂාකාරී හිමිකම් බවට පත් නොවේ.

| ව්‍යවහාර කරණ උදාහරණ |
|---|
| **11 වන උදාහරණය** |
| එහි ප්‍රාරම්භක ලියකියවිලිවල පැහැදිලිව සඳහන් කර ඇති පරිදි ආයෝජිතයකුගේ එකම ව්‍යාපාරික ක්‍රියාකාරකම වනුයේ ලැබියයුතු දෑ මිලට ගැනීම සහ එහි ආයෝජකයනට දින පතා පදනම මත සේවාවන් ලබාදීමයි. දිනපතා පදනම මත සේවා සැපයීමට මුල් මුදල සහ පොලිය ගෙවිය යුතු වූ විට ඒවා රැස් කරගැනීම ඇතුළත් වේ. ලැබියයුතු දෙයක් පැහැර හැරීම මත ආයෝජිත ලැබිය යුතු දෑ ස්වංක්‍රීයව ආයෝජකයකු සහ ආයෝජිතයකු අතර, වෙනම එකඟ වූ පරිදි ගැනුම් ගිවිසුමක වූ ආයෝජකයෙක් වෙත තබයි. එකම අදාළ ක්‍රියාකාරකම වන්නේ, පැහැර හැරීම මතලැබිය යුතු දෑ කළමනාකරණය පමනි, එයට හේතු වන්නේ ආයෝජිතගේ ප්‍රතිලාභ වලට සැලකිය යුතු ලෙස බලපෑම් කළ හැකි එකම ක්‍රියාකාරකම එය වනනිසාය. ලැබිය යුතු දෑ පැහැර හැරීමට පෙර කළමනාකරණය කිරීම අදාළ ක්‍රියාකාරකම් නොවේ. එසේවන්නේ ආයෝජිතගේ ප්‍රතිලාභවලට සැලකිය යුතු ලෙස බලපෑම් ඇතිවිය හැකි ස්ථාවර තීරණ ගැනීමට අවශ්‍ය නොවන නිසාය. පැහැර හැරීම් වලට පෙර ක්‍රියාකාරකම් කලින් නිර්ණය කළ ඒවා වේ. සහ ඒවා ගෙවීමට නියමිත වූවිට මුදල් ප්‍රවාහ එකතු කර ඒවා ආයෝජක හට යැවීමට පමණක් ප්‍රතිඵලය වේ. එබැවින් ආයෝජිතගේ ප්‍රතිලාභ වලට සැලකිය යුතු අන්දමින් බලපාන ආයෝජිතගේ සමස්ථ ක්‍රියාකාරකම් තක්සේරු කිරීමේදී පැහැර හැරීම් මත ආයෝජකගේ වත්කම් කළමනාකරණ හිමිකම් පමණක් සලකා බැලිය යුතුය. මෙම උදාහරණයේදී ආයෝජිත සැකසුම් කිරීම මගින් එවැනි තීරණ ගැනීමේ අධිකාරිය අවශ්‍ය කරන එකම වේලාවේ පමණක් ප්‍රතිලාභවලට සැලකිය යුතු ලෙස බලපාන ක්‍රියාවන් මත ආයෝජකට තීරණ ගැනීමේ හැකියාව ඇති බව සහතික වේ. ගැනුම් ගිවිසුමේ නියමයන් සමස්ථ ගනුදෙනුවලට සහ |

ආයෝජිත ස්ථාපිත කිරීමට සංකලිත වේ. එමනිසා පැහැර හැරීම් මත පමණක් ආයෝජක ලැබියයුතු දෑ වල නීතිමය හිමිකම ගත්තද සහ පැහැර හැරීම් ලැබිය යුතු දෑ ආයෝජිතගේ නීතිමය වපසරියෙන් පිටත වූයේ වුවද ගැනුම් ගිවිසුමෙන්හා ආයෝජිතගේ ආරම්භක ලියකියවිලි වල නියමයන් එක්වගත් කළ ආයෝජිතට ඉහළින් ආයෝජක මත බලය ඇති බව නිගමනය කිරීමට මගපෙන්වයි.

උදාහරණ 12

ආයෝජිතයකුගේ එකම වත්කම වනුයේ ලැබිය යුතු දෑය. ආයෝජිතගේ අරමුණු සහ සැකසුම සලකා බැලීමේදී එකම අදාළ ක්‍රියාකාරකම වන්නේ පැහැරහැරීම් මත ලැබිය යුතු දෑ කළමනාකරණය කිරීම බව නිර්ණයකර ඇත. ඕනෑම ණයට ගන්නෙක් ණය පැහැර ඇත්දැයි සැලකිල්ලට නොගෙන පැහැර හැරී ලැබියයුතු දෑ කළමනාකරණය කිරීමට හැකියාව ඇති පාර්ශ්වය හට ආයෝජිත මත බලය ඇත.

ආ54. සැකසුම්කළ පරිදි ආයෝජිතයකුට මෙහෙයුම් නොකඩවා පවත්වාගෙන යාමට සහතික කිරීමට ආයෝජකයකු හට ඉතා පැහැදිලි හෝ ව්‍යංග බැඳීමක් තිබිය හැකිය. එවැනි බැඳීමක් ආයෝජකගේ ප්‍රතිලාභවල විචල්‍යතාවය මත විවෘතභාවය වැඩි වන අතර, ඒ අනුව එයට බලය දීමට ප්‍රමාණවත් හිමිකම් ආයෝජකට ලබාගැනීමට වන දිරිගැන්වීම වැඩි කරයි. එම නිසා ආයෝජිත සැකසුම්කළ පරිදි මෙහෙයවන බවට සහතික කිරීමේ බැඳීම ආයෝජකට බලය ඇතිබවට ඉඟියක් විය හැකි අතර එහෙත් එමගින් ආයෝජිතට නොදෙන අතර, නොවේ නම් එය වෙනත් පාර්ශ්වයකට බලයතිබීම වළක්වාලනු නොලබයි.

**ආයෝජිතයකුගෙන් විචල්‍ය ප්‍රතිලාභවලට විවෘත වීම හෝ හිමිකම්**

ආ55. ආයෝජිතයකු කෙරෙහි ආයෝජකයකු හට පාලනය තිබේදැයි තක්සේරු කිරීමේදී ආයෝජක, ආයෝජිත සමග වන සම්බන්ධතාවයෙන් විචල්‍ය ප්‍රතිලාභවලට එය විවෘතව හෝ හිමිකමක් තිබේද යන්න ආයෝජක නිර්ණය කරයි.

ආ56. විචල්‍ය ප්‍රතිලාභ යනු ස්ථාවර නොවන ප්‍රතිලාභ වන අතර ආයෝජිතයාගේ කාර්ය සාධනයේ ප්‍රතිඵල අනුව වෙනස් වීමට හැකියාවක් ඇත. විචල්‍ය ප්‍රතිලාභ ධන පමණක් විය හැකිය හෝ ඍණ පමණක් විය හැකිය. සහ ධන හෝ ඍණ යන දෙකම විය හැකිය. (15 වන ඡේදය බලන්න). ආයෝජිතයකුගෙන් ලැබෙන ප්‍රතිලාභ විචල්‍ය ද යයි සහ ප්‍රතිලාභවල නෛතික ස්වභාවය සැලකිල්ලට නොගෙන සහභාගිත්වයේ හරය පදනම මත එම ප්‍රතිලාභකෙසේ විචල්‍ය වන්නේදැයි ආයෝජක තක්සේරු කරයි. උදාහරණ වශයෙන් ආයෝජකයකු හට බැඳුම්කර ස්ථාවර පොලී ගෙවීම් යටතේ රඳවා තබාගත හැකිය.

මෙම SLFRS හි අරමුණ සඳහා ස්ථාවර පොලී ගෙවීම් විචල්‍ය ප්‍රතිලාභ වේ. එසේ වන්නේ ඒවා පැහැර හැරීම් අවදානමට යටත්වන නිසාත් සහ බැඳුම්කර නිකුත් කරන්නාගේ ණය අවදානමට ආයෝජිතයා විවෘත වීමත් නිසාය. විචල්‍යතාවයේ වටිනාකම (එම ප්‍රතිලාභ කෙසේ විචල්‍ය වන්නේද යන්න) රඳා පවත්නේ බැඳුම් කරවල ණය අවදානම මතය. ඒ හා සමානව ආයෝජිතගේ වත්කම් කළමනාකරණය වෙනුවෙන් ස්ථාවර කාර්ය සාධන ගාස්තුත් විචල්‍ය ප්‍රතිලාභයකි. එයට හේතුවන්නේ ඒවා ආයෝජිතගේ කාර්ය සාධන අවදානමට ආයෝජකයා විවෘත වීම නිසාය. විචල්‍යතාවයේ වටිනාකම රඳා පවතින්නේ ගාස්තු ගෙවීමට ප්‍රමාණවත් ආදායම් උත්පාදනය කිරීමට ආයෝජිතගේ හැකියාව මතය.

ආ57. ප්‍රතිලාභවලට ඇතුළත් උදාහරණ

(අ) ලාභාංශ, ආයෝජිතගේ ආර්ථික ප්‍රතිලාභවලින් වන වෙනත් බෙදාහැරීම් (උදා: ආයෝජිත නිකුත් කළ ණය සුරැකුම් වලින් ලැබෙන පොලිය) සහ එම ආයෝජනයේ ආයෝජනය කර ඇති ආයෝජකගේ ආයෝජිතවල වටිනාකමේ වෙනස් වීම්.

(ආ) ආයෝජනයේ වත්කම් හෝ වගකීම් සේවාකරණය සඳහා වන පාරිශ්‍රමික ගාස්තු සහ ණය හෝ ද්‍රවශීල නඩත්තුව සැපයීම සඳහා වන පාඩුවට විවෘතභාවය, ආයෝජිතයෙක් ඈවර කිරීම නිසා ඒ ආයෝජනයේ වත්කම් හෝ වගකීම් වලින් ලැබෙන අවශේෂ හිමිකම, බදු ප්‍රතිලාභ, ආයෝජිත සමග සහභාගිත්වයනිසා ආයෝජකට ද්‍රවශීලතාවය සඳහා අනාගත ප්‍රවේශ වීම්.

(ඇ) අන් හිමිකම් දරන්නන්ට නොමැති ප්‍රතිලාභ උදාහරණ වශයෙන් එහි වත්කම් ආයෝජිතගේ වත්කම් සමග සංයෝජිතව මෙහෙයුම් ක්‍රියාකරවීම, පරිමාණුකූල පිරිමැසුම් ලබාගැනීම සඳහා මෙහෙයුම් සංයෝග කිරීම, පිරිවැය ඉතිරි කිරීම, දුර්ලභ නිෂ්පාදිත ලබාගැනීම, ලියාපදිංචි වෙළඳනාම පිළිබඳ දැනුම සඳහා ප්‍රවේශය ලාභ ගැනීම හෝ ආයෝජකගේ වෙනත් වත්කම්වල වටිනාකම වැඩිකිරීම සඳහා සමහර මෙහෙයුම් හෝ වත්කම් සීමාකිරීම වැනි දේ ආයෝජකහට භාවිතා කළ හැකිය.

**බලය සහ ප්‍රතිලාභ අතර සම්බන්ධතාවය**
**පවරන ලද බලය**

ආ58. තීරණ ගැනීමේ හිමිකම සහිත ආයෝජකගෙන් (තීරණ ගැනීම) එය ආයෝජිතයෙක් පාලනය කරන්නේද යන්න තක්සේරු කිරීමේදී එය ප්‍රධානියාද හෝ නියෝජිතයාද යන්න නිර්ණය කළ යුතුය. නියෝජිතයෙකු යනු වෙනත් පාර්ශ්වයක් හෝ පාර්ශ්වයන් (ප්‍රධානියා/නීන්) වෙනුවෙන් ගේ ඒ අයසඳහා මුලික වශයෙන් ක්‍රියා කිරීමේ නිරත වන පාර්ශ්වයන් නිසා ඔවුන් තීරණ ගැනීමේ අධිකාරිය කිරීමේදී ඒ සඳහා ආයෝජිත හට පාලනයක් නොමැත. (17 සහ 18 ඡේද බලන්න)

ඒ අනුව සමහරවිට ප්‍රධානියාගේ බලය නියෝජිතයා රඳවාගෙන එහෙත් ප්‍රධානියා වෙනුවෙන් ක්‍රියාත්මක කළ හැකිය. සරලව ගත්කළ තීරණ ගන්නා නියෝජිත නොවේ. එසේ වන්නේ වෙනත් පාර්ශ්වයනට එම තීරණ ගැනීමෙන් වාසි වියහැකි බැවිනි.

ආ59. ආයෝජකයෙක් සිය තීරණ ගැනීමේ අධිකාරිය සමහර නිශ්චිත කරුණු සඳහා හෝ අදාළ සියලු ක්‍රියාකාරකම් සඳහා නියෝජිතයකුට පැවරිය හැකිය.

එය ආයෝජිතයෙක් පාලනය කරන්නේද යන්න තක්සේරු කිරීමේදී ආයෝජක නියෝජිත වෙත පැවරූ තීරණ ගැනීමේ හිමිකම් ආයෝජකයා සෘජුව තබාගෙන ඇති ලෙස සලකනු ලැබේ. ප්‍රධානීන් එක්කෙනෙකුට වඩා සිටින අවස්ථාවලදී, සෑම ප්‍රධානියෙකුම ආ5 - ආ54 ඡේදයෙහි අවශ්‍යතාවයන් සලකා බැලීමෙන් එයට ආයෝජිතයාට ඉහළින් බලය තිබේදැයි තක්සේරු කළ යුතුය. තීරණ ගන්නෙක් නියෝජිතයකුද හෝ ප්‍රධානියෙකුද යන්න නිර්ණය කිරීමට අවශ්‍ය උපදේශන ආ60 - ආ72 ඡේදවල සලසයි.

ආ60. එය නියෝජිතයෙකුදැයි නිර්ණය කිරීමේදී විශේෂ වශයෙන් පහත සඳහන් සාධක එයත්, කළමනාකරණය කරනු ලබන ආයෝජිත සහ ආයෝජිත සමග සහභාගී කරගන්නා වෙනත් පාර්ශ්වයනුත් අතර පවත්නා සමස්ථ සම්බන්ධතාත් තීරකයෙකු විසින් සලකා බැලිය යුතු වන්නේය.

(අ) ආයෝජිත මත එහි තීරණ ගැනීමේ අධිකාරියේ විෂය පථය (ආ 62 සහ ආ 63 ඡේදයන්)

(ආ) වෙනත් පාර්ශ්වයන් දරන හිමිකම් (ආ 64 - ආ 67 ඡේදයන්)

(ඇ) පාරිශ්‍රමික ගිවිසුම(ම්) යටතේ එය හිමිකම් ලබන පාරිශ්‍රමික ආ 68 - ආ 7 ඡේදයන්.

(ඈ) එය ආයෝජිතගේ දරන වෙනත් හිමිකම් වලින් වන ප්‍රතිලාභ වල විචල්‍යතාවයට තීරණ ගන්නන්ගේ විවෘතභාවය (ආ 71 සහ 72 ඡේදයන්)

එක් එක් සාධකය සඳහා විශේෂ කරුණු සහ තත්ත්වයන් පදනම මත වෙනස් බර තැබීම් ව්‍යවහාර කළ යුතුය.

ආ61. හේතු නොදන්වා තීරණ ගන්නාව ඉවත් කිරීම (ආ 65 ඡේදය බලන්න). තීරණ ගන්නා ඉවත් කිරීමට (ඉවත් කිරීමේ හිමිකම) තනි පාර්ශ්වයන්ට ස්ථාවර හිමිකම් දරන්නේනැතිනම් මිස තීරණ ගන්නෙක් නියෝජිතයෙකු ද යන්න නිර්ණය කිරීමට ආ60 ඡේදයේ ලැයිස්තුගත කර ඇති සියලු සාධක ඇගයීම අවශ්‍ය වේ.

*තීරණ ගැනීමේ අධිකාරියේ විෂය පථය*

ආ62. තීරණ ගන්නාගේ තීරණ ගැනීමේ අධිකාරියේ විෂය පථය පහත දෑ සලකා බැලීමෙන් අගය කෙරේ.

(අ) නීතියෙන් නියම කරනලද සහ තීරණ ගැනීම් ගිවිසුම(ම්) ප්‍රකාර අනුමත කළ ක්‍රියාකාරකම්.

(ආ) එම ක්‍රියාකාරකම් පිළිබඳ තීරණ ගැනීමේදී තීරණ ගන්නා සතු අභිමතය.

ආ63. ආයෝජිතගේ සැලසුම සහ අරමුණු ගැන ආයෝජිතව සැලසුම්කළ අවදානම විවෘත කළ යුතුය. එය සහභාගිත්වය දක්වූ පාර්ශ්වය අතට යැවීමට සැලසුම් කළ අවදානමට සහ ආයෝජිත සැලසුම් කිරීමේදී තීරණ ගන්නාගේ සහභාගිත්වයේ මට්ටම තීරණ ගන්නෙක් සලකා බැලිය යුතුය. උදාහරණයක් වශයෙන් තීරණ ගන්නෙක් ආයෝජිතව සැලසුම් කිරීමේදී සැලකිය යුතු අන්දමින් සහභාගිත්වය දක්වන්නේ නම් (තීරණගැනීමේ අධිකාරියේ විෂය පථය නිර්ණය කිරීම ඇතුළුව) එම සහභාගිත්වය මගින් තීරණ ගන්නාට අදාළ ක්‍රියාකාරකම් මෙහෙයවීමේ ප්‍රතිඵලයක් වන හිමිකම් සඳහා වාසිදායක තත්ත්වයන් සහ දිරිගැන්වීමක් තීරණ ගන්නාට තිබෙන බව ඉඟි කෙරෙනවා විය හැකිය.

*අනෙක් පාර්ශ්වයන් දරන හිමිකම්*

ආ64. වෙනත් පාර්ශ්වයන් දරන ස්ථාවර හිමිකම් ආයෝජකට, ආයෝජිතගේ අදාළ ක්‍රියාකාරකම් මෙහෙයවීමේ හැකියාවට බලපෑම් ඇතිකළ හැකිය. ස්ථාවර ඉවත්කිරීමේ හෝ වෙනත් හිමිකම් මගින් තීරණ ගන්නා නියෝජිතයෙක් බව ඉඟි කෙරෙනවා විය හැකිය.

ආ65. තනි පාර්ශ්වයකට ස්ථාවර ඉවත්කිරීමේ හිමිකම් සහ හේතු නොදක්වා තීරණ ගත්තෙක් ඉවත් කිරීමේ හැකියාව ඇතිවිට, විසංග මනයෙන් තීරණ ගන්නා නියෝජිතයෙකු වන බව නිගමනය කිරීමට ඒවා ප්‍රමාණවත් වේ. එවැනි හිමිකම් පාර්ශ්ව එකකට වැඩි ගණනක් දරන විට (කිසියම් තනි පාර්ශ්වයකට තීරණ ගන්නා අනෙක් පාර්ශ්වයන්ගේ එකඟතාවය නොමැතිව ඉවත්කිරීමට වෙනුවෙන් හෝ ඒ අයගේ යහපත සඳහා තීරණ ගන්නා බවට මූලිකව ක්‍රියාකරන බව නිර්ණයකිරීටම තීරණාත්මක නොවේ. මෙයට අමතරව තීරණ ගන්නෙක් ඉවත් කිරීමට ඔවුන්ගේ හිමිකම් ක්‍රියාත්මක කිරීමට එකට එක්වකටයුතු කිරීමට අවශ්‍යකරන පාර්ශ්ව වල සංඛ්‍යාවවිශාලවන විට සහ ප්‍රමාණයෙන් සහ තීරණ ගන්නාගේ වෙනත් ආර්ථික වාසි (පාරිශ්‍රමික සහ වෙනත් වාසි) ආශ්‍රිත විචල්‍යතාවය විශාලනම් මෙම කරුණ පිළිබඳව අඩුවෙන් බර තැබීමක් කළ යුතුය.

ආ66. තීරණ ගන්නාගේ අභිමතය සීමාකරන වෙනත් පාර්ශ්ව දරන ස්ථාවර හිමිකම් තීරණගන්නා නියෝජිතයකු ද යන්න ඇගයීමේදී ඉවත් කිරීමේ හිමිකම් පිළිබඳව කටයුතු කරන හා සමාන ආකාරයකින් සැලකිය යුතුය. උදාහරණ වශයෙන් තීරණ ගන්නෙකුට ඔහුගේ ක්‍රියාවන් සඳහා කුඩා සංඛ්‍යාවක වෙනත් පාර්ශ්වයන්ගෙන් අනුමැතිය ලබාගැනීමට අවශ්‍ය නම් සාමාන්‍යයෙන් ඔහු නියෝජිතයෙකු වේ. (හිමිකම් සහ ඒවා ස්ථාවර දැයි සඳහා අමතර උපදේශන සඳහා ඡේද ආ22 - ආ25 බලන්න).

ආ67. වෙනත් පාර්ශ්වයන් දරන හිමිකම් සලකා බැලීමේදී, ආයෝජිතගේ අධ්‍යක්‍ෂ මණ්ඩලය (හෝ වෙනත් පාලක සභාවක්) ක්‍රියාත්මක කළහැකි යම් අයිතීන් තක්සේරුවක් සහ තීරණ ගැනීමේ අධිකාරියට ඒවායින් වන බලපෑම ද ඊට ඇතුළත් කළ යුතුය. (ආ 23(ආ) ඡේදය බලන්න).

**පාරිශ්‍රමික**

ආ68. ආයෝජිතගේ ක්‍රියාකාරකම්වලින් අපේක්ෂිත ප්‍රතිලාභ වලට තීරණ ගන්නාගේ පාරිශ්‍රමික සම්බන්ධතාවයේ ප්‍රමාණය සහ ආශ්‍රිත විචල්‍යතාවය විශාල වනවිට බොහෝදුරට තීරණ ගන්නා ප්‍රධානියෙකු විය හැකිය.

ආ69. එය ප්‍රධානියෙක් හෝ නියෝජිතයෙක් ද යන්න නීරණය කිරීමේදී තීරණ ගන්නා පහත සඳහන් තත්ත්වයන් පවතීද යන්නත් සලකා බැලිය යුතුය.

(අ) සපයන ලද සේවයට අනුපාතික තීරණ ගන්නාගේ පාරිශ්‍රමික ප්‍රමාණවත්ද/ගැළපේද,

(ආ) පාරිශ්‍රමික ගිවිසුම්වල ඇතුළත් වන්නේ නියමයන්, කොන්දේසි හෝ සමාන සේවා සහ නිපුණතා මට්ටම අනුව අතේ දුරින් එකඟ වූ චාරිත්‍රානුකූලව පවත්නා විධිවිධාන අනුව වූ වටිනාකම් පමණි.

ආ70. ආ69 (අ) සහ (ආ) හි නියම කර ඇති කොන්දේසි දක්නට නොමැති නම් තීරණ ගන්නා නියෝජිතයෙක් විය නොහැකිය. කෙසේ වෙතත් එම කොන්දේසි විසංගමනයෙන් සපුරාලීම තීරණගන්නා නියෝජිතයෙක් ලෙස නිගමනය කිරීමට ප්‍රමාණවත් නොවේ.

*වෙනත් හිමිකම් වලින් ප්‍රතිලාභ විචල්‍යතාවයට විවෘත වීම.*

ආ71. ආයෝජිතගේ වෙනත් හිමිකම් දරන තීරණ ගන්නෙක් (උදාඃ ආයෝජිතගේ ආයෝජන හෝ ආයෝජිතගේ කාර්යසාධනය පිළිබඳව ඇප සපයන) එය නියෝජිතයෙක්ද යන්න තක්සේරු කිරීමේදී එම හිමිකම් වලින් වන ප්‍රතිලාභ වල විචල්‍යතාවයේ විවෘතවීම සලකා බැලිය යුතුය. අයෝජිතගේ හිමිකම් දැරීම තීරණ ගන්නා ප්‍රධානියෙකු විය හැකි බව ඉඟි කෙරේ.

ආ72. ආයෝජිතගේ වෙනත් හිමිකම් වලින් වන ප්‍රතිලාභ වල විචල්‍යතාවයේ විවෘතවීම අගයකිරීමේදී තීරණ ගන්නා පහත දැක්වෙන දෑ සැලකිල්ලට ගත යුතුය.

(අ) එහි ආර්ථික වාසිවල ආශ්‍රිත විචල්‍යතාවයේ ප්‍රමාණය විශාල වනවිට සහ පාරිශ්‍රමික සහ වෙනත් හිමිකම් සම්බන්ධයෙන් සමාහාරයක් සලකා බැලීමෙන් බොහෝදුරට තීරණ ගන්නා ප්‍රධානියෙක් විය හැකිය.

(ආ) ප්‍රතිලාභවල විචල්‍යතාවයට වන එහි විවෘතවීම වෙනත් ආයෝජකයනට වඩා වෙනස් ද එසේ නම් මෙය එහි ක්‍රියාවන්ට බලපෑම් සිදුවිය හැකිද? උදාහරණ වශයෙන් මේ සඳහා අවස්ථාවක් වන්නේ තීරණ ගන්නකු ද්විතියික හිමිකම් දැරීම හෝ වෙනත් ස්වභාවයක ණය උද්දීපනයක් ආයෝජිතට ලබාදීමය.

තීරණ ගන්නා එහි විවෘතවීම අගය කළ යුත්තේ ආයෝජිතයාගේ ප්‍රතිලාභ වල මුළු විචල්‍යතාවට සාපේක්ෂවය. මෙම ඇගයීම ප්‍රාථමිකව කරනුයේ ආයෝජකගේ ක්‍රියාකාරකම් වලින් අපේක්ෂිත ප්‍රතිලාභ පදනම මතය. එහෙත් තීරණ ගන්නා දරන අනෙකුත් හිමිකම් හරහා අයෝජිතගේ ප්‍රතිලාභ මත තීරණ ගන්නාගේ විචල්‍යතාවයට වන උපරිම විවෘතවීම නොසලකා හැරිය යුතු නැත.

ව්‍යවහාරකරණ උදාහරණ

13 වන උදාහරණය

තීරණ ගන්නෙක් (අරමුදල් කළමනාකරුවෙක්) ප්‍රසිද්ධියේ අලෙවි වන සහ එහි දේශීය නීති හා රෙගුලාසි මගින් අවශ්‍ය කෙරෙන පරිදි සීමිත ලෙස නිර්වචනය කර නියම කර ඇති පරාමිතියකින් ප්‍රකාරව පැවරුම් බලය දී ඇති විධිමත්ව හසුරුවනු ලබන අරමුදලක් පිහිටුවා අලෙවි කිරීම සහ කළමනාකාරණය කරයි. විවිධාංගීකරනය කරන ලද ප්‍රසිද්ධියේ අලෙවි වන අස්තිත්වයන්හි ස්කන්ධ සුරැකුම් කලඹක් ලෙස අරමුදල ආයෝජකයනට අරමුදලක් ලෙස අලෙවි කරයි. නිර්වචනය කරන ලද පරාමිතියක් තුළ අරමුදල් කළමනාකරුට කුමන වත්කමේ ආයෝජනයකළ යුතුදැයි යන අභිමතය තිබේ. අරමුදල් කළමනාකරු අරමුදලේ සමානුපාතිකව සියයට 10 ක ආයෝජනය කර එහි සේවය සඳහා වෙළඳ පදනම් ගාස්තුවක් වශයෙන් අරමුදලේ ශුද්ධ වත්කම් වටිනාකමක් සියයට එකක් ලබාගනී. සපයනලද සේවාව සඳහා ගාස්තුව ප්‍රමාණවත් වේ. අරමුදල් කළමනාකරු අරමුදලේ ආයෝජනවලින් සියයට 10 ඉක්මවා යන පාඩු සඳහා කිසිම වගකීමක් නොමැත. අරමුදල සඳහා ස්වාධීන අධ්‍යක්‍ෂ මණ්ඩලයන් පිහිටුවා නැති අතර, පිහිටුවීම ද අවශ්‍ය නොවේ. අරමුදල් කළමනාකරුගේ තීරන ගැනීම් අධිකාරියට බලපෑම් කළ හැකි ඕනෑම ස්ථාවර හිමිකමක් ආයෝජකයන් නොදරයි එහෙත් ඔවුන්ගේ හිමිකම් අරමුදල නියම කරන යම් විශේෂ සීමාවන් තුළ නිදහස් කළ හැක. ආයෝජන පැවරුම් බලය නියමකර ඇති පරාමිතියන් තුළ සහ නියාමන අවශ්‍යතාවයන් ප්‍රකාරව මෙහෙයුම් කළඹ, අරමුදලේ අදාළ ක්‍රියාකාරකම් මෙහෙයවීමට ප්‍රවර්තන හැකියාව ලබාදෙන තීරණ ගැනීමේ හිමිකම අරමුදල් කළමනාකරුට ඇත. අරමුදල් කළමනාකරුගේ තීරණ ගැනීමේ අධිකාරියට බලපා හැකි ස්ථාවර හිමිකම් ආයෝජකයන් නොදරයි. අරමුදල් කළමනාකරුට සපයන ලද සේවාවට සහ අරමුදලේ කරන ලද සමානුපාතික ආයෝජනයට සරිලන වෙළඳපොළ පදනම් ගාස්තුවක් ලැබේ.

පාරිශ්‍රමිකය සහ එහි ආයෝජනය අරමුදලේ ක්‍රියාකාරකම් වලින් ලැබෙන ප්‍රතිලාභ විචල්‍යතාවයනට අරමුදල් කලමනාකරු විවෘත කළා වූවද වැදගත්කමක් සහිත විවෘත කිරීමක් ඇතිනොකර අරමුදල් කළමනාකරු ප්‍රධානියෙකු බව පෙන්නුම් කරන්නේය.

මෙම උදාහරණයේදී අරමුදල් කළමනාකරුගේ අරමුදලේ ප්‍රතිලාභ වල විචල්‍යතාවය මත වන විවෘතවීම සීමිත පරාමිතියයක් තුළ තීරණ ගැනීම් අධිකාරිය සමග සැලකීමේදී අරමුදල් කළමනාකරු නියෝජිතයෙක් වන බව ඉඟි කෙරේ. ඒ අනුව අරමුදල් කළමනාකරු අරමුදල පාලනය නොකරන බව නිගමනය කෙරේ.

**උදාහරණ 14**

ආයෝජකයන් ගණනාවකට ආයෝජන ඉඩ ප්‍රස්ථා සලසන අරමුදලක් තීරණ ගන්නෙක් ස්ථාපනය කර අලෙවිකරණය කර කළමනාකරණය කරයි. තීරණ ගන්නා (අරමුදල් කළමනාකරු) අරමුදලේ පාලක ගිවිසුම අනුව සියලුම ආයෝජකයන්ගේ වඩාත් වාසි සහගත යහපත සඳහා තීරණ ගත යුතුය. එනමුදු අරමුදල් කළමනාකරුට පුළුල් තීරණ ගැනීමේ අභිමතයක් ඇත. එහි සේවා සඳහා අරමුදලේ කළමනාකරණයට යටත් වත්කම් වලින් සියයකට එකක ගාස්තුවක් සහ නිශ්චය කරනලද ලාභ මට්ටමක් ළඟා කරගතහොත් අරමුදලේ මුළු ලාභයෙන් 20% ක් අරමුදල් කළමනාකරුට ලැබේ. ගාස්තු සපයන ලද සේවාවන් සඳහා ප්‍රමාණයෙන් සහ තත්ත්වයෙන් අනුරූප වේ. එය සියලු ආයෝජකයනට වඩාත් වාසිදායක වන තීරණ ගන්නා වුවත්, අරමුදලේ අදාළ ක්‍රියාකාරකම් මෙහෙයවීමට අරමුදල් කළමනාකරු හට පෘතුල තීරණ ගැනීමේ අධිකාරියක් ඇත. අරමුදල් කළමනාකරු හට ස්ථාවර සහ කාර්යසාධනය හා සම්බන්ධ සපයන ලබනු සේවාව පිළිබඳව ප්‍රමාණයෙන් සහ අනුපාතයෙන් අනුරූප ගාස්තුවක් ගෙවනු ලැබේ. මීට අතිරේකව පාරිශ්‍රමිකය ඒකලන තත්ත්වයෙන් සලකා බලන කල්හි අරමුදල් කළමනාකරු ප්‍රධානියෙකු ලෙස පෙන්වන හෙයින්, අරමුදලේ වටිනාකම වැඩිකිරීමට අරමුදල් කළමනාකරණයේ ඇල්ම සහ පාරිශ්‍රමිකයඑකට බැඳීම සිදුවන අතර අරමුදලේ ක්‍රියාකාරකම් වලින් ලැබෙන ප්‍රතිලාභ විචල්‍යතාවයන්ට විවෘත කිරීමෙන් තොරවීම ද ඒ හා වැදගත් වන්නේය.

මීට අතිරේකව පාරිශ්‍රමිකය ඒකලන තත්ත්වයෙන් සලකා බලන කල්හි අරමුදල් කළමනාකරු ප්‍රධානියෙකු ලෙස පෙන්වන හෙයින්, අරමුදලේ වටිනාකම වැඩිකිරීමට අරමුදල් කළමනාකරුගේ ඇල්ම හා පාරිශ්‍රමිකය එකට බැඳීම සිදුවන අතර, අරමුදලේ ක්‍රියාකාරකම් වලින් ලැබෙන ප්‍රතිලාභ විචල්‍යතාවයන්ට විවෘත කිරීමෙන් තොරවීම ද ඒ හා වැදගත් වන්නේය.

ඉහත සඳහන් කරුණු රටාව සහ විශ්ලේෂණය පහත විස්තර කෙරෙන උදාහරණ 14අ - 14 ඇ දක්වා ව්‍යවහාර වේ. සෑම උදාහරණයක්ම විසංගමනයෙන් සලකා බැලේ.

**උදාහරණ 14අ**

අරමුදල් කළමනාකරුහට ද අරමුදලේ සියයට 2ක ආයෝජනයක් ඇති අතර එය අනෙක් ආයෝජකයන්ගේ හිමිකම හා එකට බැඳේ. එහි ආයෝජනය කළ සියයට 2කට වඩා වන අරමුදලේ හානියක් වුවහොත් ඒ සඳහා කිසිම වගකීමක් අරමුදලේ කළමනාකරුට නැත. ආයෝජකයන්ට ගිවිසුම් කඩ කිරීම මත පමණක් ආයෝජන කළමනාකරුව සරල බහුතරයෙන් ඉවත් කළ හැකිය. අරමුදල් කළමනාකරුගේ සියයට 2ක ආයෝජනය අරමුදල් කළමනාකරු ප්‍රධානියා ලෙස ඉඟි කෙරෙන එතරම් වැදගත්කමක් නොමැති විවෘතවීමක් ඇති නොකර අරමුදලේ ක්‍රියාකාරකම් වලින් වන ප්‍රතිලාභ වල විචල්‍යතාවයේ විවෘතවීම වැඩි කරයි. අරමුදල් කළමනාකරු ඉවත් කිරීමට අනෙකුත් ආයෝජකයන්ගේ හිමිකම ආරක්ෂාකාරී හිමිකමක් ලෙස සැලකේ. එයට හේතුවන්නේ එය ක්‍රියාත්මක කළහැකි වන්නේ ගිවිසුම් කඩ කිරීමකදී පමණක් නිසාය. මෙම උදාහරණයේ අරමුදල් කළමනාකරුට හට තීරණ ගැනීමේ පෘතුල අධිකාරියක් සහ එහි හිමිකම් සහ පාරිශ්‍රමික මගින් වන ප්‍රතිලාභවලට විචල්‍යතාවයට විවෘත වුවද අරමුදල් කළමනාකරුගේ විවෘතවීම නියෝජිතයෙකු ලෙස ඉඟියක් කෙරේ. ඒ අනුව අරමුදල අරමුදල් කළමනාකරු එය පාලනය නොකරන බව නිගමනය කරයි.

**14 ආ උදාහරණය**

අරමුදල් කළමනාකරුට අරමුදලේ සැලකිය යුතු අන්දමේ බොහෝ සමානුපාතික ආයෝජන ඇති අතර එම ආයෝජන අභිබවා අරමුදලේ සිදුවන පාඩුවලට ඔහු හට වගකීමක් නොමැත. ගිවිසුම් කඩ කිරීමකදී පමණක් ආයෝජකයනට අරමුදල් කළමනාකරුව සරල බහුතර ඡන්දයෙන් ඉවත් කළ හැකිය.

මෙම උදාහරණයේදී අනෙකුත් ආයෝජකයන්ට ආයෝජන කළමනාකරු ඉවත් කිරීමේ හිමිකම ආරක්ෂාකාරී හිමිකමක් ලෙස සැලකේ. එසේ වන්නේ ඒවා ක්‍රියාත්මක කළ හැකි වන්නේ ගිවිසුම් කඩ කිරීමකදී පමණක් වීම නිසාය. සපයනලද සේවාවට ප්‍රමාණයෙන් සහ අනුපාතිකයෙන් අනුරූපී වෙළඳපළ පදනම් ස්ථාවර සහ කාර්යසාධනය මත ගාස්තුවක් අරමුදල් කළමනාකරුට ගෙවුවේ වුවද අරමුදල කළමනාකරුගේ පාරිශ්‍රමික සහ ආයෝජන සංයෝජනය එකට ගත්විට අරමුදලේ ක්‍රියාකාරකම් වලින් වන විචල්‍යතාවයක් ඇතිවිය හැකි විවෘතවීම එය එවැනි වැදගත් නිසා එමගින් ඇඟවෙන්නේ අරමුදල් කළමනාකරු ප්‍රධානියා ලෙසය. අරමුදල් කළමනාකරුගේ ආර්ථික වාසිවල ආශ්‍රිත විචල්‍යතාවයේ ප්‍රමාණය විශාල වනවිට (පාරිශ්‍රමික සහ වෙනත් හිමිකම් සමාහාරයක් ලෙස සලකා බැලීමෙන්) එහි විශ්ලේෂණයේදී අරමුදල් කළමනාකරු වඩා අවධාරණය තැබිය යුත්තේ එම ආර්ථික වාසිවල සහ බොහෝදුරට අරමුදල් කළමනාකරු ප්‍රධානියකු ලෙසය.

උදාහරණ වශයෙන් එහි පාරිශ්‍රමික සහ වෙනත් සාධක සලකා බැලීමෙන් සියයට 20 ක ආයෝජනය එය අරමුදල පාලනයකරන බව නිගමනය කිරීමට ප්‍රමාණවත් විය හැකි බව අරමුදල් කළමනාකරු සලකා බැලිය හැකිය. කෙසේ වෙතත් වෙනස් තත්ත්වයන්හිදී (උදා: පාරිශ්‍රමික හෝ වෙනත් සාධක වෙනස් නම්) ආයෝජන මට්ටම වෙනස් වන විට පාලනය පැනනැගිය හැකිය.

**14 ඇ උදාහරණය**

අරමුදල් කළමනාකරුට සමානුපාතික පදනමක් මත සියයට 20 ක් ආයෝජනය අරමුදලේ ඇත. එහෙත් එහි ආයෝජනවලින් සියයට 20 ඉක්මවා වනපාඩු සඳහා ඔහුහට කිසිම වගකීමක් නොමැත. අරමුදලට අධ්‍යක්ෂ මණ්ඩලයක් ඇති අතර, එහි සියලුම සාමාජිකයන් අරමුදල් කළමනාකරුගෙන් ස්වාධීන වන අතර, ඔවුන් පත් කරනුයේ වෙනත් ආයෝජකයන්ය. වාර්ෂිකව අධ්‍යක්ෂ මණ්ඩලය අරමුදල් කළමනාකරු පත්කරයි. ආයෝජන කළමනාකරුගේ ගිවිසුම අලුත් නොකිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණ කළහොත් ආයෝජන කළමනාකරු ඉටුකරන සේවාවන් කර්මාන්තයේ සිටින වෙනත් කළමනාකරුවන් ලවා ඉටුකර ගනු ලැබේ. ආයෝජන කළමනාකරු සපයන සේවාව සඳහා ස්ථාවර සහ කාර්ය සාධනයට සම්බන්ධ ප්‍රමාණයෙන් හා අනුපාතික අනුරූපී ගාස්තුවක් ගෙවූවද, ආයෝජන කළමනාකරුගේ සියයට 20 ක ආයෝජනය සහ එහි පාරිශ්‍රමික එකට ගත්කළ අරමුදලේ ක්‍රියාකාරකම් වලින් වන ප්‍රතිලාභයේ විචල්‍යතාවයේ විවෘතවීම ඇතිකරන එවැනි වැදගත් එයින් ඇඟවෙන්නේ අරමුදල් කළමනාකරු ප්‍රධානියා ලෙසය. කෙසේ වෙතත් ආයෝජකවරුන් අරමුදල් කළමනාකරු ඉවත් කිරීමට ස්ථාවර හිමිකම් තිබේ. ආයෝජකවරු එසේ කිරීමට තීරණය කළහොත් ආයෝජකවරුන්ට අරමුදල් කළමනාකරු ඉවත් කිරීමට සුදුසු යාන්ත්‍රණයක් සැපයීම අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරයි. මෙම උදාහරණයේදී අරමුදල් කළමනාකරු විශාල අවධාරණය ස්ථාවර ඉවත්කිරීමේ හිමිකම් විශ්ලේෂණයේදී දක්වයි. ඒ අනුව අරමුදල් කළමනාකරු හට පෘථුල තීරණ ගැනීමේ අධිකාරියක් තිබුණ සහ එහි පාරිශ්‍රමික සහ ආයෝජන නිසා අරමුදලේ ආයෝජන වල විචල්‍යතාවය විවෘත වූයේ වුවද, වෙනත් අයෝජකයන් හැර ස්ථාවර හිමිකම් මගින් අරමුදල කළමනාකරු නියෝජිතයෙකු ලෙස ඉඟි කෙරේ. ඒ අනුව අරමුදල් කළමනාකරු අරමුදල පාලනය නොකරන බව නිගමනය කරයි.

**15 වන උදාහරණය**

ස්ථාවර අනුපාතික ණය සාධන පත්‍ර සහ ස්කන්ධ සාධන පත්‍ර වලින් මූල්‍යනය කරන ලද ස්ථාවර අනුපාතික වත්කම් වලින් ආරක්ෂිත සුරැකුම් කළඹක් මිලදී ගැනීමට ආයෝජිතයෙක් ඇති කරයි. ස්කන්ධ සාධන පත්‍ර සැලසුම් කර ඇත්තේ මුලින්ම ණය ආයෝජකයන් ණය ආරක්ෂණයට සහ ආයෝජිතගේ යම් අවශේෂ ප්‍රතිලාභයක් ලැබීමටය. කළඹේ ඇති වත්කම් සුරැකුම්පත් නිකුත් කරන්නාගේ සිදුවිය හැකි ආශ්‍රිත ණය අවදානම් විවෘතවීම සහිත වත්කම් වලින් ආරක්ෂිත සුරැකුම් කළඹේ ආයෝජනයක් ලෙස සහ කළඹ කළමනාකරණය කිරීමේ ආශ්‍රිත පොලී අවදානම් අවදානම සහිතව ගනුදෙනුව අනාගත ණය ආයෝජකයනට අලෙවි කිරීම, පිහිටුවීම මත ස්කන්ධ සාධන පත්‍ර මිලදී ගත් වත්කම් වල වටිනාකමෙන් සියයට 10 ක් නියෝජනය කරයි. තීරණ ගන්නෙක් (වත්කම් කළමනාකරු) ක්‍රියාකාරී වත්කම් කළඹ ආරාධිතයන්ගේ සංස්ථා ප්‍රකාශයේ නියම කර ඇති පරාමිතියන් තුළ ආයෝජන තීරණ ගෙන කළමනාකරණය කරයි. එම සේවා සඳහා ආයෝජන කළමනාකරුට වෙළඳපළ පදනම් ස්ථාවර ගාස්තුවක් (උදා: කළමනාකරණයට යටත් වත්කම් වලින් සියයට 1ක්) සහ කාර්ය සාධනයට අදාළ ගාස්තුවක් (ලාභ වලින් සියයට 10 ක්) ආයෝජිතගේ ලාභ නිශ්චය කරන ලද මට්ටමක් ඉක්මවන්නේ නම් ලැබෙයි. සපයන ලද සේවා සඳහා ගාස්තු ප්‍රමාණයෙන් සහ අනුපාතිකව අනුරූපී වේ. ආයෝජිතගේ ස්කන්ධ ආයෝජන වලින් සියයට 35 ක් වත්කම් කළමනාකරු දරයි. ස්කන්ධයෙන් ඉතිරි සියයට 65 සහ සියලු ණය සාධන පත්‍ර පුළුල් ව පැතිරුණු විශාල සංඛ්‍යාව සම්බන්ධයක් ඇති තුන්වන පාර්ශ්වයක ආයෝජකයෝ දරයි. වත්කම් කළමනාකරුට හේතුවක් නොදක්වා වෙනත් ආයෝජකයන් සරල බහුතර තීරණයකින් ඉවත් කළ හැකිය.

වත්කම් කළමනාකරුට ස්ථාවර සහ කාර්යසාධන සම්බන්ධිත ප්‍රමාණයෙන් සහ අනුපාතිකයෙන් අනුරූපී ගාස්තු ගෙවනු ලැබේ. අනෙක් ආයෝජකයන් හා සමග අරමුදලේ වටිනාකම වැඩි කිරීමේ උනන්දුව අරමුදල් කළමනාකරුගේ පාරිශ්‍රමිකය මගින් එකට බැඳේ. එය ස්කන්ධයෙන් සියයට 35 ක් දැරීම සහ එයින් ලැබෙන පාරිශ්‍රමික නිසා අරමුදලේ ක්‍රියාකාරකම්වලින් වන ප්‍රතිලාභ වල විචල්‍යතාවයේ විවෘතවීම වත්කම් කළමනාකරුට තිබේ.

ආයෝජිතගේ සංස්ථා ප්‍රකාශයේ නියමකර ඇති පරාමිතියන් තුළ මෙහෙයවීම් සිදුකළේ වූයේ වුවද ආයෝජිතගේ ප්‍රතිලාභ වලට සැලකිය යුතු ලෙස බලපෑ හැකි ආයෝජන තීරණ ගැනීමේ ප්‍රවර්තන හැකියාව වත්කම් කළමනාකරුට ඇත. අනෙක් ආයෝජකයන් දරණ ඉවත් කිරීමේ හිමිකම පුළුල් ලෙස පැතිරුණු විශාල සංඛ්‍යාවක ආයෝජකයන් දරනනිසා විශ්ලේෂණයේදී එට ලැබෙන්නේ කුඩා බර තැබීමකි. ණය සාධන පත්‍රවලට ද්විතීයනය කර ඇති ස්කන්ධය හිමිකරුවන් අරමුදලට ලැබෙන ප්‍රතිලාභවල විචල්‍යතාවයේ විවෘතවීම වත්කම් කලමණාකරු වඩා අවධානයෙන් තබයි. ස්කන්ධයෙන් සියයට 35 දරීම පාඩුවලට ද්විතීයනය විවෘත වීම සහ ආයෝජිතගේ ප්‍රතිලාභ හිමිකම්ඇති කරනු එවැනි වැදගත්කම අනුව වත්කම් කළමනාකරු ප්‍රධානියෙකු ලෙස ඇඟ වේ. ඒ අනුව වත්කම් කළමනාකරු ආයෝජිතයාට පාලනය කරන බව නිගමනය කෙරේ.

**උදාහරණ 16**

අනුග්‍රාහකයකු සම්බන්ධයක් නොමැති තුන්වන පාර්ශ්වයේ ආයෝජකයන්ට කෙටිකාලීන ණය සාධන පත්‍රයක් නිකුත් කරන බහුවිධ අලෙවි නාලිකාවකට අනුග්‍රාහකත්වය දරයි.

මෙම ගනුදෙනුව, කළඹේ නිකුත්කරුගෙන් වියහැකි ණය පැහැර හැරීම් අවදානමට අවම විවෘත කිරීම සහිත ඉතා ඉහළ ඇගයීමක් ඇති මධ්‍යකාලීන වත්කම් කළඹක ආයෝජනයක් ලෙස අනාගත ආයෝජකයනට අලෙවි කෙරේ. සෑම පවරන්නෙක්ම එය නාලිකාවට විකුණනු ලබන වත්කම් කළඹට සේවා සපයන අතර වෙළඳපොළ පදනම් සේවා ගාස්තුවකට ලැබිය යුතුදෑ පැහැර හැරීම් කළමනාකරණය කරයි. සෑම ණය පවරන්නෙක්ම නාලිකාවට පවරන ලද වත්කම් අධි අතිරේක ඇපකරණය මගින් එහි වත්කම් කළඹේ ණයහානිවලට එරෙහි ප්‍රථම අලාභ ආරක්ෂණය සලසයි. අනුග්‍රාහකයා නාලිකාවේ නියමයන් ස්ථාපනය කරන අතර වෙළඳපොළ පදනම් ගාස්තුවකට නාලිකාවේ මෙහෙයුම් පාලනය කරයි. ගාස්තුව සපයන ලබන සේවාවට ප්‍රමාණයෙන් අනුපාතිකව අනුරූපී වේ. නාලිකාවට විකුණුම් කිරීමට අවසර ඇති විකුණුම් කරුවන්, නාලිකාව මිලදීගත යුතු වත්කම් සහ නාලිකාවේ අරමුදල් පිළිබඳ තීරණයන් අනුග්‍රාහක අනුමත කරයි. අනුග්‍රාහක ආයෝජකයන්ගේ වඩාහොඳ යහපත සඳහා ක්‍රියා කළ යුතුය.

අනුග්‍රාහක නාලිකාවේ යම් අවශේෂ ප්‍රතිලාභයකට හිමිකම් කියන අතර, ඔහු නාලිකාවට ණය උද්දීපනයන් සහ ද්‍රවශීලතා පහසුකම් ද සපයයි. පවරන්නන් විසින් අලාභ අවශෝෂණය කරගත් පසු, අනුග්‍රාහක සපයනු ලබන ණය උද්දීපනයන් මගින් නාලිකාවේ සියලු වත්කම් වලින් සියයට 5ක් දක්වා අලාභ අවශෝෂණය කරගනු ලැබේ. ද්‍රවශීල පහසුකම් පැහැර හරින ලද වත්කම් වලට එරෙහිව අත්තිකාරම් නොවේ. අනුග්‍රාහකගේ තීරණ ගැනීමේ අධිකාරියට බලපෑහැකි ස්ථාවර හිමිකම් ආයෝජකයන් නොදරයි. අනුග්‍රාහකට එහි සේවාවන් සඳහා වෙළඳපොළ පදනම් ගාස්තුවක් සහ සපයනලද සේවාවට ප්‍රමාණයෙන් අනුරූපී ගාස්තුවක් ගෙවූයේ වුවද, නාලිකාවේ යම් අවශේෂ ප්‍රතිලාභ වලට එහි හිමිකම් සහ ණය උද්දීපණ සහ ද්‍රවශීලතා පහසුකම් සැපයීම නිසා (මධ්‍යකාලීන වත්කම් සඳහා අවශ්‍ය අරමුදල් කෙටිකාලීන ණයසාධන පත්‍ර මගින් මූල්‍යනය කිරීමට භාවිත කිරීම නිසා නාලිකාව ද්‍රවශීලතා අවදානමට විවෘත වේ.) අනුග්‍රාහකයා හට නාලිකාවේ ක්‍රියාකාරකම් වලින් වන ප්‍රතිලාභ වලට විචල්‍යතාවයට විවෘතවීමක් තිබේ. සෑම පවරන්නෙකුටම නාලිකාවේ වත්කම් වලට බලපාන තීරණ ගැනීමේ හිමිකම තිබුනේ වූයේ වුවද, අනුග්‍රාහකට නාලිකාවේ ප්‍රතිලාභවලට වඩාත් සැලකිය යුතු අන්දමින් බලපාන ක්‍රියාකාරකම් මෙහෙයවීමේ පෘථුල ප්‍රවර්තන හැකියාව තිබේ. උදා: අනුග්‍රාහක නාලිකාවේ නියමයන් ස්ථාපනය කිරීම වත්කම් පිළිබඳ තීරණ (මිලදී ගත් සහ පවරන ලද වත්කම් අනුමත කිරීම) සහ නාලිකාව අරමුදල්කරණය කිරීමේ අයිතිය ඇත. (නව ආයෝජන නිතිපතා පදනම මත සොයාගැනීම සඳහා). නාලිකාවේ අවශේෂ ප්‍රතිලාභ සඳහා හිමිකම් සහ ණය උද්දීපනය සහ ද්‍රවශීලතා පහසුකම් ප්‍රතිපාදන පහසුකම් අත් ආයෝජකයන්ගෙන් වෙනස්වන නාලිකාවේ ක්‍රියාකාරකම් වලින් වන ප්‍රතිලාභ විචල්‍යතාවයට අනුග්‍රාහක විවෘත වේ. ඒ අනුව එම විවෘතවීම අනුග්‍රාහකයා ප්‍රධානියා වන බව ඉඟි කෙරෙන අතර, ඒ අනුව අනුග්‍රාහකයා නාලිකාව පාලනය කරන බව නිගමනය කරයි. සියලු ආයෝජකයන්ගේ පොදු යහපත සඳහා අනුග්‍රාහකයා ක්‍රියාකිරීමේ වගකීම මත අනුග්‍රාහක ප්‍රධානියා වළක්වා වනු නොලබයි.

**අනෙක් පාර්ශ්වයන් සමග සබඳතා**

ආ73. පාලනය තක්සේරු කිරීමේදී ආයෝජකයෙක් විසින් අනෙක් පාර්ශ්ව සමග ඇති සම්බන්ධතාවයේ ස්වභාවය සහ එම පාර්ශ්ව ආයෝජක වෙනුවෙන් ක්‍රියාකරනවාදැයි සලකා බැලිය යුතුය. (උදා: ඒ අය "ඇත්ත වශයෙන්ම නියෝජිතවරුද?"). අනෙක් පාර්ශ්වය ඇත්ත වශයෙන් නියෝජිතවරුන් ලෙස ක්‍රියාකරන්නේද යන්න නිර්ණය කිරීමට විචාර බුද්ධිය මෙන්ම සම්බන්ධතාවයේ ස්වභාවය පමණක් නොව එම පාර්ශ්ව එකිනෙකා සමග මෙන්ම ආයෝජන සමග කෙසේ අනෝන්‍ය වශයෙන් ක්‍රියාකරන්නේද යන්නත් සලකා බැලීම අවශ්‍ය වේ.

ආ74. එවැනි සබඳතාවයකට ගිවිසුම්ගත එකඟවීමක් සම්බන්ධ කරගැනීමත් සිදුනොවේ. ආයෝජක වෙනුවෙන් ක්‍රියාකිරීමට එම පාර්ශ්වය මෙහෙයවීමට හැකියාව ආයෝජිතයකුට ඇතිවිට හෝ ආයෝජකගේ ක්‍රියාකාරකම් මෙහෙයවීමට හැකියාව තිබෙන විට එම පාර්ශ්වය ඇත්ත වශයෙන්ම නියෝජිතයෙක් වේ. මෙවැනි තත්ත්වයන්හිදී ආයෝජිත විසින් ඇත්ත වශයෙන්ම වන නියෝජිතයේ තීරණ ගැනීමේ හිමිකම් සහ එහි වක්‍ර විවෘතවීම හෝ හිමිකම් ආයෝජිතගේ එහිම වන පාලන ඇත්ත වශයෙන්ම වන නියෝජිත හරහා වන විචල්‍ය ප්‍රතිලාභ එක්ව ගෙන තක්සේරු කිරීම ආයෝජිත සලකා බැලිය යුතුය.

ආ75. ඒ අයගේ සම්බන්ධතාවයේ ස්වභාවය අනුව ආයෝජකයා සඳහා ඇත්ත වශයෙන්ම නියෝජිතවරු ලෙස ක්‍රියාකළ හැකි එවැනි වෙනත් පාර්ශ්වයන් සඳහා උදාහරණ පහත දැක්වේ.

(අ) ආයෝජකයාගේ සම්බන්ධිත පාර්ශ්ව.

(ආ) ආයෝජිතයාගේ එහි හිමිකම ආයෝජකයාගේ දායකත්වයක් හෝ ණයක් වශයෙන් ලැබුණ පාර්ශ්වයන්.

(ඇ) ආයෝජිතයකුගේ එහි හිමිකම ආයෝජිතයාගේ පූර්ව අනුමැතිය නොමැතිව විකිණීමට, පැවරීමට හෝ ණය බරක් හැමවිටම එකඟ නොවන පාර්ශ්වය (ආයෝජකයෙක් සහ වෙනත් පාර්ශ්වවල පූර්ව අනුමැති හිමිකම ඇතිවිට සහ කැමති ස්වාධීන පාර්ශ්වවල අන්‍යොන්‍ය වශයෙන් එකඟ වූ නියමයන් පදනම් වන අවස්ථාවන් හැර)

(ඈ) ආයෝජකගේ ද්විතීයනය මූල්‍ය සහාය නොමැතිව සිය මෙහෙයුම් මූල්‍යනය කළ නොහැකි පාර්ශ්වයන්.

(ඉ) ආයෝජිතයකුගේ එහි පාලක මණ්ඩලයේ සාමාජිකයන් හෝ කළමනාකාරිත්වයේ ප්‍රධාන සේවක පිරිස්වල බහුතරය ආයෝජකගේම එම තනතුරු දරණ අය වීම.

(ඊ) වෘත්තිය සේවා සපයන්නෙක් සහ එහි වැදගත් සේවාදායකයකු අතර වැනි සම්බන්ධතාවයක් ඇති ආයෝජක සමග සමීප ව්‍යාපාර සම්බන්ධතාවයක් ඇති පාර්ශ්වයන්.

**විශේෂිත වත්කම්වල පාලනය**

ආ76. ආයෝජිතගේ කොටසක් වෙන්වූ ලෙස සැලකිය හැකි අස්තිත්වයන් ලෙස ආයෝජක සලකන්නේද යන්න සහ එය එසේ නම් වෙන්වූ ලෙස සැලකිය හැකි අස්තිත්වය එය පාලනය කරන්නේද යන්නත් සලකා බැලිය යුතුය.

ආ77. ආයෝජකයෙක්, ආයෝජිතයෙකුගේ කොටසක් වෙන්වූ ලෙස සැලකිය හැකි අස්තිත්වයන් ලෙස සැලකිය හැක්කේ පහත සඳහන් කොන්දේසි පමණක් සපුරාලන්නේ නම් පමණි.

ආයෝජකගේ නිශ්චය කරනලද වගකීම් හෝ නිශ්චය කරනලද වෙනත් හිමිකම් සඳහා ගෙවන එකම මූලාශ්‍රයවන්නේ ආයෝජිතයාගේ නිශ්චිත වත්කමය (යම් සම්බන්ධිත ණය උද්දීපනයන් ඇත්නම්) නිශ්චය කරනලද වගකීමක් ඇති පාර්ශ්වයනට හැර, අන්අයට එම වත්කම්වලින් වන අවශේෂ මුදල් ප්‍රවාහ වලට හෝ නිශ්චය කරන ලද වත්කම් වලට සම්බන්ධිත හිමිකම් හෝ වගකීම් නොතිබේ. හරයක් වශයෙන් නිශ්චිත වත්කම්වලින් වන ප්‍රතිලාභ කිසිවක් ඉතිරිව ඇති ආයෝජිතයනට භාවිත කළ නොහැකි අතර වෙන් වූ ලෙස සැලකිය හැකි අස්තිත්වයේ වගකීම් කිසිවක් ඉතිරිවන ආයෝජිතයන්ගේ වත්කම් වලින් ගෙවිය නොහැක. ඒ අනුව හරයක් වශයෙන් එම වෙන්වූ ලෙස සැලකිය හැකි අස්තිත්වයන්ගේ සියලු වත්කම්, වගකීම් සහ ස්කන්ධය සමස්ථ අයෝජිතයන්ගෙන් වටකර වැට බැඳ ඇත. එවැනි වෙන්වූ ලෙස සැලකිය හැකි අස්තිත්වයක් බොහෝවිට 'කොටුකළ' ලෙස හැඳින්වේ.

ආ78. ආ77 ඡේදයේ කොන්දේසි සපුරාලන විට ආයෝජකයකු විසින් වෙන්වූ ලෙස සැලකිය හැකි අස්තිත්වයේ ප්‍රතිලාභවලට සැලකිය යුතු ලෙස බලපෑ හැකි ක්‍රියාකාරකම් සහ එයට ආයෝජිතගේ කොටස මත බලය තිබේදැයි තක්සේරු කිරීමට හැකිවන පරිදි එම ක්‍රියාකාරකම් කෙසේ මෙහෙය විය යුතුදැයි හඳුනාගත යුතුය. වෙන් වූ ලෙස සැලකිය හැකි අස්තිත්වයේ පාලනය තක්සේරු කිරීමේදී ආයෝජක විසින් එයට විවෘත වූ හෝ එම වෙන්වූ ලෙස සැලකිය හැකි අස්තිත්වය සමග එහි සහභාගිත්වය නිසා විචල්‍ය ප්‍රතිලාභවලට සහ ආයෝජකගේ ප්‍රතිලාභවල වටිනාකමට බලපෑ හැකි එහි බලය ආයෝජකගේ කොටස මත භාවිතා කිරීමට හැකියාව තිබේද යන්න සලකා බැලිය යුතුය.

ආ79. වෙන්වූ ලෙස සැලකිය හැකි අස්තිත්වය ආයෝජකයා විසින් පාලනය කරයිනම් ආයෝජිතයාගේ එම කොටස ආයෝජක ඒකාබද්ධ කළ යුතුය. එම අවස්ථාවේදී එහි පාලනය තක්සේරු කිරීමේදී සහ ආයෝජිත ඒකාබද්ධ කිරීමේදී වෙනත් පාර්ශ්වයන් ආයෝජිතයේ එම කොටස බැහැර කරයි.

**අඛණ්ඩ ඇගයීම**

ආ80. 7 වන ඡේදයේ ලැයිස්තුගත කර ඇති පාලන මූලිකාංග තුනෙන් එකක් හෝ ඊට වැඩි ගණනකට වෙනස්වීම සිදුවී ඇතැයි වන කරුණු සහ තත්ත්වයන් පිළිබඳව ඇගවීමක් කෙරෙන්නේ නම් එය ආයෝජිත පාලනය කරන්නේද යන්න ආයෝජිත යළි තක්සේරු කළ යුතුය.

ආ81. ආයෝජිතයකු මත බලය ක්‍රියාත්මක කළ යුතු ආකාරය වෙනස් වී ඇත්නම් එම වෙනස්වීම ආයෝජිත මත බලය ආයෝජක තක්සේරු කරන ආකාරය පිළිබිඹු වියයුතුය. උදාහරණ වශයෙන් තීරණ ගැනීමේ අයිතීන් වෙනස්වීම යන්නෙන් අදහස් විය හැක්කේ අදාළ ක්‍රියාකාරකම් තවදුරටත් ඡන්ද අයිතිය මෙහෙයවනු නොලබන බවයි. එහෙත් ඒ වෙනුවට ගිවිසුම් වැනි වෙනත් එකඟවීම් මගින් අදාළ ක්‍රියාකාරකම් මෙහෙයවීමට වෙනත් පාර්ශ්වයකට හෝ පාර්ශ්වවලට ප්‍රවර්තන හැකියාව ලබාදෙයි.

ආ82. යම් සිදුවීමක් නිසා එම සිදුවීමට ආයෝජකගේ සහභාගිත්වයක් නොමැතිව ආයෝජකට ආයෝජක මත බලය ලබාගැනීම හෝ අහිමිවීම සිදුවිය හැකිය. උදාහරණ වශයෙන් තීරණ ගැනීමේ අයිතිය දරන වෙනත් පාර්ශ්වයක් හෝ පාර්ශ්වයන් ආයෝජක හට ආයෝජිතව පාලනය කිරීම වළක්වාලන කලින් තිබූ බලයේ කාලය ඉකුත්වීම නිසා ආයෝජකයෙකු හට ආයෝජිත මත බලය ලබාගත හැකිය.

ආ83. ආයෝජකයෙක්, ආයෝජිතයෙක් සමග වන එහි සබඳතාවයෙන් වන විචල්‍ය ප්‍රතිලාභවලට හෝ හිමිකම් වලට එහි විවෘතවීමට බලපාන වෙනස්කම් ද ආයෝජකයෙක් සලකා බලයි. උදාහරණ වශයෙන් ආයෝජකට ලැබීමට හිමිකම් ඇති ප්‍රතිලාභ නවතින්නේ නම් හෝ ආයෝජන 7 (ආ) ඡේදය සපුරාලීමට ආපොහොසත් වීම නිසා බැදීම් වලට විවෘත වීම නිසා ආයෝජිතයෙකු මත බලය ඇති ආයෝජිතයකුට ආයෝජිතගේ පාලනය අහිමිවිය හැකිය. (උදා: කාර්ය සාධන හා සම්බන්ධිත ගාස්තු ලැබීමට ඇති ගිවිසුමක් අවසන් වීම)

ආ84. ආයෝජකයෙක් විසින් එය නියෝජිතයෙක් හෝ ප්‍රධානියෙක් ලෙස ක්‍රියාකරන බවට වූ තක්සේරුව වෙනස් වී ඇත්දැයි ආයෝජක සලසා බැලිය යුතුය. ආයෝජක සහ වෙනත් පාර්ශ්වයන් අතර සමස්ථ සබඳතාවක් වෙනස් වීම් වලින් ආයෝජිත කලින් නියෝජිතයෙක් ලෙස ක්‍රියාකළේ වූයේ වුවද තවදුරටත් නියෝජිතයෙකු ලෙස කටයුතු නොකරන බව අදහස් වියහැකිය. උදාහරණ වශයෙන් ආයෝජකගේ හෝ වෙනත් පාර්ශ්වවල හිමිකම් වෙනස්වීම සිදුවුවහොත් ආයෝජක ඔහුගේ තරාතිරම ප්‍රධානියෙක් වශයෙන් ද හෝ නියෝජිතයෙක් වශයෙන් දැයි යළි සලකා බැලිය යුතුය.

ආ85. වෙළඳපොළ තත්ත්වයන් වෙනස්වීම නිසා 7 වන ඡේදයේ ලැයිස්තුගත කර ඇති පාලන මූලිකාංගවල එකක් හෝ ඊට වැඩි ගණනක් වෙනස් වන්නේ නම් හෝ ප්‍රධානියා සහ නියෝජිතයා අතර සමස්ත සබඳතාවය වෙනස් වන්නේ නම් හැර පාලනය හෝ ප්‍රධානියකුගේ නියෝජිතයකු ලෙස එහි තරාතිරමේ ආයෝජකයකුගේ මූලික ඇස්තමේන්තුව සරලව වෙනස් නොවේ.

**අස්තිත්වයක් ආයෝජන අස්තිත්වයක්දැයි නිර්ණය කිරීම**

ආ85අ අස්තිත්වයක් ආයෝජන අස්තිත්වයක් දැයි තක්සේරු කිරීමේදී එහි අරමුණ සහ සැලැස්ම ඇතුළු සියලු කරුණු සහ තත්ත්වයන් එය සලකා බැලිය යුතුය. 27 වන ඡේදයේ ආයෝජන අස්තිත්වයක නිර්වචනයේ නියමකර ඇති මූලිකාංග තුන සතුව පවතින අස්තිත්වයක් ආයෝජන අස්තිත්වයකි.

නිර්වචනයේ මූලිකාංග සවිස්තරාත්මකව ආ85ආ - ආ85අඅ ඡේදවල විස්තර කෙරේ.

**ව්‍යාපාරික අරමුණ**

ආ85ආ ආයෝජන අස්තිත්ත්වයක අරමුණ වන්නේ තනිකරම ප්‍රාග්ධනය වැඩිවීම, ආයෝජන ආදායම (ලාභාංශ, පොලී හෝ කුලී ආදායම් වැනි) හෝ දෙකම සඳහා ආයෝජන කිරීම බව ආයෝජන අස්තිත්වයක නිර්වචනයෙන් අවශ්‍ය කෙරේ. අස්තිත්වයේ ආයෝජන අරමුණු මොනවාදැයි සඳහන් වන අස්තිත්වයේ පිරිනැමීමේ සංස්ථාපත්‍රය, අස්තිත්වය බෙදාහල ප්‍රකාශන සහ වෙනත් සංස්ථාමය හෝ හවුල් ව්‍යාපාරික ලියවිලි වැනි ලියවිලි ආයෝජන අස්තිත්වයක ව්‍යාපාරික අරමුණේ ආකෘතිමය සාක්ෂි සපයනු ඇත. අස්තිත්වයම වෙනත් පාර්ශ්වවලට ඉදිරිපත් කරන ක්‍රමයේ අමතර සාක්ෂි ඇතුළත් විය හැකිය. (භව්‍ය ආයෝජන හෝ භව්‍ය ආයෝජිත වැනි) උදා: ප්‍රාග්ධන අගය වැඩිකිරීම සඳහා මධ්‍යකාලීන ආයෝජන සලස්වන්නන් ලෙස අස්තිත්වයක් සිය ව්‍යාපාරය ගෙන හැර දක්විය හැකිය.

එයට වෙනස් ව එහි ආයෝජිත සමග බද්ධව නිෂ්පාදනයක් සංවර්ධනය කිරීම නිෂ්පාදනය කිරීම සහ අලෙවි කරන අස්තිත්වයක් ලෙස ගෙනහැර දක්වන ආයෝජකයෙක් ආයෝජන අස්තිත්ත්වයක ව්‍යාපාරික අරමුණු සමග අසංගත වේ. එයට හේතුවන්නේ එහි ආයෝජනවලින් මෙන්ම නිෂ්පාදනය සංවර්ධනය කිරීම, නිෂ්පාදනය කිරීම, සහ අලෙවි කිරීම යන ක්‍රියාකාරකම් වලිනුත් අස්තිත්වය ප්‍රතිලාභ උපද්දවන නිසාය (ආ 85 ඒ ඡේදය බලන්න).

ආ85ඇ එක්කෝ සෘජුව හෝ පරිපාලිතයක් මගින් තුන්වන පාර්ශ්වයකට මෙන්ම සිය ආයෝජකයනට ආයෝජන සම්බන්ධිත සේවාවන් (උදා: ආයෝජන උපදේශන සේවාවන්, ආයෝජන කළමනාකරණය සහ පරිපාලන සේවාවන්) මෙම ක්‍රියාකාරකම් අස්තිත්වයට සැලකිය යුතු අන්දමේ වුවත් ආයෝජන අස්තිත්වයක් විසින් ලබාදිය හැකිය.

ආ85ඇ එහි ආයෝජිතයන්ගේ ආයෝජන ප්‍රතිලාභ උපරිම කිරීමට (ප්‍රාග්ධන අගය වැඩිවීම හෝ ආයෝජන ආදායම) හෝ වෙන් වූ සැලකිය යුතු අන්දමේ ව්‍යාපාරික ක්‍රියාකාරකමක හෝ වෙන් වූ සැලකිය යුතු අන්දමේ ආදායම් ප්‍රභවයක් අස්තිත්වයට නියෝජනය නොකිරීමට මෙම ආයෝජන ක්‍රියාකාරකම් භාර ගන්නේ නම්, ආයෝජන අස්තිත්වයකට පහත සඳහන් ක්‍රියාකාරකම්වලට ද සහභාගී විය හැකිය.

(අ) ආයෝජිතයෙකුට කළමනාකරණ සේවා සහ ක්‍රමෝපාය උපදෙස් දීම ; සහ

(ආ) ආයෝජිතයෙකුට ණය ප්‍රාග්ධන බැදීම් හෝ ඇප වැනි මූල්‍යමය පහසුකම් ලබාදීම

ආ85ඉ ආ85 ඇ - ආ 85 ඈ ඡේදවල විස්තර කර ඇති දෑ වැනි අස්තිත්වයට හෝ වෙනත් පාර්ශ්වවලට ආයෝජන සම්බන්ධිත සේවා හෝ ක්‍රියාකාරකම් සලසනු ලබන පරිපාලිතයක් ආයෝජන අස්තිත්වයට ඇත්නම් එය එම පරිපාලිතය 32 වන ඡේදය ප්‍රකාරව ඒකාබද්ධ කළ යුතුය.

**ඉවත්වීමේ ක්‍රමෝපායන්**

ආ85ඊ අස්තිත්වය ආයෝජන සැලැස්මෙන් ද එහි ව්‍යාපාරික අරමුණු පිළිබඳ සාක්ෂි ආයෝජන අස්තිත්වයක් වෙනත් අස්තිත්වයන්ගෙන් වෙන්කොට හඳුනාගන්නා එක ගති ලක්ෂණයක් වන්නේ ආයෝජන අස්තිත්වය එහි ආයෝජන අනියත කාලයක් සඳහා රඳවා තබාගැනීමට සැලසුම් නොකිරීමය. එය ඒවා රඳවා තබාගන්නේ සීමිත කාලසීමාවකටය. ස්කන්ධ ආයෝජන සහ මූල්‍ය නොවන වත්කම්වල ආයෝජන අනියත කාල සීමාවක් සඳහා රඳවා තබාගැනීමට හැකියාවක් ඇති නිසා ආයෝජන අස්තිත්වයේ සැලකිය යුතු අන්දමේ සියලු ස්කන්ධ ආයෝජන සහ මූල්‍ය නොවන වත්කම් වල ආයෝජන වල ප්‍රාග්ධන අගය වැඩිවීම කෙසේ උපලබ්ධි කරගන්නේ ද යන්න ලේඛණගත කළ සැලැස්මක් ඉවත් වීමේ ක්‍රමෝපායක් ලෙස එයට තිබිය යුතුය. අනියත කාලසීමාවක් සඳහා රඳවා තබාගැනීමට හැකියාව ඇති ඕනෑම ණය සාධන පත්‍ර සඳහා ද ආයෝජන අස්තිත්වයකට ඉවත්වීමේ ක්‍රමෝපායක් තිබිය යුතුය. උදා: සනාතන ණය සාධනපත්‍ර සෑම තනි ආයෝජනයක් සඳහාම අස්තිත්වය නිශ්චිත ඉවත්වීමේ ක්‍රමෝපායන් ලේඛණගත කිරීම අවශ්‍ය නොවේ. එහෙත් වෙනස් වර්ගවල ආයෝජන හෝ ආයෝජන කළඹවල් සඳහා ආයෝජනවලින් ඉවත්වීම සඳහා ස්ථිර පදනමකින් යුත් කාලරාමුවක් ද ඇතුලුව වෙනත් භව්‍ය ක්‍රමෝපායන් අස්තිත්වය හඳුනාගත යුතුය. මෙහිදී ඉවත්වීමේ යාන්ත්‍රණය ඉදිරිපත්කර ඇත්තේ පැහැර හැරීමේ සිද්ධිය සඳහා පමණි. මෙම තක්සේරු කිරීමේ අරමුණු සඳහා ගිවිසුම් පැහැර හැරීම් හෝ ඉටුකළ නොහැකි වීම් වැනිදෑ ඉවත්වීමේ ක්‍රමෝපායන් හඳුනාගත යුතුය.

ආ85උ ආයෝජනයේ වර්ගය අනුව ඉවත්වීමේ ක්‍රමෝපායන් වෙනස්විය හැකිය. පෞද්ගලික ස්කන්ධ සුරැකුම්පත්වල ආයෝජන සඳහා ඉවත්වීමේ ක්‍රමෝපායන්ට ඇතුළත්වන්නේ උදාහරණ ලෙසෑ මූලික පොදු පිරිනැමීම, පෞද්ගලික ස්ථාපනය, ව්‍යාපාරයේ වෙළඳාම විකිණීම, ආයෝජිතයාගේ හිමිකමේ අයිතිය බෙදාහැරීම (ආයෝජකයන්ට) සහ වත්කම් විකිණීම (ආයෝජිතයාගේ වත්කම් විකිණීමෙන් අනතුරුව ආයෝජිතයා ඈවර කිරීම ඇතුළුව) පොදු වෙළඳපොළක එකිනෙක ස්කන්ධ ආයෝජන සඳහා ඉවත්වීමේ ක්‍රමෝපායන්ට ඇතුළත් වනුයේ ආයෝජන පෞද්ගලික ස්ථානයකදී හෝ පොදුවෙළඳපළකදී විකිණීමය. නිශ්චල දේපළ ආයෝජන සඳහා ඉවත්වීමේ ක්‍රමෝපායකට උදාහරණයකට ඇතුළත් වනුයේ නිශ්චල දේපළ විශේෂඥ දේපළ වෙළඳාම්කරුවන් හෝ විවෘත වෙළඳපොළ හරහා විකිණීමය.

අ85ඌ ආයෝජන අස්තිත්වයක නෛතික, නියාමන, බදු හෝ ඒ හා සමාන ව්‍යාපාරික හේතු සම්බන්ධයෙන් පිහිට වූ වෙනත් ආයෝජන අස්තිත්වයක, අස්තිත්වයකට ආයෝජනක් තිබිය හැකිය. ආයෝජන අස්තිත්වයේ ආයෝජිතහට එහි ආයෝජනය සඳහා උචිත ඉවත් වීමේ ක්‍රමෝපායක් තිබේ නම්, මෙම අවස්ථාවේදී ආයෝජන අස්තිත්වයේ ආයෝජක හට එම ආයෝජනය සඳහා ඉවත්වීමේ ක්‍රමෝපායක් තිබීම අවශ්‍ය නොවේ.

**ආයෝජනවලින් ඉපයීම්**

ආ85එ අස්තිත්වයක් තනිකරම ප්‍රාග්ධන අගය වැඩිවීම ආයෝජන ආදායම් හෝ ඒ දෙකම සඳහා පමණක් ආයෝජනය නොකරයි. අස්තිත්වය හෝ අස්තිත්වය සමන්විත සමූහයේ අන්සාමාජිකයකු (එනම් ආයෝජන අස්තිත්වයේ අවසාන පරිපාලකය පාලනය කරන සමූහය) අන් පාර්ශ්වයකට ලබාගත නොහැකි අස්තිත්වයේ ආයෝජනවලින් වෙනත් ප්‍රතිලාභ ලබාගැනීම හෝ ලබාගැනීමට අරමුණක් තිබේනම් ඒවා ආයෝජිතයට සම්බන්ධිත නොවේ. එවැනි ප්‍රතිලාභවලට ඇතුළත් වන්නේ,

(අ) ආයෝජිතයකුගේ ක්‍රියාවලි, වත්කම් හෝ තාක්ෂණය, අත්පත්කරගැනීම, භාවිතය, හුවමාරුව හෝ උපයෝජනයය, ඕනෑම ආයෝජිතයකුගේ වත්කම්, තාක්ෂණය, නිෂ්පාදන හෝ සේවා අත්කරගැනීමට අස්තිත්වයට හෝ අන් සමූහ සාමාජිකයනට සමානුපාතික නොවන හෝ සුවිශේෂී අයිතිය මෙයට ඇතුළත් විය හැකිය. උදාහරණ වශයෙන් වත්කමේ සංවර්ධන සාර්ථක බව හැඟී යන්නේ නම් එම වත්කම ආයෝජිතයාගෙන් මිලදී ගැනීම ඇති විකල්පයක් රඳවා තබාගැනීම ;

(ආ) නිෂ්පාදන හෝ සේවාවන් සංවර්ධනය කිරීම, නිෂ්පාදනය, අලෙවිය හෝ සැපයීම සඳහා අස්තිත්වය හෝ අන් සමූහයක සාමාජිකයන් සහ ආයෝජිත අතර වන බද්ධ එකඟවීම් (SLFRS 11 නිර්වචනය කර ඇති පරිදි) හෝ වෙනත් ගිවිසුම් ;

(ඇ) අස්තිත්වයේ හෝ වෙනත් සමූහක සාමාජිකයෙකුට ණයට ගැනීම් එකඟවීම් සඳහා අතිරේක ඇපයක කාර්යභාරය ඉටු කිරීමට ආයෝජිතයා සපයන ලද මූල්‍ය ඇපකර හෝ වත්කම් (කෙසේ වෙතත් ආයෝජිතයකු තුළ කර ඇති ආයෝජනයක් ආයෝජන අස්තිත්වයක එහි ඕනෑම ණය ගැනීම් සඳහා අතිරේක ඇපයක් ලෙස තවමත් භාවිත කළ හැකිවනු ඇත) ;

(ඈ) අස්තිත්වයේ ආයෝජිතයාගේ හිමිකමේ අයිතියක් එම අස්තිත්වයෙන් හෝ වෙනත් සමූහ සාමාජිකයෙකුගෙන් මිලදීගැනීමට අස්තිත්වයේ සම්බන්ධිත පාර්ශ්වයක් දරන විකල්පයක්.

(ඉ) ආ85 ඒ ඡේදයේ විස්තර කර ඇති පරිදි හැර,

(i) එක්කෝ අස්තිත්වයේ හෝ අන් සමූහයක සාමාජික හෝ ආයෝජිතයාගේ සම්බන්ධිත පාර්ශ්වයන්ට නොවන අස්තිත්වයන්ට ලබාගත නොහැකි කොන්දේසි මත වන,

(ii) සාධාරණ අගයට නොවන ; හෝ

(iii) අන් සමූහ අස්තිත්වයන්හි ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඇතුළුව ආයෝජිතයාගේ හෝ අස්තිත්වයේ ව්‍යාපාරික ක්‍රියාකාරකම්වල සැලකිය යුතු අන්දමේ කොටසක් නියෝජනය කරන,

අස්තිත්වය හෝ අන් සමූහ සාමාජිකයන් සහ ආයෝජිතයා අතර වන ගනුදෙනු.

ආ85ඒ සහක්‍රියාකාරකම් වලින් ආයෝජිතයන්ගේ ප්‍රාග්ධන අගය සහ ආයෝජන ආදායම් ඉහළයාමෙන් වැඩිවන ප්‍රතිලාභ ලබාගැනීමට ආයෝජන අස්තිත්වයකට, එකම කර්මාන්තයේ, වෙළඳපොලේ හෝ භූගෝලීය ප්‍රදේශයේ එක ආයෝජකයකුට වඩා වැඩි ගණනක ආයෝජනය කිරීමට ක්‍රමෝපායක් තිබිය හැකිය. ආ85එ(ඉ) හි එසේ සඳහන් වුවත් එවන් ආයෝජිතයන් එකිනෙකා අතර හුදු වෙළඳාම් කිරීමේ හේතුව අස්තිත්වය ආයෝජන අස්තිත්වයක් ලෙස වර්ගීකරණය කිරීමට නුසුදුසුකමක් නොවේ.

**සාධාරණ අගය මැනීම**

ආ85ඔ ආයෝජන අස්තිත්වයක නිර්වචනයේ මූලිකාංගයක් වනුයේ සෑහෙනදුරට එහි සියලුම ආයෝජනවල කාර්යසාධනය මැනීම සහ අගය කිරීම කරනුයේ සාධාරණ අගයට වන වගය. උදාහරණ වශයෙන් එහි පරිපාලිත ඒකාබද්ධ කිරීම හෝ එහි ආශ්‍රිත හෝ බද්ධ ව්‍යාපාර වල හිමිකම සඳහා ස්කන්ධ ක්‍රමය භාවිතා කිරීමට වඩා සාධාරන අගය භාවිත කිරීමෙන් වඩා අදාළ තොරතුරු ලබාදීම ප්‍රතිඵලයක් වන හේතුවනිසාය. නිර්වචනයේ මෙම මූලිකාංගය සපුරාලන බව පෙන්නුම් කිරීම සඳහා ආයෝජන අස්තිත්වයක් ;

(අ) ආයෝජකයනට සාධාරණ අගය තොරතුරු ලබාදීම සහ SLFRS ප්‍රකාරව සාධාරණ අගය අවශ්‍යකරන විට හෝ ඉඩදෙන විටදී බොහෝදුරට එහි සියලුම ආයෝජන සාධාරන අගයට එහි මූල්‍ය ප්‍රකාශනවල මැනීම ; සහ

(ආ) අස්තිත්වයේ සැලකිය යුතු අන්දමේ සියලු ආයෝජනවල කාර්ය සාධනය මැනීමට සහ ආයෝජන තීරණ ගැනීමට, සාධාරණ අගය මූලික මැනීමේ ගුණාංගයක් ලෙස ප්‍රයෝජනයට ගන්නා අස්තිත්වයේ ප්‍රමුඛ කළමනාකරණ පිරිස (LKAS 24 හි නිර්වචනය කර ඇති පරිදි) වෙත අභ්‍යන්තරව සාධාරන අගය තොරතුරු වාර්තා කරයි.

ආ85ඕ ආ85ඔ(අ) හි අවශ්‍යතාවයන් සපුරාලීමට අස්තිත්වයක් පහත දෑ කරනු ලැබිය හැකිය.

(අ) LKAS 40 හි ආයෝජන දේපොළ, සාධාරණ අගය ආකෘතිය භාවිත කර ඕනෑම ආයෝජන දේපළක් ගිණුම්ගත කිරීමට තෝරාගැනීම.

(ආ) ආශ්‍රිත සහ බද්ධ ව්‍යාපාරවල අස්තිත්වයේ ආයෝජන සඳහා LKAS 28 හි ස්කන්ධ ක්‍රමය ව්‍යවහාර කර නිදහස් කිරීම තෝරාගැනීම ; සහ

(ඇ) SLFRS 9 හි අවශ්‍යතාවයන් භාවිතා කර අස්තිත්වයේ මූල්‍ය වත්කම් සාධරණ අගයට මැනීම.

ආ85අඅ ප්‍රධාන කාර්යාලයේ දේපළ සහ සම්බන්ධිත උපකරණ වැනි සමහර ආයෝජන නොවන වත්කම් මෙන්ම මූල්‍ය වගකීම් ද අස්තිත්වයකට තිබිය හැකිය. 27(ඇ) ඡේදයේ ආයෝජන අස්තිත්වයක සාධාරණ අගය මැනීමේ නිර්වචනයේ මූලිකාංග ආයෝජන අස්තිත්වයක ආයෝජනවලට අදාළ වේ. ඒ අනුව ආයෝජන අස්තිත්වයක එහි ආයෝජන නොවන වත්කම් හෝ එහි වගකීම් සාධාරණ අගයට මැනීම අවශ්‍ය නොවේ.

**ආයෝජන අස්තිත්වයක ආකෘතික ගතිලක්ෂණ**

ආ85අආ අස්තිත්වය ආයෝජන අස්තිත්වයක නිර්වචනය සපුරාලන්නේද යනවග නිර්ණය කිරීමේදී අස්තිත්වය විසින් එක (28 ඡේදය බලන්න) අපේක්ෂිත ගතිලක්ෂණයක් පෙන්වන්නේද යන්න සලකා බැලිය යුතුය. මෙම අපේක්ෂිත ගතිලක්ෂණ වලින් එකක් හෝ වැඩි ගණනක් නොමැතිවීම අස්තිත්වය ආයෝජන අස්තිත්වයක් ලෙස වර්ගීකරණය කිරීම නුසුදුසු කිරීම අවශ්‍යයෙන්ම සිදුනොවන අතර අස්තිත්වය, ආයෝජන අස්තිත්වයක්දැයි නිර්ණය කිරීමේදී අමතර විනිශ්චයක් අවශ්‍ය වන බව ඇඟ වේ.

**එකකට වඩා වැඩි ආයෝජන**

ආ85අඇ ඒවායේ අවදානම නානාංගකරණය කිරීමට සහ එවායේ ප්‍රතිලාභ උපරිම කිරීමට ආයෝජන අස්තිත්වයක් අපේක්ෂා කරන පරිදි ආයෝජන ගණනාවක් දරා සිටුනු ඇත. අස්තිත්වයක් ආයෝජන කළඹක් සෘජුව හෝ වක්‍රව දරා සිටිය හැකිය. උදාහරණ වශයෙන් ආයෝජන ගණනාවක් දරන අන් ආයෝජන අස්තිත්වයක තනි ආයෝජනයක් දැරීම.

ආ85අඈ අස්තිත්වයක් තනි ආයෝජනයක් දරා සිටින වාර ගණනක්ද තිබිය හැකිය. කෙසේ වෙතත් තනි ආයෝජනයක් දැරීම නිසා අස්තිත්වයක්, ආයෝජන අස්තිත්වයක නිර්වචනය සපුරාලීමේ අවශ්‍යතාවයෙන් වළක්වා ලනු නොලබයි. උදාහරණ වශයෙන් අස්තිත්වය පහත දක්වෙන අවස්ථාවන්හිදී ආයෝජන අස්තිත්වය එක ආයෝජනයක් පමණක් දැරීම සිදුවිය හැකිය.

(අ) අස්තිත්වය පටන්ගැනීමේ කාලපරිච්ඡේදයේ වීම සහ සුදුසු ආයෝජන මෙතෙක් හඳුනාගෙන නොමැති වීම නිසා ආයෝජන ගණනාවක් අත්කර ගැනීමට වූ ආයෝජන සැලැස්ම මෙතෙක් ක්‍රියාවට නංවා නොතිබීම.

(ආ) අස්තිත්වය බැහැර කල ආයෝජන ආදේශනය කිරීම සඳහා මෙතෙක් වෙනත් ආයෝජනයන් හි ආයෝජනය කර නොතිබීම,

(ඇ) එක් එක් ආයෝජකයනට තනි ආයෝජනයක් ලබාගත නොහැකිවිට එම තනි ආයෝජනයේ ආයෝජනය කිරීම සඳහා ආයෝජකයන්ගේ අරමුදලක් එක්රැස් කිරීම සඳහා පිහිටුවීම (එනම් තනි ආයෝජකයකුට අවශ්‍ය කරන අවම ආයෝජනය ඉතා විශාලවීම) හෝ

(ඇ) එය ඇවර කරන අවධියේ තිබීම

**එක ආයෝජකයකුට වඩා වැඩි ගණනක්**

ආ85අඉ එක් එක් ආයෝජකයෙක් වශයෙන් ප්‍රවේශවීමට නොහැකිවිය හැකි, ආයෝජන කළමනාකරණ සේවා සහ ආයෝජනයට වාසිදායක තත්ත්වයනට ප්‍රවේශවීමට ළඟාවීම සඳහා ඔවුන් අරමුදල් එක්රැස් කරන ආයෝජකයන් ගණනක් නියම අන්දමට නම් ආයෝජන අස්තිත්වයකට සිටිය හැකිය. ආයෝජකයන් ගණනාවක් සිටීම අස්තිත්වයට හෝ අස්තිත්වය සමන්විත වන සමූහයේ වෙනත් සාමාජිකයනට, ආයෝජනවල ප්‍රාග්ධන අගය හෝ ආයෝජන ආදායම් වැඩිවීම හැර වෙනත් ප්‍රතිලාභ ලබාගැනීමට ඇති ඉඩ ප්‍රස්ථා බොහෝදුරට අඩුවිය හැකිය (ආ85එ ඡේදය බලන්න).

ආ85අඊ පුළුල් කණ්ඩායමක ආයෝජකයන් ගේ (උදා: විශ්‍රාම අරමුදල්, රාජ්‍ය ආයෝජන අරමුදල් හෝ පවුලේ භාරයක්) අයිතීන් වලට සහායවන හෝ ඒ අය නියෝජනය කිරීම සඳහා හෝ තනි ආයෝජකයෙකුට, විකල්පයක් වශයෙන් ආයෝජන අස්තිත්වයක් පිහිටුවිය හැකිය.

ආ85අඋ අස්තිත්වයකට තාවකාලිකව තනි ආයෝජකයෙක් සිටිය හැකි අවස්ථාවන් ගණනක් ද තිබිය හැකිය. උදාහරණ වශයෙන් පහත දැවනවිටදී ආයෝජන අස්තිත්වයකට තනි ආයෝජකයකු පමණක් සිටිය හැකිය.

(අ) අස්තිත්වය සක්‍රිය ලෙස සුදුසු ආයෝජකයන් හඳුනාගන්නා මූලික පිරිනැමීමේ කාලපරිච්ඡේදය නොඉක්මවුණ කාලපරිච්ඡේදය තුළවීම.

(ආ) නිදහස් කළ හිමිකමේ අයිතිය ආදේශන කිරීමට මෙතෙක් සුදුසු ආයෝජනයන් හඳුනාගෙන නොතිබීම.

(ඇ) ඇවර කිරීමේ අවධියේ තිබීම.

**අසම්බන්ධිත ආයෝජකයන්**

ආ85අඌ අස්තිත්වයේ සම්බන්ධිත පාර්ශ්ව නොවන (LKAS 24 හි නිර්වචනය කර ඇති පරිදි) හෝ අස්තිත්වය සමන්විත වන සමූහයේ අන් සාමාජිකයන් වන ආයෝජකයන් ගණනාවක් නියම වශයෙන් ආයෝජන අස්තිත්වයකට සිටී. අසම්බන්ධිත ආයෝජකයන් සිටීම අස්තිත්වයට හෝ අස්තිත්වය සමන්විත වන සමූහයේ වෙනත් සාමාජිකයනට ආයෝජනවල ප්‍රාග්ධන අගය හෝ ආයෝජන ආදායම් වැඩිවීම හැර වෙනත් ප්‍රතිලාභ ලබාගැනීමට ඇති ඉඩ ප්‍රස්ථා බොහෝ දුරට අඩුවිය හැකිය. (අ85 එ ඡේදය බලන්න).

ආ85අඑ කෙසේ වෙතත් ආයෝජන අස්තිත්වයේ ආයෝජකයන් ආයෝජන අස්තිත්වයට සම්බන්ධිත වූයේ නමුදු අස්තිත්වය ආයෝජන අස්තිත්වයක් ලෙස තවදුරටත් සුදුසුකම්ලබයි. උදාහරණ ලෙස, ආයෝජන අස්තිත්වයත් එහි සේවකයන් කණ්ඩායමක් සඳහා (ප්‍රමුඛ කළමනාකරණ පිරිස් වැනි) හෝ වෙනත් අරමුදලක් පිහිටුවිය හැකි අතර එමගින් අස්තිත්වයේ ප්‍රධාන ආයෝජන අරමුදලේ ආයෝජන පිළිබඳ නිවැරදි චිත්‍රයක් පිළිබිඹු වේ. එහි වන සියලුම ආයෝජකයන් සම්බන්ධිත පාර්ශ්ව වූයේ වුවද මෙම සමාන්තර අරමුදල ආයෝජන අස්තිත්වයක් ලෙස සුදුසුකම් ලැබිය හැකිය.

**හිමිකමේ අයිතීන්**

ආ85අඒ ආයෝජන අස්තිත්වයක් දර්ශීය වුවත්, වෙනම වූ නෛතික අස්තිත්වයක් වීම අවශ්‍ය නොවේ. ආයෝජන අස්තිත්වයක හිමිකමේ අයිතීන් දර්ශීයව ස්කන්ධ හෝ ඒ හා සමාන හිමිකම්වල (එනම් හවුල් ව්‍යාපාර හිමිකම්) ස්වරූපයේ පවතින අතර එයට ආයෝජන අස්තිත්වයේ ශුද්ධ වත්කම්වල සමානුපාතික කොටස් ආරෝපණය වේ.

සමහර ආයෝජකයනට නිශ්චිත ආයෝජන හො ආයෝජන කාණ්ඩයකට පමණක් හිමිකම් තිබීම හෝ ශුද්ධ වත්කම්වල වෙනස් සමානුපාතික කොටස් තිබීම වැනි වෙනත් පන්තිවල ආයෝජකයන් සිටීම කෙසේ වෙතත් අස්තිත්වය ආයෝජන අස්තිත්ව තත්ත්වයේ පැවැත්ම වළක්වාලනු නොලබයි.

ආ85අඔ අමතරව හිමිකමේ සැලකිය යුතු අන්දමේ අයිතියක් ණය ස්වරූපයෙන් ඇති අස්තිත්වයක් අදාළ SLFRSs ප්‍රකාරව ස්කන්ධය යන්නෙහි නිර්වචනය සපුරාලන්නේ නැත. එහෙම වුණත් ණය දරන්නන් අස්තිත්වයේ ශුද්ධ වත්කම්වල සාධාරණ අගයේ වෙනස්වීම් වලින් වන විචල්‍ය ප්‍රතිලාභවලට අනාවෘත වන්නේ නම් ආයෝජන අස්තිත්වය තවමත් ආයෝජන අස්තිත්වයක් ලෙස සුදුසුකම් ලැබිය හැකිය.

**ගිණුම්කරණ අවශ්‍යතාවයන්**

**ඒකාබද්ධකරණ ක්‍රියාපටිපාටිය**

ආ86. ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

(අ) පරිපාලකයේ සමග එහි වන පරිපාලිතයන්ගේ සමාන අයිතම වන වත්කම් වගකීම්, ස්කන්ධය, ආදායම්, වියදම් සහ මුදල් ප්‍රවාහ එකතු කිරීම

(ආ) සෑම පරිපාලිතයකම ඇති පරිපාලකයේ ආයෝජනවල ධාරණ අගය සහ සෑම පරිපාලිකයකම ඇති පරිපාලකයේ ස්කන්ධයේ කොටස හිලව් කිරීම (ඉවත් කිරීම) (SLFRS 3 කිසියම් සම්බන්ධිත කීර්තිනාමයක් වුවහොත් එය ගිණුම්ගතකරන අන්දම පැහැදිලි කරයි.)

(ඇ) සමූහයේ අස්තිත්වයයන් අතර සම්බන්ධිත ගනුදෙනු, අන්තර් සමූහ වත්කම්, සහ වගකීම්, ස්කන්ධය, ආදායම් සහ වියදම් සහ මුදල් ප්‍රවාහ ඉවත් කිරීම (තොග සහ ස්ථාවර වත්කම් වැනි අන්තර් සමූහ ගනුදෙනු වලින් ප්‍රතිඵලයක් වන වත්කම් වල හඳුනාගෙන ඇති ලාභ හෝ අලාභ සම්පූර්ණයෙන්ම ඉවත් කිරීම). අන්තර් සමූහ පාඩු හානිකරණයක් ඇඟවිය හැකි අතර එය ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගැනීම අවශ්‍ය වේ. අන්තර් සමූහ ගනුදෙනු වලින් ප්‍රතිඵලයක් වනලාභ හෝ අලාභ ඉවත් කිරීමේ වන තාවකාලික වෙනස්කම් සඳහා LKAS 12 *ආදායම් බදු* ව්‍යවහාර වේ.

**ඒකාකාර ගිණුම් ප්‍රතිපත්තිය**

ආ87. සමාන ගනුදෙනු සහ සමාන තත්ත්වයන්හිදී වන සිදුවීම සඳහා සමූහයේ එක් සාමාජිකයෙක් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වලට තෝරාගත් ගිණුම් ප්‍රතිපත්ති හැර වෙනත් ගිණුම් ප්‍රතිපත්ති භාවිතා කරයි නම්, සමූහයේ ගිණුම් ප්‍රතිපත්තිවලට අනුකූල වීම සහතික වීමට ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී එම සමූහයේ සාමාජිකයාගේ මූල්‍ය ප්‍රකාශනවලට උචිත ගැලපුම් කරනු ලැබේ.

**මැනීම**

ආ88. අස්තිත්වයක් පරිපාලිතයක පාලනය ලබාගත් දින සිට එහි පාලනය නවතින දිනයතෙක් පරිපාලිතයේ ආදායම් සහ වියදම් අස්තිත්වයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කරයි. අත්පත් කරගත් දින ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත් වත්කම් සහ වගකීම්වල වටිනාකම මතපරිපාලිතයේ ආදායම් සහ වියදම් පදනම් වේ. උදාහරණ වශයෙන් අත්පත් කරගත් දිනට පසු ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගත් ක්ෂය වියදම දැක්වෙනුයේ අත්පත් කරගත් දින ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වල හඳුනාගත් සම්බන්ධිත ක්ෂය කළයුතු වත්කම් වල සාධාරණ අගය පදනම් කරගෙනය.

**භව්‍ය ඡන්ද අයිතීන්**

ආ89. භව්‍ය ඡන්ද අයිතිය හෝ භව්‍ය ඡන්ද අයිතිය අඩංගු වෙනත් ව්‍යුත්පන්නන පවතින විට 90 ආ ඡේදය ව්‍යවහාර වන්නේ නම් හැර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී පරිපාලකය සහ පාලනය නොවන හිමිකමට වෙන් කරන ලද ලාභයේ හෝ අලාභයේ සහ ස්කන්ධයේ වෙනස්වීමේ සමානුපාතික කොටස් නිර්ණය කරනුයේ තනිකරම පවතින අයිතීන් හිමිකම පදනම මතවන අතර භව්‍ය ඡන්ද අයිතීන් සහ වෙනත් ව්‍යුත්පන්නන සිදුවියහැකි ක්‍රියාත්මක කිරීමක් හෝ පරිවර්තනයක් පිළිබිඹු නොවේ.

ආ90. ඇතැම් අවස්ථාවල දී, ගනුදෙනුවක ප්‍රතිඵලයක් වශයෙන් හිමිකම් ආශ්‍රිතව එන අයිතියක් ප්‍රතිලාභ ලැබීමට, අස්තිත්වයට මේ අවස්ථාවේ ප්‍රවේශය සලසමින් හරාත්මක වශයෙන් පවතින හිමිකම් අයිතිය අස්තිත්වයකට තිබේ.

එවැනි තත්ත්වයන්හිදී ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී පරිපාලකයට සහ පාලනය නොවන හිමිකමට වෙන්කළ සමානුපාතික කොටස නිර්ණය කරනුයේ එම භව්‍ය ඡන්ද අයිතීන් සහ ප්‍රතිලාභ සඳහා අස්තිත්වයට වර්තමානයේ ප්‍රවේශය ලබාදෙන වෙනත් ව්‍යුත්පන්නන අවසානයේ ක්‍රියාත්මක කිරීම සැලකිල්ලට ගැනීමෙනි.

ආ91. ඒකාබද්ධ කරන ලද පරිපාලිතයේ හිමිකම සඳහා SLFRS 9 ව්‍යවහාර නොවේ. පරිපාලිතයක හිමිකමේ අයිතිය ආශ්‍රිත ප්‍රතිලාභවලට වර්තමානයේ ප්‍රවේශය ලබාදෙන හරයක් වශයෙන් භව්‍ය ඡන්ද අයිතිය සාධන පත්‍රවල අඩංගුවනවිට එම සාධන පත්‍ර SLFRS 9 හි අවශ්‍යතාවයනට යටත් නොවේ. අන්සෑම අවස්ථාවකදීම පරිපාලතයක භව්‍ය ඡන්ද අයිතිය සහිත සාධන පත්‍ර ගිණුම්ගත කරනුයේ SLFRS 9 අනුවය.

**වාර්තා කරන දිනය**

ආ92. පරිපාලකයේ මූල්‍ය ප්‍රකාශණ සහ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සඳහා භාවිතා කළ එහි පරිපාලිත වල මූල්‍ය ප්‍රකාශන සඳහා තිබිය යුත්තේ එකම වාර්තා කරන දිනයකි. පරිපාලිතයේ වාර්තා කරන කාලපරිච්ඡේදයේ අවසානය පරිපාලකයේ එම කාලපරිච්ඡේදයට වඩා වෙනස් නම්, එසේ කිරීම ප්‍රායෝගික නොවන්නේ නම් හැර පරිපාලකයට, පරිපාලිතයේ මූල්‍ය තොරතුරු ඒකාබද්ධ කිරීමේ කාර්යයට හැකියාව ලබාදෙනු පිනිස පරිපාලකයේ මූල්‍ය ප්‍රකාශන හා සමාන දිනට ඒකාබද්ධ කරනයේ අරමුණ සඳහා පරිපාලිතය අතිරේක මූල්‍ය තොරතුරු පිළියෙළ කරයි.

අ93. එසේ කිරීම ප්‍රායෝගික නොවන්නේ නම් පරිපාලකය විසින් පරිපාලිතයේ ඉතාමෑත මූල්‍ය ප්‍රකාශන භාවිතා කර, එම මූල්‍ය ප්‍රකාශන වල දිනය සහ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වල දිනය අතර සිදුවූ වැදගත් ගනුදෙනු සහ සිද්ධීන්ගේ බලපෑම් සඳහා ගැළපුම් කර පරිපාලකයේ මූල්‍ය තොරතුරු ඒකාබද්ධ කරයි. කුමන අවස්ථාවකදී වුවද පරිපාලිතයේ මූල්‍ය ප්‍රකාශන වල දිනය සහ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල දිනය අතර වෙනස මාසතුනකට වඩා වැඩි නොවිය යුතු අතර, වාර්තාකරන කාලපරිච්ඡේදයේ කාලය සහ මූල්‍ය ප්‍රකාශන වන දින අතර වෙනස කාලපරිච්ඡේදයෙන් පරිච්ඡේදයට එකම විය යුතුය.

**පාලනය නොවන හිමිකම්**

ආ94. ලාභ හෝ අලාභ හෝ වෙනත් විස්තීර්ණ ආදායමේ ඇති සෑම සංරචකයක්ම පරිපාලකයේ අයිතිකරුවන්ට සහ පාලනය නොවන හිමිකමට අස්තිත්වය පැවරිය යුතුය. මෙහි ප්‍රතිඵලය පාලනය නොවන හිමිකමේ හිඟ ශේෂයක් තිබුණේ වුවත් සම්පූර්ණ විස්තීර්ණ ආදායම පරිපාලකයේ අයිතිකරුවන් සහ පාලනය නොවන හිමිකමට පැවරිය යුතුය.

අ95. පාලනය නොවන හිමිකම් දරන ස්කන්ධය ලෙස වර්ගීකරණය කරඇති ගෙවීමට තිබෙන සමුච්චිත වරණීය කොටස් පරිපාලිතයකට ඇතිවිට ඒවා සඳහා වන ලාභාංශ ප්‍රකාශ කලා හෝ නොකලා හෝ වුවද එවැනි කොටස් සඳහා වූ ලාභාංශ සඳහා ගැළපීමෙන් පසු එහි ලාභය හෝ අලාභය අස්තිත්වය ගණනය කළ යුතුය.

**පාලනය නොවන හිමිකම් දරණ සමානුපාතික කොටස වෙනස්වීම**

ආ96. පාලනය නොවන හිමිකම් දරන සමානුපාතික ඒකක කොටස වෙනස් වූවිට පරිපාලිතයේ ඔවුන්ගේ සාපේක්ෂ හිමිකමේ වෙනස්වීම පිළිබිඹු වීමට අස්තිත්වය විසින් පාලනය සහ පාලනය නොවන හිමිකම්වල ධාරණ අගය ගැලපිය යුතුය. පාලනය නොවන හිමිකම සඳහා ගැළපුම් කාල වටිනාකම සහ සාධාරණ අගයේ ප්‍රතිෂ්ඨාව සඳහා ගෙවූ හෝ ලැබූ සහ පරිපාලකයේ හිමිකරුවනට පැවරූ වටිනාකම අතර වෙනස අස්තිත්වය විසින් ඍජුව එකවර හඳුනාගත යුතුය.

**පාලනය අහිමිවීම**

ආ97. දෙකක් හෝ ඊට වැඩි එකඟවීම් (ගනුදෙනු වලින්) පරිපාලිතයක පාලනය පරිපාලකයකට අහිමි වියහැකිය. කෙසේ වෙතත් බහු ආංශික එකඟ වීම් තනි ගනුදෙනුවක් වශයෙන් ගිණුම් ගතකළ යුතුයයි සමහර තත්ත්වයන් හිදී ඇඟ වේ. එකඟවීම් සඳහා තනි ගනුදෙනුවක් වශයෙන් ගිණුම්ගත කළයුතු දැයි නිර්ණය කිරීමේදී පරිපාලකය එකඟවීම් වල නියමයන් සහ කොන්දේසි සහ ඒවායේ ආර්ථික බලපෑම් සලකා බැලිය යුතුය. පරිපාලකය බහුඅංගික එකඟවීම් තනි ගනුදෙනුවක් වශයෙන් ගිණුම්ගත කළ යුතු යැයි පහත සඳහන් ඒවායින් එකකින් හෝ වැඩි ගණනකින් ඇඟ වේ.

(අ) ඒවාට ඇතුළත් වී ඇත්තේ එකම වේලාවේ හෝ එකිනෙකා කල්පනා කර බලාය.
(ආ) සමස්ථ වාණිජ බලපෑම අත්කර ගැනීමට ඔවුන් තනි ආකාරයේ ගනුදෙනුවක් සැලසුම් කිරීම.
(ඇ) එක එකඟවීමක් සිදුවීම රඳා පවත්නේ අවුතරමින් වෙනත් එක එකඟවීමක් සිදුවීම මතය.
(ඈ) එක් එකඟවීමක් එහි ස්වකීය ලෙස සැලකීමේදී ආර්ථිකව සාධාරණීය කළ නොහැකිවූත්, වෙනත් එකඟවීම් සමඟ එක්ව සලකා බලනවිට ආර්ථිකව සාධාරණීයකරණය වේ.

උදාහරණයක් ලෙස කොටස් බැහැර කිරීමක් වෙළඳපළ මිලට අඩුවෙන් මිලකර ඇතිවිටෙක පසුව ඒවා බැහැර කිරීමේදී වෙළඳපොළ මිලට වැඩියෙන් මිලකර හානිපූර්ණය කිරීම.

ආ98. පරිපාලකයට පරිපාලිතයක පාලනය අහිමිවුවහොත් එය

(අ) පාලනය අහිමිවූ විට එම දිනට පරිපාලිතයේ ඒවායේ ධාරණ අගයට,

(i) වත්කම් (යම් කීර්තිනාමයක් වෙතොත් එය ඇතුළුව) සහ වගකීම් සහ

(ii) පාලනය අහිමිවූ විට එම දිනට කලින් පරිපාලිතයේ පාලනය නොවන හිමිකම්වල ධාරණ අගය (වෙනත් විස්තීර්ණ ආදායමේ ඔවුන්ට පැවරූ යම් සංරචකයන්ද ඇතුළුව)

(ආ) හඳුනාගැනීම ඉවත් කළ යුතුය.

(i) පාලනය අහිමිවීමෙන් ප්‍රතිඵලයක් වන ගනුදෙනුවෙන් සිද්ධියන් හෝ තත්ත්වයන්ගෙන් ලැබුන සාධාරණ අගය ප්‍රතිෂ්ඨාව කිසිවක් වේනම් ;

(ii) පාලනය අහිමිවීමේ ප්‍රතිඵලයක් වන, ගනුදෙනුව, සිද්ධියන් හෝ තත්ත්වයන් අයිතිකරුවන්ගේ තරාතිරමෙන් පරිපාලිතයන් කොටස් බෙදාහැරීමක් අයිතිකරුවකුට සහභාගිවන්නන් එම බෙදාහැරීම, සහ

(iii) පාලනය අහිමිවන වනවිට කලින් පරිපාලිතයේ රඳවාගත් යම් ආයෝජනයක පාලන අහිමිවන දින ඒවායේ සාධාරණ අගයට හඳුනාගත යුතුය.

(ඇ) ආ99 ඡේදයේ විස්තර කර ඇති පදනම මත පරිපාලිතය හා සම්බන්ධිත වෙනත් විස්තීර්ණ ආදායමේ හඳුනාගත් වටිනාකම් අන් SLFRSs වලින් අවශ්‍ය කරන්නේ නම් ලාභ හෝ අලාභවලට යළි වර්ගීකරණය කිරීම හෝ ඍජුව රඳවාගත් ඉපයීම් වලට මාරු කිරීම

(ඈ) ප්‍රතිඵලයක් මත යම් වෙනසක් ප්‍රතිලාභයක් හෝ අලාභයක් ලෙස ලාභ හෝ අලාභ පරිපාලිතයට කරන පැවරුමින් ලෙස හඳුනාගැනීම.

ආ99. පරිපාලකයකට පරිපාලිතයේ පාලනය අහිමි වන්නේ නම් එම පරිපාලිතයේ සම්බන්ධිත වෙනත් විස්තීර්ණ ආදායම්වල පෙරදී හඳුනාගත් සියලු වටිනාකම් පරිපාලකය සම්බන්ධයෙන් වත්කම් සහ වගකීම් සෘජුව බැහැර කළේ නම් හා සමාන පදනමක් මත පරිපාලකය ගිණුම්ගත කළ යුතුය. එමනිසා වෙනත් විස්තීර්ණ ආදායම්වල ඇති ප්‍රතිලාභ හෝ අලාභ සම්බන්ධිත වත්කම් හෝ වගකීම් බැහැර කිරීම මත ලාභ හෝ අලාභ යළි වර්ගීකරණය අතර, පරිපාලිතයේ පාලනය අහිමිවූවිට පරිපාලකය ප්‍රතිලාභ හෝ අලාභ ස්කන්ධයෙන් ලාභ හෝ අලාභ වලට යළි වර්ගීකරණය කළ යුතුය. (යළි වර්ගීකරණය කිරීමේ ගැලපුමක් ලෙස), වෙනත් විස්තීර්ණ ආදායම්වල පෙරදී හඳුනාගත් ප්‍රත්‍යාගණන අතිරික්තයක් වේනම් වත්කම් බැහැර කිරීමක් සමග එය කෙලින්ම රඳවාගත් ඉපයීම්වලට මාරු කළ පරිපාලකයකට පරිපාලිතයේ පාලනය අහිමිවූ විට ප්‍රත්‍යාගණන අතිරික්තය කෙලින්ම රඳවාගත් ඉපයීම් වලට මාරු යුතුය.

අවශ්‍යකරන ඒ කලින් හඳුනාගත් කළයුතු වන යුතුය. කළ

**ආයෝජන අස්තිත්ව තත්ත්වය වෙනස්වීම සඳහා ගිණුම්කරණය**

ආ100. අස්තිත්වයකට ආයෝජන අස්තිත්ව තත්ත්වය අවසන් වනවිට 31වන ඡේදය ප්‍රකාරව ලාභාලාභ හරහා සාධාරණ අගයට මීට පෙර මනිනු ලැබූ ඕනෑම පරිපාලිතයක් සඳහා අස්තිත්වය SLFRS 3 ව්‍යවහාර කළ යුතුය. තත්ත්වය වෙනස්වූ දිනය අත්පත් ගත් දිනය ලෙස සැලකිය හැකිය. අත්පත් කරගන්නේ යයි සැලකෙන දින පරිපාලිතයේ සාධාරන අගය, සැලකෙන කර ගැනීමක දී පැන නගින කේවල් කිරීමේ මිලදී ගැනීමකදී මණිනු යම් කීර්තිනාමයක් හෝ ප්‍රතිලාභයක් පැවරූ ප්‍රතිෂ්ඨාව නියෝජනය කළ යුතුය. තත්ත්වය වෙනස් වූ දින සිට සියලුම පරිපාලිත මෙම SLFRS 19 – 24 ඡේද ප්‍රකාරව ඒකාබද්ධ කළ යුතුය.

කර අත්පත් සැලකෙන

ආ101. 32 වන ඡේදය ප්‍රකාරව අඛණ්ඩව ඒකාබද්ධ කළ යුතු යම් පරිපාලිතයක් හැර අස්තිත්වයක් ආයෝජන අස්තිත්වයක් බවට පත්වන විට තත්ත්වය වෙනස් වන දින සිට එය පරිපාලිත ඒකාබද්ධ කිරීම අවසන් කළ යුතුය. එම දිනයේදී එම පරිපාලිතයන්හි පාලනය ආයෝජන අස්තිත්වය අහිමිවූ නමුදු ඒකාබද්ධ කිරීම නතර කළ එම පරිපාලිතවලට 25 සහ 26 ඡේදවල අවශ්‍යතාවයන් ආයෝජන අස්තිත්වය ව්‍යවහාර කළ යුතුය.

**ඇ. පරිශිෂ්ඨය**

**බලාත්මක දිනය සහ සංක්‍රාන්තිය**

*මෙම පරිශිෂ්ඨය මෙම SLFRS හි අත්‍යවශ්‍ය කොටසක් වන අතර වෙනත් SLFRS කොටස් වලට ඇති හා සමාන අධිකාරියක් මෙහිද ඇත.*

**බලාත්මක වන දිනය**

ඇ. 2014 ජනවාරි 1 වන දිනින් ආරම්භවන වාර්ෂික කාලපරිච්ඡේද සඳහා අස්තිත්වයක් මෙම SLFRS ව්‍යවහාර කල යුතුය. ඊට පෙර ව්‍යවහාරකරණයට අවසර ඇත. අස්තිත්වයන් මෙම SLFRS කලින් ව්‍යාවහාර කරන්නේ නම් ඒ කරුණ හෙලිදරව් කර SLFRS 11, SLFRS 12, *වෙන් වූ මූල්‍ය ප්‍රකාශන* LKAS 27 සහ LKAS 28 ද එම කාලයේදීම (ඒ සමගම) ව්‍යවහාර කල යුතුය.

ඇ1අ ( ඉවත් කරන ලදී)

ඇ1ආ (ඉවත් කරන ලදී)

**සංක්‍රාන්තිය**

ඇ2. ඇ2අ - ඇ ඡේදයන්හි විශේෂයෙන්ම සඳහන් කර ඇති පරිදි හැර LKAS - 8 *ගිණුම ප්‍රතිපත්තීන්, ගිණුම් ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි* අනුව අස්තිත්වයක් මෙම SLFRS අතීතයට බලපාන පරිදි ව්‍යාවහාර කළ යුතුය.

ඇ2අ LKAS 8 හි 28 වන ඡේදයේ අවශ්‍යතාවයන් එසේ වුවත් මෙම SLFRS ප්‍රථමවරට ව්‍යවහාර කරනවිට සහ පසුව *ආයෝජන අස්තිත්වයන්හි* සංශෝධිත මෙම SLFRS ප්‍රථම වරට ව්‍යවහාර කරනවිට, අස්තිත්වය විසින් ඉදිරිපත් කිරීමට අවශ්‍ය කරනුයේ, මෙම SLFRS ("*වහාම වන පූර්වගාමී කාලපරිච්ඡේදය*") ආරම්භක භාවිත කරන දිනට වහාම පූර්වගාමී කාලපරිච්ඡේදය සඳහා LKAS 8 හි 28 (ඊ) ඡේදයෙන් අවශ්‍ය කරන ප්‍රමාණාත්මක තොරතුරු පමණි. අස්තිත්වයක් විසින් මෙම තොරතුරු ප්‍රවර්තන කාලපරිච්ඡේදය හෝ කලින් සංසන්දනාත්මක කාලපරිච්ඡේද සඳහා ද ඉදිරිපත් කළහැකිය. එහෙත් එසේ කිරීම අවශ්‍ය නොවේ.

ඇ2ආ මෙම SLFRS හි අරමුණු සඳහා ආරම්භක ව්‍යවහාර කරන දිනය වනුයේ මෙම SLFRS ප්‍රථම වරට ව්‍යවහාර කරන වාර්ෂික වාර්තාකරන කාලපරිච්ඡේදයේ ආරම්භයයි.

ඇ3 ආරම්භක ව්‍යවහාරකරන දිනයේදී අස්තිත්වය විසින් සිය සහභාගිත්වය සඳහා එක්කෝ

(අ) LKAS 27 *ඒකාබද්ධ සහ වෙන්වූ මූල්‍ය ප්‍රකාශන* සහ SIC - 12 *ඒකාබද්ධකරණය - විශේෂිත අරමුණු අස්තිත්වයේ* ප්‍රකාරව එමදින ඒකාබද්ධ කළයුතු අස්තිත්වයන් සහ මෙම SLFRS ප්‍රකාරව තවදුරටත් ඒකාබද්ධ කළයුතු වීම සමග ; හෝ

(ආ) LKAS 27 සහ SIC 12 ප්‍රකාරව එමදින ඒකාබද්ධ නොකළ යුතු සහ මෙම SLFRS ප්‍රකාරව තවදුරටත් ඒකාබද්ධ නොකළ යුතු අස්තිත්ව ඒවායේ කලින් ගිණුම්කරණයට ගැළපුම් කිරීම අවශ්‍ය නොවේ.

ඇ3අ ආරම්භක ව්‍යවහාර කරන දිනදී පැවති කරුණු සහ තත්ත්වයන් පදනම මත එය ආයෝජන අස්තිත්වයක්ද යන්න අස්තිත්වය තක්සේරු කළ යුතුය. ආරම්භක ව්‍යවහාර කරන දිනදී, එය ආයෝජන අස්තිත්වයක් යයි අස්තිත්වය නිගමනය කරන්නේ නම් එය ඇ5 - ඇ5අ ඡේදවල අවශ්‍යතාවයන් වෙනුවට ඇ3ආ - ඇ3ඊ ඡේදවල අවශ්‍යතාවයන් ව්‍යවහාර කළයුතුය.

ඇ3ආ මෙම SLFRS හි අවශ්‍යතාවයන් සැමවිටම බලාත්මකව පැවතියේ නම් 32 වන ඡේදය ප්‍රකාරව (ඇ3 සහ ඇ6 ඡේද හෝ ඇ4 - ඇ4ඇ ඡේද අදාළ වන කුමක් හෝ ව්‍යවහාර කළයුතු) ඒකාබද්ධකරන ලද යම් පරිපාලිතයක් හැර ආයෝජන අස්තිත්වයක් සැම පරිපාලිතයක එහි ආයෝජනයන් ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයට මැණිය යුතුය. ආරම්භක ව්‍යවහාර කරන දිනයට වහාම කලින් වන වාර්ෂික කාලපරිච්ඡේදය සහ වහාම වන පූර්වගාමී කාලපරිච්ඡේදය ආරම්භයේ ඇති ස්කන්ධය යන දෙකම සඳහා පහත සඳහන් වටිනාකම් අතර යම් වෙනසක් අතීතයට බලපාන අයුරින් ආයෝජන අස්තිත්වය ගැළපිය යුතුය.

(අ) පරිපාලිතයේ කලින් වූ ධාරන වටිනාකම ; සහ

(ආ) පරිපාලිතයේ වන ආයෝජන අස්තිත්වයේ ආයෝජනවල සාධාරණ අගය.

වෙනත් විස්තීර්ණ ආදායම තුළවන කලින් හඳුනාගත් යම් සාධාරණ අගය ගැළපුම් වල සමුච්චිත වටිනාකම, ආරම්භක ව්‍යවහාර කරන දිනට වහාම පූර්වගාමී වාර්ෂික කාලපරිච්ඡේදය ආරම්භයේ ඇති රඳවාගත් ඉපයීම් වලට මාරු කළ යුතුය.

ඇ3ඇ තක්සේරු කළදින අතේදුරින් සිදුවූ ගනුදෙනුවකදී දැනුමැති හා කැමැත්ත ඇති පාර්ශ්වයන් අතර ආයෝජනය හුවමාරුවීම සඳහා වියහැකි වටිනාකම, එම වටිනාකම් නියෝජනය කරන්නේ නම්, SLFR 13 *සාධාරණ අගය මැනීම* භාවිත කිරීමට පෙරදින ආයෝජන අස්තිත්වයක් ආයෝජකයන් වෙත හෝ කළමනාකාරිත්වය වෙත කලින් වාර්තා කරන ලද සාධාරන අගය වටිනාකම් භාවිතා කළ යුතුය.

ඇ3ඈ ඇ3ආ - ඇ3ඇ ඡේද ප්‍රකාරව පරිපාලිතයක ආයෝජන මැනීම ප්‍රායෝගික නොවන්නේ නම් (LKAS 8 හි නිර්වචනය කර ඇති පරිදි) ආයෝජන අස්තිත්වයේ ඇ3ආ - ඇ3ඇ ඡේද ව්‍යවහාර කිරීම ප්‍රායෝගික වන පෙරතම කාල පරිච්ඡේදයේ ආරම්භයේ සිට මෙම SLFRS හි අවශ්‍යතාවයන් ව්‍යවහාර කළ යුතුය. එය ප්‍රවර්තන කාලපරිච්ඡේදය විය හැකිය. මෙම ඡේදය ව්‍යවහාරකරණය ප්‍රායෝගික වන ප්‍රවර්තන කාලපරිච්ඡේදය පෙරතම කාලපරිච්ඡේදයේ ආරම්භය වන්නේ නම් හැර, ආයෝජක විසින් ආරම්භක ව්‍යවහාර කරන දිනට වහාම පූර්වගාමී වාර්ෂික කාලපරිච්ඡේදය අතීතයට බලපාන ලෙස ගැලපිය යුතුය. අවස්ථාව මෙයනම් ස්කන්ධයට වන ගැලපුම ප්‍රවර්තන කාලපරිච්ඡේදයේ ආරම්භයේ සිට හඳුනාගත යුතුය.

ඇ3ඉ මෙම SLFRS ය මුල් ව්‍යවහාර කරන දිනයට පෙර, පරිපාලිතයක ආයෝජනයක්, ආයෝජන අස්තිත්වය විසින් බැහැර කර හෝ පාලනය අහිමි වී ඇත්නම්, ආයෝජන අස්තිත්වය එම පරිපාලිතය සඳහා පෙරකල ගිණුම්කරණයට ගැලපීම් කිරීම අවශ්‍ය නොවේ.

ඇ3ඊ SLFRS 10 ප්‍රථම වතාවට ව්‍යවහාර කරන අවස්ථාවට පසුව වන කාලපරිච්ඡේදයන් සඳහා අස්තිත්වය *ආයෝජන අස්තිත්වයන්හි* සංශෝධනය ව්‍යවහාර කරන්නේ නම් ඇ3අ - ඇ3ඉ ඡේදවල 'මුල් ව්‍යවහාරකරන දිනය' පිළිබඳ යොමුවීම් කියවිය යුත්තේ *ආයෝජන අස්තිත්වයන්හි* සංශෝධන ප්‍රථම වතාවට ව්‍යවහාර කරන වාර්ෂික වාර්තාකරන කාලපරිච්ඡේදයේ ආරම්භය ලෙසය.

ඇ4 LKAS 27 සහ SIC 12 ප්‍රකාරව ඒකාබද්ධ නොකළ ආයෝජිතයෙක් එය ඒකාබද්ධ කළ යුතුයැයි මුල් ව්‍යවහාර කරන දින ආයෝජකයෙක් නිගමනය කරන්නේ නම් ආයෝජක විසින්,

(අ) ආයෝජිතයා ව්‍යාපාරයක් නම් (SLFRS 3 ව්‍යාපාර සංයෝජනයන්හි නිර්වචනය කර ඇති පරිදි) මෙම SLFRS හි අවශ්‍යතාවයන්ගේ පදනම මත එම ආයෝජිතයාගේ පාලනය ආයෝජකයා ලබාගත් අවස්ථාවේ දින සිට එම ආයෝජිතයා ඒකාබද්ධ කළේ යයි සලකා (SLFRS 3 ප්‍රකාරව අත්පත් කරගැනීමේ ගිණුම්කරණය ව්‍යවහාර කර ඇතැයි යන්න අනුව) කලින් ඒකාබද්ධ නොකළ ආයෝජිතයාගේ වත්කම් වගකීම් සහ පාලනය නොවන හිමිකම් මැනීම. ආයෝජකයා විසින් ආරම්භක ව්‍යවහාර කරන දිනට වහාම පූර්වගාමී වාර්ෂික කාලපරිච්ඡේදය අතීතයට බලපාන ලෙස ගැලපිය යුතුය. එම පාලනය ලබාගන්නා දිනය වහාම පූර්වගාමී කාලපරිච්ඡේදයේ ආරම්භයට වඩා පෙර වූ දිනයක් වනවිට පහත සඳහන් වටිනාකම්වල වෙනස වහාම පූර්වගාමී කාලපරිච්ඡේද ආරම්භයේ ඇති ස්කන්ධයට ගැලපුමක් ලෙස ආයෝජක හඳුනාගත යුතුය.

(i) හඳුනාගත් වත්කම්, වගකීම් සහ පාලනය නොවන හිමිකමේ අයිතියේ වටිනාකම ; සහ

(ii) ආයෝජිත සමග ආයෝජකගේ සහභාගිත්වයේ කලින් වූ ධාරණ වටිනාකම

(ආ) ආයෝජිතයා ව්‍යාපාරයක් නොවේ නම් (SLFRS 3හි නිර්වචනය කර ඇති ලෙස) මෙම SLFRS හි අවශ්‍යතාවයන්ගේ පදනම මත එම ආයෝජිතයාගේ පාලනය ආයෝජකයා ලබාගත් අවස්ථාවේ දින සිට එම ආයෝජිතයා ඒකාබද්ධ කලේ යයි සලකා (ආයෝජිත සඳහා යම් කීර්තිනාමයක් හඳුනාගැනීමෙන් තොරව එහෙත් SLFRS 3 හි විස්තර කර ඇති අත්පත් කර ගැනීමේ ක්‍රමය ව්‍යවහාර කරමින්) කලින් ඒකාබද්ධ නොකළ ආයෝජිතයාගේ වත්කම් වගකීම් සහ පාලනය නොවන හිමිකම් මැනීම.

ආයෝජකයා විසින් ආරම්භක ව්‍යවහාර කරන දිනට වහාම පූර්වගාමී වාර්ෂික කාලපරිච්ඡේදය අතීතයට බලපාන ලෙස ගැලපිය යුතුය. එම පාලනය ලබාගන්නා දිනය වහාම පූර්වගාමී කාලපරිච්ඡේදයේ ආරම්භයට වඩා පෙර වූ දිනයක් වනවිට පහත සඳහන් වටිනාකම්වල වෙනස වහාම පූර්වගාමී කාලපරිච්ඡේදය ආරම්භයේ ඇති ස්කන්ධයට ගැලපුමක් ලෙස ආයෝජක හඳුනාගත යුතුය.

(i) හඳුනාගත් වත්කම්, වගකීම් සහ පාලනය නොවන හිමිකමේ අයිතියේ වටිනාකම ; සහ

(ii) ආයෝජිත සමග ආයෝජකගේ සහභාගිත්වයේ කලින් වූ ධාරන වටිනාකම

ඇ4අ ඇ4 (අ) හෝ (ආ) ඡේද ප්‍රකාරව ආයෝජකයකුගේ වත්කම්, වගකීම් සහ පාලනය නොවන හිමිකම් මැණීම ප්‍රායෝගික නොවන්නේ නම් (LKAS 8 හි නිර්වචනය කර ඇති පරිදි) ආයෝජක විසින් ;

(අ) ආයෝජිතයා ව්‍යාපරයක් නම් අත්පත් කරගත්තා යැයි සැලකෙන දින සිට SLFRS 3 හි අවශ්‍යතාවයන් ව්‍යවහාර කිරීම අත්පත් කරගත්තා යැයි සැලකෙන දිනය විය යුත්තේ ඇ 4 (අ) ඡේදය ව්‍යවහාරකරනය සඳහා ප්‍රායෝගිකවන පෙරතම කාලපරිච්ඡේදයේ ආරම්භයයි. එය ප්‍රවර්තන කාලපරිච්ඡේදය විය හැකිය.

(ආ) ආයෝජිතයා ව්‍යාපාරයක් නොවේ නම් අත්පත් කරගත්තේ යැයි සැලකෙන දින ආයෝජිත සඳහා යම් කීර්තිනාමයක් හඳුනා නොගනිමින්, SLFRS 3 හි විස්තර කර ඇති පරිදි අත්පත් කරගැනීමේ ක්‍රමය ව්‍යවහාර කිරීම, අත්පත් කරගත්තා යැයි සැලකෙන දිනය විය යුත්තේ ඇ4 (ආ) ඡේදය ව්‍යවහාරකරණය සඳහා ප්‍රායෝගිකවන පෙරතම කාලපරිච්ඡේදයේ ආරම්භයයි. එය ප්‍රවර්තන කාලපරිච්ඡේදය වියහැකිය. මෙම ඡේදය ව්‍යවහාරකරණය ප්‍රායෝගික වන ප්‍රවර්තන කාලපරිච්ඡේදය පෙරතම වූ කාල පරිච්ඡේදයේ ආරම්භය වන්නේ නම් හැර ආයෝජක විසින් ආරම්භක ව්‍යවහාර කරන දිනට වහාම පූර්වගාමී වන වාර්ෂික කාලපරිච්ඡේදය අතීතයට බලපාන අයුරු ගැලපිය යුතුය. එම අත්පත් කරගත්තා යැයි සැලකෙන දිනය වහාම පූර්වගාමී කාලපරිච්ඡේදයට වඩා පෙර වූ දිනයක් වනවිට පහත සඳහන් වටිනාකම් වල වෙනස වහාම පූර්වගාමී කාලපරිච්ඡේදය ආරම්භයේ ඇති ස්කන්ධයට ගැලපුමක් ලෙස ආයෝජක හඳුනාගත යුතුය.

(ඇ) හඳුනාගත් වත්කම් වගකීම් සහ පාලනය නොවන හිමිකමේ අයිතියේ වටිනාකම ; සහ

(ඈ) ආයෝජිත සමග ආයෝජකගේ සහභාගිත්වයේ කලින් වූ ධාරන වටිනාකම,

මෙම ඡේදය ව්‍යවහාරකරනය සඳහා ප්‍රායෝගික වන පෙරතම කාල පරිච්ඡේදය වර්තමාන කාලපරිච්ඡේදය නම් ස්කන්ධය සඳහා ගැලපුම ප්‍රවර්තන කාලපරිච්ඡ්දය ආරම්භයේදී හඳුනාගත යුතුය.

ඇ4ආ ආයෝජකයෙක් ඇ4 - ඇ4උ ඡේද ව්‍යවහාර කරනවිට සහ මෙම SLFRS ප්‍රකාරව එම පාලනය අත්පත් කරගත්තේ SLFRS 3 බලාත්මක වූ දිනට වඩා පසු දිනක නම් ඇ4 සහ ඇ4අ ඡේදවල SLFRS 3 වෙත කර ඇති යොමුකිරීම විය යුත්තේ SLFRS 3 වෙත ලෙසය.

ඇ4ඇ ආයෝජකයෙක් ඇ4 සහ ඇ4අ ඡේද ව්‍යවහාර කරනවිට සහ මෙම SLFRS ප්‍රකාරව එම පාලනය ලබාගත් දිනය LKAS 27 බලාත්මක වූ දිනට පසුව නම් ආයෝජිතයා විසින් ඇ4 - ඇ4අ ඡේද ප්‍රකාරව අතීතයට බලපාන ලෙස ඒකාබද්ධ කල සියලු කාලපරිච්ඡේද සඳහා මෙම SLFRS හි අවශ්‍යතාවයන් ආයෝජකයෙක් ව්‍යවහාර කළ යුතුය.

ඇ5 LKAS 27 සහ SIC 12 ප්‍රකාරව ඒකාබද්ධ ආයෝජිතයෙක් ආයෝජකයා විසින් තවදුරටත් ඒකාබද්ධ නොකරන බව ආරම්භක ව්‍යවහාර කරන දිනදී ආයෝජක නිගමනය කරන්නේ නම්, ආයෝජිතයා තුළවන, ආයෝජකගේ සිය හිමිකම් මැනිය යුත්තේ ආයෝජකයා ආයෝජිත සමග සහභාගීවීම (එහෙත් මෙම SLFRS ප්‍රකාරව පාලනය ලබා නොගත්) හෝ පාලනය අහිමිවීම වූ අවස්ථාවේ මෙම SLFRS හි අවශ්‍යතාවයන් බලාත්මක වුණි නම් මැනිය යුතු වටිනාකමටය. ආයෝජකයා විසින් ආරම්භක ව්‍යවහාර කරන දිනට වහාම පූර්වගාමී වාර්ෂික කාලපරිච්ඡේදය අතීතයට බලපාන ලෙස ගැලපිය යුතුය. ආයෝජකයා ආයෝජිත සමග සහභාගී වූ (එහෙත් මෙම SLFRS ප්‍රකාරව පාලනය ලබා නොගත්) හෝ පාලනය අහිමි වූ අවස්ථාවේ දිනය වහාම පූර්වගාමී කාලපරිච්ඡේදයට වඩා පෙර වූ දිනයක් වනවිට පහත සඳහන් වටිනාකම් වල වෙනස වහාම පූර්වගාමී කාලපරිච්ඡේදය ආරම්භයේ ඇති ස්කන්ධයට ගැලපුමක් ලෙස ආයෝජක හඳුනාගත යුතුය.

(අ) ආයෝජිත සමග ආයෝජකගේ සහභාගිත්වයේ කලින් වූ ධාරන වටිනාකම, සහ

(ආ) ආයෝජිතගේ, ආයෝජකයාගේ හිමිකමේ හඳුනාගත් වටිනාකම

ඇ5අ ඇ5 ඡේදය ප්‍රකාරව ආයෝජිතයාගේ අයිතිය මැනීම ප්‍රායෝගික නොවන්නේ නම් (LKAS 8 හි නිර්වචනය කර ඇති පරිදි) ආයෝජකයෙක් ඇ5 ඡේදය ව්‍යවහාර කිරීම ප්‍රයෝගික වන පෙරතම කාල පරිච්ඡේදයේ ආරම්භයේ සිට මෙම SLFRS හි අවශ්‍යතාවයන් ව්‍යවහාර කළ යුතුය. එය ප්‍රවර්තන කාලපරිච්ඡේදය විය හැකිය. මෙම ඡේදය ව්‍යවහාර කරන ප්‍රයෝගික වන ප්‍රවර්තන කාලපරිච්ඡේදය පෙරතම කාලපරිච්ඡේදයේ ආරම්භය වන්නේ නම් හැර ආයෝජක විසින් ආරම්භක ව්‍යවහාර කරන දිනට වහාම පූර්වගාමී වර්ෂික කාලපරිච්ඡේදය අතීතයට බලපාන ලෙස ගැලපිය යුතුය. ආයෝජකයා, ආයෝජිත සමග සහභාගීවීම (එහෙත් මෙම SLFRS ප්‍රකාරව පාලනය ලබා නොගත්) හෝ පාලනය අහිමි වූ අවස්ථාවේ දිනය වහාම පූර්වගාමී කාලපරිච්ඡේදයට වඩා පෙර වූ දිනයක් වනවිට පහත සඳහන් වටිනාකම් වල වෙනස වහාම පූර්වගාමී කාලපරිච්ඡේදය ආරම්භයේ ඇති ස්කන්ධයට ගැලපුමක් ලෙස ආයෝජක හඳුනාගත යුතුය.

(අ) වත්කම්, වගකීම් සහ පාලනය නොවන හිමිකම්වල පෙර වූ ධාරන වටිනාකම් ; සහ

(ආ) ආයෝජිතගේ, ආයෝජකයාගේ හිමිකමේ හඳුනාගත් වටිනාකම

මෙම ඡේදයේ ව්‍යවහාරකරණය සඳහා ප්‍රයෝගික වන පෙරතම කාලපරිච්ඡේදය වර්තමාන කාලපරිච්ඡේදය නම් ස්කන්ධය සඳහා ගැලපුම ප්‍රවර්තන කාලපරිච්ඡේදය ආරම්භයේ හඳුනාගත යුතුය.

ඇ6 23, 25, ආ94 සහ ආ96 - ආ99 ඡේද LKAS 27 ට කරන ලද සංශෝධන වන අතර ඒවා SLFRS 10 වෙත ඉදිරියට ගෙන ගොස් ඇත. අස්තිත්වය ඇ3 ඡේදය ව්‍යවහාර කරනවිටදී හෝ එය ඇ4 - ඇ5අ ඡේද ව්‍යවහාරකරණය කිරීම අවශ්‍යකරන විටකදී හැර අස්තිත්වය විසින් එම ඡේදවල අවශ්‍යතාවයන් පහත දක්වෙන පරිදි ව්‍යවහාර කළ යුතුය.

(අ) ආ94 ඡේදයේ සංශෝධන ප්‍රථමවරට ව්‍යවහාර කිරීමට පෙර අස්තිත්වයක් වාර්තාකරන කාලපරිච්ඡේද සඳහා ලාභ හෝ අලාභ පැවරීමක් නැවත ප්‍රකාශ නොකළ යුතුය.

(ආ) පාලනය ලබාගත් පසු පරිපාලිතයක අයිතියේ හිමිකම වෙනස්වීම ගිණුම්කරණය සඳහා 23 සහ ආ96 ඡේදවල අවශ්‍යතාවයන්, අස්තිත්වයක් මෙම සංශෝධන ප්‍රථමවරට ව්‍යවහාර කිරීමට පෙර සිදුවූ වෙනස්කම්වලට ව්‍යවහාර නොවේ.

(ඇ) 25 සහ 97ආ - 99ආ ඡේදවල සංශෝධන එය ප්‍රථමවරට ව්‍යවහාර කිරීමට පෙර පාලනය අහිමි වූවොත් අස්තිත්වය කලින් පරිපාලිතයේ වන ආයෝජනයේ ධාරන අගය නැවත ප්‍රකාශ නොකළ යුතුය. 25 සහ 97අ - 99ආ ඡේදවල සංශෝධන එය ප්‍රථමවරට ව්‍යවහාර කිරීමට පෙර පරිපාලිතයක පාලනය අහිමිවීම මතවන යම් ප්‍රතිලාභයක් හෝ අලාභයක් අස්තිත්වය විසින් යළි ගණනය නොකළ යුතුය.

**''වහාම පූර්වගාමී කාලපරිච්ඡේදය" වෙත යොමුකිරීම්**

ඇ6අ ඇ3 ආ - ඇ5අ ඡේදවල ආරම්භක ව්‍යවහාර කරන දින (වහාම වන පූර්වගාමී කාලපරිච්ඡේදය) වහාම වන පූර්වගාමී වාර්ෂික කාලපරිච්ඡේදයට යොමුකිරීම් කලා වුවත්, අස්තිත්වයක් කලින් ඉදිරිපත් කළ ඕනෑම කාල පරිච්ඡේදයක් සඳහා ගලපන ලද තුළනාත්මක තොරතුරු ඉදිරිපත් කිරීම ද කළ හැකිය. එහෙත් එසේ කිරීම අවශ්‍ය නොවේ. යම් කාල පරිච්චේදයක් සඳහා අස්තිත්වය ගලපන ලද තුලනාත්මක තොරතුරු ඉදිරිපත් කරන්නේ නම් ඇ3ආ - ඇ5අ ඡේදවල "වහාම වන පූර්වගාමී කාලපරිච්ඡේදය" යන්නට වන සියලුම යොමුකිරීම් "ඉදිරිපත් කරන ලද පෙරතම ගලපන ලද තුලනාත්මක කාල පරිච්ඡේදය" ලෙස කියවිය යුතුය.

ඇ6ආ යම් පෙර කාලපරිච්ඡේදයක් සඳහා නොගලපන ලද තුලනාත්මක තොරතුරු අස්තිත්වයක් ඉදිරිපත් කරන්නේ නම් එම තොරතුරු ගලපනු නොලැබූ ඒවා ලෙස පැහැදිලිව හඳුනාගත යුතු අතර ඒවා වෙනස් පදනමක් මත පිළියෙළ කර ඇති බව සඳහන් කර එම පදනම පැහැදිලි කිරීම.

**SLFR 9 ට යොමු කිරීම**

ඇ7. යම් අස්තිත්තවයක් මෙම SLFRS ව්‍යවහාර කර එහෙත් තවමත් SLFRS 9 ව්‍යවහාර නොකරන්නේ නම්, මෙම SLFRS හී ඇති ඕනෑම යොමුවක් කියවියයුත්තේ LKAS 39 *මූල්‍ය සාධන පත්‍ර හඳුනාගැනීම සහ මැනීමට* වන යොමුවක් ලෙසය.

**අනෙක් SLFRS අස්කර ගැනීම**

ඇ8. මෙම SLFRS, LKAS 27 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධ අවශ්‍යතා අවලංගු වේ/(අභිභවා යයි).

ඇ9. මෙම SLFRS මඟින් SIC 12 ඒකාබද්ධකරණය - විශේෂ අරමුණු අස්තිත්වයන්ද අවලංගු වේ (අභිභවායයි).

**ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත**

**SLFRS 11**

**බද්ධ සැකසුම්/පිළිවෙල**

SLFRS 11

පටුන


| | |
|---|---|
| **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - SLFRS 11** | ඡේද |
| *බද්ධ සැකසුම්* | |
| **අරමුණ** | |
| **විෂය පථය** | 1-2 |
| **බද්ධ සැකසුම්** | 3 |
| බද්ධ පාලනය | 4-19 |
| බද්ධ සැකසුම් වර්ග | 7-13 |
| **බද්ධ සැකසුමක පාර්ශවයන්ට ආදාලවූ මූල්‍ය ප්‍රකාශන** | 20-25 |
| බද්ධ මෙහෙයුම් | 20-23 |
| බද්ධ ව්‍යාපාර | 24-25 |
| **වෙන්ව ඉදිරිපත්කරන මූල්‍ය ප්‍රකාශන** | 26-27 |
| **පරිශිෂ්ඨ** | |

*අ* නිර්වචිත යෙදුම්

*ආ* ව්‍යවහාරකරණ උපදේශ

*ඇ* බලාත්මක දිනය, සංක්‍රාන්තිය සහ වෙනත් SLFRSs ඉවත්කිරීම


**ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - SLFRS 11**

***බද්ධ සැකසුම්***

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය - SLFRS 11 බද්ධ සැකසුම් 1-27 ඡේදවල සහ අ - ඇ පරිශිෂ්ඨයන්හි දක්වා ඇත. සියළුම ඡේදවලට එක සමාන අධිකාරියක් ඇත. ඡේදවල **තද කළු** අකුරෙන් ප්‍රධාන මූලධර්ම දක්වා ඇත. අ පරිශිෂ්ඨයෙහි නිර්වචිත යෙදුම් ඇල අකුරෙන් ඇති අතර ඒවා මුල්වරට ප්‍රමිතියක දක්වේ. අනෙක් යෙදුම්වල නිර්වචන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සඳහා පාරිභාෂිත ශබ්ද මාලාවේ දක්වා ඇත. SLFRS 11 එහි පරමාර්ථ, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට වූ පූර්විකාව සහ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සාදහා වූ ආකෘතිමය රාමුවද සම්බන්ධ කොටගෙන කියවිය යුතුය. පැහැදිලි මාර්ගෝපදේශ නොමැති අවස්ථාවලදී ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සඳහාත් ඒවා භාවිතය සඳහාත් පදනමක් LKAS 8 ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු සහ වැරදි මගින් සැපයේ.

**අරමුණ**

1 **මෙම SLFRS හි අරමුණ, බද්ධ පාලිත සැකසුම් වල (එනම් බද්ධ සැකසුම්) හිමිකමක් ඇති අස්තිත්ව මඟින් මූල්‍ය වාර්තාකරණ සඳහා මූලධර්ම ප්‍රතිශ්ඨාපනය කිරීමටය.**

**අරමුණ ඉටුකරගැනීම**

2 1 වන ඡේදයේ අරමුණ ඉටුකරගැනීමට මෙම SLFRS හි බද්ධ පාලනය නිර්වචනය කිරීම සහ බද්ධ සැකසුමකට පාර්ශවයක්වන අස්තිත්වයක්, එය සම්බන්ධවී ඇති බද්ධ සැකසුමේ වර්ගය, එහි අයිතිවාසිකම් සහ බැඳීම් තක්සේරුව මගින් නිර්නය කිරීම සහ ඒ අයිතිවාසිකම් සහ බැඳීම් සඳහා බද්ධ සැකසුම් වර්ගය ප්‍රකාර ගිණුම් තැබීමටය.

**විෂය පථය**

3 **බද්ධ සැකසුමකට පාර්ශවයක් වන සියළුම අස්තිත්වයන් විසින් මෙම SLFRS ව්‍යවහාර කළ යුතුය.**

බද්ධ සැකසුම්

4 **බද්ධ සැකසුමක් යනු පාර්ශවයන් දෙකක හෝ වැඩි ගණනක බද්ධ පාලනයක් පවත්නා සැකසුමකි.**

5 **බද්ධ සැකසුමකට පහත සඳහන් ලක්ෂණ ඇත :**

**(අ) පාර්ශවයන් ගිවිසුම්ගත සැකසුමක් මගින් බැඳී සිටී. (අ2-අ4 ඡේද බලන්න)**

**(ආ) ගිවිසුම්ගත සැකසුම, පාර්ශවයන් දෙකකට හෝ වැඩිගණනකට ඒ සැකසුමේ බද්ධ පාලනය දෙනු ලබයි. (7-13 ඡේද බලන්න)**

6 **බද්ධ සැකසුමක්, බද්ධ මෙහෙයුමක් නැතහොත් හෝ බද්ධ ව්‍යාපාරයකි.**

බද්ධ පාලනය

7 **බද්ධ පාලන යනු පිළිවෙලක පාලනය පිළිබඳව හවුල්වීමේ ගිවිසුම්ගත එකඟවීමක් වන අතර, එය පවතිනුයේ අදාළ ක්‍රියාකාරකම් පාලනයට හවුල්වන පාර්ශවයන්ගේ ඒකමතික එකඟතාවය අවශ්‍ය තීරණ පවත්නා කල්හිය.**

8 පිළිවෙලකට පාර්ශවයක් වන අස්තිත්වයක්, ගිවිසුම්ගත පිළිවෙල සියළුම පාර්ශවයන්ට හෝ පාර්ශව කණ්ඩායමකට, පිළිවෙලේ සාමූහිකව පාලනය දෙනු ලැබේදැයි තක්සේරු කළ යුතුය. පිළිවෙල සාමූහිකව පාලනය කරන සියළුම පාර්ශවයන් හෝ පාර්ශව කණ්ඩායමක් පිළිවෙලෙහි ඵලදාවට (එනම් අදාල ක්‍රියාකාරකම්) වැදගත්ව බලපාන ක්‍රියාකාරකම් මෙහෙයවීමට එක්වන්ව ක්‍රියාකළ යුතුය.

9 සියළුම පාර්ශවයන් හෝ පාර්ශව කණ්ඩායමකට සාමූහිකව පිළිවෙල පාලනය කිරීම නිර්ණයකර ඇති විට, බද්ධ පාලනය පවතිනුයේ, අදාල ක්‍රියාකාරකම් වල තීරණ පිළිබඳව පිළිවෙල සාමූහිකව පාලනය කරන පාර්ශවයන්ගේ ඒකමතික එකඟතාවය අවශ්‍යවන කල්හි පමණකි.

10 බද්ධ පිළිවෙලක, තනි පාර්ශවයක් , එයට උවමනා පරිදි පිළිවෙල පාලනය නොකරයි. පිළිවෙලක බද්ධ පාලනය සහිත පාර්ශවයකට, වෙනත් පාර්ශව හෝ පාර්ශව කණ්ඩායමකට පිළිවෙල පාලනය කිරීම වැලැක්විය හැකිය.

11 බද්ධ පාලන පිළිවෙලේ සියළුම පාර්ශවයන්ට, පාලනය නොමැති වුවද, පිළිවෙලක් බද්ධ පිළිවෙලක් විය හැකිය. මෙම SLFRS හි බද්ධ පිළිවෙලක (බද්ධ මෙහෙයුම්කරුවන් හෝ බද්ධ ව්‍යාපාරිකයන්) බද්ධ පාලනය සහිත පාර්ශව සහ බද්ධ පිළිවෙලක, සහභාගීවන පාර්ශවයක් නමුත් බද්ධ පාලනය නොමැති පාර්ශව අතර වෙනස්කම දක්වයි.

12 සියළුම පාර්ශවයන්ට හෝ පාර්ශව කණ්ඩායමකට පිළිවෙලිහි බද්ධ පාලනය පවතිද යන්න තක්සේරු කරන කල්හි, අස්තිත්වයක් විනිශ්චය ව්‍යවහාරය අවශ්‍යවෙයි. අස්තිත්වය මෙම තක්සේරු කිරීම සියළුම කරුණු සහ අවස්ථාවන් සලකාබැලීම මගින් කළයුතුය. (අ5-අ11 ඡේද බලන්න).

13 සාධක සහ අවස්ථාවන් වෙනස්වී නම්, අස්තිත්වයක් පිළිවෙලක බද්ධ පාලනය තවමත් පවතීදැයි නැවත තක්සේරු කළ යුතුය.

බද්ධ වර්ග

14 **අස්තිත්වයක්, එය සම්බන්ධවී ඇති බද්ධ පිළිවෙලෙහි වර්ගය නිර්නය කරගත යුතුය. බද්ධ පිළිවෙලක වර්ගීකරණය බද්ධ මෙහෙයුමක් හෝ බද්ධ ව්‍යාපාරයක් ලෙසද යන්න, රදාපවතින්නේ, පිළිවෙළට එක්වූ පාර්ශවයන්ගේ අයිතිවාසිකම් හා බැඳීම් මතය.**

15 **බද්ධ මෙහෙයුමක්, බද්ධ පිළිවෙලක් වීමේදී එමඟින් පිළිවෙලහි බද්ධ පාලනය සතු පාර්ශවයන්ට, පිළිවෙලට අදාල වත්කම්වල අයිතියක් සහ වගකීම් සඳහා බැඳීම් ඇත. ඒ පාර්ශවයන් බද්ධ මෙහෙයවන්නන් ලෙස හැඳින්වෙයි.**

16 **බද්ධ ව්‍යාපාරයක් බද්ධ පිළිවෙලක් වන අතර, එමගින්, පිළිවෙලෙහි බද්ධ පාලනය සතු පාර්ශවයන්ට පිළිවෙලේ ශුද්ධ වත්කම්වලට අයිතියක් ඇත. ඒ පාර්ශවයන් බද්ධ ව්‍යාපාරිකයින් ලෙස හැඳින්වෙයි.**

17 බද්ධ පිළිවෙලක් , බද්ධ මෙහෙයුමක්ද නැතහොත් බද්ධ ව්‍යාපාරයක් ද යන්න තක්සේරු කිරීමේදී අස්තිත්වයක් විනිශ්චය ව්‍යවහාර කරයි. අස්තිත්වයක්, තමා සම්බන්ධවී ඇති බද්ධ පිළිවෙලේ වර්ගය, පිළිවෙල මඟින් පැනනඟින අයිතිවාසිකම් සහ බැඳීම්, සලකා බැලීමෙන් නිර්නය කළ යුතුය. අස්තිත්වයක් එහි අයිතිවාසිකම් සහ බැඳීම් පිළිවෙලේ ව්‍යුහය සහ නෛතික ආකෘතිය, ගිවිසුම්ගත පිළිවෙලේ පාර්ශවයන් විසින් එකඟවූ කොන්දේසි සහ අදාල වන විට, වෙනත් කරුණු සහ තත්ත්වයන් සලකාබැලීමෙන් තක්සේරු කරයි.
( ආ 12- ආ 33 ඡේද බලන්න)

18 සමහරවිට පාර්ශවයන්, ක්‍රියාකාරකම් එකක් හෝ වැඩි ගණනක් භාරගැනීම සඳහා ඇති කළ පොදු ගිවිසුම්මය කොන්දේසි එකඟවීම් ආකෘතිමය රාමුවක් මඟින් බැඳීසිටී. ගිවිසුමේ කොටසක්වන විශේෂිත ක්‍රියාකාරකම් සමඟ කටයුතු කිරීමට රාමු එකඟවීම් ඒ පාර්ශ්වයන්ට ප්‍රතිශ්ඨාපනය කරන, වෙනස්වූ බද්ධ පිළිවෙලවල් සකස්කළ හැකිය, එකම රාමු ගිවිසුමක කටයුතු කරන භාරගනු ලැබූ විවිධ ක්‍රියාකාරකම්වල, අදාල පාර්ශවයන්ගේ අයිතිවාසිකම් සහ බැඳීම් වෙනස් නම්, ඒ බද්ධ පිළිවෙල එකම රාමු ගිවිසුමකට සම්බන්ධ වුවද, ඒවායේ වර්ග වෙනස්විය හැකිය. ප්‍රතිඵලයක් ලෙස, පාර්ශ්වයන් එකම රාමු ගිවිසුමේ කොටස්වලින් සෑදෙන, වෙනස්වූ ක්‍රියාකාරීත්ව භාරගත් කල්හි, බද්ධ මෙහෙයුම් සහ බද්ධ ව්‍යාපාර එක්ව පැවතිය හැකිය.

19 කරුණු සහ තත්ත්වයන් වෙනස්වීනම්, අස්තිත්වය එය සම්බන්ධවී සිටින බද්ධ පිළිවෙලේ වර්ගය වෙනස්වීදැයි නැවත තක්සේරුකළ යුතුය.

**බද්ධ පිළිවෙලකට පාර්ශවයන් පිළිබඳ මූල්‍ය ප්‍රකාශන**

**බද්ධ මෙහෙයුම්**

**20 බද්ධ මෙහෙයුමක එහි අයිතිවාසිකම් සම්බන්ධයෙන් බද්ධ මෙහෙයුම් කරුවකු හඳුනාගත යුතු දෑ :**

**(අ) බද්ධව රඳවා ගෙන සිටින යම් වත්කම්වල කොටසද ඇතුලත්ව, එහි වත්කම් ;**

**(ආ) බද්ධව ඇතිවූ යම් වගකීම් එහි කොටසද ඇතුලත්ව, එහි වගකීම් ;**

**(ඇ) බද්ධ මෙහෙයුම මඟින් පැනනඟින එහි නිමවුමේ කොටස විකිණීම මඟින් එහි අයභාරය ;**

**(ඈ) බද්ධ මෙහෙයුම මඟින් නිමැවුම, විකිණීමෙන් ලද අයභාරයේ එහි කොටස ; සහ**

**(ඉ) බද්ධව වැයකල යම් වියදමක කොටසද ඇතුලත්ව එහි වියදම්**

21 බද්ධ මෙහෙයුම්කරු, වත්කම්, වගකීම්, අයභාරය සහ වියදම්වලට අදාළව, බද්ධ මෙහෙයුමේ එහි හිමිකම, නියමිත වත්කම්, වගකීම්, අයභාරය සහ වියදම් වලට ව්‍යවහාර කළයුතු SLFRSs ප්‍රකාර ගිණුම්ගත කළ යුතුය.

22 බද්ධ මෙහෙයුම් කරු සීමිත අස්තිත්වය සහ බද්ධ මෙහෙයුම අතර විකුණුම්, දායකය හෝ වත්කම් මිලදී ගැණුම් වැනි ගණුදෙනු සඳහා ගිණුම්කරණය 34- ආ 37 ඡේදයන්හි නිශ්චිතව දක්වා ඇත.

23 බද්ධ මෙහෙයුමට අදාලව, වත්කම්වලට හිමිකම් සහ වගකීම් සඳහා බැඳීම් ඒ පාර්ශ්වයට තිබේනම්, යම් පාර්ශ්වයක් සහභාගී වන නමුත් බද්ධ මෙහෙයුමෙහි, බද්ධ පාලනය නොමැතිවුවද, පිළිවෙළෙහි අයිතිය සඳහා 20-22 ඡේද ප්‍රකාර ගිණුම් තැබිමද කළයුතුය. සහභාගිවන්නාවූ පාර්ශවයකට බද්ධ මෙහෙයුමක, බද්ධ පාලනය නොමැතිව, බද්ධ මෙහෙයුමට අදාල වත්කම්වලට අයිතියක් සහ වගකීම් සඳහා බැඳීමක් නොමැති නම්, බද්ධ මෙහෙයුමෙහි එහි අයිතිය සඳහා ව්‍යවහාර කළහැකි ජ ප්‍රකාර ගිණුම් ගත කළ යුතුය.

බද්ධ ව්‍යාපාර

**24 ඒ ප්‍රමිතියෙහි විශේෂිතව දක්වා ඇති පරිදි ස්කන්ධ ක්‍රමය ව්‍යවහාර කිරීමෙන් අස්තිත්වය නිදහස්කර තිබේනම් හැර, බද්ධ ව්‍යාපාරයක් එහි බද්ධ ව්‍යාපාරයේ අයිතිය ආයෝජනයක් ලෙස සහ ආයෝජන සඳහා LKAS 28 ආශ්‍රිත සහ බද්ධ ව්‍යාපාරයන්හි, ආයෝජන ප්‍රකාර ස්කන්ධ ක්‍රමය භාවිතා කරමින් ගිණුම්ගත කළ යුතුය.**

25 සහභාගීවන පාර්ශ්වයක්, බද්ධ ව්‍යාපාරයෙහි, බද්ධ පාලනය නොමැති නම්, පිළිවෙලෙහි එහි අයිතිය සඳහා SLFRS 9 මූල්‍ය සාධන පත්‍ර ප්‍රකාර ගිණුම්ගත කළයුතු අතර, එයට බද්ධ ව්‍යාපාරය කෙරෙහි වැදගත් බලපෑමක් ඇත්නම්, LKAS 28 ප්‍රකාර ගිණුම් ගතකළ යුතුය.

<u>වෙන්ව ඉදිරිපත් කරන මූල්‍ය ප්‍රකාශන</u>

**26 එහි වෙන්ව ඉදිරිපත් කරන මූල්‍ය ප්‍රකාශනයන්හි, බද්ධ මෙහෙයුම්කරු හෝ බද්ධ ව්‍යාපාරිකයා තම අයිතිය සඳහා ගිණුම්ගත කළයුත්තේ :**

**(අ) බද්ධ මෙහෙයුමක, 20-22 ඡේද ප්‍රකාරව ;**

**(ආ) බද්ධ ව්‍යාපාරයක, LKAS 27 වෙන්ව ඉදිරිපත් කරන මූල්‍ය ප්‍රකාශනයෙහි, 10 වන ඡේදය ප්‍රකාරව.**

27 එහි වෙන්ව පිළියෙල කරණ මූල්‍ය ප්‍රකාශනවල පාර්ශ්වයන් සහභාගි වන නමුත්, බද්ධ පිළිවෙලෙහි බද්ධ පාලනයක් නොමැති නම්, තම අයිතිය සඳහා ගිණුම්ගත කළයුත්තේ ෑ

**(අ) බද්ධ මෙහෙයුමක 23 වන ඡේදය ප්‍රකාර ;**

**(ආ) බද්ධ ව්‍යාපාරයක SLFRS 9 ප්‍රකාර වන අතර, අස්තිත්වයට බද්ධ ව්‍යාපාරය කෙරෙහි වැදගත් බලපෑමක් ඇත්නම්, එවැනි අවස්ථා වල LKAS 27 හි 10 වන ඡේදය ව්‍යවහාර කළයුතුය.**

SLFRS 11

**අ පරිශිෂ්ඨය**

**නිර්වචිත යෙදුම්**

*මෙම පරිශිෂ්ඨය SLFRS හි අවශ්‍යම කොටසකි.*

| | |
|---|---|
| **බද්ධ පිළිවෙල** | පාර්ශවයන් දෙකකට හෝ වැඩි ගණනකට බද්ධ පාලනය ඇති පිළිවෙලක්. |

| | |
|---|---|
| **බද්ධ පාලනය** | ආර්ථික කටයුත්තක් සම්බන්ධයෙන් ගිවිසුම්මය එකඟතාවයකින් පාලනය බෙදාගැනීම වන අතර, එය පවතින්නේ එම කාර්යයන්ට අදාල උපායමාර්ගික මූල්‍ය සහ මෙහෙයුම් තීරණවලට, ව්‍යාපාර පාලනය හවුලේ බෙදාගන්නා පාර්ශවයන්ගේ (ව්‍යාපාරිකයින්) ඒකමතික කැමැත්ත අවශ්‍ය වන විටය. |
| **බද්ධ මෙහයුම** | බද්ධ පිළිවෙලක  එමගින් පිළිවෙලක බද්ධ පාලනය සතු පාර්ශවයන්ට, පිළිවෙලට අදාළ වත්කම්වල අයිතිය සහ වගකීම් සඳහා බැඳීම් තිබීම. |
| **බද්ධ මෙහෙයුම්කරු** | බද්ධ මෙහෙයුම් පාර්ශවයකට, බද්ධ මෙහෙයුම පිළිබඳ බද්ධ පාලනය සතුවීම. |
| **බද්ධ ව්‍යාපාරය** | බද්ධ පිළිවෙලක, පිළිවෙල පිළිබඳ පාලනය සතු, පාර්ශවයන්ට පිළිවෙලෙහි ශුද්ධ වත්කම් වලට අයිතිය සතුවීම. |
| **බද්ධ ව්‍යාපාරිකයා** | බද්ධ ව්‍යාපාරයක, බද්ධ පාලනය සතු බද්ධ ව්‍යාපාරයේ පාර්ශවකරු |
| **බද්ධ පිළිවෙලක පාර්ශ්වකරු** | පිළිවෙලෙහි අස්තිත්වයට පාලනය සතු දැයි නොසලකා, පාර්ශවකරු බද්ධපිළිවෙලට සහභාගීවන අස්තිත්වයක් |
| **වෙන්ව ඉදිරිපත් කරන අංශය** | ඒ අස්තිත්වයන්ට නෛතික පුද්ගලිකත්වයක් ඇද්දැයි නොසලකා, වෙන්වූ නෛතික හෝ, ව්‍යවස්ථාවක්, මඟින් හඳුනාගත් අස්තිත්ව ඇතුලත්, වෙන්ව හඳුනාගත හැකි මූල්‍ය ව්‍යුහය, |

පහත සඳහන් යෙදුම් LKAS 27, LKAS 28  හෝ  SLFRS 10  ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන යන්හි නිර්වචනය කර ඇති අතර, ඒ  SLFRSs වල නිශ්චිතව දක්වූ තේරුම සහිතව මෙම SLFRS හි භාවිතා කරනලදී.

* ආයෝජකයකු පිළිබඳ පාලනය
* ස්කන්ධ ක්‍රමය
* බලය
* ආරක්ෂිත අයිතිය
* අදාළ ක්‍රියාකාරකම්
* වෙන්ව ඉදිරිපත් කරන මූල්‍ය ප්‍රකාශන
* වැදගත්  බලපෑම

SLFRS 11

**ආ පරිශිෂ්ඨය**

**ව්‍යවහාරකරණ උපදේශන**

*මෙම පරිශිෂ්ඨය SLFRS හි අවශ්‍යම කොටසකි. එය 1-27 ඡේද ව්‍යවහාරකරණය විස්තර කරණ අතර, SLFRS හි වෙනත් කොටසක් ලෙසම අධිකාරියක් ඇත.*

ආ1 මෙම පරිශිෂ්ඨයේ උදාහරණ උපකල්පිත අවස්ථා රූප මවයි. උදාහරණවල සමහර අංගයන් කිනම් ස්වරූපයේ කරුණු ඉදිරිපත් කළද, නියමිත තොරතුරු ස්වරූපයේ සියළුම අදාළ කරුණු සහ තත්ත්වයන් SLFRS 11 ව්‍යවහාර කරන කල්හි, අගය කිරීම අවශ්‍යය.

<u>බද්ධ පිළිවෙල</u>

**ගිවිසුම්ගත පිළිවෙල (5වන ඡේදය)**

ආ2 ගිවිසුම්ගත පිළිවෙල විවිධ ආකාරයට තහවුරු කළ හැකිය. බලාත්මක කළහැකි ගිවිසුම්ගත පිළිවෙලක් බොහෝවිට, නමුත් සෑම විටම නොව, ලිඛිත වන අතර, සාමාන්‍යයෙන් කොන්ත්‍රාත්තුවක හෝ පාර්ශව අතර සාකච්ඡා ලේඛනගතකිරීමක ස්වරූපය ගනී. ව්‍යවස්ථාමය යාන්ත්‍රණයන්ටද බලාත්මක කළහැකි පිළියෙල ඔවුන් විසින්ම හෝ පාර්ශව අතර කොන්ත්‍රාත් සමඟ එකට එක්ව ඇතිකළ හැකිය.

ආ3 බද්ධ පිළිවෙල වෙන්වූ අංශයක මාර්ගයෙන් ව්‍යුහගත කළ කල්හි (ආ19-ආ 33 ඡේද බලන්න) සමහර අවස්ථාවල ගිවිසුම්ගත පිළිවෙල හෝ ගිවිසුම්ගත පිළිවෙලේ සමහර අංග සේවා වෙන්වූ අංශයක ව්‍යවස්ථාවලියක, වරයක, හෝ අතුරු නීතිවල සංස්ථාපිත විය හැකිය.

ආ4 ගිවිසුම්ගත පිළිවෙල, පිළිවෙලේ විෂයවන ක්‍රියාකාරකමෙහි පාර්ශවයන් සහභාගීවීම මත කොන්දේසි දක්වයි. ගිවිසුම්ගත පිළිවෙල සාමාන්‍යයෙන් මෙවැනි කරුණු සමග කටයුතු කරයි :

(අ) බද්ධ පිළිවෙලේ අරමුණ, කාර්යය සහ කාළසීමාව.

(ආ) බද්ධ පිළිවෙලේ අධ්‍යක්‍ෂ මණ්ඩලයේ සාමාජිකයන් හෝ සමාන පාලන මණ්ඩලයක් පත්කරන ආකාරය.

(ඇ) තීරණගැනීමේ ක්‍රියාවලිය : පාර්ශවයන්ගේ තීරණය අවශ්‍යවන කරුණු, පාර්ශවයන්ගේ ඡන්ද අයිතිය සහ ඒ කරුණු සඳහා අවශ්‍යකරන සහයෝග මට්ටම. ගිවිසුම්ගත පිළිවෙලේ පිළිඹිබුවන තීරණගැනීමේ ක්‍රියාවලිය, පිළිවෙලෙහි බද්ධ පාලනය ප්‍රතිශ්ඨාපන කරයි (ආ 5- ආ 11 බලන්න).

(ඈ) පාර්ශවයන්ගෙන් අවශ්‍යකරන ප්‍රාග්ධනය හෝ වෙනත් දායකවීම්

(ඉ) බද්ධ පිළිවෙලට අදාලව පාර්ශවයන් වත්කම්, වගකීම්, අයහාර, වියදම් හෝ ලාභ හෝ අලාභ බෙදාගන්නා පිළිවෙල.

**බද්ධ පාලනය (7- 13 ඡේද)**

ආ5 පිළිවෙලක බද්ධ පාලනය සතුදැයි අස්තිත්වයක් තක්සේරු කිරීමේදී, අස්තිත්වයක් විසින් පළමුවෙන් සියළුම පාර්ශ්වයන් හෝ පාර්ශව කණ්ඩායමක් පිළිවෙල පාලනය කරන්නේදැයි තක්සේරු කළයුතුය. SLFRS 10 පාලනය නිර්වචනය කරන අතර, සියළුම පාර්ශ්වයන් හෝ පාර්ශව කණ්ඩායමක්, පිළිවෙල සමග ඇති ඔවුන්ගේ සම්බන්ධයෙන් විචල්‍ය ඵලදාවට විවෘත වූ හෝ පවත්නා අයිතිය, පිළිවෙල මත ඇති ඔවුන්ගේ බලය මගින්, ඒ ඵලදාවට බලපෑමක් ඇතිකිරීමේ හැකියාව නිර්නය කිරීමට භාවිතා කළ හැකිය. සියළුම පාර්ශ්වයන් හෝ පාර්ශ්ව කණ්ඩායමක්, සාමූහිකව සලකාබැලූ කල්හි, පිළිවෙලේ ඵලදාවට වැදගත්වම බලපාන කාර්යයන් සෘජුව මෙයෙවීමට ඇති හැකියාව (එනම් අදාල කාර්ය), පාර්ශ්ව පිළිවෙල සාමූහිකව පාලනය කරති.

ආ6 සියළුම පාර්ශ්වයන් හෝ පාර්ශ්ව කණ්ඩායමක් පිළිවෙල සාමූහිකව පාලනය කරන බව නිගමනය කිරීමට පසුව, පිළිවෙල පිළිබඳ අස්තිත්වයට බද්ධ පාලනයක් ඇද්දැයි තක්සේරු කළ යුතුය. අදාළ කාර්යයන් පිළිබඳව තීරණගැනීමේදී, පිළිවෙල සාමූහිකව පාලනය කරන පාර්ශ්වයන්ගේ ඒකමතික තීරණය අවශ්‍යවන කල්හි, පමණක් බද්ධ පාලනය පවතී. පිළිවෙලක් එහි සියළුම පාර්ශ්වයන් හෝ පාර්ශ්ව කණ්ඩායමක් මගින් බද්ධව පාලනය කරන්නේද නැතහොත්, එහි එක් පාර්ශ්වයක් මගින් පාලනය වන්නේද තක්සේරුකිරීමේදී විනිශ්චය අවශ්‍යවිය හැකිය.

ආ7 සමහරවිට පාර්ශ්වයන් විසින් තීරණ ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳ එකඟවීම් මගින්, ඔවුන්ගේ ගිවිසුම්ගත පිළිවෙල බද්ධ පාලනයට යොමුවී ඇති බව හඟවයි. උදාහරණයක් ලෙස, එක් පාර්ශවයකට 50% බැගින් ඡන්ද අයිතිය සහිතව පිළිවෙලක් ප්‍රතිශ්ඨාපනය කලේයයි උපකල්පනය කරන්න. අදාළ කාර්යයන් පිළිබඳ තීරණ ගැනීමේදී ඡන්ද බලයෙන් සීයයට 51ක් අවශ්‍ය බව ඔවුන් අතර ගිවිසුම්ගත පිළිවෙලෙහි විශේෂිතව දක්වා ඇත. මෙම සිද්ධියේදී, පාර්ශ්ව පිළිවෙල කෙරෙහි බද්ධ පාලනයක් හැඟවීමෙන්ම එකඟවූ බව පෙනියන්නේ අදාළ කාර්යයන් පිළිබඳ තීරණ පාර්ශ්ව දෙකම එකඟ නොවී ගත නොහැකි බැවිනි.

ආ8 වෙනත් අවස්ථාවලදී, අදාළ කාර්යයන් පිළිබඳ තීරණ ගැනීමට ඡන්ද අයිතියේ අවම අනුපාතයක් ගිවිසුම්ගත පිළිවෙලේහි අවශ්‍යකරයි. එකට එකඟවන පාර්ශ්වයන් එකක් හෝ වැඩි ගණනක සංයුතියෙන් අවම ඡන්ද අනුපාතය ලබාගත හැකි කල්හි, ගිවිසුම්ගත පිළිවෙලෙහි කුමන පාර්ශ්වයන්( හෝ පාර්ශ්ව සංයුතියක්) පිළිවෙලේ අදාළ කාර්යයන් පිළිබඳ තීරණයට ඒකච්ඡන්දෙයන් එකඟවීමට අවශ්‍යයයි ගිවිසුම්ගත පිළිවෙලෙහි විශේෂිතව නොමැතිනම්, පිළිවෙල බද්ධ පිළිවෙලක් නොවේ.

**ව්‍යවහාරකරණ උදාහරණ**

**උදාහරණ 1**

පාර්ශ්වයන් තුනක් පිළිවෙලක් ප්‍රතිශ්ඨාපනය කළ බව උපකල්පනය කරන්න. ''ඒ'' ට පිළිවෙලෙහි සියයට 50ක ඡන්ද අයිතිය හිමි අතර, ''බී''ට සියය 30ක් සහ 'සී' ට සියයට 20ක් අයත්ය. අදාළ කාර්යයන් පිළිබඳ තීරණ ගැනීමට ඡන්ද හිමිකම්වලින් අඩුම වශයෙන් සියයට 75ක් අවශ්‍යබව ඒ, බී, සහ සී අතර ගිවිසුම්ගත පිළිවෙලෙහි විශේෂිතව දක්වා ඇත. යම් තීරණයක් 'ඒ' ට අවහිර කළහැකි වුවද, එය පිළිවෙල පාලනය නොකරනුයේ එයට 'බී' ගේ එකඟතාවය අවශ්‍ය හෙයිනි. ඔවුන්ගේ ගිවිසුම්ගත එකඟතාවයෙහි අදාළ කාර්යයන් පිළිබඳ තීරණ ගැනීම සඳහා සියයට 75ක අවම ඡන්ද හිමිකම අවශ්‍යකරණ හෙයින් 'ඒ' සහ 'බී' ට පිළිවෙලෙහි බද්ධ පාලනයක් පවතිනුයේ, 'ඒ' සහ 'බී' දෙදෙනෙක් එකඟතාවයකින් තොරව පිළිවෙලෙහි අදාළ කාර්යයන් පිළිබඳ තීරණ ගත නොහැකි හෙයිනි.

**උදහරණ 2**

පිළිවෙලක පාර්ශ්වයන් තුනක් සිටින බව උපකල්පනය කරන්න. ඡන්ද අයිතියෙන් සියයට 50ක් 'ඒ' සතු අතර 'බී' සහ 'සී'ට සියයට 25 බැගින් අයත්ය. ඒ, බී. සහ සී අතර ගිවිසුම්ගත එකඟතාවයෙන් පිළිවෙලෙහි අදාළ ක්‍රියාකාරකමක තීරණගැනීම සඳහා සියයට 75ක ඡන්ද අයිතිය අවශ්‍ය බව විශේෂිතව සඳහන්කර ඇත. 'ඒ' ට ඕනෑම තීරණයක් අවහිර කළහැකි නමුත්, පිළිවෙල පාලනය කළ නොහැක්කේ 'බී' හෝ 'සී' ගේ එකඟතාවය අවශ්‍යවන හෙයිනි. මෙම උදාහරණයේ ඒබීසී තිදෙනාම සාමූහිකව පිළිවෙල පාලනය කරනු ලබයි. මෙම උදාහරණයේ සියයට 75ක එකඟතාවය ඇතිකර ගැනීමට පාර්ශ්වයන් අතර එක සංයෝජනයකට වැඩි ගණනක් පවතී(එනම්, ඒ සහ බී හෝ ඒ සහ සී) එවැනි තත්ත්වයකදී පිළිවෙලක අදාල ක්‍රියාකාරකමක් පිළිබඳ ඒකමතික එකඟතාවයකට, කිනම් පාර්ශ්වයන්ගේ සංයෝජනයක් අවශ්‍යදැයි ගිවිසුම්ගත පිළිවෙලෙහි විශේෂිතව සඳහන් විය යුතුය.


**උදාහරණ 3**

පිළිවෙලක 'ඒ' සහ 'බී'ට සියයට 35 බැගින් ඡන්ද අයිතියද, පිළිවෙලෙහි ඉතිරි සියයට 30 පුළුල්ව විහිදී ඇති බව සලකන්න. අදාළ කාර්යයන් පිළිබඳ තීරණවලට ඡන්ද අයිතියේ බහුතරය මගින් අනුමැතිය අවශ්‍යය. ගිවිසුම්ගත පිළිවෙලෙහි ඒ සහ බීට විශේෂිතව ඇත්නම් පමණක් පිළිවෙලෙහි බද්ධ පාලනය ඒ සහ බී සතුවෙයි.

ආ9 ඒකමතික කැමැත්ත, සඳහා අවශ්‍යතා යන්නෙන් අදහස්කරනුයේ පිළිවෙලක බද්ධ පාලනය සතු ඕනෑම පාර්ශවයකට, වෙනත් යම් පාර්ශ්වයක් හෝ පාර්ශව කණ්ඩායමක්, ඔවුන්ගේ කැමැත්ත නොමැතිව, ඒකපාර්ශික තීරණ ගැනීම වැලැක්වීමට හැකිවීමයි. ඒකමතික තීරණ සඳහා අවශ්‍යතා සම්බන්ධවනුයේ, පාර්ශ්වයක අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ තීරණවලට පමණක් සහ පිළිවෙලේ අදාළ තීරණ පිළිබඳව නොවේ නම්, එම පාර්ශ්වය පිළිවෙලේ බද්ධ පාලනය සහිත පාර්ශවයක් නොවේ.

ආ10 ගිවිසුම්ගත පිළිවෙලක ආරවුල් විසඳාගැනීම වැනි මතභේද නිරවුල්කිරීමේ වගන්ති ඇතුලත් විය හැකිය. මෙවැනි ප්‍රතිපාදන බද්ධ පාලනය හිමිපාර්ශවයන් අතර ඒකමතික කැමැත්තක් නොමැති නම්, තීරණගැනීම සඳහා ඉඩ සලසයි. මෙවැනි ප්‍රතිපාදන පැවතීම, පිළිවෙල බද්ධපාලනයෙන් සහ ප්‍රතිඵලයක් ලෙස බද්ධ පිළිවෙලක්වීමෙන් වලක්වන්නේ නැත.

**බද්ධ පාලනය තක්සේරුකිරීම**



ආ 11 පිළිවෙල SLFRS 11 හි විෂය පථයෙන් බාහිර වූ කල්හි, අස්තිත්වයක් පිළිවෙලේ තම අයිතිය සඳහා SLFRS10, SLFR 28 හෝ SLFS 9 වැනි අදාළ SLFRSs ප්‍රකාර ගිණුම්ගත කරයි.

බද්ධ පිළිවෙල වර්ග ( 14 - 19 ඡේද)

ආ12 බද්ධ පිළිවෙල විවිධ අරමුණු සඳහා ප්‍රතිශ්ඨාපනය කරන (උදාහරණ ලෙස, පාර්ශ්වයන්ට පිරිවැය සහ අවදානම බෙදාගැනීම සඳහා හෝ පාර්ශ්වයන්ට නව තාක්ෂණය හෝ වෙළෙඳපොල සැපයීමට මාර්ගයක්) අතර වෙනස්වූ ව්‍යුහයන් සහ නෛතික ආකෘති භාවිතා කරමින් ප්‍රතිශ්ඨාපනය කළ හැකිය.

ආ13 සමහර පිළිවෙලවල කාර්යභාරය එනම් පිළිවෙලේ විෂයය වෙන්වූ කටයුත්තක් ලෙස භාරගැනීම අවශ්‍ය නොකරයි. කෙසේවෙතත්, වෙනත් පිළිවෙලවල වෙන්වූ කටයුත්තක් ප්‍රතිශ්ඨාපනය අදාළවෙයි.

ආ14 මෙම SLFRS මගින් අවශ්‍යකරන බද්ධ පිළිවෙලවල වර්ගීකරණය පිළිවෙලෙහි සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලින් පැනනගින පාර්ශ්වයන්ගේ අයිතීන් සහ බැඳීම් මත රඳාපවතී. මෙම SLFRS බද්ධ පිළිවෙල, බද්ධ මෙහෙයුමක් හෝ බද්ධ ව්‍යාපාරයක් ලෙස වර්ගීකරණය කරයි. අස්තිත්වයකට පිළිවෙලට අදාල වත්කම්වලට අයිතිය සහ වගකීම් සඳහා බැඳීම් ඇති කල්හි, පිළිවෙල බද්ධ මෙහෙයුමකි. අස්තිත්වයට පිළිවෙලෙහි ශුද්ධ වත්කම්වලට අයිතිය ඇති කල්හි, පිළිවෙල බද්ධ ව්‍යාපාරයකි. අස්තිත්වය ක්‍රියාත්මකවන්නේ බද්ධ මෙහෙයුම් අයිතියකද නැතහොත් බද්ධ ව්‍යාපාර අයිතියකද යන්න නිර්නය කිරීමට තක්සේරුව ආ 16- ආ 33 ඡේදයන්හි දක්වා ඇත.

**බද්ධ පිළිවෙලක් පිළිබඳ වර්ගීකරණය**

ආ15 ආ 14 ඡේදයෙහි සඳහන්කර ඇති පරිදි බද්ධ පිළිවෙළ වර්ගීකරණය පිළිබඳව පාර්ශ්වයන්ට පිළිවෙල මගින් පැන නගින ඔවුන්ගේ අයිතිය සහ වගකීම් තක්සේරුකිරීමට අවශ්‍යවේ. තක්සේරු කරන කල්හි, අස්තිත්වයක් පහත සඳහන් දෑ සැලකිල්ලට ගත යුතුය.

(අ) බද්ධ පිළිවෙලෙහි ව්‍යුහය ( ආ 16- ආ 21 ඡේද බලන්න)

(ආ) බද්ධ පිළිවෙල වෙන්වූ අංශයක් ලෙස ව්‍යුහගත කළ කල්හිඃ

(i) වෙන්වූ අංශයේ නෛතික ආකෘතිය (ආ 22- ආ24 ඡේද බලන්න)

(ii) ගිවිසුම්ගත පිළිවෙලෙහි කොන්දේසි (ආ 25- ආ 28 ඡේද බලන්න)

(iii) අදාල කල්හි, වෙනත් කරුණු සහ තත්ත්වයන් (ආ 29-ආ 33 ඡේද බලන්න)

**බද්ධ පිළිවෙලෙහි ව්‍යුහය**

*බද්ධ පිළිවෙල වෙන්වූ අංශයන් මාර්ගයෙන් ව්‍යුහගත නොවීම.*

අ16 බද්ධ පිළිවෙලක් වෙන්වූ අංශයක් මගින් ව්‍යුහගත නොකලේ නම්, එය බද්ධ මෙහෙයුමකි. එවැනි අවස්ථාවල ගිවිසුම්ගත පිළිවෙල, පිළිවෙලට අදාලව පාර්ශ්වයන්ගේ වත්කම්වලට අයිතිය සහ වගකීම් සඳහා බැඳීම් සහ පාර්ශ්වයන්ගේ අනුරූපවන අයභාරයට හිමිකම් සහ අනුරූපවන වියදම් සඳහා බැඳීම් ප්‍රතිශ්ඨාපනය කරයි.

අ 17 ගිවිසුම්ගත පිළිවෙල බොහෝවිට, පිළිවෙලෙහි විෂයවන කාර්යභාරයේ ස්වභාවය සහ පාර්ශ්වයන් එක්වී ඒ කාර්යයන් ඉටුකිරීමට භාරගන්නා ආකාරයත් පැහැදිලි කරයි. උදාහරණයක් ලෙස, බද්ධ පිළිවෙලකට පාර්ශ්වයන් එකතුවී, එකිනෙකා තමන්ගේ වත්කම් භාවිතාකරමින් සහ තමන්ගේම වගකීම් ඇතිකරගනිමින්, එක් එක් පාර්ශ්වය විශේෂිත කාර්යයක් සඳහා වගකිම භාරගෙන, භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමට එකඟවිය හැකිය. ගිවිසුම්ගත පිළිවෙල සියළුම පාර්ශ්වයන්ට පොදුවූ අයභාර සහ වියදම් ඔවුන් අතර බෙදාගන්නා ආකාරය නිශ්චිතව දක්විය හැකිය. එවැනි අවස්ථාවල සෑම බද්ධ මෙහෙයුම්කරුවෙක්ම, ගිවිසුම්ගත පිළිවෙල ප්‍රකාර නිශ්චිත කාර්යය සඳහා භාවිතාකළ වත්කම් සහ වගකීම්ද, අයභාර සහ වියදම් වල තමන්ගේ කොටසද තමන්ගේ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගනී.

අ18 වෙනත් අවස්ථාවල, බද්ධ පිළිවෙලක පාර්ශ්වයන්, උදාහරණ ලෙස එකට එකතුවී හවුල්ව වත්කමක් මෙහෙයවීමට එකඟවිය හැකිය. එවැනි අවස්ථාවල, ගිවිසුම්ගත පිළිවෙල පාර්ශ්වයන්ගේ, බද්ධව මෙහෙයවූ වත්කම් වලට අයිතිය සහ වත්කමෙන් ඇතිවූ නිමැවුමෙන් අයභාරය සහ මෙහෙයුම් පිරිවැය, පාර්ශ්වයන් අතර බෙදාගන්නා ආකාරය ප්‍රතිශ්ඨාපනය කරයි.

වෙනම අංශයක් මාර්ගයෙන් ව්‍යුගතකළ බද්ධ පිළිවෙලවල්

ආ19 පිළිවෙලට අදාළ වත්කම් හා වගකීම් වෙන් වූ අංශයක රඳවා තිබෙන බද්ධ පිළිවෙලක්, බද්ධ ව්‍යාපාරයක් හෝ බද්ධ මෙහෙයුමක් විය හැකිය.


ආ20 පාර්ශ්වයක් බද්ධ මෙහෙයුම්කරුවෙකු හෝ බද්ධ ව්‍යාපාරිකයකුගේ වැඩ පිළිවෙලකට අදාළ වෙනම අංශයක රඳවා ඇති, වත්කම්වලට ඇති අස්තිත්වයේ අයිතිය සහ වගකීම් සඳහා බැඳීම් මත රඳාපවතී.

ආ21 ආ 15 ඡේදයෙහි සඳහන් කර ඇති පරිදි, පාර්ශ්වයන් වෙන්වූ අංශයක බද්ධ පිළිවෙලක් ව්‍යුගතකල කල්හි, පාර්ශවයන් වෙන්වූ අංශයේ නෛතික ආකෘතිය, ගිවිසුම්ගත පිළිවෙලෙහි කොන්දේසි සහ අදාළ කල්හි, වෙනත් යම් කරුණු සහ අවස්ථාවන් ඔවුන්ට පහත සඳහන් දෑ දෙනු ලබයි දැයි තක්සේරුකිරීම අවශ්‍යවෙයි.

(අ) පිළිවෙලට අදාළ වත්කම්වලට අයිතිය සහ වගකීම් සඳහා බැඳීම් (එනම්, පිළිවෙල බද්ධ මෙහෙයුමක්) ; හෝ

(ආ) පිළිවෙලේ ශුද්ධ වත්කම්වලට අයිතිය (එනම්, පිළිවෙල බද්ධ ව්‍යාපාරයකි).

**බද්ධ පිළිවෙලක වර්ගීකරණය : පිළිවෙල මතින් පැන නඟින පාර්ශවයන්ගේ අයිතිය සහ බැඳීම් තක්සේරු කිරීම**




**වෙන්වූ අංශයෙහි නෛතික ආකෘතිය**

ආ22 බද්ධ පිළිවෙලෙහි වර්ගය තක්සේරු කිරීමේදී, වෙන්වූ අංශයෙහි නෛතික ආකෘතිය අදාළවෙයි. පාර්ශ්වයන්ට වෙන්වූ අංශයෙහි තබාගෙන ඇති වත්කම්වලට ඇල්මක් ඇද්ද සහ වෙන්වූ අංශයෙහි දරන්නාවූ වගකීම් සඳහා ඔවුනට බැඳීමක් ඇද්ද වැනි, වෙන්වූ අංශයෙහි දරන්නාවූ වත්කම්වලට අස්තිත්වයේ අයිතිය සහ වගකීම් සඳහා බැඳීම් පිළිබඳ මූලික තක්සේරුවේදී නෛතික ආකෘතිය සහායවෙයි.

ආ23 උදාහරණ ලෙස, පාර්ශවයන් වෙන්වූ අංශයක් මාර්ගයෙන් බද්ධ පිළිවෙල ක්‍රියාකල හැකි අතර, වෙන්වූ අංශයේ නෛතික ආකෘතිය අනුව වෙන්වූ අංශයට අයිතිය ඇති බව සලකනු ලබයි. (එනම්, වෙන්වූ අංශයේ තබාගෙන ඇති වත්කම් සහ වගකීම්, වෙන්වූ අංශයේම වත්කම් හා වගකීම් වන අතර පාර්ශ්වයන්ගේ වත්කම් සහ වගකීම් නොවේ.) එවැනි අවස්ථාවක, වෙන්වූ අංශයේ නෛතික ආකෘතිය අනුව පාර්ශවයන් මත තබා ඇති අයිතිය සහ වගකීම් තක්සේරුව, පිළිවෙල බද්ධ ව්‍යාපාරයක් බව පෙන්වනු ඇත. කෙසේ වෙතත්, ගිවිසුම්ගත පිළිවෙලෙහි පාර්ශ්වයන් විසින් එකඟවී ඇති කොන්දේසි (ආ 25 - ආ 28 ඡේද බලන්න) සහ අදාළ කල්හි වෙනත් කරුණු සහ අවස්ථාවන්, වෙන්වූ අංශයේ නෛතික ආකෘතිය මඟින් තබා ඇති අයිතිය සහ බැඳීම් තක්සේරුව අභිබවා යෑමට පුළුවන.

ආ24 නෛතික ආකෘතිය පාර්ශ්වයන් සහ වෙන්වූ අංශය අතර, වෙන්කිරීමක් තබා නොමැති, වෙන්වූ අංශයක පාර්ශ්වයන් බද්ධ පිළිවෙලෙහි කටයුතු කරගෙන යන්නේනම් පමණක්, වෙන්වූ අංශයේ නෛතික ආකෘතිය සහ බැඳීම් තක්සේරු පිළිවෙල බද්ධ මෙහෙයුමක් බව නිගමනය කිරීමට ප්‍රමාණවත් (එනම්, වෙන්වූ අංශයෙහි රඳවා ඇති වත්කම් සහ වගකීම්, පාර්ශ්වයන්ගේ වත්කම් සහ වගකීම්ය).

**ගිවිසුම්ගත පිළිවෙලෙහි කොන්දේසි තක්සේරු කිරීම**

අ25 බොහෝ අවස්ථාවල ඔවුන්ගේ ගිවිසුම්ගත පිළිවෙල පාර්ශ්ව මගින් එකඟවූ අයිතිවාසිකම් හා බැඳීම් සංගත හෝ පිළියෙල ව්‍යුහගත කළ වෙන්වූ අංශයේ නෛතික ආකෘතිය මගින් පාර්ශ්වයන් වෙත ප්‍රදානය කළ අයිතිය සහ බැඳීම් සමඟ ගැටීම් ඇති නොවේ.

අ26 අනෙක් අවස්ථාවල පිළියෙල ව්‍යුහගත කළ වෙන්වූ අංශයේ නෛතික ආකෘතිය මගින් ප්‍රදානය කළ අයිතිය සහ බැඳීම් ප්‍රතිවර්ත්‍ය හෝ සංශෝධනයට පාර්ශ්ව විසින් ගිවිසුම්ගත පිළිවෙල භාවිතා කරයි.

| ව්‍යවහාරකරණය උදාහරණය |
|---|
| **උදාහරණ 4**<br>පාර්ශ්වයන් දෙකක් බද්ධ පිළිවෙලක් සංස්ථාපිත අස්තිත්වයක ව්‍යුහගත කළේයයි උපකල්පනය කරන්න. එක් එක් පාර්ශ්වයට සංස්ථාපිත අස්තිත්වයේ සියයට 50ක අයිතිවාසිකම් සතුය. සංස්ථාපිත කිරීම අස්තිත්වය එහි අයිතිකරුවන්ගෙන් වෙන්කිරීමට ඉඩදෙනු ලබන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස අස්තිත්වය සතු වත්කම් සහ වගකීම් සංස්ථාපිත අස්තිත්වයේ වත්කම් සහ වගකීම්වේ. එවැනි අවස්ථාවක, වෙන්වූ අංශයේ නෛතික ආකෘතිය මගින් පාර්ශවයන් වෙත ප්‍රදානය කළ අයිතිය සහ බැඳීම්, පාර්ශ්වයන්ට පිළිවෙලෙහි ශුද්ධ වත්කම් වලට අයිතිය ඇතිබව හඟවයි.<br>කෙසේ වෙතත්, පාර්ශ්වයන් ඔවුන්ගේ ගිවිසුම් ගත පිළිවෙල තුලින් සංස්ථාපනයේ අංගයන් සංශෝධනය කර, එකිනෙකාට සංස්ථාපිත අස්තිත්වයේ නිශ්චිත අනුපාතයකට වත්කම්වලට හිමිකමත්, සංස්ථාපිත අස්තිත්තවයේ වගකීම්වලට බැඳීමත් ඇතිකරයි. සංස්ථාපනයේ ලක්ෂණයන්ට, එවැනි ගිවිසුම්ගත සංශෝධනයන්, පිළිවෙලක් බද්ධ මෙහෙයුමක් කළ හැකිය. |

ආ 27 පහත සඳහන් වගුව, ගිවිසුම්ගත පිළිවෙලක පාර්ශ්වයන්ගේ බද්ධ මෙහෙයුමකට පොදුවූ කොන්දේසි සහ ගිවිසුම්ගත පිළිවෙලක පාර්ශ්වයන්ගේ බද්ධ ව්‍යාපාරයක පොදුවූ කොන්දේසි සැසඳීම් කරයි. පහත සඳහන් වගුවෙහි සපයා ඇති ගිවිසුම්ගත කොන්දේසි උදාහරණ පරිපූර්ණ නොවේ.

| ගිවිසුම්ගත පිළිවෙලෙහි කොන්දේසි තක්සේරු කිරීම | | |
|---|---|---|
| | *බද්ධ මෙහෙයුම* | *බද්ධ ව්‍යාපාරය* |
| **ගිවිසුම්ගත පිළිවෙලෙහි කොන්දේසි** | ගිවිසුම්ගත පිළිවෙල බද්ධ පිළිවෙලේ පාර්ශ්වයන්ට, පිළිවෙලට අදාළ වත්කම්වලට අයිතිය සහ වගකීම් සඳහා බැඳීම් ලබාදෙයි | ගිවිසුම්ගත පිළිවෙල බද්ධ පිළිවෙලේ පාර්ශ්වයන්ට පිළිවෙලට අදාල ශුද්ධ වත්කම්වලට අයිතිය ලබාදෙයි. (එනම්, පාර්ශ්වයන්නොව වෙන්වූ අංශයට පිළිවෙලට අදාළ වත්කම් වලට අයිතිය සහ වගකීම් සඳහා බැඳීම් ඇත. |
| **වත්කම්වලට අයිතිය** | ගිවිසුම්ගත පිළිවෙල බද්ධ පිළිවෙලේ පාර්ශ්වයන්ට වත්කම්වලට ඇති සියළුම හිමිකම් (උදාහරණ ලෙස, අයිතිවාසිකම්, හිමිකම හෝ අයිතිකාරකම) නිශ්චිත අනුපාතයකට බෙදා ගැනීම ප්‍රතිශ්ඨාපනය කරයි (උදාහරණ ලෙස, පිළිවෙලේ අයිතිවාසිකමේ සමානුපාතය අනුපාතයට හෝ පිළිවෙල මගින් කරගෙන යන කාර්යයට ඍජුව ඔවුනට ආරෝපිත සමානුපාතයට) | පිළිවෙලට ගෙන එනු ලැබූ බද්ධ පිළිවෙල මගින් පසුව අත්පත්කරගත් වත්කම් පිළිවෙලට අයත් වත්කම් බව ගිවිසුම්ගත පිළිවෙල ප්‍රතිශ්ඨාපනය කරයි. පාර්ශ්වයන්ට පිළිවෙලහිඇති වත්කම්වලට හිමිකමක්නැත. (එනම්,අයිතිය, හිමිකම හෝ අයිතිවාසිකම) |

| ගිවිසුම්ගත පිළිවෙලෙහි කොන්දේසි තක්සේරු කිරීම | | |
|---|---|---|
| | *බද්ධ මෙහෙයුම* | *බද්ධ ව්‍යාපාරය* |
| **වගකීම් සඳහා බැඳීම්** | බද්ධ පිළිවෙලක පාර්ශ්ව සියළුම වගකීම්, පිරිවැය සහ වියදම් වලට නිශ්චිත සමානුපාතයකට හවුල් වන බව ගිවිසුම්ගත පිළිවෙල ප්‍රතිශ්ඨාපනය කරයි. (උදාහරණය ලෙස, පිළිවෙලිහි පාර්ශවයන්ගේ අයිතිවාසිකම් හිමිකමේ සමානුපාතයට හෝ ඔවුනට සෘජුව ආරෝපනය වන පිළිවෙල මඟින් කරගෙන යන ක්‍රියාකාරකම් සමානුපාතයට) | බද්ධ පිළිවෙල එහි ණය සහ බැඳීම් සඳහා වගකියන බව, ගිවිසුම්ගත පිළිවෙලෙහි ප්‍රතිශ්ඨාපනය කරයි. |
| | | බද්ධ ව්‍යාපාරයෙහි පාර්ශ්ව, පිළිවෙලට වගකියනුයේ ඔවුන්ගේ නියමිත ආයෝජන ප්‍රමාණයට හෝ ඔවුන්ගේ යම් නොගෙවූ නියමිත දායකයකට හෝ පිළිවෙලට නොගෙවූ අමතර ප්‍රාග්ධනයට හෝ දෙකටම පමණක් බව ගිවිසුම්ගත පිළිවෙල ප්‍රතිශ්ඨාපනය කරයි. |
| | බද්ධ ගිවිසුමක පාර්ශ්වයන්, තුන්වන පාර්ශ්වයන් කරනු ලබන වන්දි ඉල්ලීමක් සඳහා වගකීම, ගිවිසුම්ගත පිළිවෙල මඟින් ප්‍රතිශිෂ්ඨාපනය කරයි. | බද්ධ ගිවිසුමක ණයහිමියන්ට, පිළිවෙලෙහි ණය සහ බැඳීම් වෙනුවෙන් පිහිටපතා යම් පාර්ශ්වයකට එරෙහිව අයිතියක් නොමැති බව ගිවිසුම්ගත පිළිවෙල සඳහන් කරයි. |
| **අයහාර, වියදම්, ලාභය හෝ අලාභය** | බද්ධ පිළිවෙලෙහි එක් එක් පාර්ශවයේ සාපේක්ෂ කාර්‍ය සාධන පදනම මත අයහාර සහ වියදම් වෙන් කිරීම ගිවිසුම්ගත පිළිවෙලෙහි ප්‍රතිශ්ඨාපනය කරයි. උදාහරණ වශයෙන්, එක් එක් පාර්ශ්වය පෙර සැරි ධාරිතාවය බද්ධව මෙහෙයවන පදනම මත අයහාර සහ වියදම් වෙන්කිරීම ගිවිසුම්ගත පිළිවෙලෙහි ප්‍රතිශ්ඨාපනය කළ හැකිය. වෙනත් අවස්ථාවල පාර්ශවයන් පිළිවෙලට අදාළ ලාභ සහ අලාභ, පාර්ශ්වයන්ගේ පිළිවෙලෙහි අයිතිවාසිකම් නිශ්චිත සමානුපාතය වැනි පදනම මත බෙදාගැනීමට එකඟවිය හැකිය. පාර්ශ්වයන්ට පිලිවෙලෙහි වත්කම් වලට අයිතිය සහ වගකීම් සඳහා බැඳීම් ඇත්නම්, මෙය පිළිවෙල බද්ධ මෙහෙයුමක් වීමෙන් වලක්වන්නේ නැත. | පිළිවෙලෙහි කාර්යයන්ට අදාලව, එක් එක් පාර්ශ්වයේ ලාභ හෝ අලාභ කොටස ගිවිසුම්ගත පිළිවෙල ප්‍රතිශ්ඨාපනය කරයි. |

| ගිවිසුම් ගත පිළිවෙලෙහි කොන්දේසි තක්සේරු කිරීම. | | |
|---|---|---|
| | *බද්ධ මෙහෙයුම* | *බද්ධ ව්‍යාපාරය* |
| **ඇපවීම්** | බද්ධ පිළිවෙලක පාර්ශ්වයන්ම බොහෝ විට තුන්වන පාර්ශවයන්ට ඇප ලබාදීම අවශ්‍ය වේ, උදාහරණ ලෙස බද්ධ පිළිවෙලට සේවාවක් ලබාගැනීමේදී, මූල්‍යණ ලබාදීමට, එවැනි ඇප ලබාදීම හෝ පාර්ශවයක් විසින් සේවාවක් ලබාදීමට. බැඳීම, බද්ධ පිළිවෙල බද්ධ මෙහෙයුමක් ද යන වග එය මඟින්ම නිර්ණය කළ නොහැක. බද්ධ පිළිවෙල. බද්ධ මෙහෙයුමක් ද නැතහොත් බද්ධ ව්‍යාපාරයක් ද යන්න නිශ්චය කිරීමේ ලක්ෂණය නම්, පාර්ශ්වයන්ට පිළිවෙලට අදාල වගකීම් සඳහා බැඳීම් ඇද්ද යන්නය. (සමහර ඒවා සඳහා පාර්ශවයන් ඇප සපයාදී තිබීම හෝ නොතිබීම විය හැකි ය.) | |

ආ. 28 පිළිවෙලට අදාලව, පාර්ශ්වයන්ට වත්කම් වලට අයිතිය සහ වගකීම් සඳහා බැඳීම් ගිවිසුම්ගත පිළිවෙලින් නිශ්චිත කරන කල්හි, ඔවුන් බද්ධ මෙහෙයුමට පාර්ශ්වයන් සහ බද්ධ පිළිවෙල වර්ගීකරණය කිරීමේ අරමුණ සඳහා වෙනත් කරුණු සහ අවස්ථාවන් (ආ 29- ආ 33) සලකා බැලීමට අවශ්‍ය නොවේ.

**වෙනත් කරුණු සහ අවස්ථාවන් තක්සේරු කිරීම.**

ආ 29 ගිවිසුම්ගත පිළිවෙලෙහි, පිළිවෙලට අදාල පාර්ශ්වයන්ට වත්කම්වලට අයිතිය සහ වගකීම් සඳහා බැඳීම් තිබෙන බව නිශ්චිතව දක්වා නොමැති කල්හි, පාර්ශ්වයන් විසින් වෙනත් කරුණු සහ අවස්ථාවන් පිළිවෙල බද්ධ මෙහෙයුමක් ද නැතහොත් බද්ධ ව්‍යාපාරයක් ද යන්න තක්සේරුවට සලකා බැලිය යුතුය.

ආ 30 බද්ධ පිළිවෙලක්, වෙන් වූ අංශයක් ලෙස ව්‍යුහගත කළ හැකි අතර, එහි නෛතික ආකෘතිය පාර්ශ්යන්ව සහ වෙන්වූ අංශය අතර වෙන්වීමක් පිරිනැමිය හැකිය. පාර්ශ්වයන් අතර එකඟ වූ කොන්දේසි පාර්ශ්වයන්ගේ වත්කම් වලට අයිතිය සහ වගකීම් සඳහා බැඳීම් නිශ්චිතව දක්වා නොමැති වුවද, වෙනත් කරුණු සහ අවස්ථාවන් සලකා බැලීමේදී එවැනි පිළිවෙලක් බද්ධ මෙහෙයුමක් බවට වර්ගීකරණය කිරීමට තුඩු දිය හැකිය. පිළිවෙලට අදාල වත්කම්වලට අයිතිය සහ වගකීම් සඳහා බැඳීම, වෙනත් කරුණු හා අවස්ථාවන් මත දෙනු ලබන අවස්ථාවක් විය හැකිය.

ආ 31 පිළිවෙලෙහි කාර්යයක් මූලිකව නිර්මාණය, පාර්ශ්වයන්ට නිමැයුම සපයාදීම සඳහා වන කල්හි, පිළිවෙලෙහි වත්කම් වලින් සියළුම ආර්ථික වාසි සැහෙන පමණට පාර්ශ්වයන්ට අයිතිය තිබෙන බව හඟවයි. එවැනි පිළිවෙලක පාර්ශ්වකරුවනට, බොහෝ විට පිළිවෙල මගින් සපයන නිමැයුමට ඔවුන්ගේ ප්‍රවිශ්ඨය තහවුරු කරන අතර, පිළිවෙල මඟින් තුන්වන පාර්ශවයන්ට නිමැයුම පිළිවෙල මඟින් අලෙවි කිරීම වලක්වයි.

ආ 32 එවැනි නිර්මාණයක සහ අරමුණක, පිළිවෙල කෙරෙහි බලපෑම වනුයේ, පිළිවෙල මඟින් ඇතිකරන වගකීම් හරාත්මකව, පාර්ශ්වයන් නිමැයුම ඔවුන් විසින්ම මිලදී ගැනීම තුළින් ලැබෙන මුදල් ප්‍රවාහය මඟින් තෘප්තිමත් වීමයි. පිළිවෙලෙහි ක්‍රියාකාරකම් අඛණ්ඩව පවත්වා ගැනීමට පාර්ශ්වයන්ගෙන් සැහෙන පමණට දායකවන මුදල් ප්‍රවාහය එකම ප්‍රභවය වන කල්හි, පිළිවෙලට අදාල වගකීම් සඳහා පාර්ශ්වයන්ට බැඳීමක් ඇති බව හඟවයි.

**ව්‍යවහාරකරණ උදාහරණය**

*උදාහරණ 5*

පාර්ශ්වයන් දෙකක්, එක් එක් පාර්ශ්වයට සියයට 50 ක අයිතියක් ඇති සංස්ථාපිත අස්තිත්වයක බද්ධ පිළිවෙලක් ව්‍යුහගත කරන්නේ යයි උපකල්පනය (අලුතින්ම - ඇ) කරන්න. පිළිවෙලෙහි අරමුණ පාර්ශ්වයන් සඳහා ඔවුන්ගේ පෞද්ගලික නිශ්පාදන පෙරසැරී වලට අවශ්‍ය ද්‍රව්‍ය නිශ්පාදනය කිරීම තහවුරු කිරීමයි.

ක්‍රියාකාරකම් කරගෙන යනු ලබන මාර්ගය වන අස්තිත්ව 'සී' හි (සංස්ථාපිත අස්තිත්වයක්) නෛතික ආකෘතිය, මූලිකවම හඟවෙනුයේ, 'සී' අස්තිත්වයෙහි පවත්නා වත්කම් සහ වගකීම්, 'සී' අස්තිත්වයට අයත් වත්කම් හා වගකීම් බවයි. පාර්ශවයන් අතර පිළිවෙලෙහි 'සී' අස්තිත්වයේ වත්කම් වලට අයිතිය සහ වගකීම් සඳහා බැඳීමක් පාර්ශවන්ට ඇති බව නිශ්චිතව නොමැත. ඒ අනුව 'සී' අස්තිත්වයේ නෛතික ආකෘතිය සහ ගිවිසුම්ගත පිළිවෙලේ කොන්දේසී, පිළිවෙල බද්ධ ව්‍යාපාරයක් බව හඟවයි.

කෙසේ වෙතත්, පාර්ශ්වයන් පිළිවෙලහි පහත සඳහන් අංශයන් ද සැලකිල්ලට ගනී.

* පාර්ශවයක් 'සී' අස්තිත්වය මගින් නිෂ්පාදනය කරණ සියළුම භාණ්ඩ 50:50 අනුපාතයට මිල දී ගැනීමට එකඟවීම. 'සී' අස්තිත්වයට, පිළිවෙලෙහි පාර්ශ්වයන් දෙක අනුමත නොකර, නිශ්පාදන කිසිවක් තුන්වන පාර්ශ්වයකට විකිණිය නොහැකිවීම. පිළිවෙලෙහි අරමුණ පාර්ශ්වයන්ට ඔවුනට අවශ්‍ය භාණ්ඩ සම්පාදනය බැවින්, තුන්වන පාර්ශ්වයට එවැනි විකුණුම් අසාමාන්‍ය බව සහ වැදගත් නොවන බවට අපේක්ෂාව.
* පාර්ශ්වයන්ට විකුණනු ලබන නිෂ්පාදනවල මිල, පාර්ශ්ව දෙක මගින් 'සී' අස්තිත්වය දරණ ලද නිශ්පාදන පිරිවැය සහ පරිපාලන වියදම් ආවරණය කළ හැකි මට්ටමකට නිර්මාණය කරයි. මෙම මෙහෙයුම් ආදර්ශ පදනම මත, පිළිවෙල සමපේක්ෂ මට්ටමට මෙහෙයවීම අපේක්ෂා කරයි.


ඉහත කරුණුවල ආකාරය අනුව, පහත සඳහන් කරුණු සහ අවස්ථාවන් අදාල වෙයි.

* 'සී' අස්තිත්වය මඟින් නිශ්පාදනය කරනු ලබන සියළුම නිශ්පාදන මිලදී ගැනීමට පාර්ශ්වයන්ගේ බැඳීම, මුදල් ප්‍රවාහ ජනිත කිරීමට 'සී' අස්තිත්වය මුළුමනින්ම යැපීම සහ ඒ අනුව 'සී' අස්තිත්වයේ සියලුම වගකීම් අරමුදල්කරණයට පාර්ශවයන්ට බැඳී සිටි.
* 'සී' අස්තිත්වය මඟින් නිශ්පාදනය කරන සියළුම නිශ්පාදනවලට පාර්ශ්වයන්ට ඇති අයිතිය යන කරුණෙන් අදහස් කරනුයේ පාර්ශ්වයන් පරිභෝජනය කරන බව සහ එම නිසා 'සී' අස්තිත්වයේ වත්කම් වලින් සියළුම ආර්ථික වාසි වලට අයිතිය ඇති බවයි.මෙම කරුණු සහ අවස්ථාවන්, පිළිවෙල බද්ධ මෙහෙයුමක් බව හඟවයි. ඉදිරි නිෂ්පාදන ක්‍රියාවලියක පාර්ශ්වයන් තමන්ගේ නිශ්පාදන කොටස ඔවුන් විසින්ම භාවිත නොකර, ඒ වෙනුවට පාර්ශ්වයන් ඔවුන්ගේ නිශ්පාදන කොටස තුන්වන පාර්ශ්වයකට විකුණුවේ නම් හැර, බද්ධ පිළිවෙල වර්ගීකරණය පිළිබඳ නිගමනය වෙනස් නොවේ.

> * තුන්වන පාර්ශ්වයන්ට විකිණීමට හැකිවන පරිදි පාර්ශව ගිවිසුම්ගත පිළවෙලහි කොන්දේසි වෙනස් කළේ නම්, එහි ප්‍රතිඵලය අස්තිත්වය ''සී'' ඉල්ලුම, තොග සහ ණය අවදානම් පවරා ගැනීමයි. එම සිදුවීමෙන් ඇතිවන කරුණු හා සිදුවීම් බද්ධ පිළිවෙලෙහි වර්ගිකරනය නැවත තක්සේරු කිරීමේ අඩපණ වෙයි. එවැනි කරුණු සහ සිදුවීම්, පිළිවෙල බද්ධ ව්‍යාපාරයක් බව පෙන්වනු ඇත.

ආ 33 බද්ධ පිළිවෙල වෙන් වූ අංශයක් මඟින් ව්‍යුගතකර ඇති කල්හි, පිළිවෙල වර්ගීකරණයට අස්තිත්වය අනුගමනය කරන තක්සේරු කිරීම පහත ප්‍රවාහ සටහනෙහි පිළිබිඹු කරයි.

**වෙන් වූ අංශයක් මඟින් ව්‍යුහගත කළ බද්ධ පිළිවෙලක වර්ගීකරණය**



**බද්ධ පිළිවෙලක පාර්ශ්වයන්ගේ මූල්‍ය ප්‍රකාශන**

**(22 වන ඡේදය)**

**බද්ධ මෙහෙයුමකට විකුණුම් හෝ වත්කම් වලින් දායකවීම් සඳහා ගිණුම්කරණය**

ආ 34 තමා බද්ධ මෙහෙයුම්කරුවකු වන, බද්ධ මෙහෙයුමක, විකුණුමක් හෝ වත්කම් වලින් දායක වීමක් වැනි ගනුදෙනුවකින් අස්තිත්වයක් ඇතුලත් වන කල්හි, එහි අනෙක් පාර්ශ්ව සමග බද්ධ මෙහෙයුමට ගනුදෙනුවක් කරනු ලබන අතර, ඒ අනුව, බද්ධ මෙහෙයුම්කරු එවැනි ගනුදෙනුවක ප්‍රතිඵලය වන ප්‍රතිලාභ හෝ අලාභ හඳුනාගත යුත්තේ, බද්ධ මෙහෙයුමතුළ අනෙක් පාර්ශ්වයන්ගේ හිමිකමේ ප්‍රමාණයට පමණකි.

ආ 35 එවැනි ගනුදෙනුවක්, විකිණීමට ඇති වත්කම් වල ශුද්ධ උපලබ්ධි අගයේ හෝ බද්ධ මෙහෙයුමට දායකවීම් වල අඩු වීමක් හෝ ඒ වත්කම්වල හානිකරණ අලාභ පිළිබඳ සාක්ෂි සපයන කල්හි, බද්ධ මෙහෙයුම්කරු විසින් එවැනි අලාභ සම්පූර්ණයෙන්ම හඳුනාගත යුතුය.

**බද්ධ මෙහෙයුමකින් වත්කම් මිලදී ගැනීම සඳහා ගිණුම්කරණය**

ආ 36 තමා බද්ධ මෙහෙයුම්කරුවකු වන බද්ධ මෙහෙයුමක් සමග, වත්කම් මිලදී ගැනීම වැනි ගණුදෙනුවකට අස්තිත්වයක් ඇතුලත් වූ කල්හි, එය තුන්වන පාර්ශවයකට නැවත විකුණන තුරු, එහි ලාභය හෝ අලාභ කොටස හඳුනානොගත යුතුය.

ආ 37 එවැනි ගණුදෙනුවක් මිලදී ගැනීමට ඇති වත්කම් වල ශුද්ධ උපලබ්ධි අගයේ අඩුවීමක් හෝ ඒ වත්කම් වල හානිකරණ අලාභ පිළිබඳ සාක්ෂි සපයන කල්පිත, බද්ධ මෙහෙයුම්කරු එහි අලාභ වල කොටස හඳුනාගත යුතුය.

**පරිශිෂ්ඨය 'ඇ'**

*බලාත්මක දිනය, සංක්‍රාපතිය සහ වෙනත් SLFRS ඉවත් කිරීම්*

*මෙම පරිශිෂ්ඨය SLFRS හි අවශ්‍යම කොටසක් සහ SLFRS හි අනෙක් කොටස් වලට සමාන අධිකාරියක් ඇත.*

**බලාත්මක දිනය**

ඇ1 *අස්තිත්වයක් මෙම SLFRS 2014 ජනවාරි 1 දින හෝ පසුව ආරම්භවන වාර්ෂික කාලපරිච්ඡේද සඳහා ව්‍යාවහාර කළ යුතුය. ඊට පෙර ව්‍යාවහාරකරණයට ඉඩදෙනු ලැබේ. අස්තිත්වයක් මෙම SLFRS කලින් ව්‍යවහාර කරන්නේනම්, එය විසින් ඒ සමගම SLFRS 10, SLFRS 12, වෙනත් අස්තිත්වයන්හි හිමිකම් හෙළිදරව් කිරීම, LKAS 27 සහ LKAS 28 ව්‍යවහාර කරන බව අනාවරණය කළ යුතුය.*

ඇ1 අ [ඉවත් කර ඇත]

**සංක්‍රාන්තිය**

ඇ1 ආ LKAS 8 ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් හා වැරදි හි 28 වන ඡේදයේ අවශ්‍යතාවයන් එසේ වුවත් මෙම SLFRS ය ප්‍රථම වරට ව්‍යවහාර කරන විටදී SLFRS 11 ව්‍යවහාර කළ ප්‍රථම වාර්ෂික කාලපරිච්ඡේදයට ("වහාම වූ පූර්වගාමී කාලපරිච්ඡේදය") වහාම වූ පූර්වගාමී වාර්ෂික කාලපරිච්ඡේදයේදී අස්තිත්වය ඉදිරිපත් කිරීමට අවශ්‍ය කරනුයේ LKAS 8 හි 28(ඊ) ඡේදයෙන් අවශ්‍යකරන ප්‍රමාණාත්මක තොරතුරු පමණි. ප්‍රවර්තන කාලපරිච්ඡේදය හෝ කලින් වූ සංසන්දනාත්මක කාලපරිච්ඡේද සඳහා ද මෙම තොරතුරු අස්තිත්වයට ඉදිරිපත් කළ හැකිය එහෙත් එසේ කිරීම අවශ්‍යම නොවේ.

**බද්ධ ව්‍යාපාර- සමානුපාතික ඒකබද්ධකරණය, ස්කන්ධ ක්‍රමයට සංක්‍රාන්තිවීම.**

ඇ2 සමානුපාතික ඒකාබද්ධකරණයෙන්, ස්කන්ධ ක්‍රමයට මාරුවන කල්හි, අස්තිත්වයක් බද්ධ ව්‍යාපාරයෙහි තම ආයෝජනය, ඉදිරිපත් කළ ආසන්නතම වූ පූර්වගාමී පරිච්ඡේදයේ ආරම්භය පරිදි හඳුනාගත යුතුය. ඒ ආරම්භක ආයෝජනය අස්තිත්වය කලින් සමානුපාතික ඒකබද්ධකරණයේ වත්කම් සහ වගකීම්වල ධාරණ අගයේ සමාහාරය, අත්පත්කර ගැනීමේදී පැනනගින යම් කීර්තිනාමයක් ඇතුලත්ව මිණුම්කළ යුතුය. කීර්තිනාමය විශාල මුදල් උත්පාදන ඒකකයකට හෝ මුදල් උත්පාදන ඒකක සමූහයකට කලින් අයත් වී නම්, අස්තිත්වය විසින් බද්ධ ව්‍යාපාරයට සහ මුදල් උත්පාදන ඒකකය හෝ මුදල් උත්පාදන ඒකක සමූහයේ ධාරණ අගයේ සාපේක්ෂ පදනම මත කීර්තිනාමය එය අයිති අයට බෙදා වෙන්කල යුතුය.

ඇ3 ඇ 2 ඡේදය ප්‍රකාර නිර්ණය කළ ආයෝජනයේ ආරම්භක ආරම්භය ශේෂය මූලික හඳුනාගැනීමේදී, ආයෝජනයේ සලකනු ලබන පිරිවැය ලෙස සලකයි. අස්තිත්තවයක් ආයෝජනයේ ආරම්භක ශේෂයට LKAS 28 හි 40-43 ඡේද ව්‍යවහාරකර, ආයෝජනය හානිකරණය වී ඇත්දැයි තක්සේරුකර, යම් හානිකරන අලාභයක් කලින්ම ඉදිරිපත් කළ ආසන්නතම වූ පූර්වගාමී කාලපරිච්ඡේදය ආරම්භයේ රඳවාගත් ඉපැයීම්වලට ගැලපිය යුතුය. LKAS 12 ආදායම් බදු වල 15 වන සහ 24 වන ඡේදයන්හි, මූලික බැහැර කිරීමේ අවශ්‍යතාවය කලින් සමානුපාතිකව ඒකාබද්ධ කල බද්ධ ව්‍යාපාරයක් සඳහා සංක්‍රාන්ති අවශ්‍යතා ව්‍යවහාරකරණයේ ප්‍රතිඵලයක් වන බද්ධ ව්‍යාපාරයක ආයෝජනයක්, අස්තිත්වයක් හඳුනාගන්නා කල්හි, ව්‍යවහාර නොවේ.

ඇ4 කලින් සමානුපාතිකව ඒකාබද්ධ කල සියළුම වත්කම් සහ වගකීම් සමාහාරකරණයේ දී සෘණ ශුද්ධ වත්කම් ප්‍රතිඵලය වී නම්, සෘණ ශුද්ධ වත්කම්වලට අදාල නෛතික හෝ සම්මුතික බැඳීමක් ඇද්දැයි අස්තිත්වයක් විසින් තක්සේරු කළ යුතු අතර, එසේ නම්, අස්තිත්වය විසින් අනුරූපී වගකීම හඳුනාගත යුතුය. සෘණ ශුද්ධ වත්කම් වලට අදාලව නෛතික හෝ සම්මුතික බැඳීමක් නැතිබව අස්තිත්වය විසින් නිගමනය කළහොත්, අනුරූපී වගකීම හඳුනා නොගත යුතු නමුත් එය ඉදිරිපත් කළ ආසන්නතම පූර්වගාමී කාල පරිච්ඡේදය ආරම්භයේ රඳවාගත් ලාභ ගැලපිය යුතුය. අස්තිත්වය විසින් මෙම කරුණ බද්ධ ව්‍යාපාරයේ මුලින්ම ඉදිරිපත් කළ ආසන්නතම පූර්වගාමී පරිච්ඡේදයේ ආරම්භයට සහ මෙම SLFRS මුලින් ව්‍යවහාර කරන දිනට සමුච්චය හඳුනානොගත් අලාභ කොටස සමග හෙළිදරව් කළ යුතුය.

ඇ5 අස්තිත්වයක් විසින් ඉදිරිපත් කරන ලද ආසන්නතම පූර්වගාමී කාලපරිච්ඡේදය ආරම්භයට තනි රේඛීය ආයෝජන ශේෂයක් ලෙස එකතු කරනු ලැබූ වත්කම් හා වගකීම් වල බෙදුනු ආකාරය හෙළිදරව් කළ යුතුය. ඇ 2-6 ඡේදයන්ට යොමුව අස්තිත්වයක් සංක්‍රාන්ති අවශ්‍යතා සඳහා සකස් කරනු ලබන එකම ආකාරයකට, සියලුම බද්ධ ව්‍යාපාර සඳහා හෙළිදරව් කළ යුතුය.

ඇ6 ආරම්භක හඳුනාගැනීමෙන් පසුව, අස්තිත්වයක් LKAS 28 ප්‍රකාර එහි බද්ධව්‍යාපාරවල ආයෝජන ස්කන්ධ ක්‍රමය භාවිතකරමින් ගිණුම්ගත කළ හැකිය.

**බද්ධ මෙහෙයුම්- වත්කම් සහ වගකීම් සඳහා ගිණුම්කරණයට ස්කන්ධ ක්‍රමයෙන් සංක්‍රාන්ති වීම.**

ඇ7 බද්ධ මෙහෙයුමක එහි අයිතිය වෙනුවෙන් එහි වත්කම් සහ වගකීම් සඳහා ගිණුම්කරණයට, ස්කන්ධ ක්‍රමයෙන් මාරුවන කල්හි, අස්තිත්වයක් ඉදිරිපත් කරන ලද මුල්ම ආසන්නතම වූ පූර්වගාමී කාලපරිච්ඡේදය ආරම්භයේ දී, කලින් ස්කන්ධ ක්‍රමය භාවිතාකරමින් ගිණුම්කරගතකර තිබුණ ආයොජන ඉවත්කර සහ LKAS 28 හි 38 වන ඡේදය ප්‍රකාර, පිළිවෙලෙහි ශුද්ධ ආයෝජනයේ කොටසක් වූ වෙනත් අයිතම සහ ආයෝජනයේ ධාරණ අගයේ කොටසක් විය හැකි කීර්තිනාමය ඇතුලත්ව, බද්ධ මෙහෙයුමෙහි, එහි අයිතිය වෙනුවෙන් එක් එක් වත්කමේ සහ වගකීමේ කොටස හඳුනාගනී.

ඇ8 ගිවිසුම්ගත පිළිවෙල ප්‍රකාර එහි අයිතිය සහ වගකීම නිශ්චිත සමානුපාත පදනම මත බද්ධ පිළිවෙලෙට අදාල වත්කම් සහ වගකීම්වල එහි අයිතිය අස්තිත්වයක් නිර්ණය කළ යුතුය. අස්තිත්වයක් ආරම්භක වත්කම් සහ වගකීම්වල ධාරණ අගය, ආසන්නතම පූර්වගාමී කාලපරිච්ඡේදයේදී ඉදිරිපත් කරන ලද ආයෝජනවල ධාරණ අගය ආරෝපනය නොකිරීම මඟින් අස්තිත්වය ස්කන්ධ ක්‍රමය ව්‍යවහාර කිරීමේදී භාවිතාකල තොරතුරු පදනම මතම මිණුම්කරයි.

ඇ9 ආයෝජනයක් මුලින් ස්කන්ධ ක්‍රමය භාවිතාකරමින් ගිණුම්ගත කිරීම තුළින් පැන නගින යම් වෙනසක්, LKAS 28 හි 38 වන ඡේදය ප්‍රකාර පිළිවෙලෙහි අස්තිත්වයේ ශුද්ධ ආයෝජනයේ කොටසක් වන වෙනත් අයිතම සහ කීර්තිනාමය ඇතුලත්ව වත්කම් සහ වගකීම්වල, ශුද්ධ අගය හඳුනාගැනීමේදී:

(අ) කීර්තිනාමය ඇතුලත්ව, වත්කම් සහ වගකීම්වල ශුද්ධ අගය ඉවත් කළ ආයෝජනයට (සහ අස්තිත්වයේ ශුද්ධ වත්කම්වල කොටසක් වන වෙනත් අයිතම) වඩා වැඩිනම්, ආයෝජනයට අදාල යම් කීර්තිනාමය සමඟ යම් ඉතිරි වෙනසක් ඉදිරිපත් කරන ලද ආසන්නතම පූර්වගාමී කාලපරිච්ඡේදයේ ආරම්භයට රඳවාගත් ඉපයීම් වලින් ගැලපීම්කර, හිලව් කළ යුතුය.

(ආ) යම් කීර්තිනාමයක් ඇතුලත්ව, වත්කම් සහ වගකීම් වල ශුද්ධ අගය හඳුනාගත් ඉවත්කල ආයෝජනයට (සහ අස්තිත්වයේ ශුද්ධ වත්කම්වල කොටසක් වන යම් වෙනත් අයිතම) වඩා අඩු නම්, ආසන්නතම පූර්වගාමී කාල පරිච්ඡේදය ආරම්භයේ රඳවාගත් ඉපයීම් වලින් ගැලපිය යුතුය.

ඇ 10 අස්තිත්වයක් වත්කම් සහ වගකීම් සඳහා ස්කන්ධ ක්‍රමයෙන් මාරුවීමේදී ඉවත්කළ ආයෝජන සහ හඳුනාගත් ආයෝජන අතර සැසඳීමක්, ඉදිරිපත් කළ ආසන්නතම පූර්වගාමී කාලපරිච්ඡේදයේ ආරම්භක රඳවාගත් ඉපයීම් වලින් ගැලපීම් කරන ලද ඉතිරි වෙනස ද සමඟ සැපයිය යුතුය.

ඇ 11 අස්තිත්වයක් බද්ධ මෙහෙයුමකට අදාල වත්කම් සහ වගකීම්වල එහි අයිතිය හඳුනාගැනීමේදී LKAS 12 හි 15 සහ 24 වන ඡේදයන්හි මූලික හඳුනාගැනීමේ ව්‍යතිරේක ව්‍යවහාර නොවෙයි.

**අස්තිත්වයක වෙන්ව ඉදිරිපත් කරන මූල්‍ය ප්‍රකාශන වලදී සංක්‍රාන්ති ප්‍රතිපාදන**

ඇ 12 අස්තිත්වයක් LKAS 27 හි 10 වන ඡේදය ප්‍රකාර, එහි මෙන්ම ඉදිරිපත් කරන මූල්‍ය ප්‍රකාශන සඳහා, එහි බද්ධ මෙහෙයුමක අයිතිය පිරිවැයට හෝ SLFRS 9 ප්‍රකාර කලින් ගිණුම්කරණය කිරීමේදී.

(අ) ආයෝජනය ඉවත් කිරීම සහ එහි බද්ධ මෙහෙයුමේ අයිතිය වෙනුවෙන් වත්කම් සහ වගකීම් ඇ-7 ඇ-9 ඡේද ප්‍රකාර අගයන් නිර්ණය කිරීම.

(ආ) ඉවත් කළ ආයෝජනය සහ හඳුනාගත් වත්කම් සහ වගකීම්, ඉතිරි වූ යම් වෙනසක් ආසන්නතම පූර්වගාමී කාල පරිච්ඡේදය ආරම්භයේ රඳවාගත් ඉපයීම් සමඟ ගැලපීම් කිරීමත් අතර සැසඳීමක් සැපයීම.

**ආසන්නතම පූර්වගාමී කාලපරිච්ඡේදයට' යොමුවීම්**

ඇ 12 අ ඇ 2 - ඇ12 ඡේදයන්හි 'ආසන්නතම පූර්වගාමී කාලපරිච්ඡේදයට' යොමුවීම කෙසේ වෙතත් ඕනෑම කලින් ඉදිරිපත් කරන ලද කාලපරිච්චේදයක් සඳහා ගලපන ලද තුලනාත්මක තොරතුරු ඉදිරිපත් කළ හැකිය. එහෙත් එසේ කිරීම අවශ්‍ය නොවේ. අස්තිත්වයක් ගලපන ලද තුලනාත්මක තොරතුරු කලින් කාල පරිච්ඡේදයක් සඳහා ඉදිරිපත් නොකරන්නේ නම් ඇ2 - ඇ12 ඡේදවල 'ආසන්නතම පූර්වගාමී කාලපරිච්ඡේදය' වෙත සියලු යොමුවීම් 'ඉදිරිපත් කරන ලද කලින්ම වූ ගැලපූ තුලනාත්මක කාලපරිච්ඡේදය'ට ලෙස කියවිය යුතුය.

ඇ 12 ආ අස්තිත්වයක් නොගැලපූ තුලනාත්මක තොරතුරු ඕනෑම කලින් කාලපරිච්ඡේදයන් සඳහා ඉදිරිපත් කරන්නේ නම් එම තොරතුරු නොගැලපූ තොරතුරු ලෙස පැහැදිලිව හඳුනාගත යුතුය. සහ එම තොරතුරු පිළියෙළ කර ඇත්තේ වෙනත් පදනමක් මත බව සඳහන් කර එම පදනම පැහැදිලි කළ යුතුය.

ඇ 13 ඇ 12 ඡේදයට යොමු වූ බද්ධ මෙහෙයුම් සඳහා සංක්‍රාන්ති අවශ්‍යතාවයන් ව්‍යවහාරකරණය මඟින් ප්‍රතිඵලය වන එහි වෙන්ව ඉදිරිපත් කරන මූල්‍ය ප්‍රකාශන, බද්ධ මෙහෙයුමේ එහි අයිතියට අදාල වත්කම් සහ වගකීම් අස්තිත්වයක් හඳුනාගන්නා කල්හි, LKAS 12, 15 වන සහ 24 වන ඡේදයන්හි ආරම්භක හඳුනාගැනීමේ ව්‍යතිරේක ව්‍යවහාර නොවේ.

SLFRS 9 ට යොමුවීම්

ඇ 14 අස්තිත්වයක් මෙම SLFRS ව්‍යවහාර කරන නමුත්, තවමත් SLFRS 9 ව්‍යවහාර නොකරන්නේ නම්, SLFRS 9 ට යම් යොමුකිරීමක්, LKAS 39 මූල්‍ය සාධන පත්‍ර: හඳුනාගැනීම සහ මිනුම්කරණයට යොමුව කියවිය හැකිය.

**වෙනත් SLFRS ඉවත්කිරීම**

ඇ 15 මෙම SLFRS පහත සඳහන් SLFRS අවලංගු කරයි.

(අ) LKAS 31 *බද්ධ ව්‍යාපාරයන්හි අයිතිය, සහ*

(ආ) SIC 13- *බද්ධව පාලිත අස්තිත්ව - බද්ධ ව්‍යාපාරිකයින් විසින් මූල්‍ය නොවන දායකවීම්.*

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

# SLFRS 12

වෙනත් අස්තිත්තවයන්හි හිමිකම් හෙළිදරව් කිරීම

**පටුන**


| **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත SLFRS 12** | **ඡේද** |
|---|---|
| **වෙනත් අස්තිත්වයන්හි හිමිකම් හෙළිදරව් කිරීම** | |
| අරමුණ | **1 - 4** |
| අරමුණ සපුරා ගැනීම | **2 - 4** |
| විෂය පථය | **5 - 6** |
| සැලකියයුතු විනිශ්වයන් සහ උපකල්පන | **7 - 9** |
| පරිපාලිතයන්හි හිමිකම් | **10 - 19** |
| සමුහයේ ක්‍රියාකාරකම් සහ මුදල් ප්‍රවාහ කෙරෙහි පාලනය | |
| නොමැති හිමිකම්වලට ඇති අයිතිය | **12** |
| සැලකිය යුතු සීමා කිරිම්වල ස්වභාවය සහ ප්‍රමාණය | **13** |
| ඒකාබද්ධ ව්‍යුහාත්මක අස්තිත්වයන්හි අස්තිත්වයේ හිමිකම් සමග | |
| සම්බන්ධිත අවදානම්වල ස්වභාවය | **14 - 17** |
| පරිපාලිතයක පාලනය අහිමිවීමේ ප්‍රතිඵලයකී | |
| නොමැති පරිපාලකගේ අයිතිවාසිකම් හිමිකම් | |
| සංචලනයන්හි ප්‍රතිඵල | **18** |
| වාර්තාකරණය කාලපරිච්ඡේදය තුල පරිපාලිතයක | |
| පාලනය අහිමිවීමේ ප්‍රතිඵලය | **19** |
| **බද්ධ සැකසුම් හා ආශ්‍රිතයන්හි හිමිකම්** | **20 - 23** |
| බද්ධ සැකසුම් සහ ආශ්‍රිතයන්හි ඇති අස්තිත්වයේ | |
| හිමිකම් වල ස්වභාවය ප්‍රමාණය සහ මුල්‍යමය බලපැම් | **21 - 22** |
| බද්ධ ව්‍යාපාර සහ ආශ්‍රිතයන්හි ඇති අස්තිත්වයේ හිමිකම් | **23** |
| සමග සම්බන්ධිත අවදානම් | |
| ඒකාබද්ධ නොවන ව්‍යුහගත අස්තිත්වයන්හි හිමිකම් | **24 - 31** |
| හිමිකම්වල ස්වභාවය | **26 - 28** |
| අවදානම්වල ස්වභාවය | |

**පරිශිෂ්ඨ**

අ නිර්වචිත යෙදුම්

ආ ව්‍යවහාරකරණ උපදේශ

ඇ බලාත්මක දිනය සහ සංක්‍රාන්තිය


**ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත SLFRS 12**

***වෙනත් අස්තිත්වයන්හි හිමිකම් හෙළිදරව් කිරීම***

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත SLFRS 12 වෙනත් අස්තිත්වයන්හි හිමිකම් හෙළිදරව් කිරීම 1-31 ඡේදයන්හි සහ පරිශිෂ්ඨ අ - ඇ වල දක්වා ඇත. සෑම ඡේදයකටම සමාන වු අධිකාරියක් ඇත. **තද අකුරු** ඡේද ප්‍රධාන මුලධර්ම සඳහන් කරයි. පරිශිෂ්ඨ 'අ' හි නිර්වචිත යෙදුම් ඇල අකුරින් වන අතර ඒවා SLFRS වල පළමුවරට දක්නට ලැබේ. අනෙක් යෙදුම්වල නිර්වචන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සඳහා පාරිභාෂික ශබ්ද මාලාවේ දක්වා ඇත. SLFRS 12, එහි පරමාර්ථ සහ නිගමනයන් සඳහා වූ පදනම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට වු පුර්විකාව සහ මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම සහ ඉදිරිපත් කිරීම සඳහා වු ආකෘතිමය රාමුවද සම්බන්ධ කොටගෙන කියවිය යුතුය. පැහැදිලි මාර්ගෝපදේශ නොමැති අවස්ථාවලදී ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සඳහාත් ඒවා භාවිතය සඳහාත් පදනමක් SLFRS 8 ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු සහ වැරදි මගින් සැපයේ.

<u>අරමුණ</u>

1 **මෙම SLFRS හි අරමුණ, අස්තිත්වයකට එහි මුල්‍ය ප්‍රකාශන භාවිතාකරන්නට පහත සඳහන් දෑ ඇගයීමට හැකිවන ලෙස තොරතුරු හෙළිදරව් කිරීම අවශ්‍ය කිරීමටය.**

**(අ) වෙනත් අස්තිත්වයන්හි එහි හිමිකම් සමග සම්බන්ධිත අවදානම්වල ස්වභාවය, සහ**

**(ආ) එවැනි හිමිකම්, එහි මුල්‍ය තත්ත්වයට මුල්‍ය කාර්ය සාධනය සහ මුදල් ප්‍රවාහය කෙරෙහි බලපෑම.**

අරමුණ සපුරා ගැනීම

2 1 වන ඡේදයෙහි අරමුණ සපුරාගැනිමට අස්තිත්වයක් හෙළිදරව් කළයුතු දෑ

(අ) පහත සඳහන් දෑ නිර්ණය කිරීමේදී කරන ලද වැදගත් විනිශ්චයන් සහ උපකල්පන

(i) වෙනත් අස්තිත්වයක හෝ සැකසුමක එහි හිමිකම්වල ස්වභාවය.

(ii) එහි හිමිකම් ඇති බද්ධ සැකසුමක වර්ගය (7 - 9 ඡේද)

(iii) අදාළ වන්නේ නම් (9අ ඡේදය) එය ආයෝජන අස්තිත්වයක නිර්වචනය සමග එකඟ වන වග; සහ

(ආ) එහි හිමිකම් පිළිබඳ තොරතුරු

(i) පරිපාලකයන්හි (10-19 ඡේද)

(ii) බද්ධ සැකසුම් සහ ආශ්‍රිතයන්හි (20-23 ඡේද) සහ

(iii) අස්තිත්වය මගින් පාලනය නොවන ව්‍යුහගත අස්තිත්ව (ඒකාබද්ධ නොකරන ව්‍යුහගත අස්තිත්ව) (24-31 ඡේද)

3 මෙම **SLFRS** මගින් අවශ්‍යකරන හෙළිදරව් කිරීම්, වෙනත් **SLFRSs** මගින් අවශ්‍යකරන හෙළිදරව් කිරීම්ද එක්ව, 1 වන ඡේදයෙහි අරමුණ සපුරාලන්නේ නොමැති නම්, ඒ අරමුණ සපුරා ගැනීම සඳහා අවශ්‍ය කරන වෙනයම් අමතර තොරතුරු අස්තිත්වයක් හෙළිදරව් කළ යුතුය.

4 අස්තිත්වයක් අරමුණ තෘප්ත කිරීමට අවශ්‍ය හෙළිදරව් කිරීම් විස්තර තලය සහ මෙම SLFRS හි එක් එක් අවශ්‍යතාවය කෙරෙහි කෙතරම් අවධාරනයක් තැබිය යුතුද යන්න සලකා බැලිය යුතුය. නොවැදගත් විස්තර විශාල ප්‍රමාණයක් හෝ විවිධ ලක්ෂණ වලින් යුක්ත අයිතම සමාහාර කිරීම මගින් ප්‍රයෝජනවත් තොරතුරු විකෘති නොකිරීම උදෙසා හෙළිදරව් කිරීම් සමාහාර කිරීම හෝ සමාහාර නොකිරීම අස්තිත්වයකට කළ හැකිය.

<u>විෂය පථය</u>

5 පහත සඳහන් ඕනෑම එකක හිමිකමක් ඇති අස්තිත්වයක් මෙම SLFRS ව්‍යවහාර කළ යුතුය.

(අ) පරිපාලිත

(ආ) බද්ධ සැකසුම් (එනම්, බද්ධ මෙහෙයුම් හෝ බද්ධ ව්‍යාපාර)

(ඇ) ආශ්‍රිත

(ඈ) ඒකාබද්ධ නොකරන ව්‍යුහගත අස්තිත්ව

6 මෙම SLFRS ව්‍යවහාර නොවන්නේ

(අ) LKAS 19 සේවක ප්‍රතිලාභ ව්‍යාපාර වන පසු රැකියා ප්‍රතිලාභ සැලසුම් හෝ වෙනත් දිගු කාලීන සේවක ප්‍රතිලාභ සැලසුම්.

(ආ) LKAS 27 වෙන්ව ඉදිරිපත් කරන මුල්‍ය ප්‍රකාශන ව්‍යවහාර කරන අස්තිත්වයේ වෙන්ව ඉදිරිපත් කරන මුල්‍ය ප්‍රකාශනවලට කෙසේවෙතත්, අස්තිත්වයක හිමිකම් පවතිනේ, ඒකාබද්ධ නොකරන ව්‍යුහගත අස්තිත්වයන්හි සහ එවායේ එකම මුල්‍ය ප්‍රකාශන ලෙස වෙන්ව ඉදිරිපත් කරන මුල්‍ය ප්‍රකාශන පිලියෙල කරන්නේ නම්, ඒ මුල්‍ය ප්‍රකාශන පිලියෙළ කරන කල්හි 24-31 ඡේදයන්හි අවශ්‍යතා ව්‍යවහාර කළ යුතුය.

(ඇ) අස්තිත්වයක් මගින් සහභාගි වන නමුත් බද්ධ පාලනයක් නොමැති හිමිකම් රඳවාගෙන ඇති බද්ධ සැකසුමක, ඒ හිමිකමක් රඳවාගෙන ඇති බද්ධ සැකසුමක, ඒ හිමිකමේ ප්‍රතිඵලයක් ලෙස සැකසුම කෙරෙහි සැලකිය යුතු බලපෑමක් නොමැතිවීම හෝ හිමිකම ව්‍යුහගත අස්තිත්වයක් වීම.

(ඈ) SLFRS 9 මුල්‍ය සාධන පත්‍ර ප්‍රකාර ගිණුම් තබන වෙනත් අස්තිත්වයක හිමිකම තිබීම, කෙසේ වෙතත්, අස්තිත්වයක් මෙම SLFRS ව්‍යවහාර කළ හැකි අවස්ථා.

(i) ආශ්‍රිතයක හෝ බද්ධ ව්‍යාපාරයක ඇති හිමිකම් LKAS 28 ආශ්‍රිතයන්හි සහ බද්ධ ව්‍යාපාරවල ආයෝජන ප්‍රකාර, ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමට ඒ හිමිකම මිණුම්කරණ කල්හි ; හෝ

(ii) ඒ හිමිකම් ඒකාබද්ධ නොකරන ව්‍යුහගත අස්තිත්වයක හිමිකමක් වන විට.

<u>සැලකියයුතු විනිශ්චයන් සහ උපකල්පන</u>

**7 පහත සඳහන් දෑ නිර්නය කිරීමේදී කරන ලද සැලකිය යුතු විනිශ්චයන් සහ උපකල්පන (සහ ඒ විනිශ්චයයට සහ උපකල්පනයන් වෙනස් කිරීම්) පිළිබඳ තොරතුරු අස්තිත්වයක් විසින් හෙළිදරව් කළ යුතුය.**

**(අ) වෙනත් අස්තිත්වයක පාලනය එය සතුවීම, එනම්, SLFRS 10 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 5 සහ 6 වන ඡේදවල විස්තර කර ඇති පරිදි ආයෝජකයෙක් වීම.**

**(ආ) සැකසුමක බද්ධ පාලනයක් හෝ වෙනත් අස්තිත්වයක් කෙරෙහි සැලකිය යුතු බලපෑමක් තිබීම සහ**

**(ඇ) සැකසුම වෙන් වු අංශයන් හරහා ව්‍යුහ ගතකල කල්හි, බද්ධ සැකසුමේ වර්ගය (එනම්, බද්ධ මෙහෙයුමක් හෝ බද්ධ ව්‍යාපාරයක්)**

8 7 වන ජේදය ප්‍රකාර හෙළිදරව් කළ සැලකිය යුතු විනිශ්චයන් සහ උපකල්පන වල “අස්තිත්වය මගින් කරුණු සහ තත්ත්වයන් වෙනස් කිරීම් කරන කල්හි, එයට පාලනයක් තිබිම, බද්ධ පාලනයක් හෝ වාර්තාකරණ කාලපරිච්ජේදය තුල සැලකිය යුතු බලපෑම් සංචලන වැනි කරුණු පිළිබඳ නිගමන ඇතුලත් වෙයි.

9 7 වන ජේදය සමග අනුකූලවීමට, අස්තිත්වයක් විසින් උදාහරණ ලෙස පහත සඳහන් කරුණු නිර්නය කිරීමට කළ සැලකිය යුතු විනිශ්චයන් සහ උපකල්පන හෙළිදරව් කළ යුතුය.

(අ) වෙනත් අස්තිත්ත්වයක ඡන්ද අයිතියෙන් භාගයකට වඩා රඳවා ගත්ත ද, වෙනත් අස්තිත්ත්වය පාලනයට වඩා රඳවා ගත්තද, වෙනත් අස්තිත්වය පාලනය නොකරන බව.

(ආ) වෙනත් අස්තිත්වයක ඡන්ද අයිතියෙන් භාගයකට වඩා අඩුවෙන් රඳවා ගත්තද, වෙනත් අස්තිත්වය පාලනය කරන බව.

(ඇ) එය නියෝජිතයෙක් හෝ ප්‍රධානියෙක් වීම (SLFRS 10 හි ආ 58 - ආ72 ජේද බලන්න)

(ඈ) වෙනත් අස්තිත්වයක ඡන්ද අයිතියෙන් සියයට 20 කට වැඩියෙන් රඳවා ගත්තද, එය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් නොමැති බව.

(ඉ) වෙනත් අස්තිත්වයක ඡන්ද අයිතියෙන් සියයට 20 කට අඩුවෙන් රඳවා ගත්තද, එය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති බව.

ආයෝජන අස්තිත්ත්ව තත්ත්වය

**9අ. SLFRS 10, 27 ඡේදය ප්‍රකාරව අස්තිත්වයක් ආයෝජන අස්තිත්වයක් ලෙස පරිපාලකය නිර්ණය කරනවිට, එය ආයෝජන අස්තිත්වයක් ලෙස නිර්ණය කිරීමට හේතු වූ වැදගත් විනිශ්චයන් සහ උපකල්පන ආයෝජන අස්තිත්වය හෙළිදරව් කළ යුතුය. ආයෝජන අස්තිත්වයට එකක් හෝ ඊට වැඩි ගණනක ආයෝජන අස්තිත්වයක දර්ශීය ගති ලක්ෂණ (SLFRS 10 හි 28 ඡේදය) දක්නට නොමැති නම් එය එසේ වුවත් ආයෝජන අස්තිත්වයක් ලෙස නිගමනය කිරීමට වූ හේතු ආයෝජන අස්තිත්වයට හෙළිදරව් කළ යුතුය.**

9ආ. අස්තිත්වයක් ආයෝජන අස්තිත්වයක් බවට පත්වනවිට හෝ එම තත්ත්වය නවතින විටදී, ආයෝජන අස්තිත්වයේ තත්ත්වයට වෙනස්වීම් සහ වෙනස්වීමට හේතු හෙළිදරව් කළ යුතුය. අමතරව ආයෝජන අස්තිත්වයක් බවට පත්වන අස්තිත්වය පහත දෑ ඇතුළුව අස්තිත්වයේ තත්ත්වයේ වෙනස්වීමේ බලපෑම ඉදිරිපත් කළ කාල පරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය.

(අ) ඒකාබද්ධකරණය කළයුතු බව නැවතුන පරිපාලිත වල තත්ත්වය වෙනස් වූ දින මුළු සාධාරණ අගය.

(ආ) SLFRS 10 හි ආ 101 ඡේදය ප්‍රකාරව ගණනය කරන ලද මුළු ප්‍රතිලාභ හෝ අලාභ යමක් වේනම් ; සහ

(ඇ) ප්‍රතිලාභ හෝ අලාභ හඳුනාගත් (වෙනම ඉදිරිපත් නොකරන්නේ නම්) ලාභ හා අලාභ පේලි අයිතමය(යන්)

පරිපාලිකයන්හි හිමිකම්

**10 අස්තිත්වයක් විසින්, එහි ඒකාබද්ධ මූල්‍යය ප්‍රකාශන භාවිතා කරන්නන්ට පහත කරුණු පිළිබඳ තොරතුරු හෙළිදරව් කළ යුතුය.**

**(අ) තේරුම් ගැනීමට.**

**(i) සමූහයේ සංයුතිය, සහ**

**(ii) පාලනය- නොමැති හිමිකම්වලට සමූහයේ ක්‍රියාකාරම් සහ මුදල් ප්‍රවාහයෙහි ඇති හිමිකම් (12 වන ජේදය) ؛ සහ**

(ආ) ඇගයීමට ：

**(i)** **සමූහය පිළිබඳ ප්‍රවිශ්‍යයට හෝ වත්කම් භාවිතය සහ වගකීම් බේරුම් කිරීමට එහි හැකියාව මත පවත්නා සැලකිය යුතු සීමා කිරීම්වල ස්වභාවය සහ ප්‍රමාණය (13 වන ජේදය)**

**(ii)** **එහි ඒකාබද්ධ ව්‍යුහගත අස්තිත්වයන්හි හිමිකම් සමග සම්බන්ධිත අවදානම්වල ස්වභාවය සහ සංචලන (14-17 ජේදය)**

**(iii)** **පරිපාලිතයක පාලනය අහිමිවීමේ ප්‍රතිඵලයක් නොමැති අයිතිවාසිකමේ හිමිකම් සංචලනයන්හි ප්‍රතිඵල (18 වන ජේදය) සහ**

**(iv)** **වාර්තාකරණ කාලපරිච්ජේදය තුල පරිපාලිතයක පාලනය අහිමිවීමේ ප්‍රතිඵල (18 වන ජේදය)**

11 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට භාවිතාකරන පරිපාලිතයේ මූල්‍යප්‍රකාශන වල දිනය හෝ කාලපරිච්ජේදය ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලින් වෙනස්වන කල්හි,

(SLFRS 10 හි ආ 92 සහ ආ 93 ජේද බලන්න) අස්තිත්වයක් හෙළිදරව් කළ යුතුද：

(අ) පරිපාලිතයේ මූල්‍ය ප්‍රකාශනවල, වාර්තාකරණ කාලපරිච්ජේදයේ අවසාන දිනය, සහ

(ආ) වෙනස් වූ දිනයක් හෝ කාලපරිච්ජේදයක් භාවිතා කිරිම සඳහා හේතුව.

**පාලනය නොමැති හිමිකම් වලට සමූහයේ ක්‍රියාකාරිකම් සහ මුදල් ප්‍රවාහයේ පවත්නා හිමිකම**

12 වාර්තාකරණය අස්තිත්වයට ප්‍රමාණවත් පාලනය නොමැති හිමිකම් සතු සෑම පරිපාලිතයක් වෙනුවෙන්ම අස්තිත්වයක් විසින් හෙළිදරව් කළ යුතු දෑ.

(අ) පරිපාලිතයේ නම

(ආ) පරිපාලිතයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය (සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානයෙන් වෙනස්කම් සංස්ථාපිතව)

(ඇ) පාලනය නොමැති හිමිකම් රඳවා ගෙන ඇති අයිතිවාසිකම් හිමිකමේ සමානුපාතය.

(ඈ) රඳවාගෙන ඇති අයිතිවාසිකම් හිමිකමෙන් වෙනස්කම්, පාලනය - නොමැති හිමිකම් රදවා ගෙන ඇති ඡන්ද අයිතියේ අනුපාතය.

(ඉ) වාර්තාකරණ කාලපරිච්ජේදය තුල පරිපාලිතයක පාලනය නොමැති හිමිකම්වලට බෙදා වෙන්කල ලාභය හෝ අලාභය.

(ඊ) වාර්තාකරණ කාලපරිච්ජේදය පරිපාලනයේ සමුච්චිත පාලනය නොමැති හිමිකම්.

(උ) පරිපාලිත පිළිබඳ සංක්ෂිප්ත මූල්‍ය තොරතුරු (ආ 10 ජේදය බලන්න.)

**සැලකිය යුතු සීමා කිරීම්වල ස්වභාවය සහ ප්‍රමාණය.**

13 අස්තිත්වයක් හෙළිදරව් කළ යුතු දෑ

(අ) සමූහයේ වත්කම්වලට ප්‍රවිශ්‍යය හෝ භාවිතය සහ වගකීම් බේරුම් කිරීමට එහි හැකියාව මත වැනි සැලකිය යුතු සීමා කිරීම් (උදා ව්‍යාවස්ථාපිත, ගිවිසුම්මය සහ නියාමන සීමාකිරීම්)

(i) පරිපාලකට හෝ එහි පරිපාලිතයට සමූහය ඇතුලත වෙනත් අස්තිත්වයන්ට මුදල් හෝ වෙනත් වත්කම් (හෝ ආකෘතියේ) මාරු කිරීමේ හැකියාව වෙනුවෙන් සීමා.

(ii) සමූහය ඇතුලත වෙනත් අස්තිත්වයන්ට ලාභාංශ සහ වෙනත් ප්‍රාග්ධන බෙදාහැරීම් ගෙවනු ලැබීම, හෝ ණය සහ අත්තිකාරම් ලබාදීම හෝ ආපසු ගෙවීම සීමා කිරීම වැනි සහතිකවීම් හෝ වෙනත් අවශ්‍යතා

(ආ) පාලනය නොමැති හිමිකම්වල අයිතිවාසිකම් ආරක්ෂා කිරීම්වල ස්වභාවය සහ ප්‍රමාණය සමූහයේ වත්කම්වලට ප්‍රවිශ්‍යය සහ වත්කම් බේරුම් කිරීමට (පාරිපාලකට, පරිපාලිතයේ වගකීම් බේරුම් කිරීමට, එහි තමාගේ වගකිම් බේරුම් කිරීමට පෙර සිදු කිරීමට ඇති බැඳීම හෝ පරිපාලිතයක වත්කම්වලට ප්‍රවිශ්‍ය හෝ වගකීම් බේරුම් කිරිමට පාලනය නොමැති හිමිකම්වල අනුමැතිය අවශ්‍යවීම වැනි දෑ ඇති අස්තිත්වයේ හැකියාවට සැලකිය යුතු සීමා ඇතිවිය හැකිය.)

(ඇ) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයෙහි, එවැනි සීමාකිරීම් ව්‍යවහාරවන වත්කම් සහ වගකීම්වල ධාරණ අගය.

**ඒකාබද්ධ ව්‍යුහගත අස්තිත්වයන්හි, අස්තිත්වයේ හිමිකම් සමඟ ආශ්‍රිත වූ අවදානම් වල ස්වභාවය.**

14 වාර්තාකරණ අස්තිත්වය අලාභයකට වුවද මුහුණ දියහැකි සිද්ධි සහ තත්ත්වයන් ඇතුලත්ව පරිපාලකය හෝ එහි පරිපාලිත, ඒකාබද්ධ ව්‍යුහගත අස්තිත්වකට මූල්‍යමය සහාය ලබාදීමට ඇති ගිවිසුම්ගත සැකසුම් අස්තිත්වයක් හෙළි දරව් කළ යුතුය. (උදා : ද්‍රවශීලතා, සැකසුම් හෝ ඒකාබද්ධ ව්‍යුහගත අස්තිත්වයක වත්කම් මිලදී ගැනීමට බැඳීම හෝ මූල්‍ය සහාය ලබාදීම සමග ආශ්‍රිතය වූ ණය වර්ගීකරන උත්තේජන)

15 වාර්තාකරන කාලපරිච්ජේදය තුල පරිපාලක හෝ එහි පරිපාලිත ගිවිසුම් ගත බැදීමකින් තොරව ඒකාබද්ධ ව්‍යුහගත අස්තිත්වයකට මූල්‍යමය හෝ වෙනත් සහායක් ලබාදී ඇත්නම් (උදා : වත්කම් හෝ ව්‍යුහගත අස්තිත්වය නිකුත් කරණ සාධන පත්‍ර මිලදී ගැනීම) අස්තිත්වය විසින් හෙළිදරව් කළ යුතුය.

(අ) පරිපාලයක හෝ එහි පරිපාලිත, ව්‍යුහගත අස්තිත්වයට මූල්‍යමය සහාය ලබා ගැනීමට උදව්කිරීම් ඇතුලත්ව, සහාය ලබාදීම් වර්ගය සහ ප්‍රමාණය, සහ ;

(ආ) සහාය ලබාදීම සඳහා හේතු.

16 වාර්තාකරනය කාලපරිච්ජේදය තුල පරිපාලක හෝ එහි යම් පරිපාලිතයන් ගිවිසුම්ගත බැදීම් වලින් තොරව, කලින් ඒකාබද්ධ නොවූ ව්‍යුහගත අස්තිත්වයකට මූල්‍යමය හෝ වෙනත් සහාය සලසා ඇත්නම්, සහ එම සහාය සැලසීම අස්තිත්වය, ඒ තීරණය සෑහිමට අදාල පැහැදිලි කිරීම් සහ හේතු සාධක අස්තිත්වය විසින් හෙළිදරව් කළ යුතුය.

17 ව්‍යුහගත අස්තිත්වයයකට මූල්‍යමය සහාය ලබා ගැනීමට සහයවීමේ අභිප්‍රාය ඇතුලත්ව, ඒකාබද්ධ ව්‍යුහගත අස්තිත්වයට මූල්‍යමය සහාය හෝ වෙනත් සහාය සැපයීමට තුඩුදුන් ප්‍රවර්තන අභිප්‍රායන් අස්තිත්වය විසින් හෙළිදරව් කළ යුතුය.

***පාලනය අහිමිවීමක් නොමැතිව, පරිපාලිතයක අයිතිවාසිකම් හිමිකම් සංචලනයේ ප්‍රතිවිපාක.***

18 පාලනය අහිමිවීමක් තොරව ප්‍රතිඵලයක් ඇති පරිපාලිතයක එහි යම් අයිතිවාසිකම් හිමිකම සංචලනයක, පරිපාලකයේ අයිතිකරුවන්ට ආරෝපිත ස්කන්ධය මත බලපෑම පෙන්වන ලේඛනයක් අස්තිත්වය විසින් ඉදිරිපත් කල යුතුය.

***වාර්තාකරණ කාලපරිච්ජේදය තුල පරිපාලිතයක පාලනය අහිමිවීමේ ප්‍රතිවිපාක***

19 යම් ප්‍රතිලාභයක් හෝ අලාභයක් නම්, SLFRS 10, 25 වන ජේදය ප්‍රකාර ගණනයකර අස්තිත්වයක් විසින් හෙළිදරව් කළ යුතුවීම සහ

(අ) කලින් පරිපාලිතයේ යම් රඳවාගත් ආයෝජනයක, පාලනය අහිමි වූ දිනයේ එහි සාධාරන අගය විකුණුම් කිරීමට ආරෝපිත ප්‍රතිලාභ හෝ අලාභ කොටස ඃ සහ

(ආ) ප්‍රතිලාභ හෝ අලාභ හඳුනාගත් (වෙන්ව ඉදිරිපත් කර නොමැති නම්) ලාභ හෝ අලාභ රේඛිය අයිතමය

**ඒකාබද්ධ නොකළ පරිපාලිතයන්හි හිමිකම් (ආයෝජන අස්තිත්ත්ව)**

19අ. SLFRS 10 ප්‍රකාරව ආයෝජන අස්තිත්වයකට ඒකාබද්ධකරණයේ ව්‍යතිරේඛයක් ව්‍යවහාර කිරීම අවශ්‍යකරන විට සහ ඒ වෙනුවට පරිපාලිතයක එහි කර ඇති ආයෝජනය ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයට ගිණුම්ගත කරනවිට එම කරුණ හෙළිදරව් කළ යුතුය.

19ආ. ඒකාබද්ධ නොකරන ලද සෑම පරිපාලිතයක්ම සඳහා ආයෝජන අස්තිත්ත්වය පහත සඳහන් දෑ හෙළිදරව් කළ යුතුය.

(අ) පරිපාලිතයේ නම ;

(ආ) පරිපාලිතයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානයේ ලිපිනය (සංස්ථාපනය කරන ලද රටේ නම, ප්‍රධාන ව්‍යාපාරික ස්ථානයෙන් වෙනස් වන්නේ නම් පමණක්)

(ඇ) ආයෝජන අස්තිත්වය සන්තක හිමිකමේ අයිතියේ සමානුපාතිකය සහ එය වෙනස් නම් දරන ඡන්ද අයිතියේ හිමිකම.

19ඇ. ආයෝජන අස්තිත්ත්වය වෙනත් ආයෝජන අස්තිත්වයක පරිපාලකයක් නම් එහි ආයෝජන අස්තිත්වයේ පරිපාලිතය පාලනය කරනු ලබන ආයෝජන සඳහා 19 ආ (අ) - (ඇ) හි වන හෙළිදරව් කිරීම් ද පරිපාලකය සැපයිය යුතුය. ඉහත තොරතුරු අඩංගු දෑ පරිපාලකයේ මූල්‍යය ප්‍රකාශන වල, පරිපාලිතයේ (පරිපාලිතවල) මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කිරීමෙන් අවශ්‍ය කරන හෙළිදරව් කිරීම සැපයිය හැකිය.

19ඈ. ආයෝජන අස්තිත්වයක් පහත දෑ හෙළිදරව් කළ යුතුය.

(අ) ඒකාබද්ධ නොකළ පරිපාලිතයකට මුදලින් කරනු ලබන ලාභාංශ ස්වරූපයෙන් ආයෝජන අස්තිත්වයට අරමුදල් මාරු කිරීමට ඇති හැකියාව හෝ ආයෝජන අස්තිත්වය විසින් ඒකාබද්ධ නොකළ පරිපාලිතයකට කරන ලද ණය හෝ අත්තිකාරම් ආපසු ගෙවීම පිළිබඳව සැලකිය යුතු අන්දමේ යම් සීමා කිරීම්වල (උදාඃ ණය ලබාගැනීමේ එකඟවීම් නියාමන අවශ්‍යතාවයන්, හෝ ගිවිසුම්ගත එකඟවීම්වල ප්‍රතිඵලයක් ලෙස) ස්වභාවය සහ ප්‍රමාණය ; සහ

(ආ) පරිපාලිතයකට මූල්‍ය සහාය ලබාගැනීමට උදව් වන බැඳීම් හෝ අභිප්‍රායන් ඇතුළුව ඒකාබද්ධ නොකළ පරිපාලිතයකට මූල්‍ය හෝ වෙනත් සහායන් සැපයීමට වන යම් ප්‍රවර්ථන බැඳීම් හෝ අභිප්‍රායයන්.

19ඉ. වාර්තාකරන ලද කාලපරිච්ජේදය තුළදී ආයෝජන අස්තිත්වයක් හෝ එහි පරිපාලිතයක් එසේ කිරීමට ගිවිසුම් ගත බැඳීමක් නොමැතිව ඒකාබද්ධ නොකළ පරිපාලිතයකට මූල්‍ය හෝ වෙනත් සහායක් (උදාඃ පරිපාලිතයේ වත්කම් හෝ නිකුත් කළ සාධන පත්‍ර මිලට ගැනීම, හෝ මූල්‍ය සහාය ලබාගැනීමට පරිපාලිතයට උදව් වීම) සපයා ඇත්නම් අස්තිත්වය පහත දෑ හෙළිදරව් කළ යුතුය.

(අ) ඒකාබද්ධ නොකරන ලද එක් එක් පරිපාලිතයට සපයා ඇති සහායේ වටිනාකම සහ ස්වභාවය ; සහ

(ආ) සහාය සැපයීමට සඳහා වූ හේතු

19ඊ. ඒකාබද්ධ නොකළ පාලනය කරන ව්‍යුහගත අස්තිත්වයකට, අස්තිත්වය හෝ එහි ඒකාබද්ධ නොකළ පරිපාලිත විසින් මූල්‍ය සහාය සැපයීමට අවශ්‍ය වියහැකි එකඟවීම් වල කොන්දේසි, වාර්තාකරන අස්තිත්වය අලාභයකට අනාවෘත වන සිද්ධි සහ තත්ත්වයන් ඇතුළුව ආයෝජන අස්තිත්වය හෙළිදරව් කළ යුතුය. (උදා: ද්‍රවශීලතා එකඟවීම් හෝ ව්‍යුහගත අස්තිත්වයේ වත්කම් මිලට ගැනීම ආශ්‍රිත බැඳීමක් ඇති ණය වර්ගීකරණ ක්‍රියාවලියක් දියත් කිරීම හෝ මූල්‍ය සහාය සැපයීම.)

19උ. වාර්තා කරන කාලපරිච්ඡේදය තුළදී ආයෝජන අස්තිත්වයක් හෝ එහි ඒකාබද්ධ නොකළ යම් පරිපාලිතයක්, ආයෝජන අස්තිත්වය පාලනය නොකරන ඒකාබද්ධ නොකළ ව්‍යුහගත අස්තිත්වයකට මූල්‍ය හෝ වෙනත් සහායක් එසේ කිරීමට ගිවිසුම් ගත බැඳීමක් නොමැතිව සපයයි නම් සහ එම සහාය සැපයීම මගින් ආයෝජන අස්තිත්වය ව්‍යුහගත අස්තිත්වය පාලනය කිරීම ප්‍රතිඵලයක් වන්නේ නම් එසේ එම සහාය සැපයීමට ආයෝජන අස්තිත්වය එළඹි තීරණයට අදාල කරුණු පිළිබඳව වූ හේතු හෙළිදරව් කළ යුතුය.

<u>බද්ධ සැකසුම් සහ ආශ්‍රිතයන්හි හිමිකම්</u>

20 මූල්‍ය ප්‍රකාශන භාවිතරන්නට ඇගයීම් කිරීමට හැකිවන පරිදි පහත තොරතුරු අස්තිත්වයක් විසින් හෙළිදරව් කළ යුතුය.

(අ) බද්ධ පාලනය සහිත වෙනත් ආයෝජනයන් සමග එහි ගිවිසුම්ගත සම්බන්ධතාවයන්හි ස්වභාවය සහ බලපෑම ඇතුලත්ව, බද්ධ සැකසුමේ හෝ ආශ්‍රිත කෙරෙහි සැලකිය යුතු බලපෑම් ඇතුලත්ව, බද්ධ සැකසුමේ හෝ ආශ්‍රිතයේ එහි වත්කම්වල ස්වභාවය ප්‍රමාණය සහ මූල්‍යමය බලපෑම (21සහ 22 ජේද) සහ

(ආ) බද්ධ සැකසුම් සහ ආශ්‍රිතයන්හි හිමිකම් සම්බන්ධිත අවදානම් වල ස්වභාවය සහ සංචලනය,

බද්ධ සැකසුම් සහ ආශ්‍රිතයන්හි අස්තිත්වයේ හිමිකම්වල ස්වභාවය, ප්‍රමාණය සහ මූල්‍ය බලපෑම්.

21 අස්තිත්වයක් හෙළිදරව් කළයුතු දෑ

(අ) වාර්තාකරණ අස්තිත්වයට වැදගත්වන සෑම බද්ධ සැකසුමක් සහ ආශ්‍රිතයක් සඳහාම

(i) බද්ධ සැකසුමේ හෝ ආශ්‍රිතයේ නම

(ii) බද්ධ සැකසුම හෝ ආශ්‍රිතය සමග අස්තිත්වයේ සම්බන්ධතාවයේ ස්වභාවය (උදාහරණ ලෙස බද්ධ සැකසුමේ හෝ ආශ්‍රිතයේ ක්‍රියාකාරකම්වල ස්වභාවය විස්තර කිරිම සහ ඒවා අස්තිත්වයේ ක්‍රියාකාරකම්වලට උපක්‍රමශිලි වන්නේද මාර්ගයෙන්)

(iii) බද්ධ සැකසුම හෝ ආශ්‍රිතයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය සංස්ථාපිත රට, අදාලවන්නේ නම් සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානයෙන් වෙනස් වේ.

(iv) අස්තිත්වය මගින් රඳවාගෙන ඇති අයිතිවාසිකම් හිමිකම් හෝ සහභාගි කොටස් සමානුපාතය සහ රඳවාගෙන ඇති ඡන්ද හිමිකම වෙනස් නම්, එහි සමානුපාතය.

(ආ) වාර්තා කිරීමේ අස්තිත්වයට වැදගත්වන සෑම බද්ධ ව්‍යාපාරයක් සහ ආශ්‍රිතයන් සඳහාම :

(i) බද්ධ ව්‍යාපාරයේ හෝ ආශ්‍රිතයේ ආයෝජනය ස්කන්ධ ක්‍රමය හෝ සාධාරණය අගය භාවිතා කරමින් මිණුම් කර ඇද්ද

(ii) ආ 12 සහ ආ 13 ජේදයන්හි විශේෂිතව දක්වා ඇති පරිදි, බද්ධ ව්‍යාපාරය හෝ ආශ්‍රිතය පිළිබඳ සංක්ෂිප්ත මූල්‍ය තොරතුරු,

(iii) බද්ධ ව්‍යාපාරය හෝ ආශ්‍රිතය ස්කන්ධ ක්‍රමය භාවිතා කරමින් ගිණුම්ගත කර ඇත්නම්, ආයෝජන සඳහා මිල සඳහන් වෙළඳ මිලක් පවතීනම්, බද්ධ ව්‍යාපාරයේ හෝ ආශ්‍රීතයේ එහි ආයෝජනයේ සාධාරණ අගය.

(ඇ) බද්ධ ව්‍යාපාර සහ ආශ්‍රීතයන්හි අස්තිත්තවයේ ආයෝජන එකිනෙක ගත් කල්හි වැදගත් නොවේ නම්, ආ 16 ජේදයේ විශේෂිතව දක්වා ඇති මූල්‍ය තොරතුරු

(i) සියළුම එකිනෙක වැදගත් නොවන බද්ධ ව්‍යාපාර සඳහා සමාහාරව සහ වෙන් වෙන්ව,

(ii) එකිනෙක වැදගත් නොවන ආශ්‍රිත සඳහා සමාහාරව

21අ. ජේද 21 (ආ) - 21 (ඇ) වලින් අවශ්‍ය කරන හෙළිදරව් ආයෝජන අස්තිත්වයන් ලබාදීම අවශ්‍ය නොවේ.

22 අස්තිත්වයක් මෙයද හෙළිදරව් කළ යුතුය.

(අ) බද්ධ ව්‍යාපාර හෝ ආශ්‍රිතවලට, මුදලින් ලාභාංශ, හෝ අස්තිත්වය මගින් දෙන ලද ණය හෝ අත්තිකාරම් ආපසු ගෙවීමට අරමුදල් මාරු කිරීමේ හැකියාව මත යම් සැලකිය යුතු සීමාකිරීම්වල ස්වභාවය සහ ප්‍රමාණය (උදාහරණ ලෙස, ණය ලබා ගැනීමේ සැකසුම් වල ප්‍රතිඵලයක්, ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන්, හෝ ආයෝජකයන් සහ බද්ධ පාලනය අතර ගිවිසුම් ගත එකඟවීම් හෝ බද්ධ ව්‍යාපාරය හෝ ආශ්‍රිතය මත සැලකිය යුතු බලපෑම්)

(ආ) බද්ධ ව්‍යාපාරයක හෝ අස්තිත්වයක මූල්‍ය ප්‍රකාශන අස්තිත්වයේ දිනට හෝ කාල පරිච්ඡේදයට වඩා වෙනස්ව භාවිතාකරණ කල්හි, ස්කන්ධ ක්‍රමය ව්‍යවහාර කිරීමේදී

(i) බද්ධ ව්‍යාපාරයේ හෝ ආශ්‍රිතයේ මූල්‍යය ප්‍රකාශන වල වාර්තාකරන කාලපරිච්ඡේදයේ අවසාන දිනය ; සහ

(ii) වෙනස් වූ දිනයක් හෝ කාලපරිච්ඡේදයක් භාවිතා කිරීමට හේතුව.

(ඇ) බද්ධ ව්‍යාපාරයේ හෝ ආශ්‍රිතයේ අලාභ කොටස අස්තිත්වය විසින් හඳුනා ගැනීම, ස්කන්ධ ක්‍රමය ව්‍යවහාර කිරීමේදී නවත්වා ඇත්නම්, වාර්තාකරණය කාලපරිච්ඡේදයට සහ සමුච්චිතය බද්ධ ව්‍යාපාරයේ හෝ ආශ්‍රිතයේ හඳුනා නොගත් අලාබ කොටස.

**බද්ධ ව්‍යාපාර සහ ආශ්‍රිතයන්හි අස්තිත්වයේ හිමිකම් සමඟ සම්බන්ධිත අවදානම්**

23 අස්තිත්වයක් හෙළිදරව් කළ යුතු දෑ

(අ) ආ 18- ආ 20 ඡේදයන්හි විශේෂිතව දක්වා ඇති පරිදි, වෙනත් බැඳීම් වල මුදල් ප්‍රමාණයන්ගෙන් වෙන්ව, බද්ධ ව්‍යාපාරයට සම්බන්ධව එහි බැඳීම්.

(ආ) SLFRS 31 ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම් ප්‍රකාර, අලාභයක් ඇතිවීමේ සම්භාව්‍යතාවය අඩුනම් හැර, බද්ධ ව්‍යාපාරයේ හෝ ආශ්‍රිතයේ එහි හිමිකම්වලට අදාල අත්විදි අසම්භාව්‍ය වගකීම් (බද්ධ පාලනය සහිත අනෙක් ආයෝජිතයින් සමඟ බද්ධව බුක්තිවිදි එහි අසම්භාව්‍ය වගකීම් කොටස හෝ බද්ධ ව්‍යාපාරය හෝ ආශ්‍රිතය කෙරෙහි සැලකිය යුතු බලපෑම් ඇතුලත්ව) වෙනත් අසම්භාව්‍ය වගකිම් වල මුදල් ප්‍රමාණයෙන් මෙන්ම.

**ඒකාබද්ධ නොවන ව්‍යුහගත අස්තිත්වයන්හි හිමිකම්**

24 අස්තිත්වයක් එහි මූල්‍ය ප්‍රකාශන භාවිතා කරන්නන්ට පහත දක්වෙන දෑ ගැන හැකියාව ඇති කරන තොරතුරු හෙළිදරව් කළ යුතුය.

(අ) ඒකාබද්ධ නොවන ව්‍යුහගත අස්තිත්වයන්හි, එහි හිමිකම්වල ස්වභාවය සහ ප්‍රමාණය අවබෝධ කර ගැනීමට (26-28 ජේද) සහ

(ආ) ඒකාබද්ධ නොවන ව්‍යුහගත අස්තිත්වයන්හි එහි හිමිකම්වලට සම්බන්ධිත අවදානම්වල ස්වභාවය, සහ සංචලනය ඇගයීමට.

25 24 (අ) ජේදයෙන් අවශ්‍යවන තොරතුරුවලට, ඒකාබද්ධ නොවන ව්‍යුහගත අස්තිත්වයන්හි පෙර කාලපරිච්ඡේදවල තිබු, අස්තිත්වයේ සම්බන්ධ වීම් වලින් අවදානම්වලට නිරාවරණය වීම් පිළිබඳ තොරතුරු, (උදා : ව්‍යුහගත අස්තිත්වයට අනුග්‍රහය) වාර්තා කරනය දිනට ව්‍යුහගත අස්තිත්වය සමග ගිවිසුම්ගත සම්බන්ධ වීමක් තවදුරටත්, අස්තිත්වය නොතිබුනද

25අ. ආයෝජන අස්තිත්වය පාලනය කරන සහ 19අ - 19උ ජේදවලින් අවශ්‍ය කරන ඉදිරිපත් කරන හෙළිදරව් කිරීම් ඒකාබද්ධ නොකළ ව්‍යුහගත අස්තිත්වයන් සඳහා ආයෝජන අස්තිත්වයක් 24 වන ඡේදයෙන් අවශ්‍ය කරන හෙළිදරව් කිරීම සැපයීම අවශ්‍ය නොවේ.

**හිමිකම්වල ස්වභාවය**

26 ව්‍යුහගත අස්තිත්වයේ ස්වභාවය, අරමුණ, ප්‍රමාණය සහ ක්‍රියාකාරකම් සහ ව්‍යුහගත අස්තිත්වය මූල්‍යනය කරන ලද්දේ කෙසේද යන්න ඇතුළුව නමුත් එයට සීමා නොකර, ඒකාබද්ධ නොකරන ව්‍යුහගත අස්තිත්වයන්හි එහි හිමිකම් පිළිබඳ ගුණාත්මක සහ ප්‍රමාණාත්මක තොරතුරු අස්තිත්වයක් විසින් හෙළිදරව් කළයුතුය.

27 අස්තිත්වයක් අනුග්‍රහය දක්වූ ඒකාබද්ධ නොවන ව්‍යුහගත අස්තිත්ව සඳහා 29 වන ජේදය මගින් අවශ්‍යකරන තොරතුරු සපයන්නේ නොමැති නම්, (උදා : වාර්තාකරණ දිනට අස්තිත්වය කෙරෙහි හිමකමක් නොමැති විම් හේතුවෙන්) අස්තිත්වය විසින් හෙළිදරව් කළ යුතුය.

(අ) එය අනුග්‍රහය දක්වන්නේ කුමන ව්‍යුහගත අස්තිත්වයන්දැයි එය නිර්නය කරන ලද්දේ කෙසේද?

(ආ) ඉදිරිපත් කළ ආදායම්වල වර්ගය පිළිබඳ විස්තරයක් ඇතුලත්ව, වාර්තාකරණ කාලපරිච්ඡේදය තුළ ඒ ව්‍යුහගත අස්තිත්ව වලින් ආදායම සහ

(ඇ) වාර්තාකරණ කාලපරිච්ඡේදය තුළ ඒ ව්‍යුහගත අස්තිත්වයන්ට මාරුකල සියළුම වත්කම්වල ධාරණ අගය (මාරුකළ අවස්ථාවේදී)

28 වෙනත් ආකෘතියක් වඩා යෝග්‍ය නොවන්නේ නම්, අස්තිත්වය 27 (ආ) සහ (ඇ) ඡේදයන්හි තොරතුරු ලැයිස්තුගත ආකෘතියකින් ඉදිරිපත් කිරිම සහ එහි අනුග්‍රහය දක්වන ක්‍රියාකාරකම් අදාල කාණ්ඩවලට වර්ගීකරණය කළ යුතුය. (ආ 2- ආ 6 ජේද බලන්න.)

**අවදානම්වල ස්වභාවය**

29 වෙනත් ආකෘතියක් වඩා යෝග්‍ය නොවන්නේ නම්, අස්තිත්වය විසින් ලැයිස්තුගත ආකෘතියකට ඉදිරිපත් කළ යුතු දෑ.

(අ) ඒකාබද්ධ නොකළ ව්‍යුහගත අස්තිත්වයන්හි, හිමිකම්වලට සම්බන්ධව, එහි මූල්‍ය ප්‍රකාශනයන්හි හඳුනාගත් වත්කම් සහ වගකීම්වල ධාරණ අගය.

(ආ) ඒ වත්කම් සහ වගකිම් හඳුනාගත්මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි රේඛිය අයිතම.

(ඇ) අලාභයට උපරිම අනාවරණය නිර්නය කළේ කෙසේද යන්න ඇතුලත්ව, ඒකාබද්ධ නොවන ව්‍යුහගත අස්තිත්වයන්හි, එහි හිමිකම් වලින් අස්තිත්වයේ අලාභයට උපරිම අනාවරණය නියෝජනයේ හොදම අගය අස්තිත්වයකට ඒකාබද්ධ නොවන ව්‍යුහගත අස්තිත්වයහි එහි හිමිකම් වලින් අලාබයට උපරිම අනාවරණය, අස්තිත්වයකට ප්‍රමාණාත්මක කිරිමට නොහැකි නම්, එය විසින් ඒ කරුණ සහ හේතු හෙළිදරව් කළ යුතුය.

(ඈ) ඒකාබද්ධ නොවන අස්තිත්වයන්හි එහි හිමිකම්වලට සම්බන්ධිත, අස්තිත්වයේ වත්කම් සහ වගකීම් වල ධාරණ අගය සංසන්දනය කිරීම සහ ඒ අස්තිත්ව වලින් අලාභයට අස්තිත්වයේ උපරිම අනාවරණය.

30 හිමිකම් කළින් තිබී හෝ වර්තමානයේ ඇති ඒකාබද්ධ නොවන ව්‍යුහගත අස්තිත්වයකට, එසේ කිරීමට ගිවිසුම්ගත බැදීමක් නොමැති මුල්‍යමය හෝ වෙනත් සහනයක් ගිණුම්කරණ කාලපරිච්ජේදය තුල සලසන ලද්දේ නම්, (උදාහරණ ලෙස, වත්කම් හෝ ව්‍යුහගත අස්තිත්වය මගින් නිකුත් කළ සාධන පත්‍ර මිලදී ගැනීම) අස්තිත්වය විසින් හෙළිදරව් කළයුතු දෑ.

(අ) ව්‍යුහගත අස්තිත්වයකට මුල්‍යමය සහාය ලබා ගැනීමේදි උපකාරිවන තත්ත්වයන් ඇතුලත්ව, සත්‍ය සැපයු වර්ගය සහ මුදල සහ

(ආ) සහාය ලබාදිම සඳහා හේතු.

31 ව්‍යුහගත අස්තිත්වයකට මුල්‍යමය සහාය ලබාගැනීමේදී උදව්වීමට ඇති අපේක්ෂාව ඇතුලත්ව, ඒකාබද්ධ නොවන ව්‍යුහගත අස්තිත්වයකට මුල්‍යමය හෝ වෙනත් සහාය ලබාදීමට යම් ප්‍රවර්තන අපේක්ෂාවක් අස්තිත්වය විසින් හෙළිදරව් කළ යුතුය.

**''අ'' පරිශිෂ්ඨය**

**නිර්වචිත යෙදුම්**

*මෙම පරිශිෂ්ඨය SLFRS හි අවශ්‍යම කොටසකී*

| | | |
|---|---|---|
| **ව්‍යුහගත අස්තිත්වයකින් ආදායම** | : | මෙම SLFRS හි අරමුණ සඳහා ව්‍යුහගත අස්තිත්වයක ආදායමට, පුනරාවර්තනය වන සහ පුනරාවර්තනය නොවන ගාස්තු, පොළී, ලාභාංශ ව්‍යුහගත අස්තිත්වයන්හි හිමිකම් ප්‍රතිමිණුම් කිරීමෙන් හෝ ප්‍රතිහඳුනාගැනීමෙන් වන ප්‍රතිලාභ හෝ අලාභ සහ ව්‍යුහගත අස්තිත්ත්වයකට වත්කම් හෝ වගකීම් මාරුකිරීමෙන් වන ප්‍රතිලාභ හෝ අලාභ ඇතුලත්වන නමුත් ඒවාටම සීමා නොවේ. |
| **වෙනත් අස්තිත්වයක හිමිකම** | : | මෙම SLFRS හි අරමුණ සඳහා වෙනත් අස්තිත්වයක හිමිකම ලෙස යොමුවන්නේ, ගිවිසුම්ගතව හෝ ගිවිසුම්ගතවීමක් නොමැතිව වෙනත් අස්තිත්වයක කාර්ය සාධනයෙන් විවිධාකාර ඵලදාවන්ට අණාවරනය වීමය. වෙනත් අස්තිත්වයක හිමිකම, ස්කන්ධය දැරීම හෝ වෙනත් ණය සාධන පත්‍ර මෙන්ම, අරමුදල් සැපයීම, ද්‍රවශීලතා සහාය, ණයසීමා වැඩිකිරීම සහ ඇපවීම් වැනි වෙනස් ආකාරයේ සම්බන්ධතා මගින් තහවුරුවීම දැකිය හැකි අතර, ඒවාටම සීමා නොවේ. එයට අස්තිත්වයක පාලනය හෝ බද්ධ පාලනය පැවතීම හෝ වෙනත් අස්තිත්වයක් කෙරෙහි සැලකිය යුතු බලපෑම් ඇතුලත්ය. අස්තිත්තවයන් වෙනත් අස්තිත්වයක හිමිකම් සංකේතමය ගණුදෙනුකරු , සැපයුම්කරු සම්බන්ධතාව නිසාම පැවතීම අවශ්‍ය නොවේ. |
| **ව්‍යුහගත අස්තිත්වය** | : | අස්තිත්වය කවරකු විසින් පාලනය කරන්නේද යන්න තීරණය කිරීමේදී ඡන්ද හෝ සමාන අයිතිවාසිකම් බලගතු සාධකය නොවන පරිදි නිර්මාණය කළ අස්තිත්වයක් වන අතර, යම් ඡන්ද අයිතියක් අදාල වනුයේ පරිපාලන කටයුත්තකට පමණක් වන කල්හි, සහ අදාල කාර්යයන් ගිවිසුම්ගත විධිවිධාන මගින් මෙහෙයවනු ලබයි. |

ආ 22- ආ 24 ඡේද ව්‍යුහගත අස්තිත්ව පිළිබඳ තවදුරටත් තොරතුරු සපයයි.

පහත සඳහන් යෙදුම් LKAS 27 LKAS 28, SLFRS 10 සහ SLFRS 11 හි බද්ධ සැකසුම් හි නිර්වචනය කර ඇති අතර, මෙම SLFRS හි, ඒ SLFRSs වල නිශ්චිත වූ තේරුම් සමග භාවිතා කර ඇත.

- ආශ්‍රිත
- ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන
- අස්තිත්වයක පාලනය
- ස්කන්ධ ක්‍රමය
- සමූහය
- ආයෝජන අස්තිත්ත්වය
- බද්ධ සැකසුම
- බද්ධ පාලනය
- බද්ධ මෙහෙයුම
- බද්ධ ව්‍යාපාරය
- පාලනය- නොමැති හිමිකම්
- පරිපාලකයා
- ආරක්ෂාකරන අයිතිවාසිකම්
- සම්බන්ධ ක්‍රියාකාරකම්
- වෙන්ව ඉදිරිපත් කරන මුදල් ප්‍රකාශන
- වෙන්වූ අංශය
- සැලකිය යුතු බලපෑම
- පරිපාලිතය

**''ආ'' පරිශිෂ්ඨය**

**ව්‍යවහාරකරණ උපදේශන**

ආ 1 මෙම පරිශිෂ්ඨයෙහි උදාහරණ නිරූපණය කරන්නේ සිද්ධාන්තික තත්ත්වයන්ය, උදාහරණයන්හි සමහර අංශයන් තත්‍ය කරුණු රටාවක් ඉදිරිපත් කළ ද නියමිත තොරතුරු රටාවක සියළුම සම්බන්ධිත තොරතුරු සහ තත්ත්වයන් SLFRS 12 ට ව්‍යවහාර කරන කල්හි ඇගයීම් කිරීමට අවශ්‍ය වෙයි.

**<u>සමහාරකරණය (4 වන ඡේදය )</u>**

ආ 2 එහි අවස්ථාව අනුව අස්තිත්වයක් විසින්, භාවිතාකරන්නේ අවශ්‍යතාවය තෘප්තකිරීම සඳහා කොපමණ විස්තර සැපයිය යුතු ද, අවශ්‍යතාවයන්හි විවිධ අංග මත කොපමණ අවධාරණයක් තැබිය යුතු ද තොරතුරු සමාහාරය කෙසේ කළ යුතු ද, යන්න තීරණය කළ යුතුය. මූල්‍ය ප්‍රකාශන භාවිතාකරන්නන්ට සහායක් නොවන අධික විස්තර සහ ඉතා වැඩි සමාහාරයන්හි ප්‍රතිඵලයක් ලෙස තොරතුරු විකෘතිවීම සමග මූල්‍ය ප්‍රකාශන පීඩාකාරී කිරීම අතර තුලනයක් ඇති කිරීම අවශ්‍ය වෙයි.

ආ 3 අස්තිත්වයක් මෙම SLFRS මගින් අවශ්‍යකරණ හෙළිදරව්, සමාන අස්තිත්ව සමාන සමාහාරය, හෙළිදරව් අරමුණ සහ ආ 4 ඡේදයෙහි අවශ්‍යතා සමග සමාහාරකරණය සංගත නම්, සමාහාර කළ හැකි අතර, සපයන තොරතුරු විකෘතිවීමක් සිදු නොවිය යුතුය. අස්තිත්වයක් විසින් සමාන අස්තිත්වයන්හි එහි හිමිකම් කෙසේ සමාහාර කළේද යන්න හෙළිදරව් කළ යුතුය.

ආ 4 අස්තිත්වයක් විසින් හිමිකම් සඳහා මෙන්ම තොරතුරු හෙළිදරව් කළ යුතුය:

(අ) පරිපාලිත ;

(ආ) බද්ධ ව්‍යාපාර ;

(ඇ) බද්ධ මෙහෙයුම් ;

(ඈ) ආශ්‍රිත ; සහ

(ඉ) ඒකාබද්ධ නොකරන ව්‍යූහගත අස්තිත්ව

ආ 5 තොරතුරු සමාහාර කරන්නේද යන්න නිර්ණය කිරීමේදී, අස්තිත්වයක් විසින් සමාහාරය සඳහා සලකා බලන සෑම අස්තිත්තවයකට, විවිධ අවදානම් සහ ඵලදා ලක්ෂණ පිළිබඳව ගුණාත්මක සහ ප්‍රමාණාත්මක තොරතුරු සහ වාර්තාකරණ අස්තිත්වයට එවැනි සෑම අස්තිත්වයකින් ඇති වැදගත්කම සලකා බැලිය යුතුය. අස්තිත්වය විසින් මූල්‍ය ප්‍රකාශන භාවිතාකරන්නන්ට එහි හිමිකම්වල ස්වභාවය සහ ප්‍රමාණය පිළිබඳ පැහැදිලි විස්තර කිරීම් හෙළිදරව් කිරීම්වල ඉදිරිපත් කළ යුතුය.

ආ 6 අස්තිත්ව පංතීන් තුළ ආ 4 ඡේදයේ දක්වා ඇති උචිතවිය හැකි සමාහාර මට්ටම් පිළිබඳ උදාහරණඃ

(අ) කාර්යභාරයන්හි ස්වභාවය (උදා. පර්යේෂණ සහ සංවර්ධන අස්තිත්ව, කේන්ද්‍රීය ණය පත් ආරක්ෂා කරන අස්තිත්වයක්)

(ආ) කර්මාන්ත වර්ගීකරණය

(ඇ) භූගෝලීය (උදා ගම් ප්‍රදේශ හෝ කලාප )

**<u>වෙනත් අස්තිත්වයන්හි හිමිකම්</u>**

ආ 7 වෙනත් අස්තිත්වයක හිමිකම් යොමුවනුයේ, වාර්තාකරණ අස්තිත්වය, වෙනත් අස්තිත්වයක කාර්ය සාධනය මගින් විවිධ වූ ඵලදාවන්ට අනාවරණය වන ගිවිසුම්ගත සහ ගිවිසුම්ගත නොවන සම්බන්ධතා වලටය. ඒ අස්තිත්වයේ හිමිකමක් එයට ඇද්දැයි තක්සේරු කිරීමේදී සහ එමනිසා මෙම SLFRS හි අවශ්‍යකරණ හෙළිදරව් කිරීම් සැලසීමට, වාර්තාකරණ අස්තිත්වයට අනෙක් අස්තිත්වයේ අරමුණ සහ නිර්මාණය සලකාබැලීම උදව්විය හැකියි ඒ තක්සේරුව වාර්තාකරණ අස්තිත්වයට සහ අනෙක් පාර්ශවයන්ට පැවරීමට, නිර්මාණයකර ඇති කරනු ලබන අවදානම් සලකාබැලීම ඇතුලත් විය යුතුය.

ආ 8 සාධන පත්‍ර රඳවාගැනිම මගින් ස්කන්ධය හෝ වෙනත් අස්තිත්වය මගින් නිකුත් කළ ණය සාධන පත්‍ර) හෝ විවිධත්ව අවශෝෂණය කරන වෙනත් සම්බන්ධතා පවත්නා, වෙනත් අස්තිත්වයක කාර්ය සාධනයෙන් විවිධ වූ ඵලදාවන්ට, වාර්තාකරණ අස්තිත්වය, සංකේතවත් බව අනාවරණය වෙයි. උදාහරණයක් ලෙස, ව්‍යුහගත අස්තිත්වයක් ණය ආයෝජනයක් දැරීම, ව්‍යුහගත අස්තිත්වයක් ණයක පොලිය සහ මුල් මුදල නොගෙවා සිටීමෙන් ආරක්ෂාවීමට, වෙනත් අස්තිත්වයකින් ණය නොගෙවීමට හුවමාරුවක් ලබාගනී. වාර්තාකරණ අස්තිත්වය විවිධ වූ ඵලදාවන්ට අනාවරණය වන සම්බන්ධතා, ව්‍යුහගත අස්තිත්වය ණය නොගෙවීමේ හුවමාරුව විවිධ වූ ඵලදා, ව්‍යුහගත අස්තිත්වයේ කාර්ය සාධනයෙන් අවශෝෂණය කරගනී.

ආ 9 සමහර සාධන පත්‍ර නිර්මාණය කර ඇත්තේ, අවදානම් වාර්තාකරණ අස්තිත්වයෙන් වෙනත් අස්තිත්වයකට මාරු කිරීමටයි. එවැනි සාධන පත්‍ර වෙනත් අස්තිත්වයක විවිධ වූ ඵලදා ඇති කල ද, නමුත් වෙනත් අස්තිත්වයක කාර්ය සාධනයෙන් වාර්තාකරණ අස්තිත්වය විවිධ වූ ඵලදාවන්ට සංකේතවත්ව අනාවරණය නොවෙයි. උදාහරණ ලෙස, ව්‍යුහගත අස්තිත්වය ප්‍රතිශ්ඨාපනය කරන ලද්දේ, 'ඉසඩ්' අස්තිත්වයේ ණය අවදානම අනාවරණය අපේක්ෂා කරණ ආයෝජකයන්ට, ආයෝජන අවස්ථා සැපයීමටය. ('ඉසඩ්' අස්තිත්වය සැකසුමෙහි කිසිම පාර්ශවයක් සමග සම්බන්ධතා නොමැත) ව්‍යුහගත අස්තිත්වය අරමුදල් ලබාගන්නේ 'ඉසඩ්' අස්තිත්වයේ ණය අවදානමට බැඳුන නෝට්ටු (ණය - අවදානම් නෝට්ටු) ඒ ආයෝජකයන්ට නිකුත් කිරිම මගින් සහ එයින් ලැබීම්, අවදානම් රහිත මූල්‍ය වත්කම්වල ආයෝජනයට භාවිතා කරයි. ව්‍යුහගත අස්තිත්වයක්, ණය පැහැරහැරීම් හුවමාරු ආයතනයක් සමග, ණය පැහැරහැරීම් හුවමාරුවකට ඇතුළුවීම මගින් 'ඉසඩ්' අස්තිත්වයේ ණය අවදාමට අනාවරණයක් ලබාගනී, ණය පැහැරහැරීම් හුවමාරුව 'ඉසඩ්' අස්තිත්වයේ ණය අවදානම ව්‍යුහගත අස්තිත්වයට පවරනුයේ හුවමාරු ආයතනය මගින් ගෙවන ගාස්තුව ලබාගැනීම මගිනී ව්‍යුහගත අස්තිත්වයේ ආයෝජකයින්ට,ව්‍යුහගත අස්තිත්වයේ වත්කම්වල ආයෝජනයෙන් සහ ණය පැහැරහැරීම් හුවමාරු ගාස්තු යන දෙකෙන්ම ඵලදාවෙන් පිළිබිඹු වන ඉහල ඵලදාවක් ලබාගනී ව්‍යුහගත අස්තිත්වයේ කාර්ය සාධනයෙන් විවිධ වූ ඵලදාවන්ට අනාවරණය වූ ව්‍යුහගත අස්තිත්වය සමග සම්බන්ධතාවයන් හුවමාරු ආයතනය ඇති කරගනු නොලබන්නේ, ණය පැහැරහැරීම් හුවමාරුව, විවිධ වූ ඵලදාව ව්‍යුහගත අස්තිත්වයට මාරුකිරීම මිස, ව්‍යුහගත අස්තිත්වය විවිධ වූ ඵලදාව අවශෝෂණය කරනොගනී.

<u>පරිපාලිත, බද්ධ ව්‍යාපාර සහ ආශ්‍රිත සඳහා සංක්ෂිප්ත මූල්‍ය තොරතුරු (12 සහ 21 වන ඡේද)</u>

ආ 10 වාර්තාකරණ අස්තිත්වයට වැදගත් පාලනය - නොමැති හිමිකම් සහිත සෑම පරිපාලිතයක් සඳහා ම, අස්තිත්වයක් හෙළිදරව් කළයුතු දෑඃ

(අ) පාලනය - නොමැති හිමිකම්වලට ගෙවූ ලාභාංශ

(ආ) පාලනය - නොමැති හිමිකම්වලට සමූහයේ ක්‍රියාකාරකම් සහ මුදල් ප්‍රමාණය පිළිබඳව ඇති හිමිකම, භාවිතාකරන්නන්ට තේරුම් ගැනීමට හැකිවන පරිදි පරිපාලිතයේ වත්කම්, වගකීම්, ලාභය හෝ අලාභය සහ මුදල් ප්‍රවාහය පිළිබඳ සංක්ෂිප්ත මූල්‍යමය තොරතුරු. උදාහරණයක් ලෙස එම තොරතුරුවලට ජංගම වත්කම්, ජංගම නොවන වත්කම්, ජංගම වගකීම්, ජංගම නොවන වගකීම්, ආදායම, ලාභය හෝ අලාභය, සහ මුලු විස්තීර්ණ ආදායම යන තොරතුරු ඇතුලත් සහ මුලු විස්තීර්ණ ආදායම යන තොරතුරු ඇතුලත් විය හැකි අතර ඒවාට පමණක් සීමා නොවිය යුතුය.

ආ 11 ආ 10 (10) ඡේදයෙන් අවශ්‍ය සංක්ෂිප්ත මූල්‍යමය තොරතුරු, අන්තර් සමාගම් ඉවත්කිරීමට පෙර මුදල් ප්‍රමාණයන් විය යුතුය.

ආ 12 වාර්තාකරණ අස්තිත්වයට වැදගත් සෑම බද්ධ ව්‍යාපාරයක් සහ ආශ්‍රිතයක් සඳහා අස්තිත්වයක් විසින් හෙළිදරව් කළයුතු දෑ ;

(අ) බද්ධ ව්‍යාපාරයක් හෝ ආශ්‍රිතයෙන් ලැබුණ ලාභාංශ

(ආ) බද්ධ ව්‍යාපාරය හෝ ආශ්‍රිතය සඳහා (ආ 14 සහ ආ 15 බලන්න) පහත සඳහන් සංක්ෂිප්ත මූල්‍යමය තොරතුරු ඒවාට අවශ්‍යයෙන්ම සීමා නොකර හෙළිදරව් කළ යුතුය.

i. ජංගම වත්කම්
ii. ජංගම නොවන වත්කම්
iii. ජංගම වගකීම්
iv. ජංගම නොවන වගකීම්
v. අයභාරය
vi. සංතතික මෙහෙයුම් වලින් ලාභ හෝ අලාභය
vii. අසංතතික මෙහෙයුම් වලින් බදු- පෙර ලාභය හෝ ආලාභය
viii. වෙනත් විස්තීර්ණ ආදායම
ix. මුළු විස්තීර්ණ ආදායම

ආ 13 ආ 12 ඡේදයේ අවශ්‍යකරන සංක්ෂිප්ත මූල්‍යමය තොරතුරු වලට අමතරව, වාර්තාකරණ අස්තිත්වයට වැදගත් සෑම බද්ධ ව්‍යාපාරයක් සඳහාම, අස්තිත්තවය විසින් පහත සඳහන් දෑවල ප්‍රමාණය හෙළිදරව් කළ යුතුයඃ

(අ) ආ 12 (ආ) (i) ඡේදයෙහි ඇතුලත් මුදල් සහ මුදලට සමාන දෑ

(ආ) ආ 12 (ආ) (ii) ඡේදයෙහි ඇතුලත් ජංගම මූල්‍යමය වගකීම් (වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ සහ ප්‍රතිපාදන හැර)

(ඇ) ආ 12 ආ (iv) ඡේදයෙහි ඇතුලත් ජංගම නොවන මූල්‍යමය වගකීම් (වෙළෙඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ සහ ප්‍රතිපාදන හැර)

(ඈ) ක්‍ෂයවීම් සහ ක්‍රම ක්ෂය

(ඉ) පොලී ආදායම

(ඊ) පොලී වියදම

(උ) ආදායම් බදු වියදම හෝ ආදායම

ආ 14 ආ 12 ආ 13 ඡේද ප්‍රකාර ඉදිරිපත් කළ සංක්ෂිප්ත මූල්‍යමය තොරතුරු, බද්ධ ව්‍යාපාරයේ හෝ ආශ්‍රිතයේ SLFRS මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුලත් මුදල් ප්‍රමාණයන් විය යුතුය. (අස්තිත්වයේ එම මුදල් වල කොටස නොවේ.)අස්තිත්වය ස්කන්ධ ක්‍රමය භාවිතා කරමින් බද්ධ ව්‍යාපාරයේ හෝ ආශ්‍රිතය සඳහා ගිණුම් තබන්නේ නම්ඃ

(අ) අත්පත්කරගත් දිනයේ දී කළ සාධාරණ අගය ගැලපීම සහ ගිණුම් ප්‍රතිපත්ති වෙනස්කම් සඳහා ගැලපිම් වැනි, බද්ධ ව්‍යාපාරය හෝ ආශ්‍රිතය SLFRS මූල්‍ය ප්‍රකශනයන්හි ඇතුලත් වූ මුදල් ප්‍රමාණයන්, ස්කන්ධ ක්‍රමය භාවිතා කරමින් අස්තිත්වය කළ ගැලපීම් පිළිබිඹු කිරීමට ගැලපිය යුතුය.

(ආ) බද්ධ ව්‍යාපාරයේ හෝ ආශ්‍රිතයේ එහි හිමිකම්වල ධාරණ අගයට, සංක්ෂිප්ත මූල්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම පිළිබඳ සැසඳීමක් අස්තිත්වය විසින් ඉදිරිපත් කළ යුතුය.

ආ 15 ආ 12 සහ ආ 13 ඡේදයන් මගින් අවශ්‍ය සංක්ෂිප්ත මූල්‍යමය තොරතුරු, බද්ධ ව්‍යාපාරයේ හෝ ආශ්‍රිතයේ මූල්‍ය ප්‍රකාශන පදනම මත ඉදිරිපත් කිරීම කළ හැකි වන්නේ ඃ

(අ) බද්ධ ව්‍යාපාරය හෝ ආශ්‍රිතයෙහි එක් හිමිකම් LKAS 28 ප්‍රකාර සාධාරණ අගය අස්තිත්වය විසින් මැනීම සහ

(ආ) බද්ධ ව්‍යාපාරය හෝ ආශ්‍රිතය SLFRS මූල්‍ය ප්‍රකාශන පිළියෙල නොකිරීම සහ ඒ පදනම මත පිළියෙල කිරීම කළ නොහැකිවීම හෝ අනවශ්‍ය පිරිවැය ඇතිවීම.

එවැනි අවස්ථාවල, අස්තිත්වය විසින් සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ සෑම හෙළිදරව් කළ යුතුය.

ආ 16 එකිනෙක ගත්කල වැදගත් නොවන බද්ධ ව්‍යාපාර හෝ ආශ්‍රිත සියල්ලෙහිම, හිමිකමේ සඳහා ධාරණ අගය, ස්කන්ධ ක්‍රමය භාවිතා කරමින් ගිණුම්ගත කර, සමාහාරව අස්තිත්වය විසින් හෙළිදරව් කළ යුතුය. අස්තිත්වයක් විසින් ඒ බද්ධ ව්‍යාපාර හෝ ආශ්‍රිතවල එහි කොටසේ සමාහාර මුදල වෙන්වද හෙලිදරව් කළ යුතුය:

(අ) සංතතික මෙහෙයුම් වලින් ලාභය හෝ අලාභය

(ආ) අසංතතික මෙහෙයුම් වලින් බදු - පසු ලාභය හෝ අලාභය

(ඇ) වෙනත් විස්තීර්ණ ආදායම

(ඈ) මුළු විස්තීර්ණ ආදායම

අස්තිත්වයක් විසින් බද්ධ ව්‍යාපාර සහ ආශ්‍රිත සඳහා වෙන්ව හෙළිදරව් කිරීම් සපයයි.

ආ 17 SLFRS 5 විකිණීම සඳහා රඳවා ඇති ජංගම නොවන වත්කම් සහ අසංතතික මෙහෙයුම් ප්‍රකාර, අස්තිත්වයක හිමිකම් ඇති පරිපාලිතයක, බද්ධ ව්‍යාපාරයක හෝ ආශ්‍රිතයක හිමිකම් විකිණීම සඳහා ලෙස රඳවා ඇති කල්හි, ආ 10 - ආ 16 ඡේද ප්‍රකාර පරිපාලිතයක, බද්ධ ව්‍යාපාරයක හෝ ආශ්‍රිතයක සංක්ෂිප්ත මූල්‍යමය තොරතුරු හෙළිදරව් කිරීම අවශ්‍ය නොවේ.

<u>බද්ධ ව්‍යාපාර සඳහා බැඳීම් (23 (අ) ඡේදය)</u>

ආ 18 අස්තිත්වයක් විසින් බද්ධ ව්‍යාපාරයන්හි හිමිකම්වලට සම්බන්ධව ඇතුලත්ව බැඳීම්වලින් වාර්තාකරණ දිනට හඳුනා නොගැනේ. (අනෙක් බද්ධ පාලනය සහිත ආයෝජකයින් සමග බද්ධව සිදුකල බැඳීම් ඇතුලත්ව) හෙළිදරව් කළ යුතුය. බැඳීම් යනු අනාගතයේ දී මුදල් හෝ වෙනත් සම්පත් පිටතට ගලායා හැකි දෑය.

ආ 19 අනාගතයේ දී මුදල් හෝ වෙනත් සම්පත් පිටතට ගලා යා හැකි හඳුනානොගත් බැඳීම්වලට ඇතුලත්වන දෑ:

(අ) උදාහරණයක් ලෙස, පහත සඳහන් දෑ වල ප්‍රතිඵලයක් ලෙස, අරමුදලින් හෝ සම්පත් වලින් දායකවීමට හඳුනානොගත් බැඳීම් :

(i) ව්‍යවස්ථා හෝ බද්ධ ව්‍යාපාර අත්පත්කර ගැනීමේ ගිවිසුම් (උදාහරණ ලෙස නිශ්චිත කාල පරිච්ඡේදයක් මත අස්තිත්වයක් දායකවීමට)

(ii) බද්ධ ව්‍යාපාරය මගින් භාරගෙන ඇති ප්‍රාග්ධන දැඩි ව්‍යාපෘති

(iii) අස්තිත්වයක් බද්ධ ව්‍යාපාරයක් වෙනුවෙන් මිල දී ගැනීමට බැඳීම් ඇතිකරගත්, උපකරණ, තොග හෝ සේවා මිලදී ගැනීමට කොන්දේසි රහිත බැඳීමක්

(iv) බද්ධ ව්‍යාපාරයට ණය හෝ වෙනත් මූල්‍යමය සහාය ලබාදීමට කොන්දේසි රහිත බැඳීම්

(v) බද්ධ ව්‍යාපාරයකට වත්කම් හෝ සේවා වැනි සම්පත් වලින් දායකවීමට කොන්දේසි රහිත බැඳීම්.

(vi) බද්ධ ව්‍යාපාරයකට සම්බන්ධ, වෙනත් අවලංගු කළ නොහැකි හඳුනානොගත් බැඳීම්

(ආ) බද්ධ ව්‍යාපාරයක නියමිත සිද්ධියක් අනාගතයේදී ඇතිවීම හෝ ඇති නොවී නම්, වෙනත් පාර්ශවයක් අයිතිවාසිකම් හිමිකම් අත්පත්කර ගැනීමට කොන්දේසි නොමැති බැඳීම්.

ආ 20 ආ 18 ආ 19 ඡේදයන්හි අවශ්‍යතා සහ උපකරණ LKAS 24 හි 18 වන ඡේදය මගින් අවශ්‍ය කරන සමහර හෙළිදරව් කිරීම් වර්ග නිදර්ශණය කරයි.

<u>ඒකාබද්ධ නොකරන ව්‍යුහගත අස්තිත්වයන්හි හිමිකම් (24-31 ඡේද)</u>

**ව්‍යුහගත අස්තිත්ව**

ආ 21 අස්තිත්වය කවරකු විසින් පාලන කරන්නේ ද යන්න තීරණය කිරීමේදී ඡන්ද හෝ සමාන අයිතිවාසිකම් බලගතු සාධකය නොවන පරිදි නිර්මාණය කළ අස්තිත්වයක් වන අතර, යම් ඡන්ද අයිතියක් අදාලවනුයේ, පරිපාලන කටයුත්තකට පමණක් වන කල්හි, සහ සම්බන්ධිත කාර්යයන් ගිවිසුම්ගත සැකසුම් මගින් මෙහෙයවනු ලබයි.

ආ 22 ව්‍යුහගත අස්තිත්වයක් බොහෝ විට පහත දක්වන ලක්ෂණ හෝ ගුණාංග සමහරක් හෝ සියල්ල ඇත.

(අ) සීමාකළ ක්‍රියාකාරකම්

(ආ) බදු කාර්යක්ෂමතා කල්බදු සිදුකිරීම, පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම් කරගෙන යෑම, ප්‍රාග්ධන මාර්ග සැපයීම හෝ අස්තිත්වයකට අරමුදල්කරණයට හෝ ආයෝජකයන්ට ව්‍යුහගත අස්තිත්වයේ වත්කම් හා ආශ්‍රිය වූ අවදානම් සහ ප්‍රතිලාභ පැවරීම මත ආයෝජකයන් සඳහා ආයෝජන අවස්ථා සැලසීම වැනි, පටු සහ මනාව- නිර්වචිත අරමුණු

(ඇ) ස්කන්ධය ප්‍රමාණවත් නොවීමේදී, දෙවැනි වු මූල්‍යමය සහායක් නොමැතිව ව්‍යුහගත අස්තිත්වයට එහි ක්‍රියාකාරකම් මූල්‍යනය කිරීමට අවසර දීම

(ඈ) ආයෝජකයන්ට ණය හෝ වෙනත් අවදානම් (කොටස) අවධානයන් ඇති කරන, ගිවිසුම් ගතව සම්බන්ධ වු වක්‍ර සාධන පත්‍ර මාර්ගයෙන් මූල්‍යනය කිරීම.

ආ 23 මේවාට පමණක් සීමානොවී ව්‍යුහගත අස්තිත්වයන් පිළිබඳ උදාහරණ

(අ) ආරක්‍ෂකරණ අංශනයන්

(ආ) වත්කම් - බැඳුණ මූල්‍යකරණය

(ඇ) සමහර ආයෝජන අරමුදල්

ආ 24 ඡන්ද අයිතියෙන් පාලනය වන අස්තිත්වයක් ව්‍යුහගත අස්තිත්ත්ව නොවන්නේ, මක්නිසා ද යත් උදාහරණ ලෙස, ප්‍රති ව්‍යුහකරණයක දී එයට තුන්වන පාර්ශවයන්ගෙන් අරමුදල් ලැබෙන හෙයිනි.

**ඒකාබද්ධ නොවන ව්‍යුහගත අස්තිත්වයන්හි හිමිකම් වලින් අවදානම් ස්වභාවයකි. (29 - 31 ඡේද)**

ආ 25 29 -31 ඡේදයන් මගින් අවශ්‍ය තොරතුරු වලට අමතරව, අස්තිත්වයක් 24 (ආ) ඡේදයෙහි හෙළිදරව් කිරීමේ අරමුණ සපුරාලීමට අවශ්‍ය අමතර තොරතුරු හෙළිදරව් කළ යුතුය.

ආ 26 අස්තිත්වයක් ඒකාබද්ධ නොවන ව්‍යුහගත අස්තිත්වයක හිමිකම් ඇති කල්හි, එය අනාවරණය වන අවදානම් තක්සේරුවක් කිරීමට අදාල අවස්ථාව මත රඳාපවතින අමතර තොරතුරු පිළිබඳ උදාහරණඃ

(අ) සැකසුම් වගන්ති අනුව අස්තිත්වය, ඒකාබද්ධ නොවන ව්‍යුහගත අස්තිත්වයකට මූල්‍යමය සහාය (උදාඃ ද්‍රවශීලතා සැකසුම් හෝ ව්‍යුහගත අස්තිත්වයේ, ඒකාබද්ධ නොවන අස්තිත්වයකට මූල්‍ය සහාය සැලසීම), ඇතුලත්වඃ

i වාර්තාකරණ අස්තිත්වය අලාභයකට විවර කරන සිද්ධි හෝ අවස්ථා පිළිබඳ විස්තරයක්

(ආ) ඒකාබද්ධ නොකරණ ව්‍යුහගත අස්තිත්වයන්හි, එහි හිමිකම් වලට සම්බන්ධව වාර්තාකරණ කාලපරිච්ඡේදය තුල අස්තිත්වය මඟින් ඇති වු අලාභ

(ඇ) ඒකාබද්ධ නොවන ව්‍යුහගත අස්තිත්වයන්හි එහි හිමිකම් වලින් වාර්තාකරණ කාලපරිච්ඡේදය තුල අස්තිතිවය ලැබු ආදායම් වර්ග.

(ඈ) ඒකාබද්ධ නොවන ව්‍යුහගත අස්තිත්වයක අලාභ වෙනත් පාර්ශවයන්ට පෙර අස්තිත්වය වසින් අවශෝෂණය අවශ්‍යද, අස්තිත්වය විසින් අවශෝෂණය අවශ්‍යද, අස්තිත්වය සඳහා එවැනි අලාභයන්හි උපරිම සීමාව, සහ (අදාල නම්) ඒකාබද්ධ නොවන ව්‍යුහගත අස්තිත්වයෙහි, අස්තිත්වයේ හිමිකමට වඩා අඩු ශ්‍රේණියක හිමිකම් ඇති පාර්ශව මගින් දරණ ලද භව්‍ය අලාභයේ ශ්‍රේණිය සහ මුදල් ප්‍රමාණය.

(ඉ) සාධාරණ අගය හෝ ඒකාබද්ධ නොවන ව්‍යුහගත අස්තිත්වයෙහි අස්තිත්වයේ හිමිකම්වල අවදානමට බලපෑ හැකි තුන්වන පාර්ශව සමඟ ද්‍රවශිලතා සැකසුම් ඇපවීම් හෝ වෙනත් බැඳීම්.

(ඊ) ඒකාබද්ධ නොවන ව්‍යුහගත අස්තිත්වය වාර්තාකරණ කාලය තුලදී එහි ක්‍රියාකාකරම් මූල්‍යනය කිරීමේදී අත්විදි යම් අපහසුතා

(උ) ඒකාබද්ධ නොවන ව්‍යුහගත අස්තිත්වයේ අරමුදල් කරණයට සම්බන්ධව, අරමුදල්කරණ ආකාරය (උදා : වාණිජ ලේඛන හෝ මැදි කාලීණ නෝට්ටු) සහ ඒවායේ බරතැබූ - සාමාන්‍ය ජිව කාලය, ව්‍යුහගත අස්තිත්වයට කෙටි කාලීන අරමුදල් කර ඇත්නම්, ඒකාබද්ධ නොවන ව්‍යුහගත අස්තිත්වයේ වත්කම් සහ අරමුදල් කරණය පිළිබඳ කල්පිරීමේ විග්‍රහ තොරතුරු ඇතුලත් කළ හැකිය.

**'ඇ' පරිශිෂ්ඨය**

**බලාත්මක දිනය සහ සංක්‍රාන්තිය**

*මෙම පරිශිෂ්ඨය මෙම SLFRS හි අත්‍යවශ්‍ය කොටසක් වන අතර වෙනත් SLFRS කොටස්වලට ඇති හා සමාන අධිකාරියක් මෙහිද ඇත.*

**බලාත්මක දිනය සහ සංක්‍රාන්තිය**

ඇ1 අස්තිත්වයක් 2014 ජනවාරි 01 දින හෝ ඉන් පසුව ආරම්භවන වාර්ෂික කාලපරිච්ඡේදයන් සඳහා මෙම SLFRS ව්‍යවහාර කළ යුතුය. එය පෙර ව්‍යවහාර කිරීමට ඉඩදේ.

ඇ1 අ [ඉවත් කර ඇත]

ඇ1 ආ [ඉවත් කර ඇත]

ඇ2 2014 ජනවාරි මස 1 වන දිනෙන් හෝ ඊට පෙර ආරම්භවන වාර්ෂික කාලපරිච්ඡේදයන් සඳහා මෙම SLFRS මගින් අවශ්‍ය කරන තොරතුරු ලබාදීමට අස්තිත්වයක් උනන්දු කරවනු ලැබේ. මෙම SLFRS මගින් අවශ්‍ය කරන සමහර හෙළිදරව් ලබාදීමෙන් මෙම SLFRS හි සියලු අවශ්‍යතාවයන් සමග අනුකූල වීමට හෝ SLFRS 10, SLFRS 11, LKAS 27 සහ LKAS 28 කලින් ව්‍යවහාර කිරීමට අස්තිත්වයකට බල නොකෙරේ.

ඇ2 අ මෙම SLFRS 12 ව්‍යවහාර වන ප්‍රථම වාර්ෂික කාලපරිච්ඡේදයට පූර්වගාමීවන වහාම වන කාලපරිච්ඡේදය ආරම්භවීමට පෙර පටන් ගන්නා ඉදිරිපත් කළ ඕනෑම කාලපරිච්ඡේදයක් සඳහා මෙම SLFRS හි හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන් ව්‍යවහාර කිරීම අවශ්‍ය නොවේ.

ඇ2 ආ මෙම ප්‍රමිතයේ 24 - 31 ඡේදවල හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන් සහ ඡේද ඇ 21 - ඇ 26 හි අනුරූපී උපදේශන, මෙම SLFRS 12 ව්‍යවහාර කරන ප්‍රථම කාලපරිච්ඡේදයට පෙර ආරම්භවන ඉදිරිපත් කරන ලද ඕනෑම කාලපරිච්ඡේදයක් සඳහා ව්‍යවහාර කිරීම අවශ්‍ය නොවේ.

**SLFRS 9 වෙත යොමුකිරීම**

ඇ3 යම් අස්තිත්වයක් මෙම SLFRS ව්‍යවහාර කරයි නම් එහෙත් මෙතෙක් තවම SLFRS 9 ව්‍යවහාර නොකරයි නම්, SLFRS 9ට වන යම් යොමු කිරීමක් LKAS 39 *මූල්‍ය සාධන පත්‍ර : හඳුනාගැනීම සහ මැනීම* ලෙස වෙත යොමු කිරීමක් ලෙස කියවිය යුතුය.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

**SLFRS 13**

**සාධාරණ අගය මැනීම**

*පටුන* *ඡේද*


| | |
|---|---|
| **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති SLFRS 13** | |
| **සාධාරණ අගය මැනීම** | |
| **පරමාර්ථ** | 1 - 4 |
| **විෂය පථය** | 5 - 8 |
| **මැනීම** | 9 - 90 |
| **සාධාරණ අගයේ නිර්වචනය** | 9 - 10 |
| **වත්කම හෝ වගකීම** | 11 - 14 |
| **ගණුදෙනුව** | 15 - 21 |
| **වෙළඳපොළ සහභාගිවන්නන්** | 22 - 23 |
| **මිල** | 24 - 26 |
| **මූල්‍ය නොවන වත්කම් සඳහා ව්‍යවහාරකරණය** | 27 - 33 |
| **වගකීම්වලට සහ ස්වකීය ස්කන්ධ සාධන පත්‍රවලට ව්‍යවහාරකරණය** | 34 - 47 |
| **වෙළඳපොළ අවදානම හෝ ප්‍රතිපාර්ශ්ව අවදානම හිලව්වීමේ තත්ත්වයන් සහිත මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වගකීම්වලට ව්‍යවහාරකරණය** | 48 - 56 |
| **මුල් හඳුනාගැනීමේදී සාධාරණ අගය** | 57 - 60 |
| **තක්සේරු කිරීමේ ශිල්ප ක්‍රම** | 61 - 66 |
| **තක්සේරු කිරීමේ ශිල්ප ක්‍රම සඳහා යෙදවුම** | 67 - 71 |
| **සාධාරණ අගය අනුපිළිවෙළ** | 72 - 90 |
| **හෙළිදරව් කිරීම** | 91 - 99 |
| **පරිශිෂ්ඨ** | |
| අා. නිර්වචිත පද | |
| ආ. උපදේශන ව්‍යවහාරකරණය | |
| ඇ. බලාත්මකවන දිනය සහ සංක්‍රාන්තිය | |


**ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - SLFRS 13**

*සාධාරණ අගය මැනීම*

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - SLFRS 13 *සාධාරණ අගය මැනීම* මෙහි 1 - 99 ඡේදවල සහ පරිශිෂ්ඨ අ - ඇ හි දක්වා ඇත. සෑම ඡේදයකට එකහා සමාන අධිකාරී බලයක් ඇත. **තද කළු** අකුරෙන් දක්වා ඇති ඡේදවලින් ප්‍රධාන මූලධර්ම ප්‍රකාශ කෙරේ. අ පරිශිෂ්ඨයේ නිර්වචනය කර ඇති පද මෙම ප්‍රමිතයේ ප්‍රථමවරට සඳහන් කරනවිට ඇල අකුරු වලින් දැක්වේ. අනෙක් පද සඳහා වන නිර්වචන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සඳහා වන පාරිභාෂික ශබ්දමාලාවේ දී ඇත. SLFRS 13, එහි අරමුණු සහ නිගමන සඳහා වූ පදනම *ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට වූ පූර්විකාව සහ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සඳහා වූ ආකල්පමය ආකෘතිමය රාමුව* ද සම්බන්ධ කොටගෙන කියවිය යුතුය. පැහැදිලි මාර්ගෝපදේශ නොමැති අවස්ථාවලදී ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සඳහාත් ඒවා භාවිත කිරීම සඳහාත් පදනමක් LKAS 8 *ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි* මගින් සැපයේ.

**අරමුණ**

1. මෙම SLFRS ය ;

   **(අ) සාධාරණ අගය නිර්වචනය කරයි ;**
   **(ආ) සාධාරණ අගය මැනීම සඳහා වන ආකෘතිමය රාමුව තනි SLFRS යක පිහිටුවනු ලබයි.**
   **(ඇ) සාධාරණ අගය මැනීම පිළිබඳව හෙළිදරව් කිරීම අවශ්‍ය කෙරේ.**

2. සාධාරණ අගය වෙළඳපොළ පදනම් කළ මිණුමක් වන අතර, එය අස්තිත්ව - නිශ්චිත මිණුමක් නොවේ. සමහර වත්කම් සහ වගකීම් සඳහා නිරීක්ෂණය කළහැකි වෙළඳපොළ ගණුදෙනු සහ වෙළඳපොළ තොරතුරු තිබිය හැකිය. අනෙක් වත්කම් හෝ වගකීම් සඳහා නිරීක්ෂණය කළහැකි වෙළඳපොළ ගණුදෙනු හෝ වෙළඳපොළ තොරතුරු නොතිබිය හැකිය. කෙසේ වෙතත් අවස්ථා දෙකේදී ම සාධාරණ අගය මැනීමේ අරමුණ එක හා සමාන වේ. එනම් ප්‍රවර්තන වෙළඳපොළ තත්ත්වයන් යටතේ මිනුම්කරණ දින වෙළඳපොළ සහභාගීවන්නන් අතර සිදුවිය හැකි වත්කමක් විකිණීමට හෝ වගකීමක් හුවමාරුවන විධිමත් *ගණුදෙනුවක් සිදුවන මිල ඇස්තමේන්තු කිරීමට (උදා: වත්කම දරන හෝ වගකීමට බැඳී සිටින වෙළඳපොළ සහභාගීවන්නන්ගේ* සාපේක්ෂ වැදගත්කම අනුව මිනුම්කරණ දින *ඉවත් වන මිළයි.)*

3. සර්වසම (අනන්‍ය) වත්කමක හෝ වගකීමක මිල නිරීක්ෂණය කළ නොහැකිවනවිට අස්තිත්වයන් විසින් *නිරීක්ෂණය කළහැකි අදාළ යෙදවීම් භාවිතය උපරිමකරන සහ නිරීක්ෂණය කළනොහැකි යෙදවුම් භාවිතය* අවම කෙරෙන වෙනත් තක්සේරු කිරීමේ ශිල්ප ක්‍රමයක් භාවිතාකර සාධාරණ අගය මනිනු ලැබේ. සාධාරණ අගය වෙළඳපොළ පදනම් මිණුමක් නිසා, වෙළඳපොළ සහභාගී වන්නන් වත්කම හෝ වගකීම මිළ කිරීම සඳහා අවදානම පිළිබඳ උපකල්පනය භාවිතය ඇතුළත් කර එය මැනීමට සඳහා භාවිත කරනු ඇතැයි උපකල්පනය කෙරේ.

   ප්‍රතිඵලයක් ලෙස, වත්කමක් රඳවා තබාගැනීමට හෝ නිරවුල් කිරීමට හෝ අන් වශයෙන් වගකීමක් අවසන් කිරීමට අස්තිත්වයක අභිප්‍රාය සාධාරණ අගය මැනීමේදී අදාළ නොවේ.

4. ඒවා ගිණුම්කරණ මිනුම්කරණයේ ප්‍රාථමික විෂයයක් වන නිසා සාධාරණ අගයේ නිර්වචනය වත්කම් සහ වගකීම් කෙරෙහි අවධානය යොමුකෙරේ. මෙයට අමතරව අස්ත්තිවයක සාධාරණ අගයට මනිනු ලබන ස්වකීය ස්කන්ධ සාධන පත්‍ර සඳහා ද මෙම SLFRS ව්‍යවහාර කළ යුතුය.

**විෂය පථය**

5. **6 සහ 7 වන ඡේදයන්හි පැහැදිලිව සඳහන් කර ඇතිපරිදි හැර සාධාරණ අගය මැනීම හෝ සාධාරණ අගය මැනීම හෙළිදරව් කිරීම (සහ සාධාරණ අගය පදනම් කර හෝ එම මැනීම පිළිබඳව විකිණීම සඳහා වන පිරිවැය අඩුකළ සාධාරණ අගය වැනි මැනීම) වෙනත් SLFRS මගින් අවශ්‍ය කරණ විටදී හෝ අවසර දෙනවිටෙකදී මෙම SLFRS ව්‍යවහාර වේ.**

6. මෙම SLFRS හි මැනීම් සහ හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන් පහත සඳහන් දෑ සඳහා ව්‍යවහාර නොවේ.

   (අ) SLFRS 2 හි කොටස් පදනම් ගෙවීම් විෂයපථය යටතට ගැනෙන *කොටස් පදනම් ගෙවීම් ගණුදෙනු.*
   (ආ) LKAS 17 හි *කල්බදු* විෂය පථය යටතට ගැනෙන කල්බදු ගණුදෙනු.
   (ඇ) LKAS 32 හි *තොග ශුද්ධ උපලබ්ධි අගය* LKAS 36 *වත්කම් හානිකරණය* හි ප්‍රායෝජ්‍ය අගය වැනි සාධාරණ අගය නොවන එහෙත් සාධාරණ අගය හා සමරූපීතාවය ඇති සමහර මැණීම්

7. මෙම SLFRS මගින් අවශ්‍ය කෙරෙන හෙළිදරව් කිරීම් පහත සඳහන් දෑ සඳහා අවශ්‍ය නොකෙරේ.

   (අ) LKAS 19 *සේවක ප්‍රතිලාභ* ප්‍රකාරව සාධාරණ අගයට මනිනු ලබන සැලසුම් කළ වත්කම්.
   (ආ) LKAS 26 *සේවක ප්‍රතිලාභ සැලසුම් කිරීම ගිණුම්කරණය* සහ වාර්තා කිරීම ප්‍රකාරව සාධාරණ අගයට මනිනු ලබන සේවකප්‍රතිලාභ සැලසුම් ආයෝජන, සහ
   (ඇ) LKAS 36 ප්‍රකාරව සාධාරණ අගයෙන් බැහැර කිරීමට වන පිරිවැය අඩුකළ පසු අයකරගතහැකි වටිනාකම වන වත්කම්,

8. වෙනත් SLFRSs මගින් සාධාරණ අගය අවශ්‍ය කරන්නේ නම් හෝ අවසර දෙන්නේ නම් හෝ මෙම SLFRS හි විස්තර කරඇති සාධාරණ අගය මැනීම මූලික සහ පසුව මැනීම යන දෙකටම ව්‍යවහාර වේ.

**මැනීම**

**සාධාරණ අගයේ නිර්වචනය**

9. **මැනීම කරන දිනදී වෙළඳපොළ සහභාගී වන්නන් අතර වන ක්‍රමවත් ගණුදෙනුවකදී වත්කමක් විකිණීමට ලැබියයුතු වූ හෝ වගකීමක් පැවරීමකදී ගෙවියයුතු වූ මිල සාධාරණ අගයලෙස මෙම SLFRS ය නිර්වචනය කරයි.**

10. ආ 2 ඡේදය සමස්ථ සාධාරණ අගය මැනීමේ ප්‍රවේශය විස්තර කරයි.

**වත්කම හෝ වගකීම**

**11. සාධාරණ අගය මැනීම වනුයේ විශේෂ වත්කමක් හෝ වගකීමක් සඳහාය. එබැවින් සාධාරණ අගය මැනීමේදී අස්තිත්වයක් වත්කමේ හෝ වගකීමේ ඇති ගතිලක්ෂණ, වෙළඳපොළ සහභාගිවන්නන් මිනුම්කරණ දිනදී එම ගතිලක්ෂණ වත්කමක් හෝ වගකීමක් මිල කිරීමේදී සැලකිල්ලට ගන්නේ නම් සැලකිල්ලට ගතයුතුය. එවැනි ගතිලක්ෂණ වලට උදාහරණ වශයෙන් පහත දෑ ඇතුළත් වේ.**

**(අ) වත්කමේ තත්ත්වය සහ පිහිටීම, සහ**

**(ආ) වත්කම විකිණීම හෝ භාවිත කිරීම පිළිබඳ යම්සීමාවන් වෙතොත් ඒවා.**

12. විශේෂ ගතිලක්ෂණයකින් ඇතිවන මැනීම මත වන බලපෑම එම ගතිලක්ෂණය වෙළඳපොළ සහභාගිවන්නන් සැලකිල්ලට ගන්නේ කෙසේද යන්න මත වෙනස් වනු ඇත.

13. සාධාරණ අගයට මනිනු ලබන වත්කමක් හෝ වගකීමක් පහත දෑ වලින් දෙකෙන් එකක් විය හැකිය.

(අ) වෙනස්ව පෙනෙන වත්කමක් හෝ වගකීමක් (උදා: මූල්‍ය සාධන පත්‍රයක් හෝ මූල්‍ය නොවන වත්කමක්), හෝ

(ආ) වත්කම් සමූහයක්, වගකීම් සමූහයක් හෝ වත්කම් සහ වගකීම් සමූහයක් (උදා: මුදල් උත්පාදන ඒකකයක් හෝ ව්‍යාපාරයක්).

14. හඳුනාගැනීමේ හෝ හෙළිදරව් කිරීමේ අරමුණ සඳහා වත්කම හෝ වගකීම වෙනස්ව පෙනෙන වත්කමක් හෝ වගකීමක්ද, වත්කම් සමූහයක්ද වගකීම් සමූහයක්ද, හෝ වත්කම් හෝ වගකීම් සමූහයක්ද යන්න රඳා පවත්නේ ගිණුම්කරණ ඒකකය මතය. මෙම SLFRS හි සලසා ඇති (ප්‍රතිපාදනය කර ඇති) පරිදි හැර වත්කම හෝ වගකීම සඳහා ගිණුම් ඒකකය නිර්ණය කළ යුත්තේ සාධාරණ අගය මැනීම අවශ්‍ය කෙරෙන සහ ඉඩදෙන SLFRS ප්‍රකාරවය.

**ගණුදෙනුව**

**15. මැනීම කරන දින ප්‍රවර්තන වෙළඳපොළ තත්ත්වයන් යටතේ වත්කමක් විකිණීමකට හෝ වගකීමක් පැවරීමට වෙළඳපොළ සහභාගිවන්නන් අතර විධිමත් ගනුදෙනුවකදී වත්කම හෝ වගකීම හුවමාරු වීම සාධාරණ අගය මැනීම උපකල්පනය කරයි.**

**16. වත්කම විකිණීමට හෝ වගකීම පැවරීමට වන ගණුදෙනුව පහත සඳහන් ස්ථාන දෙකෙන් එකකදී සිදුවන බව සාධාරණ අගය මැනීම උපකල්පනය කරයි.**

**(අ) වත්කම හෝ වගකීම සඳහා ඇති ප්‍රධාන වෙළඳපොළ තුළදී හෝ**

**(ආ) ප්‍රධාන වෙළඳපොළක් නොමැති විටෙකදී වත්කම හෝ වගකීම සඳහා වඩාත් වාසි සහගත වෙළඳපොළක් තුළදී.**

17. ප්‍රධාන වෙළඳපොළ හෝ ප්‍රධාන වෙළඳපොළක් නොමැති විටෙකදී වඩාත් වාසිදායක තිබිය හැකි වෙළඳපොළවල් සොයා ගැනීම සඳහා අස්තිත්වයක් පරිපූර්ණ සොයා බැලීමක් භාරනොගත යුතු අතර, එහෙත් එය සාධාරණ ලෙස තිබෙන සියලුම තොරතුරු සැලකිල්ලට ගත යුතුය. මෙයට පටහැනිව සාක්ෂි නොමැතිවිට වත්කම විකිණීමට හෝ වගකීම පැවරීමේ ගණුදෙනුවකට සාමාන්‍යයෙන් අස්තිත්වයක් ඇතුල් වන වෙළඳපොළ, ප්‍රධාන වෙළඳපොළ හෝ ප්‍රධාන වෙළඳපොළක් නොමැතිවිටෙක වඩාත් වාසිදායක වෙළඳපොළ ලෙස උපකල්පනය කෙරේ.

18. මිනුම්කරණ දින වෙනත් වෙළඳපොළක මිල භව්‍ය ලෙස වඩා වාසිදායක වුවත්, වත්කම සහ වගකීම සඳහා ප්‍රධාන වෙළඳපොළක් තිබේනම් එම වෙළඳපොළේ මිල සාධාරණ අගය මැනීම නියෝජනය කරයි. (එම මිල ඍජුව නිරීක්ෂණය කළහැකි හෝ වෙනත් තක්සේරු ශිල්පක්‍රමයක් භාවිතා කර ඇස්තමේන්තු කළහැකි වුවත්)

19. මිනුම්කරණ දින අස්තිත්වයට ප්‍රධාන (හෝ වඩාත් වාසිසහගත) වෙළඳපොළට ප්‍රවේශ වීමට හැකියාව තිබිය යුතුය. වෙනස් ක්‍රියාකාරකම් සහිත වෙනස් අස්තිත්වයකට (සහ එම අස්තිත්වයන් තුළ වන ව්‍යාපාර) වෙනස් වෙළඳපොළ සඳහා ප්‍රවේශවීමට හැකියාව තිබීම නිසා එකම වත්කම හෝ වගකීම සඳහා ප්‍රධාන වෙළඳපොළ (හෝ වඩාත් වාසි සහගතව වෙනස් අස්තිත්වයන් සඳහා (සහ එම අස්තිත්වය තුළ වන ව්‍යාපාර) වෙනස්විය හැකිය. එබැවින් ප්‍රධාන (හෝ වඩාත් වාසිදායක) වෙළඳපොළ (සහ ඒ අනුව වෙළඳපොළ සහභාගීවන්නන්) සැලකිල්ලට ගතයුත්තේ අස්තිත්වයේ සාපේක්ෂ වැදගත්කම අනුව වන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස වෙනස් ක්‍රියාකාරකම් සහිත අස්තිත්වයන් අතර සහ කෙරෙහි වෙනස්කම් වලට ඉඩදේ.

20. අස්තිත්වයකට වෙළඳපොළකට ප්‍රවේශවීමට හැකියාව තිබියයුතු වුවත් එම වෙළඳපොළේ මිල පදනම් කර සාධාරණ අගය මැනීමට හැකිවීම පිණිස අස්තිත්වය මිනුම්කරණ දින විශේෂ වත්කමක් විකිණීමට හෝ විශේෂ වගකීමක් පැවරුම් කිරීමේ හැකියාව තිබීම අවශ්‍ය නොවේ.

21. වත්කමක් දරන හෝ වගකීමකට බැඳී සිටින වෙළඳපොළ සහභාගීවන්නන්ගේ සාපේක්ෂ වැදගත්කම පැත්තෙන් සලකා බලනවිට මැනීම කරන දිනයේ වත්කම විකිණීම හෝ වගකීම පැවරීම සම්බන්ධයෙන් මිල කිරීමේ තොරතුරු සැපයීමට නිරීක්ෂණය කළහැකි වෙළඳපොළක් නොමැති වූවිටකදී පවා එම දිනයේදී ගණුදෙනුව සිදුවූ බව සාධාරණ අගය මැනීම උපකල්පනය කරයි.

වෙළඳපොළ සහභාගීවන්නන්

**22. වෙළඳපොළ සහභාගීවන්නන් ඔවුන්ගේ හොඳම ආර්ථික වාසිය අනුව ක්‍රියා කරන්නේ යයි උපකල්පනය කරමින් වත්කමක හෝ වගකීමක මිල කිරීම වෙළඳපොළ සහභාගීවන්නන් එය භාවිත කරනු ඇතැයි උපකල්පනය කරමින් අස්තිත්වය වත්කමක හෝ වගකීමක සාධාරණ අගය මැනිය යුතුය.**

23. එම උපකල්පනය වැඩිදියුණු කිරීමේදී අස්තිත්වයන් විශේෂිත වෙළඳපොළ සහභාගීවන්නන් හඳුනාගැනීම අවශ්‍ය නොවේ. වඩා හොඳ විකල්පයක් වශයෙන් අස්තිත්වය පහත සඳහන් සාධකවලට විශේෂිත සැලකිල්ලක් දක්වමින් සාමාන්‍ය හෝ වෙළඳපොළ සහභාගීවන්නන් වෙන්කිරීම හඳුනාගැනීම සඳහාවන ගති ලක්ෂණ හඳුනා ගතයුතුය.

(අ) වත්කම හෝ වගකීම

(ආ) වත්කම හෝ වගකීම සඳහා ප්‍රධාන (වඩාත් වාසිසහගත) වෙළඳපොළ, සහ

(ඇ) අස්තිත්වය වෙළඳපොළේ කුමන වෙළඳපොළ සහභාගීවන්නන් සමග ගණුදෙනුවලට ඇතුළත් වන්නේද.

මිල

**24. වෙනත් තක්සේරු කිරීමේ ශිල්පක්‍රමයක් භාවිත කර එම මිල සෘජුව නිරීක්ෂණය කළහැකි හෝ ඇස්තමේන්තු කළහැකිද යන්න නොසලකා මිනුම්කරණ දින ප්‍රවර්තන වෙළඳපොළ තත්ත්වය යටතේ (උදා: ඉවත්වීමේ මිල) ප්‍රධාන (හෝ වඩාත් වාසිසහගත) වෙළඳපොළේ විධිමත් ගනුදෙනුවකදී වත්කමක් විකිණීමකදී ලැබියයුතු හෝ වගකීමක් පැවරීමේ ගෙවියයුතු මිල සාධාරණ අගයයි.**

25. වත්කමේ හෝ වගකීමේ සාධාරණ අගය මැනීමට භාවිතා කළ ප්‍රධාන (හෝ වඩාත් වාසිසහගත) වෙළඳපොළේ මිල ගනුදෙනු කිරීමේ සඳහා ගැළපිය යුතු නොවේ. වෙනත් SLFRSs අනුව *ගණුදෙනු කිරීමේ පිරිවැය* ගිණුම් තැබිය යුතුය. ගණුදෙනු කිරීමේ පිරිවැය වත්කමක හෝ වගකීමක ගතිලක්ෂණයක් නොවේ. වඩා හොඳ විකල්පයක් ලෙස ඒවා ගණුදෙනුවකට විශේෂිතවන අතර, වත්කම හෝ වගකීම සඳහා වන ගණුදෙනුවක් සඳහා අස්තිත්වයක ඇතුළත් වන්නේ කෙසේද යන්න මත වෙනස් වේ.

26. *ප්‍රවාහන පිරිවැය* ගණුදෙනු කිරීමේ පිරිවැයට ඇතුළත් නොවේ. වත්කමේ පිහිටීම ගති ලක්ෂණයක් නම් (සිද්ධියක් වියහැකි උදා: වශයෙන් වෙළඳ භාණ්ඩයක්) පවතින පිහිටීමේ සිට එම වෙළඳපොළ දක්වා වත්කම ප්‍රවාහනය කිරීමට වේනම්, එම පිරිවැය සඳහා ප්‍රධාන (හෝ වඩාත් වාසි සහගත) වෙළඳපොළේ මිල ගැළපිය යුතුය.

මූල්‍ය නොවන වත්කම් සඳහා ව්‍යවහාර කිරීම

මූල්‍ය නොවන වත්කම් ඉහළම මෙන්ම වඩාත් හොඳ භාවිතය

**27. වත්කම එහි ඉහළම මෙන්ම වඩාත් හොඳින් භාවිතා කිරීමෙන් හෝ වත්කම එහි *ඉහළම මෙන්ම වඩාත් හොඳින් භාවිතා* කළහැකි වෙනත් වෙළඳපොළ සහභාගී වන්නකුට විකිණීමෙන්, වෙළඳපොළ සහභාගීවන්නකුගේ ආර්ථික ප්‍රතිලාභ උත්පාදනය කිරීමේ හැකියාව, මූල්‍ය නොවන වත්කමක සාධාරණ අගය මැනීමේදී සැලකිල්ලට ගනු ලැබේ.**

28. පහත දැක්වෙන පරිදි මූල්‍ය නොවන වත්කමක ඉහළම මෙන්ම වඩාත් හොඳ භාවිතයේදී, වත්කම භෞතිකව භාවිතා කිරීමේ හැකියාව, නෛතිකව ඉඩදිය හැකිබව, සහ මූල්‍ය වශයෙන් යෝග්‍යතාවය සැලකිල්ලට ගැනේ,

(අ) වත්කමේ මිල නියම කිරීමේදී වෙළඳපොළ හා සහභාගී වන්නන් ගණන්ගනු ලැබිය හැකි භෞතික ගතිලක්ෂණ භෞතික වශයෙන් ගණන් ගැනීමේ හැකියාව ඇති භාවිතයක් (උදා.) වත්කමේ ප්‍රමාණය හෝ පිහිටීම)

(ආ) වත්කම් (උදා: වත්කමකට අදාළ වන කලාප කිරීමේ රෙගුලාසි) මිල නියම කිරීමේ වෙළඳපොළ සහභාගීවන්නන් ගණන් ගන්නා වත්කම භාවිතය පිළිබඳ නීතිමය සීමාවන් නෛතිකත්වය වශයෙන් ගණන් ගැනීමේ හැකියාවේ භාවිතය.

(ඇ) වත්කම එම භාවිතය සඳහා යෙදවීමට වන ආයෝජනයට වෙළඳපොළ සහභාගිවන්නන් ආයෝජනයට අපේක්ෂා කරන ප්‍රතිලාභ හටගැන්වීමට ප්‍රමාණවත් ආදායමක් හෝ මුදල් ප්‍රවාහයන් (වත්කම එම භාවිතයට පරිවර්තනය කිරීමට වන පිරිවැය ගණන් ගැනීමෙන්) උත්පාදනය වන වත්කම භාවිත කිරීමට භෞතික වශයෙන් හැකියාව තිබේද සහ නෛතිකව අවසර තිබේද යන්න ගණන්ගනු ලැබිය හැකි මූල්‍ය වශයෙන් ශක්‍යතාවයන් ඇති භාවිතයකි.

29. අස්තිත්වය වෙනස් භාවිතයක් අපේක්ෂා කළත් ඉහළම සහ වඩාත් හොඳ භාවිතය නිර්ණය කරනුයේ වෙළඳපොළ සහභාගිවන්නන්ගේ සාපේක්ෂ වැදගත්කම අනුවය. කෙසේ වෙතත්, වෙළඳපොළ සහභාගීවන්නන් විසින් වෙනස් භාවිතයකින් වත්කමේ වටිනාකම උපරිම කළ හැකිය යන්න වෙළඳපොළ සහ වෙනත් සාධකයක් යෝජනා කරන්නේ නම් හැර, මූල්‍ය වත්කමේ ප්‍රවර්තන භාවිතය එහි ඉහළම මෙන්ම වඩාත් හොඳම භාවිතය ලෙස උපකල්පනය කෙරේ.

30. තරඟකාරී තත්ත්වය ආරක්ෂා කිරීම සඳහා හෝ වෙනත් හේතු සඳහා අලුතින් අත්කරගත් මූල්‍ය නොවන වත්කම් ක්‍රියාකාරී ලෙස භාවිත කිරීම අපේක්ෂා නොකළ හැකි මෙන්ම එහි ඉහළම හෝ වඩාත් හොඳ භාවිතය ප්‍රකාරව භාවිත නොකිරීමත් අපේක්ෂා කළ හැකිය.

උදාහරණයක් ලෙස සිද්ධියක් විය හැක්කේ අත්පත්කරගත් අස්පෘශ්‍ය වත්කම එය වෙනත් අය භාවිතා කිරීම වැළැක්වීමට අස්තිත්වය ආරක්ෂාකාරී ලෙස භාවිතා කිරීමට සැලසුම් කිරීමය. එසේ වුවත් අස්තිත්වය මූල්‍ය නොවන වත්කමක සාධාරණ අගය වෙළඳපොළ සහභාගිවන්නන් එහි උසස් සහ වඩාත් හොඳ භාවිතය උපකල්පනය කර මැනිය යුතුය.

**මූල්‍ය නොවන වත්කම් සඳහා තක්සේරු කිරීමේ පූර්වායවය**

31. මූල්‍ය නොවන වත්කමක උසස් හා වඩාත් හොඳ භාවිතය පහත සඳහන් පරිදි වත්කම සාධාරණ අගය මැනීම සඳහා භාවිත කිරීමට තක්සේරු කිරීමේ පූර්වායවය පිහිටුවයි.

(අ) සමූහයක් වශයෙන් වෙනත් වත්කම්වල සංයෝජනයක් සමග (භාවිතය සඳහා ස්ථාපිත හෝ අන්වශයෙන් ආකෘති කරනලද) හෝ වෙනත් වත්කම් සහ වගකීම් සමග සංයෝජනයක් වශයෙන් (උදා: ව්‍යාපාරයක්) එහි භාවිතය මගින් මූල්‍ය නොවන වත්කම උසස් හා වඩාත් හොඳ භාවිතය මගින් වෙළඳපොළ සහභාගිවන්නන් හට උපරිම අගය ලබාදිය හැකිවනු ඇත.

(i) වත්කමේ ඉහළම හා වඩාත් හොඳ භාවිතය වනුයේ වත්කම වෙනත් වත්කම් හෝ වෙනත් වත්කම් හෝ වගකීම් සමග සංයෝජනයකින් භාවිත කිරීමට නම්, වත්කමේ සාධාරණ අගය වනුයේ, වත්කම වෙනත් වත්කම් හෝ වෙනත් වත්කම් හෝ වගකීම් සමග භාවිත කරන්නේ යයි හෝ වත්කම වෙළඳපොළ සහභාගි වන්නන්හට ලබාගැනීමට හැකියයි උපකල්පනය කරමින් ප්‍රවර්තන ගනුදෙනුවකදී වත්කම විකිණීමකදී ලැබිය හැකිවන මිලයි.

(ii) වත්කම සහ අනුපූරක වත්කම් සමග ආශ්‍රිත වගකීම්වලට කාරක ප්‍රාග්ධනය අරමුදල්කරනය සඳහා වන වගකීම් ඇතුළත් වන අතර එහෙත් සමූහය තුළ වන වත්කම් හැර අන් වත්කම් අරමුදල්කරණය සඳහා වන වගකීම් ඇතුළත් නොවේ.

(iii) මූල්‍ය නොවන වත්කමක උසස් සහ වඩාත්ම හොඳින් භාවිතය සඳහා වන උපකල්පන වත්කම් සමූහයක සියලු වත්කම් සඳහා (උස් සහ වඩාත්ම හොඳම භාවිතය අදාළවන) වත්කම භාවිත වියහැකි වත්කම් සහ වගකීම් සමූහයක් සඳහා සංගතවිය යුතුය.

(ආ) මූල්‍ය නොවන වත්කමක උසස් සහ වඩාත්ම හොඳ භාවිතය වෙළඳපොළ සහභාගිවන්නන් හට අසමානව පෙනෙන පදනම මත උපරිම වටිනාකම ලබාදිය හැකිය. වත්කමේ උසස් සහ වඩා හොඳ භාවිතය අසමානව පෙනෙන පදනම මත භාවිත කරන්නේ නම් වත්කමේ සාධාරණ අගයවන්නේ අසමානව පෙනෙන පදනම මත භාවිත කරනු ලැබිය හැකි වෙළඳපොළ සහභාගිවන්නන්හට ප්‍රවර්තන ගණුදෙනුවකදී විකිණීමකදී ලැබිය හැකි මිලයි.

32. වෙනත් SLFRSs වල (තනි වත්කමක් වියහැකි) නියම කර ඇති ගිණුම් ඒකක අනුව සංගතව වත්කම් විකුණනු ඇතැයි මූල්‍ය වත්කමක සාධාරණ අගය මැනීම උපකල්පනය කරයි. එවැනි සිද්ධියක් වන්නේ වෙළඳපොළ සහභාගිවන්නන් දැනටමත් අනුපූරක වත්කම් හා ආශ්‍රිත වගකීම් දරන බව උපකල්පනය කරනනිසා වත්කමේ උසස්ම මෙන්ම වඩාත් හොඳම භාවිතය වෙනත් වත්කම් හෝ වෙනත් වත්කම් හා වගකීම් සමග සංයෝජිතව භාවිත කළයුතුය යන්න සාධාරණ අගය මැනීම වුවද උපකල්පනය කරයි.

33. මූල්‍ය නොවන වත්කම් සඳහා තක්සේරු කිරීමේ පූර්වායවය සංකල්පය ව්‍යවහාර කිරීම ආ 3 ඡේදය විස්තර කරයි.

**වගකීම් සහ අස්තිත්වයේ ස්වකීය සාධනපත්‍ර සඳහා ව්‍යවහාරකරණය**

**පොදු මූලධර්ම**

**34. මූල්‍ය හෝ මූල්‍ය නොවන වගකීමක් හෝ අස්තිත්වයේ ස්වකීය ස්කන්ධ සාධන පත්‍ර (උදා: ප්‍රතිශ්‍රාව වශයෙන් ව්‍යාපාර සංයෝජනයකදී නිකුත් කළ ස්කන්ධ හිමිකම්) මිනුම්කරණ දින වෙළඳපොළ සහභාගීවන්නන්හට පවරනු බව සාධාරණ අගය මැනීම උපකල්පනය කරයි. වගකීමක් හෝ අස්තිත්වයක ස්වකීය සාධනපත්‍ර පැවරීම පහත දේ උපකල්පනය කරයි.**

**(අ) වගකීම ගෙවීමට පවතින අතර වෙළඳපොළ සහභාගීවන්නන් පැවරුම්ලාභියා වගකීම ඉටුකිරීම අවශ්‍ය කරනු ඇත. වගකීම ප්‍රතිපාර්ශ්වයන් සමග නිරවුල් නොකරන අතර, එසේ නොමැතිව මිනුම්කරණ දින අහෝසිවනු ඇත.**

**(ආ) අස්තිත්වයේ ස්වකීය සාධන පත්‍ර ගෙවීමට පවතින අතර සහ වෙළඳපොළ සහභාගිවන්නන් පැවරුම්ලාභියා සාධන පත්‍ර හා ආශ්‍රිත හිමිකම් සහ වගකීම් භාරගනු ඇත. සාධන පත්‍රය මිනුම්කරණ දිනදී අවලංගු වීම හෝ එසේ නොමැතිව අහෝසිවීම සිදුනොවනු ඇත.**

35. වගකීමක් පැවරීමට හෝ අස්තිත්වයක ස්වකීය සාධන පත්‍ර (උදා: ගිවිසුම්ගත හෝ වෙනත් නෛතික සීමාකිරීම් එවැනි අයිතම හුවමාරු කිරීම වලක්වන නිසා) මිල කිරීම පිළිබඳ තොරතුරු සැපයීමට නිරීක්ෂණය කළහැකි වෙළඳපොළක් නොමැති විටකදී වුවද, වෙනත් පාර්ශ්ව වත්කම් වශයෙන් ඒවා (උදා: සංස්ථාපිත බැඳුම්කර, හෝ අස්තිත්වයක කොටස්මත ඇරයුම් විකල්පයක්) දරන්නේ නම් ඒ අයිතම සඳහා නිරීක්ෂණය කළහැකි වෙළඳපොලක් තිබිය හැකිය.

36. සාධාරණ අගය මැනීමේ පරමාර්ථය ළඟාකර ගැනීම සඳහා එනම්, ප්‍රවර්තන වෙළඳපොළ තත්ත්වයන් යටතේ මැනීම කරන දින වෙළඳපොළ සහභාගිවන්නන් අතර වන විධිමත් ගණුදෙනුවකදී වගකීමක් හෝ ස්කන්ධ සාධන පත්‍රයක් පැවරිය යුතුවන මිල ඇස්තමේන්තු කිරීමට සියලුම අවස්ථාවලදී අස්තිත්වය අදාළ නිරීක්ෂණය කළහැකි යෙදවුම් භාවිතය උපරිම කළයුතු අතර, නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් භාවිතය අවම කළ යුතුය.

*වත්කම් වශයෙන් වෙනත් පාර්ශ්ව දරන වගකීම් සහ ස්කන්ධ සාධන පත්‍ර*

**37. සර්ව සම හෝ එක සමාන වගකීමක් හෝ අස්තිත්වයේ ස්වකීය සාධන පත්‍ර පැවරීම සඳහා ප්‍රකාශිත මිලක් නොමැති විටෙකදී, සහ සර්වසම අයිතමය වෙනත් පාර්ශ්වයක් වත්කමක් ලෙස දරන විටදී, අස්තිත්වය විසින් වගකීමේ හෝ ස්කන්ධ සාධන පත්‍රයේ සාධාරණ අගය සර්වසම අයිතමය දරන වෙළඳපොළ සහභාගිවන්නන්ගේ සාපේක්ෂ වැදගත්කම පැත්තෙන් ගත්විට මනිනු ලබන දිනදී එය වත්කමක් ලෙස මැනිය යුතුය.**

38. එවැනි අවස්ථාවලදී අස්තිත්වය විසින් වගකීමේ හෝ ස්කන්ධ සාධන පත්‍රයේ සාධාරණ වටිනාකම පහත දැක්වෙන පරිදි මැනිය යුතුය.

(අ) එම මිල ලබාගතහැකිනම්, වත්කමක් ලෙස වෙනත් පාර්ශ්වය දරන සර්වසම අයිතමය සඳහා ක්‍රියාකාරී වෙළඳපොළක ප්‍රකාශිත මිල භාවිත කරමින්,

(ආ) එම මිල ලබාගත නොහැකි නම් වෙනත් පාර්ශ්වයක් වත්කමක් ලෙස දරන සර්වසම අයිතමය සඳහා සක්‍රිය නොවන වෙළඳපොළක ප්‍රකාශිත මිල වැනි වෙනත් නිරීක්ෂණය කළහැකි යෙදවුම් භාවිතය වැනි.

(ඇ) (අ) සහ (ආ) තුළ වන නිරීක්ෂණය කළහැකි මිල ගණන් ලබාගත නොහැකි නම් පහත සඳහන් වැනි වෙනත් තක්සේරු කිරීමේ ශිල්පක්‍රමයක් භාවිත කර,

(i) *ආදායම් ප්‍රවේශය* (වෙළඳපොළ සහභාගීවන්නෙක් වගකීමක් හෝ ස්කන්ධ සාධන පත්‍රයක් ලෙස වත්කමක් දැරීමෙන් අපේක්ෂා කරන අනාගත මුදල් ප්‍රවාහවල වර්තමාන වටිනාකම ශිල්පක්‍රමය සැලකිල්ලට ගැනීම, ආ 10 සහ ආ 11 ඡේද බලන්න)

(ii) *වෙළඳපොළ ප්‍රවේශය* (වෙනත් පාර්ශ්වයන් වත්කම් වශයෙන් දරන එක සමාන වගකීම් හෝ ස්කන්ධ සාධන පත්‍ර සඳහා ප්‍රකාශිත මිල ගණන් භාවිතයෙන්, ආ5 - ආ7 ඡේද බලන්න.)

39. වගකීමේ හෝ ස්කන්ධ සාධනපත්‍රයේ සාධාරණ අගය මැනීමට අදාළ නොවන වත්කමට විශේෂිත වූ සාධක ඇත්නම් පමණක්, වත්කමක් වශයෙන් වෙනත් පාර්ශ්වයන් දරන වගකීමක හෝ අස්තිත්වයේ ස්වකීය ස්කන්ධ සාධන පත්‍රයක ප්‍රකාශිත මිල අස්තිත්වය ගැලපුම් කළ යුතුය. සීමාකිරීමක බලපෑමෙන් එම වත්කම විකිණීම වළක්වාලන වත්කමේ මිලෙන් පිළිබිඹු නොවනලෙසට අස්තිත්වය සහතික විය යුතුය. වත්කමක ප්‍රකාශිත මිල ගැළපුම් කළ යුතුයැයි ඇඟවිය හැකි සමහර සාධකවලට පහත දැ ඇතුළත් වේ.

(අ) වත්කමේ ප්‍රකාශිත මිල වෙනත් පාර්ශ්වයක් වත්කමක් ලෙස දරන එක හා සමාන (එහෙත් සර්ව සම නොවන) වගකීමකට හෝ ස්කන්ධ සාධන පත්‍රයකට සම්බන්ධිත වේ. උදාහරණ වශයෙන්, එනම් වත්කමක් වශයෙන් දරන එක හා සමාන වගකීමක හෝ ස්කන්ධ සාධන පත්‍රයකින් පිළිබිඹුවන සාධාරණ අගයට වඩා වෙනස් විශේෂ ගතිලක්ෂණයක් (නිකුත් කරන්නාගේ ණයවල ගුණාත්මකභාවය) වත්කමට හෝ ස්කන්ධ සාධන පත්‍රයට තිබිය හැකිය.

(ආ) වගකීමට හෝ ස්කන්ධ සාධන පත්‍රයකට සඳහා ඇති ගිණුම් ඒකකය වත්කම් සඳහා ඇති ගිණුම් ඒකකය එකම නොවේ. උදාහරණ වශයෙන් වගකීම් සඳහා සමහර අවස්ථාවලදී මිලෙහි නිකුත් කරන්නාගෙන් ලැබියයුතු වටිනාකම් සහ තුන්වන පාර්ශ්වයයන්ගේ ණය උද්දීපන පහසුකම් යන දෙකෙන්ම සමන්විත තනි ඒකකයක් (Package) සඳහා සංයුක්ත මිල ලෙස වත්කමක මිල පිළිබිඹු වේ. වගකීම සඳහා වන ගිණුම් ඒකකය සංයුක්ත තනි ඒකකය සඳහා නොවේනම්, පරමාර්ථය වනුයේ නිකුත් කරන්නාගේ වගකීමේ සාධාරණ අගය මැනීම මිස සංයුක්ත තනි ඒකකයේ සාධාරණ අගය මැනීම නොවේ. ඒ අනුව එවන් අවස්ථාවලදී තුන්වන පාර්ශ්වයක ණය උද්දීපන පහසුකමෙන් වන බලපෑම ඉවත් කිරීමට අස්තිත්වය වත්කම සඳහා නිරීක්ෂණය කළ මිළ ගලපනු ඇත.

**වෙනත් පාර්ශ්වයන් වත්කම් වශයෙන් නොදරන වගකීම් සහ ස්කන්ධ සාධන පත්‍ර**

40. සර්වසම හෝ එකහා සමාන වගකීමක් හෝ අස්තිත්වයේ ස්වකීය ස්කන්ධ සාධන පත්‍රයක් පැවරීමකදී ප්‍රකාශිත මිලක් නොමැති විටෙකදී සහ සර්වසම අයිතමය වත්කම්ක ලෙස වෙනත් පාර්ශ්වයක් නොදරන විටෙකදී වගකීම ගෙවීමට බැඳී සිටින හෝ ස්කන්ධය මත හිමිකම් ඉල්ලීමක් නිකුත් කළ වෙළඳපොළ සහභාගිවන්නකුගේ සාපේක්ෂ වැදගත්කම පැත්තෙන් ගත්කල තක්සේරු කිරීමේ ශිල්පක්‍රමයක් භාවිත කර අස්තිත්වයට වගකීමේ හෝ ස්කන්ධ සාධන පත්‍රයේ සාධාරන අගය මැනිය යුතුය.

41. උදාහරණ වශයෙන් වර්තමාන අගය ශිල්පක්‍රමය ව්‍යවහාර කරනවිට අස්තිත්වයන් පහත දැක්වෙන දෑ වලින් එකක් සැලකිල්ලට ගත හැකිය.

(අ) බැඳීම භාරගැනීම මත වෙළඳපොළ සහභාගිවන්නකුට අවශ්‍ය වියහැකි හානිපූරණය ඇතුළුව බැඳීමක් අවසන් කිරීමට වෙළඳපොළ සහභාගිවන්නෙක් දැරීමට අපේක්ෂා කරන අනාගත මුදල් ප්‍රවාහ වල ගලායාම් (ආ31 - ආ33 ඡේද බලන්න).

(ආ) ප්‍රධාන (වඩාත් වාසිසහගත) වෙළඳපොළේ වෙනස් නොවූ ගිවිසුම් ගත කොන්දේසි සහිතව වගකීමක් හෝ ස්කන්ධ සාධන පත්‍රයක් නිකුත්කිරීම සඳහා සර්වසම අයිතමය (වෙනස් නොවූ ණය ගතිලක්ෂණ සහිත) මිල කිරීමේදී වෙළඳපොළ සහභාගිවන්නන් භාවිත කළහැකි උපකල්පනයන් භාවිත කරමින් සර්වසම වගකීමක් හෝ ස්කන්ධ සාධන පත්‍රයකට ඇතුලුවීමට හෝ නිකුත් කිරීමට වෙළඳපොළ සහභාගිවන්නාට ලැබියහැකි වන වටිනාකම.

**කාර්ය ඵල නොමැති අවදානම**

42. වත්කමක සාධාරණ අගයෙන් කාර්ය ඵල නොමැති අවදානම් බලපෑම පිළිබිඹු වේ. කාර්ය ඵල නොමැති අවදානමට අස්තිත්වයේ ස්වකීය ණය අවදානම (SLFRS 7 *මූල්‍ය සාධන පත්‍රः හෙළිදරව් කිරීම්හි නිර්වචනය කර ඇති පරිදි*) ඇතුළත්වන අතර එයටම සීමාවිය නොහැකිය. කාර්ය ඵල නොමැති අවදානම වගකීමක් පැවරීමට පෙර හා පසුවද වෙනස් නොවන බව උපකල්පනය කෙරේ.

43. වගකීමක සාධාරණ අගය මැනීමේදී අස්තිත්වය විසින් එහි ණය අවදානමේ (ණය තත්ත්වය) බලපෑම සහ බැඳීම අවසන් කිරීමට හෝ අවසන් නොකිරීම හේතුවිය හැකි වෙනත් සාධකයන්ගේ බලපෑම සහ වෙනත් සාධකයන් සැලකිල්ලට ගතයුතුය. සිදුවන බලපෑම වගකීම රඳා පැවැත්ම මත වෙනස් වේ. උදාහරණ වශයෙන්,

(අ) වගකීම මුදල් භාරදීමට වන බැඳීමක්ද (මූල්‍ය වගකීමක්) හෝ භාණ්ඩ හෝ සේවා භාරදීමට වන බැඳීමක්ද (මූල්‍ය නොවන වගකීමක්) යන්න.

(ආ) යම් වෙතොත් වගකීමට සම්බන්ධිත ණය උද්දීපන කොන්දේසි

44. එහි ගිණුම් ඒකක පදනම මත වගකීමක කාර්ය ඵල නොමැති අවදානමේ බලපෑම පිළිබිඹු කෙරේ. වගකීමෙන් වෙන්ව ගිණුම්ගත කරන තුන්වන පාර්ශ්වයක වෙන්කළ නොහැකි ණය උද්දීපනයක් සහිත වගකීමක් නිකුත් කරන්නෙකු නිකුත් කරනු ලබන වගකීමක්, වගකීමේ සාධාරණ අගය මැනීමේදී ණය උද්දීපනය කිරීමේ (උදා: ණයක් සඳහා තුන්වන පාර්ශ්වයක ඇපවීම) බලපෑම ඇතුළත් නොකළ යුතුය. ණය උද්දීපනය වගකීමෙන් වෙන්ව ගිණුම්ගත කරන්නේ නම් වගකීමේ සාධාරණ අගය මැනීමේදී නිකුත් කරන්නා විසින් සැලකිල්ලට ගන්නේ ස්වකීය ණය තත්ත්වය මිස තුන්වන පාර්ශ්වයක ණය තත්ත්වය නොවේ.

**වගකීමක් හෝ අස්තිත්වයේ ස්වකීය ස්කන්ධ සාධන පත්‍ර පැවරීම වළක්වාලන සීමාකිරීම**

45. වගකීමක හෝ අස්තිත්වයක ස්වකීය ස්කන්ධ සාධන පත්‍රවල සාධාරණ අගය මනිනවිට අස්තිත්වය විසින් වෙනම යෙදවුමක් හෝ අයිතමය පැවරීම වළක්වාලන පවතින සීමා කිරීමකට සම්බන්ධිත වෙනත් යෙදවුම්වලට ගැළපුමක් ඇතුළත් නොකළ යුතුය. වගකීමක් හෝ අස්තිත්වයක ස්වකීය ස්කන්ධ සාධන පත්‍ර පැවරීම වළක්වාලන සීමාකිරීම් වල බලපෑම එක්කෝ ව්‍යංගව හෝ ප්‍රකාශිතව සාධාරණ අගය මැනීමේ වෙනත් යෙදවුම්වල ඇතුළත් වේ.

46. උදාහරණ වශයෙන් බැඳීම පැවරීම වළක්වන සීමාකිරීමකට ඇතුළත්ය යන පූර්ණ දැනුම ඇතිව ගණුදෙනුව සිදුවන දින ණයහිමියා සහ අනුග්‍රහය දක්වන්නා වගකීම සඳහාවන ගණුදෙනුවක මිල පිළිගනී. ගණුදෙනුවක මිලේ සීමා කිරීමක් ඇතුළත් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ගනුදෙනුවන දින පැවරුමේ සීමා කිරීම්වල බලපෑම පිළිබිඹු වීමට පවතින යෙදවුමට වෙනම යෙදවුමක් හෝ ගැළපීමක් කිරීම අවශ්‍ය නොවේ. එමෙන්ම පසුව මිනුම්කරණ දිනවලදී පැවරුමේ සීමා කිරීම්වල බලපෑම පිළිබිඹු වීමට පවතින යෙදවුමට වෙනම යෙදවුමක් හෝ ගැළපීමක් කිරීම අවශ්‍ය නොවේ.

**ඉල්ලුම් ලක්ෂණ සහිත මූල්‍ය වගකීම**

47. ඉල්ලුම් ලක්ෂණය සහිත මූල්‍ය වගකීමක (උදා: ඉල්ලුම්තැන්පතුවක්) සාධාරණ අගය ගෙවීමට අවශ්‍ය වියහැකි වටිනාකම ප්‍රථම දිනයේ සිට වට්ටම්කර ඉල්ලුම් කළවිට ගෙවියයුතු වටිනාකමට වඩා අඩු නොවිය යුතුය.

**වෙළඳපොළ අවදානම හෝ ප්‍රතිපාර්ශ්ව අවදානම හිලව්වීම තත්ත්වය සහිත මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම්වලට ව්‍යවහාරකරණය**

48. මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් සමූහයක් දරන අස්තිත්වයක් වෙළඳපොළ අවදානම්වලට (SLFRS 7 හි නිර්වචනයකර ඇති පරිදි) සහ සෑම ප්‍රතිපාර්ශ්වයකම ණය අවදානම (SLFRS 7 හි නිර්වචනය කර ඇති පරිදි) අනාවෘත වේ. එම මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් සමූහය එක්කෝ වෙළඳපොළ අවදානම් හෝ ණය අවදානම යන ශුද්ධ අනාවෘත වීමේ පදනම මත අස්තිත්වය කළමනාකරණය කරයි නම් සාධාරණ අගය මැනීම සඳහා මෙම SLFRS යට ව්‍යතිරේඛයක් ඉල්ලුම් කිරීමට අස්තිත්වයකට අවසර තිබේ. ප්‍රවර්තන වෙළඳපොළ තත්ත්වයන් යටතේ මැනුම් කරන දින වෙළඳපොළ සහභාගිවන්නන් අතර සමාන ගනුදෙනුවකදී විශේෂ අනාවෘතවීම සඳහා ශුද්ධ කෙටි තත්ත්වය (එනම් වත්කමක්) පැවරීමට හෝ විශේෂ අනාවෘතවීමේ සඳහා ශුද්ධ දිගු තත්ත්වය (එනම් විකිණීමක්) විකිණීමට ලැබිය යුතු වූ මිල පදනම මත මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් සමූහයක සාධාරණ අගය මැනීමට අස්තිත්වයකට එම ව්‍යතිරේඛයෙන් අවසර දේ.

ඒ අනුව මිනුම් කරන දිනදී ශුද්ධ අවදානම් අනාවෘතවීමේ වෙළඳපොළ සහභාගිවන්නන් කෙසේ මිල කරන්නේද යන්න සමග අස්තිත්වයක් විසින් මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් සමූහයක සාධාරණ අගය මැනිය යුතුය.

49. අස්තිත්වයකට 48 වන ඡේදයේ ඇති ව්‍යතිරේක භාවිත කිරීමට අවසර ඇත්තේ අස්තිත්වය පහත දක්වෙන සියලුම දෑ ඉටුකරන්නේ නම් පමණි.

(අ) මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් සමූහයක් අස්තිත්වයේ ශුද්ධ විවෘත කරපෑම පදනම මත විශේෂ වෙළඳපොළ අවදානම (හෝ අවදානම්) හෝ විශේෂ ප්‍රතිපාර්ශ්ව ණය අවදානම අස්තිත්වයේ ලේඛණගත අවදානම් කළමනාකරණය හෝ ආයෝජන ක්‍රමෝපාය ප්‍රකාරව කළමනාකරණය කිරීම.

(ආ) LKAS 24 *සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම්*, හි නිර්වචනය කර ඇති පරිදි, එම පදනම මත මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් සමූහයක් පිළිබඳව අස්තිත්වයේ ප්‍රධාන කළමනාකරණ පිරිස් වෙත තොරතුරු සැපයීම සහ,

(ඇ) සෑම වාර්තාකරණ කාලපරිච්ඡේදයක් අවසානයේදී මූල්‍ය තත්ත්වය දක්වෙන ප්‍රකාශනයේ එම මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් සාධාරණ අගයට මැනීමට අවශ්‍ය වීම හෝ තෝරාගැනීම.

50. 48 වන ඡේදයේ ව්‍යතිරේඛය මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට අදාළ වන්නේ නැත. සමහර අවස්ථාවලදී මූල්‍ය තත්ත්වය දක්වෙන ප්‍රකාශනයේ මූල්‍ය සාධන පත්‍ර ඉදිරිපත් කිරීමේ පදනම මූල්‍ය සාධන පත්‍ර මැනීමේ පදනමට වෙනස් වේ. උදාහරණ වශයෙන් SLFRS මගින් මූල්‍ය සාධන පත්‍ර ශුද්ධ පදනම මත ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවන්නේ නම් හෝ අවසර නොදෙන්නේ නම්, එවන් අවස්ථාවලදී කළඹේ ගැළපුම් මට්ටමේදී (53 - 56 ඡේද බලන්න). තනි වත්කමකට හෝ තනි වගකීමකට වෙන්කිරීමට සිදුවේ. එසේ ශුද්ධ අවදානම් විවෘත කර පෑම පදනම මත මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් කළමනාකරණය කිරීම සැදේ. එවැනි වෙන් කිරීමක් සාධාරණ සහ තත්ත්වය අනුව උචිත වන ක්‍රමවේදයක් සංගත පදනමින් භාවිත කර අස්තිත්වයක් විසින් ඉටුකළ යුතුය.

51. 48 වන ඡේදයේ ව්‍යාතිරේඛය භාවිතා කිරීමට LKAS 8 *ගිණුම්කරණ ප්‍රතිපත්තීන්, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි ප්‍රකාරව අස්තිත්වය ගිණුම්කරණ ප්‍රතිපත්ති තීරණයක් ගතයුතුය.* එම ව්‍යතිරේඛය භාවිතකරන අස්තිත්වයක්, ලංසු අර්පණ ගැළපුම් (53 - 55 ඡේද බලන්න) සහ ණය ගැළපුම් (56 ඡේදය බලන්න) අදාළවන්නේ නම් විශේෂ කළඹකට කාලපරිච්ඡේදයෙන් කාලපරිච්ඡේදයට සංගතව අස්තිත්වය එම ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුගමනය කළ යුතුය.

52. 48 වන ඡේදයේ ව්‍යතිරේඛය අදාළ වන්නේ LKAS 39 *මූල්‍ය සාධන පත්‍ර හඳුනා ගැනීම සහ මැනීම* හෝ SLFRS 9 *මූල්‍ය සාධන පත්‍ර* විෂය පථය තුළ වන මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් සඳහා පමණි.

**වෙළඳපොළ අවදානම් වලට අනාවෘත වීම**

53. විශේෂ වෙළඳපොළ අවදානමකට (හෝ අවදානම්) අස්තිත්වය ශුද්ධ අනාවෘත වීම පදනම මත කළමනාකරණය කරනු ලබන මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් සමූහයක සාධාරණ අගය මැනීමට 48 වන ඡේදයේ ව්‍යතිරේඛය භාවිත කරනවිට අස්තිත්වය විසින් එම වෙළඳපොළ අවදානම්වලට අස්තිත්වයේ ශුද්ධ අනාවෘත වීමේ තත්ත්වයන් තුළ වඩාත්ම නියෝජනය වන සාධාරණ අගයේ ලංසු අර්පණ විහිදුම තුළ වන මිළ ව්‍යවහාර කළ යුතුය. (70 සහ 71 ඡේදයන් බලන්න)

54. 48 වන ඡේදයේ ව්‍යතිරේඛය භාවිතාකරන විට එම මූල්‍ය වත්කම් සහ මූල්‍යවගකීම් සමූහය තුළ අස්තිත්වයේ අනාවෘත වන වෙළඳපොළ අවදානම (හෝ අවදානම්) බොහෝදුරට එකහා සමාන බවට අස්තිත්වය සහතික වියයුතුය. උදාහරණ වශයෙන් මූල්‍ය වත්කමක් සමග ආශ්‍රිත පොලී අනුපාතික අවදානම සමග මූල්‍ය වගකීමක් සමග ආශ්‍රිතවන වෙළඳද්‍රව්‍ය මිල අවදානම සංයෝජනය කරනු නොලැබේ. එයට හේතුවන්නේ එසේ කිරීමෙන් අස්තිත්වයේ පොලී අනුපාතික අවදානම හෝ වෙළඳ ද්‍රව්‍ය මිල අවදානමේ අනාවෘතය සැහැල්ලු නොවන නිසාය. 48 වන ඡේදයේ ව්‍යතිරේඛය භාවිත කරනවිට, සර්වසම නොවූ වෙළඳපොළ අවදානම් වල ප්‍රතිඵලයක් මගින් වන යම් මූලික අවදානමක්, සමූහය තුළවන මූල්‍ය වත්කම් වල හෝ මූල්‍ය වගකීම් වල සාධාරණ අගය මැනීමේදී සැලකිල්ලට ගතයුතුය.

55. ඒ හා සමානව මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් වලින් ඇතිවන විශේෂ වෙළඳපොළ අවදානමකට (හෝ අවදානම්) වල අස්තිත්වයේ අනාවෘත වීමේ කාලසීමාව බොහෝදුරට එක සමාන වේ. උදාහරණ වශයෙන් මාස 12ක පොලී අනුපාතික අවදානම් අනාවෘතය ශුද්ධ පදනම මතද ඉතිරි පොලී අනුපාතික අවදානමේ අනාවෘතය (උදා: වසර 2 - 5 දක්වා) දළ පදනම මත මනින ලද මූල්‍ය වගකීම්වල සාධාරන අගය සහ සමූහය ඇතුළත එම මූල්‍ය වත්කම් වලින් සහ වගකීම්වලින් පමණක් සමන්විත වසර 5ක මූල්‍ය සාධන පත්‍ර මත මාස 12ක් වටිනා පොලී අනුපාතික අවදානම ආශ්‍රිත මුදල් ප්‍රවාහවලට එරෙහිව මාස 12ක අනාගත ගිවිසුමක් භාවිත කරන අස්තිත්වයන්.

56. විශේෂ ප්‍රතිපාර්ශ්වයක් සමග ඇතුල්වූ මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් සමූහයක සාධාරණ අගය මැනීමට 48 වන ඡේදයේ ව්‍යතිරේඛය භාවිත කරනවිට එම ප්‍රතිපාර්ශ්වයේ ණය අවදානම වෙත හෝ පැහැරහැරීමක් සිදුවූවහොත් (උදා: ප්‍රතිපාර්ශ්වය සමග ප්‍රධාන හිලව් කිරීම්ගිවිසුමක් හෝ අනෙක් පාර්ශ්වයේ ණය අවදානමට එක් එක්පාර්ශ්වයේ ශුද්ධ අනාවෘතය ණය අවදානම පදනම මත අතිරේඛ ඇප හුවමාරු කරගැනීම අවශ්‍ය කරන ගිවිසුමක්) ණය අවදානම අනාවෘත කිරීම සැහැල්ලු කිරීමට වෙළඳපොළ සහභාගිවන්නන් විසින් පවත්නා එකඟවීම් සැලකිල්ලට ගන්නාවිට සාධාරණ අගය මැනීමේදී අස්තිත්වයේ ණය අවදානමට ප්‍රතිපාර්ශ්වයේ ශුද්ධ අනාවෘතය වෙත අස්තිත්වය විසින් අස්තිත්වයේ ශුද්ධ අනාවෘතයේ බලපෑම ඇතුළත්කළ යුතුය. පැහැර හැරීමක් සිදුවූවහොත් එවන් එකඟවීමක් නෛතිකව බලාත්මක කිරීමේ හැකියාව පිළිබඳව සහභාගි වන්නන්ගේ අපේක්ෂාවන් සාධාරණ අගය මැනීම මගින් පිළිබිඹු විය යුතුය.

#### මුල් හඳුනාගැනීමේදී සාධාරණ වටිනාකම

57. එම වත්කම හෝ වගකීම් සඳහා හුවමාරු ගනුදෙනුවන් තුළ වත්කම අත්කර ගත්විට හෝ වගකීම ආරෝපණය කරගත් විට ගණුදෙනු පිරිවැය වනුයේ වත්කම අත්කර ගැනීමට ගෙවූ හෝ වගකීම (ඇතුළුවීමේ මිළ) ආරෝපණය කරගැනීමට ලැබූ මුදලයි. මෙයට විසංසන්දනයක් වශයෙන් වත්කමක හෝ වගකීමක සාධාරණ අගය වනුයේ වත්කම විකිණීමකදී ලැබියයුතු සහ වගකීමක් (ඉවත් වීමේ මිල) පැවරීමට ගෙවන මිළයි. අස්තිත්වයන් ඒවා අත්කරගැනීමට ගෙවූ මිලට වත්කම් විකිණීම අවශ්‍යයෙන්ම සිදුනොවේ. එමෙන්ම වගකීමක් ආරෝපණය කරගැනීමට ලැබුණ මිලට අවශ්‍යයෙන්ම අස්තිත්වයන් ඒවා පැවරුම් නොකරයි.

58. බොහෝ අවස්ථාවලදී ගනුදෙනුවක මිල සාධාරණ අගයට සමාන වනු ඇත. (එය එවැනි අවස්ථාවක් වියහැක්කේ වත්කම විකුණනු ලබන වෙළඳපොළේ ගනුදෙනුව සිදුවන දින මිලදී ගැනීම සඳහා වන ගනුදෙනුවද සිදුවීම නිසාය.)

59. මුල් හඳුනාගැනීමේදී සාධාරණ අගය ගනුදෙනුවක මිලට සමාන වන්නේද යන්න නිර්ණය කිරීමේදී අස්තිත්වය ගනුදෙනුවට හා වත්කමට හෝ වගකීමට විශේෂිත වූ සාධක සලකා බැලිය යුතුය. මුල් හඳුනාගැනීමේදී වත්කමේ හෝ වගකීමේ සාධාරණ අගය ගනුදෙනුවක මිල නියෝජනය නොවිය හැකි අවස්ථාවන් ආ4 ඡේදය විස්තර කරයි.

60. වත්කමක් හෝ වගකීමක් මූලිකව සාධාරණ අගයට මැනීමට අස්තිත්වයකට වෙනත් SLFRS මගින් අවශ්‍ය කෙරෙන්නේ නම් හෝ අවසර දෙන්නේ නම් සහ ගනුදෙනුවන මිල සාධාරණ අගයෙන් වෙනස් වන්නේ නම් එහි ප්‍රතිඵලයක් වන ප්‍රතිලාභය හෝ පාඩුව එම SLFRS අන් අයුරකින් පැහැදිලිව සඳහන් කරන්නේ නම් හැර ලාභයේ හෝ පාඩුවේ හඳුනාගත යුතුය.

#### තක්සේරු කිරීමේ ශිල්පක්‍රම

**61. අදාළ නිරීක්ෂණය කළහැකි යෙදවුම් භාවිතය උපරිම කරමින් සහ නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් භාවිතය අවම කරමින් සාධාරණ අගය මැනීමට ඇති ප්‍රමාණවත් දත්ත භාවිත කරමින් අස්තිත්වයක් තත්ත්වයන් අනුව උචිත වන තක්සේරු කිරීමේ ශිල්පක්‍රමයක් භාවිත කළයුතුය.**

62. තක්සේරු කිරීමේ ශිල්ප ක්‍රමයක් භාවිත කිරීමේ පරමාර්ථය වනුයේ ප්‍රවර්තන වෙළඳපොළ තත්ත්වයන් යටතේ මිණුම්කරණ දිනදී වෙළඳපොළ සහභාගිවන්නන් අතර සිදුවිය හැකි විධිමත් ගනුදෙනුවකදී වත්කමක් විකිණීමකට හෝ වගකීමක් පැවරීමට වියයුතු මිල ඇස්තමේන්තු කිරීමය. පුළුල් ලෙස භාවිත වන තක්සේරු කිරීමේ ශිල්පක්‍රම වනුයේ වෙළඳපොළ ප්‍රවේශය, පිරිවැය ප්‍රවේශය සහ ආදායම් ප්‍රවේශයයි. එම ප්‍රවේශයන්හි ප්‍රධාන පැතිකඩවල් ආ5 - ආ11 ඡේදවල සාරාංශගත කෙරේ. සාධාරණ අගය මැනීමට අස්තිත්වයක් විසින් එම ප්‍රවේශයන්ගෙන් එකක් හෝ වැඩි ගණනක සංගත තක්සේරු කිරීමේ ශිල්පක්‍රම භාවිත කළ යුතුය.

63. සමහර අවස්ථාවලදී තනි තක්සේරු ක්‍රමයක් උචිතවිය හැකිය. (උදා: සර්ව සම වත්කම් හෝ වගකීම් සඳහා සක්‍රිය වෙළඳපොළක ප්‍රකාශිත මිල ගණන් භාවිත කරමින් වත්කමක් හෝ වගකීමක් තක්සේරු කරනවිටදී) අනෙක් අවස්ථාවලදී බහු අංශික තක්සේරු කිරීමේ ශිල්පක්‍රම උචිත විය හැකිය. (එය අවස්ථාවක් විය හැක්කේ මුදල් උත්පාදන ඒකකයන් තක්සේරු කිරීමේදීය. සාධාරණ අගය මැනීමට බහු ආංශික තක්සේරු කිරීමේ ශිල්ප ක්‍රමයක් භාවිත කරන්නේ නම් ප්‍රතිඵලය (සාධාරණ අගයේ අදාළ ඇඟවීම්) එම ප්‍රතිඵලවලින් ඉඟිකෙරෙන වටිනාකම් පරාසවල සාධාරණ තත්ත්වය සැලකිල්ලට ගැනීමෙන් අගය කළ යුතුය. සාධාරණ අගය මැනීම වන්නේ තත්ත්වයන් යටතේ එම පරාසය ඇතුළෙහි සාධාරණ අගය වඩාත්ම නියෝජනය වන ලක්ෂ්‍යයයි.

64. මුල් හඳුනාගැනීමේදී ගණුදෙනුවූ මිල සාධාරණ අගය වේනම් සහ නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් භාවිත කරන තක්සේරු කිරීමේ ශිල්ප ක්‍රමය පසුව එන කාලපරිච්ඡේද වලදී සාධාරණ අගය මැනීමට යොදාගන්නේ නම් තක්සේරු ශිල්ප ක්‍රමය ක්‍රමාංකනය කලයුතු අතර, ඒ අනුව මූලික හඳුනාගැනීමේදී වන තක්සේරු ශිල්ප ක්‍රමයේ ප්‍රතිඵලය ගනුදෙනුවන මිලට සමාන වේ. තක්සේරු ශිල්ප ක්‍රමය ප්‍රවර්තන වෙළඳපොළේ තත්ත්වයන් පිළිබිඹු කරන්නේද යන්න ක්‍රමාංකනය තහවුරු කරන අතර තක්සේරු ශිල්පක්‍රමයට ගැලපුමක් කිරීම අවශ්‍ය වන්නේද යන්න අස්තිත්වය නිර්ණය කිරීමට එය උපකාරී වේ. (උදා: තක්සේරු ශිල්ප ක්‍රමය අසු නොකරගත් වත්කම් හා වගකීම්වල ගති ලක්ෂණයක් තිබිය හැකිය.) මුල් හඳුනාගැනීමෙන් පසුව නිරීක්ෂණය නොකළ යෙදවුම් භාවිත තක්සේරු ශිල්ප ක්‍රමයක් හෝ ක්‍රම භාවිත කරමින් සාධාරණ අගය මනින විට එම තක්සේරු ක්‍රම මිනුම්කරණ දින නිරීක්ෂණය කළහැකි වෙළඳපොළ දත්ත (උදා: ඒ හා සමාන වත්කමක හෝ වගකීමක මිල) පිළිබිඹු වන බව අස්තිත්වය විසින් සහතික විය යුතුය.

65. සාධාරණ අගය මැනීමට භාවිත කරන තක්සේරු කිරීමේ ශිල්පක්‍රම සංගතව ව්‍යවහාර කළ යුතුය. කෙසේ වෙතත් තක්සේරු ශිල්ප ක්‍රමය හෝ එහි ව්‍යවහාර කිරීම වෙනස් කිරීම (බහු ආංශික තක්සේරු ශිල්ප ක්‍රම භාවිත කරනවිට එහි බරතැබීම වෙනස්කිරීම හෝ තක්සේරු ශිල්ප ක්‍රමයට ව්‍යවහාර කරන ගැලපුම වෙනස් කිරීම) තත්ත්වයන් තුළ එම වෙනස් කිරීම එනම් සාධාරණ අගයේ සමානලෙස හෝ වඩාත් නියෝජනය වන ලෙස ප්‍රතිඵලයක් වන්නේ නම් උචිත වේ. එවැනි අවස්ථාවක් වන්නේ උදාහරණ වශයෙන් පහත සඳහන් සිද්ධීන්ගේ ඕනෑම එකක් සිදුවන්නේ නම්ය.

(අ) නව වෙළඳපොළවල් සංවර්ධනය ;

(ආ) නව තොරතුරු ලබාගත හැකිවීම ;

(ඇ) කලින් භාවිත කළ තොරතුරු තවදුරටත් ලබාගත නොහැකි වීම ;

(ඈ) තක්සේරු කිරීමේ ශිල්ප ක්‍රමය වැඩි දියුණු වීම ; හෝ

(ඉ) වෙළඳපොළ තත්ත්වයන් වෙනස්වීම.

66. තක්සේරු ශිල්පක්‍රමයේ හෝ එහි ව්‍යවහාර කරණයේ වෙනසක් මගින් ප්‍රතිඵලයක් වන සංශෝධනයන් LKAS 8 ප්‍රකාරව ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීමක් ලෙස ගිණුම්ගත කළ යුතුය. කෙසේ වෙතත් තක්සේරු ශිල්ප ක්‍රමයේ හෝ එහි ව්‍යවහාරකරණයේ වෙනසක් මගින් ප්‍රතිඵලයක් වන සංශෝධනය LKAS 8 ප්‍රකාරව ගිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනස්වීම හි හෙළිදරව් කිරීම අවශ්‍ය නොවේ.

**තක්සේරු කිරීමේ ශිල්ප ක්‍රමවලට යෙදවුම්**

**පොදු මූලධර්මයන්**

**67. සාධාරණ අගය මැනීමට භාවිත කළ තක්සේරු කිරීමේ ශිල්පක්‍රමයන් අදාළ නිරීක්ෂණය කළහැකි යෙදවුම් භාවිතය උපරිම කළයුතු අතර, නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් භාවිතය අවම කළ යුතුය.**

68. සමහර වත්කම් සහ වගකීම් (උදා: මූල්‍ය සාධන පත්‍ර) සඳහා යෙදවුම් නිරීක්ෂණය කළ වියහැකි වෙළඳපොළවල් වල උදාහරණ වලට ඇතුළත් වන්නේ, විනිමය වෙළඳපොළවල්, ගනුදෙනුකරන්නන්ගේ වෙළඳපොළවල්, තැරැව්කරන වෙළඳපොළවල් සහ ප්‍රධානියාගෙන් ප්‍රධානියා වෙත වන වෙළඳපොළවල්ය (ආ 34 ඡේදය බලන්න).

69. වෙළඳපොළ සහභාගිවන්නන් සැලකිල්ලට ගන්නා වත්කම් සහ වගකීම් සඳහාවන ගනුදෙනුවකදී වත්කමේ හෝ වගකීමේ ගතිලක්ෂණයන් සමග සංගත වන යෙදවුම් අස්තිත්වයක් විසින් තෝරාගත යුතුය. (11 සහ 12 වන ඡේදයන් බලන්න.) සමහර අවස්ථාවලදී එම ගතිලක්ෂණයන් අධිමිල හෝ වට්ටම වැනි ගැලපුමක් ව්‍යවහාර කිරීම ප්‍රතිඵලයක් වේ. (උදා: පාලනය වන අධිමිල හෝ පාලනය නොවන හිමිකම් වට්ටම). කෙසේ වෙතත් සාධාරණ අගය මැනීමකදී සාධාරණ අගය මැනීම (13 හා 14 වන ඡේද බලන්න) අවශ්‍ය කරන හෝ අවසර දෙන SLFRS හි තුළවන ගිණුම්, ගිණුම් ඒකකය සමග සංගත නොවන අධිමිලක් හෝ වට්ටමක් සංයුක්ත නොකළ යුතුය. වත්කමේ හෝ වගකීමේ ගතිලක්ෂණයකට වඩා (පාලනය කිරීමේ හිමිකමේ සාධාරණ වටිනාකම මැනීමේ පාලන අධිමිල) අස්තිත්වය සතු දේ පිළිබඳව ප්‍රමාණය ගතිලක්ෂණයක් ලෙස පිළිබිඹු කෙරේ. අධිමිල හෝ වට්ටම් වලට සාධාරන වටිනාකම් මැණීමකදී ඉඩ දෙනු නොලැබේ.

සියළු අවස්ථාවලදී වත්කම සහ වගකීම සඳහා ක්‍රියාකාරී වෙළඳපොළේ මිල කියුම් ලත් මිලක් තිබේනම් (උදා: *1වන මට්ටමේ යෙදවුම*) 79 වන ඡේදයේ පැහැදිලිව සඳහන් කර ඇති පරිදි හැර සාධාරණ අගය මැනීමේදී අස්තිත්වය ගැලපුම් නොකර එම මිල භාවිත කළ යුතුය.

**ලංසු සහ අර්පණ මිල පදනම් මත යෙදවුම්**

70. සාධාරණ අගයට මනින ලද වත්කමකට හෝ වගකීමට ලංසු මිලක් සහ අර්පණ මිලක් තිබේනම්, (උදා: ගනුදෙනුකරන්නන්ගේ වෙළඳපළෙන් ලැබෙන යෙදවුමක්) ලංසු අර්පණ විහිදුම ඇතුළත මිළ, එනම් තත්ත්වයන් තුළ සාධාරණ අගයේ වඩාත් නියෝජනය වන මිල, සාධාරණ අගය අනුපිළිවෙළේ යෙදවුමේ කුමන ස්ථානයේ (උදා: 1, 2 හෝ 3 වන මට්ටම 72 - 90 ඡේද බලන්න) වර්ගීකරණය කර ඇද්ද ගැන නොසලකා සාධාරණ අගය මැනීමට භාවිත කළ යුතුය. වත්කම් ස්ථානයන් සඳහා ලංසු මිල ගණන්ද, වගකීම් ස්ථානයක් සඳහා අර්පණ මිල ගණන්ද භාවිතය සඳහා අවසර ඇති නමුත් එය අවශ්‍යම නොකෙරේ.

71. ලංසු අර්පණ විහිදුම ඇතුළත සාධාරණ අගය මැනීම සඳහා ප්‍රායෝගික සුදුසු ලෙස වෙළඳපොළ සහභාගිවන්නන් භාවිත කරන වෙළඳපොළ මධ්‍ය මිල කිරීම හෝ වෙනත් මිල කිරීම් චාරිත්‍රයක් භාවිත කිරීම මෙම SLFRS මගින් වළක්වාලනු නොලබයි.

**සාධාරණ අගය අනුපිළිවෙළ**

72. සාධාරණ වටිනාකම් මැනීමේදී සංගතතාවය හා සැසඳුම් කිරීමේ හැකියාව සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම් වැඩිකිරීම සඳහා භාවිත කරන යෙදවුම් (76-90 ඡේද) මට්ටම් තුනකට වර්ගීකරණය කෙරෙන සාධාරණ වටිනාකම් අනුපිළිවෙළක් මෙම SLFRS පිහිටුවා ඇත.

සාධාරණ අගය අනු පිළිවෙළ ක්‍රියාකාරී වෙළඳපොළක සර්වසම වත්කම් සහ වගකීම් (1 වන මට්ටමේ යෙදවුම්) සඳහා ප්‍රකාශිත මිල ගණන් වලට (ගැලපුම් නොකළ) ඉහළම ප්‍රමුඛත්වය දෙන අතර, අඩුම ප්‍රමුඛත්වය දෙනුයේ නිරීක්ෂණය නොකළ යෙදවුම් වලටය. (*3 වන මට්ටමේ යෙදවුම්*)

73. සමහර අවස්ථාවලදී වත්කමක හෝ වගකීමක සාධාරණ අගය මැනීමට භාවිත කරන යෙදවුම් සාධාරණ අගය අනුපිළිවෙළේ වෙනස් මට්ටම් ඇතුළත වර්ගීකරණය කිරීමට සිදුවිය හැකිය. එවැනි අවස්ථාවලදී සාධාරණ අගය මැනීම සම්පූර්ණ මැනීමට වැදගත් වන අඩුම මට්ටමේ යෙදවුමක් ලෙස සාධාරණ අගය අනුපිළිවෙළේ එම මට්ටමේ එය සම්පූර්ණයෙන්ම වර්ගීකරණය කෙරේ. වත්කමකට හෝ වගකීමකට විශේෂිත වූ සාධක සැලකිල්ලට ගෙන සමස්ථ මැනීමට විශේෂ යෙදවුමක වැදගත්කම කිරීමට විනිශ්චය අවශ්‍ය වේ. විකිණීමට වන පිරිවැය අඩුකළ සාධාරණ අගය මැනීමේදී විකිණීමට වන පිරිවැය වැනි සාධාරණ අගය මැනීමේ පදනමට එළඹීමට කළයුතු ගැලපුම්, සාධාරණ අගය මැනීම වර්ගීකරණය ඇතුළත වූ සාධාරණ අගය අනුපිළිවෙළ මට්ටම නිර්ණය කිරීමේදී සැලකිල්ලට නොගත යුතුය.

74. අදාළ යෙදවුම් ලබාගත හැකිභාවය සහ ඒවායේ සාපේක්ෂ විෂයානුබද්ධභාවය උචිත තක්සේරු ශිල්ප ක්‍රමයක් තෝරා ගැනීමේදී බලපෑ හැකිය. (61 ඡේදය බලන්න). කෙසේ වෙතත් සාධාරණ අගය අනුපිළිවෙළ ප්‍රමුඛතාවය දෙනු ලබන්නේ තක්සේරු ශිල්ප ක්‍රමයේ යෙදවුම්වලට මිස සාධාරණ අගය මැනීම සඳහා භාවිතකරන තක්සේරු කිරීමේ ශිල්ප ක්‍රමයට නොවේ. උදාහරණ ලෙස සමස්ත මැනීම සඳහා වැදගත්වන යෙදවුම් සහ එම යෙදවුම් වර්ගීකරණය සාධාරණ අගය අනුපිළිවෙළ මට්ටම් ඇතුළත රඳා පැවැත්ම අනුව වර්තමාන අගය ශිල්පක්‍රමය භාවිත කරමින් සංවර්ධනය කළ, සාධාරණ අගය මැනීමේ ශිල්පක්‍රමයක් 2 වන මට්ටමේ හෝ 3 වන මට්ටමේ ඇතුළත වර්ගීකරණයකළ හැකිය.

75. නිරීක්ෂණය කළහැකි යෙදවුමකට නිරීක්ෂණය කළ නොහැකි යෙදවුමක් භාවිත කර ගැලපුමක් අවශ්‍ය කරන්නේ නම්, එම ගැළපුම සැලකිය යුතු අන්දමින් ඉහළ හෝ පහළ සාධාරණ අගය මැනීම ප්‍රතිඵලයක් වන්නේ නම් ප්‍රතිඵලයක් වන මැනීම සාධාරණ අගය අනුපිළිවෙළේ 3 වන මට්ටම ඇතුළත වර්ගීකරණය කළ හැකිය. උදාහරණයක් ලෙස වෙළඳපොළ සහභාගීවන්නෙක් වත්කමක මිල ඇස්තමේන්තු කිරීමේදී වත්කම විකිණීම සඳහා ඇති සීමාකිරීමක බලපෑම් සැලකිල්ලට ගන්නේ නම්, අස්තිත්වය එම සීමාකිරීමේ බලපෑම පිළිබිඹු වීමට ප්‍රකාශිත මිල ගලපනු ලැබිය හැකිය. එම ප්‍රකාශිත මිල *2 වන මට්ටමේ යෙදවුමක්* සහ ගැලපුම නිරීක්ෂණය කළ නොහැකි යෙදවුමක් වන අතර, එය සමස්ථ මැනීමට සැලකිය යුතුතරම් නම් මැනීම 3 වන මට්ටමේ මැනීමක් ලෙස සාධාරණ අගය අනුපිළිවෙළේ වර්ගීකරණය කළයුතු වේ.

**1 වන මට්ටමේ යෙදවුම්**

76. 1 වන මට්ටමේ යෙදවුම් වනුයේ මිනුම් කරන දින අස්තිත්වයට ප්‍රවේශ වියහැකි ක්‍රියාකාරී වෙළඳපොළවල සර්වසම වත්කමේ හෝ වගකීම් වල මිල ප්‍රකාශිත මිල ගණන්ය (ගැළපුම් නොකළ).

77. ක්‍රියාකාරී වෙළඳපොළක ප්‍රකාශිත මිල සාධාරණ අගය පිළිබඳව වඩාත්ම විශ්වාසදායී සාක්ෂි සපයන අතර 79 වන ඡේදයේ පැහැදිලි කර ඇති පරිදි හැර ලබාගත හැකි ඕනෑම වේලාවක සාධාරණ අගය මැනීම සඳහා ගැලපීම් නොකර භාවිතා කළ යුතුය.

78. බොහෝ මූල්‍ය වත්කම් සහ බොහෝ මූල්‍ය වගකීම් සඳහා 1වන මට්ටමේ යෙදවුම් ලබාගත හැකි අතර ඒවායින් සමහරක් බහු ආංශික ක්‍රියාකාරකම් ඇති වෙළඳපොළවල් වල (වෙනස් හුවමාරුවන්හිදී) හුවමාරු විය හැකිය.

එබැවින් 1වන මට්ටම ඇතුළත අවධාරණය වන්නේ පහත සඳහන් දෙකම නිර්ණය කිරීම සඳහාය.

(අ) වත්කම හෝ වගකීම් සඳහා ප්‍රධාන වෙළඳපොළ හෝ, ප්‍රධාන වෙළඳපොළ නොමැතිවිට වත්කම් සහ වගකීම් සඳහා වඩාත් වාසි සහගත වෙළඳපොළ, සහ

(ආ) වත්කම හෝ වගකීම සඳහා මැනීම කරන දින එම වෙළඳපොළේ එම මිලට අස්තිත්වයක වත්කම හෝ වගකීම සඳහා ගනුදෙනුවකට ඇතුළත් වියහැකිද.

79. පහත සඳහන් තත්ත්වයන්හිදී හැර අස්තිත්වයක් 1වන මට්ටමේ යෙදවුමකට ගැලපිල්ලක් නොකළ යුතුය.

(අ) ඒවා සාධාරණ අගයට මනින සහ ක්‍රියාකාරී වෙළඳපොළක ප්‍රකාශිත මිලක් තිබෙන එහෙත් එම එක් එක් වත්කමට හෝ වගකීමට තනි තනිව (පෙරකී ලෙස අස්තිත්වය දරන විශාල සංඛ්‍යාවක එකහා සමාන වත්කම් හෝ වගකීම් සඳහා මිනුම් කරන දින එක් එක් තනි වත්කම හෝ වගකීම සඳහා මිළ කිරීමේ තොරතුරු ලබාගැනීම අපහසු වනු ඇත) කරදරයක් නොමැතිව ළගාවිය නොහැකි එක හා සමාන (එහෙත් සර්ව සම නොවන) විශාල සංඛ්‍යාවක වත්කම් හෝ වගකීම් (උදාඃ ණය සුරැකුම්) අස්තිත්වයක් දරනවිට, එම අවස්ථාවේදී ප්‍රායෝගික ලෙස සුදුසු වශයෙන් සලකා අස්තිත්වයක් ප්‍රකාශිත මිල ගණන් (උදාඃ න්‍යාස මිල කිරීම්) කෙරෙහි විශ්වාසය නොතබා විකල්ප මිල කිරීමේ ක්‍රමයක් භාවිත කර සාධාරණ අගය මනී. කෙසේ වෙතත් විකල්ප මිල කිරීමේ ක්‍රමයක් භාවිත කිරීමේ ප්‍රතිඵලයක් ලෙස සාධාරණ අගයේ අනුපිළිවෙළේ පහත මට්ටම ඇතුළත සාධාරණ අගය මැනීම වර්ගීකරණය කිරීම සිදුවේ.

(ආ) සක්‍රිය වෙළඳපොළක වන ප්‍රකාශිත මිල මිනුම්කරණ දින සාධාරණ අගය නියෝජනය නොකරන විට, එවැනි අවස්ථාවක් වියහැක්කේ උදාහරණ වශයෙන් සැලකිය යුතු අන්දමේ සිද්ධීන් (ප්‍රධානියාගෙන් ප්‍රධානියාට වන ගනුදෙනු, තැරැව්කරන වෙළඳපොළක වන වෙළඳාම්, හෝ නිවේදනයන්) වෙළඳපොළ වැසූ පසු එහෙත් මනින දිනට පෙර සිදුවන, සාධාරණ අගය මැනීමට බලපෑ හැකි එවැනි සිද්ධීන් හඳුනාගැනීමට අස්තිත්වයන් ප්‍රතිපත්තියක් ස්ථාපනය කර එය සංගතව ව්‍යවහාර කළ යුතුය. කෙසේ වෙතත් නව තොරතුරු සඳහා ප්‍රකාශිත මිල ගැළපුම් කරන්නේ නම් ගැළපුමේ ප්‍රතිඵලයක් වන්නේ සාධාරණ අගය අනු පිළිවෙළ පහත මට්ටම ඇතුළත සාධාරණ අගය මැනීම වර්ගීකරණය කිරීමයි.

(ඇ) සක්‍රිය වෙළඳපොළක වත්කමක් ලෙස වෙළඳාම් වන සර්ව සම අයිතමයක් සඳහා සහ වත්කමට හෝ අයිතමයට විශේෂිත වූ සාධකයක් සඳහා එමමිල ගැලපීම් කිරීමට අවශ්‍ය වනවිට වගකීමක හෝ අස්තිත්වයේ ස්වකීය ස්කන්ධ සාධන පත්‍ර මැනීමේදී ප්‍රකාශිත මිලක් භාවිත කිරීමේදී (39 වන ඡේදය බලන්න). වත්කමේ ප්‍රකාශිත මිලට ගැළපුම් කිරීම අවශ්‍ය නොවන්නේ ප්‍රතිඵලය වන්නේ සාධාරණ අගය අනුපිළිවෙළේ 1 වන මට්ටම ඇතුළත සාධාරණ අගය මැනීම වර්ගීකරණය කිරීමයි. කෙසේ වෙතත් වත්කමේ ප්‍රකාශිත මිලට යම් ගැළපුමක් ප්‍රතිඵලය වන්නේ සාධාරණ අගය අනුපිළිවෙළේ පහත මට්ටම ඇතුළත සාධාරණ අගය මැනීම වර්ගීකරණය කිරීමයි.

80. අස්තිත්වය තනි වත්කමක හෝ වගකීමක තත්ත්වයක් දරන්නේ නම් (මූල්‍ය සාධන පත්‍ර දැරීම වැනි විශාල සංඛ්‍යාවක සර්ව සම වත්කම් හෝ වගකීම් වලින් සමන්විත තත්ත්වයන් ඇතුළුව) වත්කම හෝ වගකීම සක්‍රිය වෙළඳපොළක වෙළඳාම් කෙරෙන වත්කමේ හෝ වගකීමේ සාධාරණ අගය අස්තිත්වයන් දරනු ලබන ප්‍රමාණය තනි වත්කමේ හෝ වගකීමේ ප්‍රකාශිත ගුණිතයක් ලෙස 1වන මට්ටම ඇතුළත මැනියයුතුය. මෙය අවස්ථාවක්වන්නේ දෛනික වෙළඳපොළේ වෙළඳාම් මත පරිමාව දරන ප්‍රමාණය අවශෝෂණය කර ගැනීමට ප්‍රමාණවත් නොවන්නේ වුවද තනි ගනුදෙනුවකින් තත්ත්වයක් විකිණීමට ඇණවුම් කිරීම ප්‍රකාශිත මිලට බලපෑම් ඇතිවිය හැකිය.

**2 වන මට්ටමේ යෙදවුම්**

81. 2වන මට්ටමේ යෙදවුම් වන්නේ වත්කමකට හෝ වගකීමකට සෘජුව හෝ වක්‍රව නිරීක්ෂණය කළහැකි 1වන මට්ටම ඇතුළත ඇතුළත් වන හැර අන් ප්‍රකාශිත මිල ගණන්ය.

82. වත්කමට හෝ වගකීමට පැහැදිලිව සඳහන් කළ (ගිවිසුම්ගත) කාලසීමාවක් තිබේනම් 2 වන මට්ටමේ යෙදවුමක් වත්කමේ හෝ වගකීමේ සම්පූර්ණ කාලසීමාවේ බොහෝදුරට නිරීක්ෂණය කළ යුතුය. 2වන මට්ටමේ යෙදවුම්වලට පහත දෑ අඩංගුය.

(අ) සක්‍රිය වෙළඳපොළවල්වල ඒ හා සමාන වත්කම් සහ වගකීම් සඳහා ප්‍රකාශිත මිල ගණන්.

(ආ) සක්‍රිය නොවන වෙළඳපොළවල සර්වසම හෝ ඒ හා සමාන වත්කම් සහ වගකීම් සඳහා ප්‍රකාශිත මිල ගණන්.

(ඇ) වත්කම හෝ වගකීම සඳහා නිරීක්ෂණය කළහැකි ප්‍රකාශිත මිල ගණන් හැර යෙදවුම් උදාහරණ වශයෙන්,

(i) පොදුවේ ප්‍රකාශිත කාලාන්තරයකදී නිරීක්ෂණය කළහැකි පොලී අනුපාතික සහ ඵලදා වක්‍රයන්

(ii) ව්‍යංග වෙනස් වනසුළු භාවයන්

(iii) ණය විහිදුම්

(ඈ) වෙළඳපොළ සනාතන යෙදවුම්

83. 2වන මට්ටමේ යෙදවුම්වලට වන ගැළපුම් වත්කමට හෝ වගකීමට විශේෂිතවන සාධක රඳා පැවැත්ම මත වෙනස් වනු ඇත. එම සාධකවලට පහත දෑ ඇතුළත්ය.

(අ) වත්කමේ තත්ත්වය සහ පිහිටීම.

(ආ) වත්කමට හෝ වගකීමට සමාන කළහැකි අයිතමයන් යෙදවුම්වලට සම්බන්ධවන ප්‍රමාණය (39 වන ඡේදයේ විස්තර කළ එම සාධකයන්ද ඇතුළුව) සහ

(ඇ) යෙදවුම් නිරීක්ෂණය කළ වෙළඳපොළවල් ඇතුළත පරිමාව හෝ ක්‍රියාකාරකම්වල මට්ටම.

84. 2වන මට්ටමේ යෙදවුමකට වන ගැළපුමක් සමස්ථ මැනීමට වැදගත් වන අතර, ගැළපුම සැලකිය යුතු අන්දමින් නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් භාවිත කරන්නේ නම් එය සාධාරන අගය මැනීමේ අනුපිලිවෙළේ තුන්වන මට්ටමට ඇතුළත සාධාරණ අගය මැනීම වර්ගීකරණය කිරීමට වන ප්‍රතිඵලයක් විය හැකිය.

85. විශේෂ වත්කම් සහ වගකීම් සඳහා 2වන මට්ටමේ යෙදවුම් භාවිතය ආ35 ඡේදයේ විස්තර කරයි.

**3 වන මට්ටමේ යෙදවුම්**

86. 3වන මට්ටමේ යෙදවුම් වන්නේ වත්කම් හෝ වගකීම් සඳහා නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම්ය.

87. අදාළ නිරීක්ෂණය කළහැකි යෙදවුම් ප්‍රමාණය දක්වා, නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් සාධාරණ අගය මැනීම සඳහා භාවිත කළ යුතුය, ඒ අනුව, එහි ප්‍රතිඵලයක් වශයෙන් මැනීම කරන දින වත්කමේ හෝ වගකීමේ වෙළඳ ක්‍රියාකාරකම් කිසිවක් වේනම්, ස්වල්ප වශයෙන් ඇති තත්ත්වයන් සඳහා ඉඩදේ. කෙසේ වෙතත් සාධාරණ අගය මැනීමේ පරමාර්ථය වෙනස් නොවී එසේම පවතී. උදා: මැනුම් කරන දින ඉවත්වීමේ මිල වත්කමක් දරණ හෝ වගකීමක් ගෙවීමට බැඳී සිටින වෙළඳපොළ සහභාගිවන්නකුගේ සාපේක්ෂ වැදගත්කම පැත්තෙන් ගත්කළ, එබැවින් වත්කමක් හෝ වගකීමක් මිල කිරීමේදී වෙළඳපොළ සහභාගිවන්නන් භාවිත කරන,අවදානම පිළිබඳව උපකල්පනයන් ද ඇතුළුව උපකල්පනයන් නිරීක්ෂණය නොකළ යෙදවුම් වලින් පිළිබිඹු විය යුතුය.

88. අවදානම පිළිබඳ උපකල්පනවලට සාධාරණ අගය මැනීමට (මිල කිරීමේ ආකෘතිය වැනි භාවිත කරන විශේෂ තක්සේරු ක්‍රමයක් තුළ ඇති ආවේණික අවදානම සහ තක්සේරු ක්‍රමයට යොදවන යෙදවුම් තුළ ඇති ආවේණික අවදානමද ඇතුළත් වේ. වත්කමක් හෝ වගකීමක් මිල කිරීමේදී වෙළඳපොළ සහභාගිවන්නන් ගැළපුමක් ඇතුළත් කරන්නේ නම්, අවදානමට ගැළපුමක් ඇතුළත්ව නැති මැනීමක් සාධාරණ අගය මැනීමක් නියෝජනය නොකරයි. උදාහරණයක් වශයෙන් සැලකිය යුතු අන්දමේ මැනීමේ අවිනිශ්චිතතාවයන් ඇතිවිටෙකදී අවදානම් ගැළපුමක් ඇතුළත් කිරීම අවශ්‍ය විය හැකිය. (ආ37 - ආ47 ඡේදයන්හි විස්තර කර ඇති පරිදි වත්කම හෝ වගකීම සඳහා හෝ ඒ හා සමාන වත්කම් සහ වගකීම් සඳහා සාමාන්‍ය වෙළඳපොළ ක්‍රියාකාරකම් සංසන්දනය කිරීමේදී පරිමාවේ හෝ ක්‍රියාකාරී මට්ටමේ සැලකිය යුතු අඩුවීමක් පවතින විට සහ ගනුදෙනු වන මිලහෝ ප්‍රකාශිත මිල සාධාරණ අගය නියෝජනය නොකරන බව අස්තිත්වය නීර්ණය කිරීම)

89. අස්තිත්වයක් විසින් තත්ත්වයන් තුළ ලබාගතහැකි හොඳම තොරතුරු භාවිත කරමින් නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් සංවර්ධනය කළයුතුය. මේවාට අස්තිත්වයේ ස්වකීය තොරතුරු ඇතුළත් විය හැකිය. නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් සංවර්ධනය කිරීමේදී අස්තිත්වය ස්වකීය දත්ත වලින් පටන් ගත හැකිය. එහෙත් වෙනත් වෙළඳපොළ සහභාගී වන්නන් වෙනත් තොරතුරු භාවිත කරන බවට, හෝ වෙනත් වෙළඳපොළ සහභාගී වන්නන්ට ලබාගත නොහැකි (උදා: අස්තිත්ව - විශේෂිත සහක්‍රියාවක්) අස්තිත්වයට විශේෂ වූ යම් දෙයක් ඇතිබව පිළිබඳ සාධාරණ ලෙස ලබාගත හැකි තොරතුරු ඉඟිකරන්නේ නම් අස්තිත්වය ස්වකීය තොරතුරු ගැළපිය යුතුය. වෙළඳපොළ සහභාගී වන්නන්ගේ උපකල්පන පිළිබඳව තොරතුරු ලබාගැනීමට අස්තිත්වය සවිස්තරාකාර උත්සාහයක් භාරගැනීම අවශ්‍ය නොවේ. කෙසේ වෙතත් වෙළඳපොළ සහභාගී වන්නන්ගේ උපකල්පන පිළිබඳව සාධාරණව ලබාගත හැකි සියලුම තොරතුරු අස්තිත්වය සැලකිල්ලට ගතයුතුය. ඉහත ආකාරයෙන් විස්තර කර සංවර්ධනය කළ නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් වෙළඳපොළ සහභාගීවන්නන්ගේ උපකල්පනයන් ලෙස සැලකෙන අතර, සාධාරණ අගය මැනීමේ පරමාර්ථය ඉන් ඉටුවේ.

90. විශේෂ වත්කම් සහ වගකීම් සඳහා 3වන මට්ටමේ යෙදවුම් භාවිතය ආ36 ඡේදය මගින් විස්තර කෙරේ.

**හෙළිදරව් කිරීම්**

91. **අස්තිත්වයක් විසින් සිය මූල්‍ය ප්‍රකාශන පරිශීලනය කරන්නන්ට පහත සඳහන් කාරණා දෙකම තක්සේරු කිරීමට උදව් කරන තොරතුරු හෙළිදරව් කළ යුතුය.**

   **(අ) මූල් හඳුනාගැනීමෙන් පසු පුනරාවර්තනය වන සහ පුනරාවර්තනය නොවන පදනම මත සාධාරණ අගයට මනින වත්කම් සඳහා මූල්‍ය තත්ත්වය දක්වෙන ප්‍රකාශණය, එම මැනීම් සංවර්ධනය කිරීමට යොදාගත් තක්සේරු ශිල්පක්‍රම සහ යෙදවුම්**

   **(ආ) සැලකිය යුතු අන්දමේ නිරීක්ෂණය නොකළ යෙදවුම් (3වන මට්ටමේ) භාවිත කරමින් පුනරාවර්තනය වන සාධාරණ අගය මැනීම සඳහා, කාලපරිච්ඡේදය සඳහා ලාභය හෝ අලාභය හෝ වෙනත් විස්තීර්ණ ආදායම මත මැනීමේ බලපෑම.**

92. 91 වන ඡේදයේ වන පරමාර්ථ ඉටු කරගැනීම සඳහා අස්තිත්වයන් විසින් පහත සඳහන් සියලුම දෑ සලකා බැලිය යුතුය.

   (අ) හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන් සපුරාලීමට අවශ්‍ය විස්තරවල මට්ටම.

   (ආ) විවිධ අවශ්‍යතාවයන් සෑම එකකටම කොපමණ ප්‍රමාණයක අවධාරණය යොමුකළ යුතුද

   (ඇ) කොපමණ ප්‍රමාණයක සමාහරණය කිරීම සහ සමාහරණය ඉවත් කිරීම භාරගත යුතුද,

   (**ඈ**) හෙළිදරව් කළ ප්‍රමාණාත්මක තොරතුරු අගය කිරීම මූල්‍ය ප්‍රකාශන පරිශීලනය කරන්නන් හට අමතර තොරතුරු අවශ්‍ය වේද

   මෙම SLFRS සහ වෙනත් SLFRSs සමග ලබාදී ඇති හෙළිදරව් කිරීම් 91 වන ඡේදයේ පරමාර්ථ ඉටුකර ගැනීමට ප්‍රමාණවත් නොවේනම් එම අරමුණු ඉටු කරගැනීමට අවශ්‍යකරණ අමතර තොරතුරු අස්තිත්වය හෙළිදරව් කළ යුතුය.

93. 91 වන ඡේදයේ අරමුණු ඉටුකර ගැනීමට මූලික හඳුනාගැනීමෙන් පසුව මූල්‍ය තත්ත්වය දක්වෙන ප්‍රකාශනයේ අවමයක් වශයෙන් සාධාරණ අගයට මනින ලද (මෙම SLFRS හි විෂයපථය ඇතුළත සාධාරණ අගය පදනම මත මැනීම් ඇතුළත්ව) සෑම වත්කමක් හා වගකීමක් (උචිත පන්තිවල වත්කම් සහ වගකීම් නිර්ණය කිරීම සඳහා වන තොරතුරු සඳහා 94 ඡේදය බලන්න) සඳහා පහත සඳහන් තොරතුරු හෙළිදරව් කළ යුතුය.

(අ) පුනරාවර්තනය වන සහ පුනරාවර්තනය නොවන සාධාරණ අගය මැනීම්, වාර්තාකරන කාලපරිච්ඡේදයඅවසානයේ සාධාරණ අගය මැනීම, සහ පුනරාවර්තනය නොවන සාධාරණ අගය මැනීම සඳහාවන හේතූන්, වත්කම් හෝ වගකීම් සඳහා පුනරාවර්තනය වන සාධාරණ අගය මැනීම වනුයේ වාර්තාකරන සෑම කාලපරිච්ඡේදයක් අවසානයේ මූල්‍ය තත්ත්වය දක්වෙන ප්‍රකාශනයේ වෙනත් SLFRSs වලින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දෙන ඒවාය. වත්කම් හෝ වගකීම් සඳහා පුනරාවර්තනය නොවන සාධාරණ අගය මැනීම වනුයේ විශේෂ තත්ත්වයකදී මූල්‍ය තත්ත්වය දක්වෙන ප්‍රකාශනයේ වෙනත් SLFRSs වලින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දෙන ඒවාය. (උදාහරණ වශයෙන් SLFRS 5 *විකිණීම සඳහා තබාගෙන ඇති ජංගම නොවන වත්කම් සහ අසන්තතික මෙහෙයුම්* ප්‍රකාරව, අස්තිත්වයක් විකිණීම සඳහා තබාගෙන ඇති වත්කමක් විකිණීම සඳහාවන පිරිවැය අඩුකළ සාධාරණ අගයට මනින විට මෙයට හේතු වන්නේ වත්කම විකිණීම සඳහාවන පිරිවැය අඩුකළ සාධාරණ අගය එහි ධාරන අගයට වඩා අඩු බැවිනි)

(ආ) පුනරාවර්තනය වන සහ පුනරාවර්තනය නොවන සාධාරණ අගය මැනීම සඳහා සාධාරන අගය මැනීම ඇතුළතම, සාධාරණ අගය අනුපිළිවෙළේ මට්ටම ඒවායේ මුළුමනින්ම වර්ගීකරණය කෙරේ. (මට්ටම් 1, 2, 3)

(ඇ) පුනරාවර්තන පදනම මත සාධාරණ අගය මනින වාර්තාකරන කාලපරිච්ඡේදය අවසානයේ දරා සිටින වත්කම් සහ වගකීම් සඳහා සාධාරණ අගයේ අනුපිළිවෙළේ 1වන මට්ටම සහ 2වන මට්ටම අතර යම් මාරුකිරීමක වටිනාකම්, එම මාරුකිරීම් වලට හේතුව සහ මට්ටම් අතර සිදුවූවා යැයි (95 වන ඡේදය බලන්න) සැලකිල්ලට ගන්නා විට මාරුකිරීම් සඳහා වන අස්තිත්වය ප්‍රතිපත්තිය නිර්ණය කිරීම. එක් එක් මට්ටම ඇතුළතට සිදුකරන මාරුකිරීම්. එක් එක් මට්ටමෙන් පිටතට කරන මාරුකිරීම් වලින් වෙන්කොට හෙළිදරව් කර හා සාකච්ඡා කළ යුතුය.

(ඈ) සාධාරණ අගය අනුපිළිවෙළේ 2වන සහ 3වන මට්ටම් ඇතුළත වර්ගීකරණය කරනලද පුනරාවර්තනය වන සහ පුනරාවර්තනය නොවන සාධාරණ අගය මැනීම සඳහා, භාවිත කළ තක්සේරු කිරීමේ ශිල්පක්‍රමය (ක්‍රමයන්) සහ භාවිතකළ යෙදවුම් වල විස්තරයක්. තක්සේරු ශිල්පක්‍රමයේ වෙනසක් සිදුවී ඇත්නම් (උදා: වෙළඳපොළ ප්‍රවේශයේ සිට ආදායම් ප්‍රවේශයට වෙනස් කිරීම හෝ අමතර තක්සේරු කිරීමේ ශිල්පක්‍රමයක් භාවිතා කිරීම) අස්තිත්වය එම වෙනස සහ එම වෙනස් කිරීමට හේතු හෙළිදරව් කළ යුතුය. සාධාරණ අගය අනුපිළිවෙලේ 3වන මට්ටම ඇතුළත වර්ගීකරණය කළ සාධාරණ අගය මැනීම සඳහා අස්තිත්වය භාවිත කළ සැලකිය යුතු අන්දමේ නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් සඳහා ප්‍රමාණාත්මක තොරතුරු අස්තිත්වය ලබාදිය යුතුය. සාධාරණ අගය මැනීමේදී ප්‍රමාණාත්මක නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් අස්තිත්වය විසින් සංවර්ධනය නොකළේ නම්, මෙම හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන් සමග අනුකූලවීමට අස්තිත්වය ප්‍රමාණාත්මක තොරතුරු නිර්මාණය කිරීම අවශ්‍ය නොවේ. (උදා: අස්තිත්වය කලින් ගනුදෙනුවල මිල ගණන් හෝ ගැළපිළි නොකර තුන්වන පාර්ශ්වයක මිල කිරීමේ තොරතුරු භාවිතා කරන විටෙකදී). කෙසේ වෙතත් අස්තිත්වය මෙම හෙළිදරව් කිරීම් ලබාදෙන විට, අස්තිත්වයට සාධාරණ ලෙස ලබාගත හැකි සහ සාධාරණ අගය මැනීමේදී සැලකිය යුතු අන්දමේ නිරීක්ෂණය කළ නොහැකි ප්‍රමාණාත්මක යෙදවුම් නොසලකා හැරිය නොහැක.

(ඉ) සාධාරණ අගය අනුපිළිවෙළේ 3වන මට්ටම ඇතුළත වර්ගීකරණය කළ පුනරාවර්තනය වන සාධාරන අගය මැනීම සඳහා පහත සඳහන් දෑවලට ආරෝපණය වූ කාලපරිච්ඡේදය තුළදී සිදුවූ වෙනස්කම් වෙනම පෙන්වමින් ආරම්භක ශේෂයේ සිට අවසාන ශේෂය දක්වා සංසන්දනය කිරීමක්,

(i) ලාභ හෝ අලාභවල හඳුනාගත් මුළු ප්‍රතිලාභ හෝ අලාභයන් සහ එම ප්‍රතිලාභයන් හෝ අලාභයන් හඳුනාගත් ලාභ හෝ අලාභවල පේළි අයිතම(යන්).

(ii) වෙනත් විස්තීර්ණ ආදායම්වල හඳුනාගත් මුළු ප්‍රතිලාභ හෝ අලාභයන් සහ එම ප්‍රතිලාභයන් හඳුනාගත් වෙනත් විස්තීර්ණ ආදායම්වල පේළි අයිතම(යන්).

(iii) මිලදී ගැනීම්, විකිණීම්, නිකුත් කිරීම් සහ නිරවුල් කිරීම් (මෙම එක් එක් වර්ගයේ වෙනස්වීම් වෙනම හෙළිදරව් කරමින්)

(iv) සාධාරණ අගයේ අනුපිළිවෙළේ 3වන මට්ටම ඇතුළත හෝ ඉන් පිටතට වූ යම් මාරුකිරීම්වල වටිනාකම්, එම මාරුකිරීම්වලට හේතූන්, මට්ටම් අතර සිදුවූවා යයි (95 වන ඡේදය බලන්න). සැලකිල්ලට ගන්නාවිට මාරුකිරීම් සඳහාවන අස්තිත්වයේ ප්‍රතිපත්තිය නිර්ණයකිරීම 3වන මට්ටම ඇතුළතම සිදුකරන මාරුකිරීම් 3වන මට්ටමෙන් පිටතට කරන මාරු කිරීම් වලින් වෙන්කොට හෙළිදරව් කර හා සාකච්ඡා කළ යුතුය.

(ඊ) සාධාරණ අගය අනුපිළිවෙළේ 3වන මට්ටම ඇතුළත වර්ගීකරණය කළ පුනරාවර්තනය වන සාධාරණ අගය මැනීම සඳහා ලාභ හෝ අලාභවල ඇතුළත් කළ (ඉ) (i) හි මුළු ප්‍රතිලාභ වල හෝ අලාභවල වටිනාකම, එනම් වාර්තාකරන කාලපරිච්ඡේදය අවසානයේ දරන එම වත්කම සහ වගකීම්වලට සම්බන්ධ ආරෝපණය වූ උපලබ්ධි නොවූ ප්‍රතිලාභවල හෝ අලාභවල වෙනස්වීම සහ එම උපලබ්ධි නොවූ ප්‍රතිලාභ හෝ අලාභ හඳුනාගත් ලාභ හෝ අලාභ තුළ වන පේළි අයිතමය(යන්).

(උ) සාධාරණ අගය අනුපිළිවෙළේ 3වන මට්ටම ඇතුළත වර්ගීකරණයකළ පුනරාවර්තනය වන හා පුනරාවර්තනය නොවන සාධාරන අගය මැනීම සඳහා අස්තිත්වය භාවිතා කළ තක්සේරු කිරීමේ ක්‍රියාවලියේ විස්තරයක් (උදාහරණ වශයෙන් සිය තක්සේරු ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි සහ කාලපරිච්ඡේදයන් කාලපරිච්ඡේදයට සාධාරන අගය මැනීම්වල වෙනස්වීම් විශ්ලේෂණය අස්තිත්වය තීරණය කරන්නේ කෙසේද ඇතුලුව.

(උ) සාධාරණ අගය අනුපිළිවෙළේ 3න්වන මට්ටම ඇතුළත වර්ගීකරණය කළ පුනරාවර්තනය වන සාධාරණ අගය මැනීම් සඳහා,

(i) එවන් සියලු මැනීම් සඳහා නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් වලට සිදුවන වෙනසකදී සාධාරණ අගය මැනීමේ සංවේදීතාවය, එම යෙදවුම්වලට වෙනසක් සිදුවුවහොත් සැලකිය යුතු අන්දමින් ඉහළ හෝ පහළ සාධාරණ අගය මැනීම ප්‍රතිඵලයක් විය හැකිවීම වැනි සංලක්ෂ්‍යමය විස්තරයක්. එම යෙදවුම් සහ සාධාරණ අගය මැනීම සඳහා භාවිත කළ නිරීක්ෂණය කළ නොහැකි වෙනත් යෙදවුම් අතර අන්තර් සබඳතාවයන් තිබේනම් අස්තිත්වය එම සබඳතාවල සහ සාධාරණ අගය මැනීම මත නිරීක්ෂණය නොකළ යෙදවුම් වල වෙනස්වීම්වල බලපෑම ඒවා කෙසේ තීව්‍ර හෝ සැහැල්ලු කරන්නේද පිළිබඳව විස්තරයක්ද ලබාදිය යුතුය. එම හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවය සමග අනුකූලවීමට නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් වල වෙනස්වීමේ සංවේදීතාවයේ සංලක්ෂ්‍යමය විස්තරයවූ අවමයක් වශයෙන් (ඇ) සමග අනුකූල වනවිට හෙළිදරව් කළ නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් ඇතුළත් කළ යුතුය.

(ii) මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් සඳහා, සාධාරණ ලෙස වියහැකි විකල්ප උපකල්පනයන් පිළිබිඹුවීමට එකක් හෝ ඊට වැඩි ගණනක නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් වෙනස් කිරීමෙන් සාධාරණ අගය සැලකිය යුතු ලෙස වෙනස්වන්නේ නම් අස්තිත්වය එම කරුණ සඳහන් කර එම වෙනස්වීම්වල බලපෑම හෙළිදරව් කළ යුතුය. වෙනස්වීමක බලපෑම සැලකිය හැකි අන්දමේ විය හැකි විකල්ප උපකල්පනය පිළිබිඹු වීම ගණනය කළේ කෙසේද යන්න අස්තිත්වය හෙළිදරව් කළයුතුය. එම අරමුණ සඳහා වැදගත්කම මැණිය යුත්තේ ලාභ හෝ අලාභ සහ මුළු වත්කම හෝ මුළු වගකීම හෝ වෙනත් විස්තීර්ණ ආදායම්වල සාධාරණ අගය වෙනස්වීම හඳුනාගන්නා විට, මුළු ස්කන්ධය සම්බන්ධයෙනි.

(ඌ) පුනරාවර්තනය වන සහ පුනරාවර්තනය නොවන සාධාරණ අගය මැනීම සඳහා, මූල්‍ය නොවන වත්කමක ඉහළම හා හොඳම භාවිතය එහි ප්‍රවර්තන භාවිතයෙන් වෙනස්වන්නේ නම් එම කරුණ සහ මූල්‍ය නොවන වත්කම එහි ඉහළම සහ ඉතා හොඳම භාවිතයෙන් වෙනස්වන අන්දමට භාවිතයේ යොදවා ඇත්තේ මක් නිසාද යන්නත් අස්තිත්වය හෙළිදරව් කළ යුතුය.

94. වත්කම් සහ වගකීම්වලට උචිත පන්තීන් පහත සඳහන් පදනම මත අස්තිත්වයක් විසින් නිර්ණය කළ යුතුය.

(අ) වත්කමේ හෝ වගකීමේ ස්වභාවය, ගතිලක්ෂණයන් සහ අවදානම් සහ

(ආ) සාධාරණ අගය මැනීම වර්ගීකරණය කළ ඇතුළත සාධාරණ අගය අනුපිළිවෙළේ මට්ටම සාධාරණ අගය අනුපිළිවෙළේ 3වන මට්ටම ඇතුළත සාධාරණ අගය මැනීම වර්ගීකරණයේ පන්තිවල සංඛ්‍යාව වඩා විශාල වීමට අවශ්‍ය විය හැකිය. එසේ වන්නේ එම මැනීම් වලට විශාල ප්‍රමාණයක අවිනිශ්චිතතාවයන් සහ විෂයානුබද්ධ වීමක් ඇති නිසාය. සාධාරණ වටිනාකම් මිණුම් පිළිබඳ හෙළිදරව් සැපයිය යුතු උචිත වත්කම් සහ වගකීම්වල පන්තීන් නිර්ණය කිරීමට විචාර බුද්ධිය අවශ්‍ය වේ.

එක පන්තියක වත්කම් හා වගකීම් බොහෝවිට මූල්‍ය තත්ත්වය දක්වෙන ප්‍රකාශනයේ ඉදිරිපත්කර ඇති පේළි අයිතම වලට වඩා විශාල ලෙස සමාහරණය ඉවත් කිරීමට අවශ්‍ය වීම සිදුවිය හැකිවීම. කෙසේ වෙතත් මූල්‍ය තත්ත්වය දක්වෙන ප්‍රකාශනයේ ඉදිරිපත් කර ඇති පේළි අයිතම වෙත සංසන්දනය කිරීමට ඉඩ ලබාදෙන ප්‍රමාණවත් තොරතුරු අස්තිත්වය ලබාදිය යුතුය. වෙනත් SLFRS යකින් වත්කමක් හෝ වගකීමක් සඳහා වන පන්තිය පැහැදිලිව සඳහන් කරන්නේ නම්, එම පන්තිය මෙම ඡේදයේ අවශ්‍යතාවයන් ඉටුකරන්නේ නම්, මෙම SLFRS මගින් අවශ්‍ය කරන හෙළිදරව් කිරීම් ලබාදීම අස්තිත්වයකට එම පන්තිය භාවිත කළ හැකිය.

95. 93(ඇ) සහ ඉ (iv) ඡේද ප්‍රකාරව සාධාරණ අගය අනුපිළිවෙළේ මට්ටම් අතර මාරු කිරීම් සිදුවූවා යයි සැලකිල්ලට ගන්නා අවස්ථා නිර්ණය කිරීම සඳහා වන අස්තිත්වයේ ප්‍රතිපත්තිය හෙළිදරව් කර සංගතව අනුගමනය කළ යුතුය.

මට්ටම් ඇතුළතට මාරුකිරීම මෙන්ම මට්ටම් තුළින් පිටත මාරු කිරීම සඳහා, මාරු කිරීම් හඳුනාගන්නා කාල නිර්ණය පිළිබඳ ප්‍රතිපත්තිය එකම විය යුතුය. මාරු කිරීම් වල කාල නිර්ණය කිරීමේ ප්‍රතිපත්තින් නිර්ණය කිරීම සඳහා වන උදාහරණවලට පහත දෑ ඇතුළත් වේ.

(අ) සිද්ධියේ දිනය හෝ මාරු කිරීමට හේතුවූ තත්ත්වයන්හි වෙනස්වීම්.

(ආ) වාර්තා කරන කාලපරිච්ඡේදයේ ආරම්භය.

(ඇ) වාර්තා කරන කාලපරිච්ඡේදයේ අවසානය.

96. 48 වන ඡේදයේ ඇති ව්‍යතිරේඛය භාවිත කිරීමට අස්තිත්වය ගිණුම්කරණ ප්‍රතිපත්ති තීරණයක් ගන්නේ නම් එම කරුණ හෙළිදරව් කළ යුතුය.

97. මූල්‍ය තත්ත්වය දක්වෙන ප්‍රකාශනය තුළ සාධාරණ අගයට මනිනු නොලැබූ එහෙත් ඒවා සඳහා සාධාරණ අගය හෙළිදරව් කළ සෑම පන්තියකම වත්කම් සහ වගකීම සඳහා අස්තිත්වය 93 (ඈ), (ඈ) සහ (i) ඡේද යන්නෙන් අවශ්‍ය කෙරෙන තොරතුරු හෙළිදරව් කළ යුතුය.

කෙසේ වෙතත් 93(ඈ) ඡේදය මගින් අවශ්‍ය කරන සාධාරණ අගය අනුපිළිවෙළේ 3වන මට්ටම ඇතුළත වර්ගීකරණය කළ සාධාරණ අගය මැනීම සඳහා භාවිතකළ සැලකියයුතු අන්දමේ නිරීක්ෂණය නොකළ යෙදවුම් පිළිබඳව ප්‍රමාණාත්මක හෙළිදරව්වක් අස්තිත්වයට ලබාදීම අවශ්‍ය නොකෙරේ. එවැනි වත්කම් සහ වගකීම් සඳහා මෙම SLFRS මගින් අවශ්‍ය කෙරෙන වෙනත් හෙළිදරව් කිරීම අස්තිත්වය ලබාදීම අවශ්‍ය නොකෙරේ.

98. සාධාරණ අගයට මනින ලද සහ තුන්වන පාර්ශ්වයක වෙන්කළ නොහැකි ණය උද්දීපනයක් සමග නිකුත් කරන වගකීමක් සඳහා නිකුත් කරන්නා විසින් එම ණය උද්දීපනයේ පැවැත්ම සහ එය වගකීමේ සාධාරණ අගය මැනීමේ පිළිබිඹු වන්නේද යන්න හෙළිදරව් කළ යුතුය.

99. මෙම SLFRS යෙන් අවශ්‍ය කරන ප්‍රමාණාත්මක හෙළිදරව් කිරීම් සඳහා වෙනත් ආකෘතියක් වඩාත් උචිත වන්නේ නම් හැර අස්තිත්වය විසින් අනුශීර්ෂ සහිත ආකෘතියක් මගින් ඉදිරිපත් කළ යුතුය.

**අ පරිශිෂ්ඨය**

**නිර්වර්චිත පද**

*මෙම පරිශිෂ්ඨය SLFRS හි සංකලිත කොටසකි.*

| | |
|---|---|
| **සක්‍රිය වෙළඳපොළ** | ප්‍රමාණවත් සංඛ්‍යාතයකින් සහ පරිමාවකින් යුත් දිගටම පවත්නා පදනම මත වත්කමක් හෝ වගකීමක් සඳහා මිල කිරීමේ තොරතුරු ලබාදීමට ගනුදෙනුවන වෙළඳපොළකි. |
| **පිරිවැය ප්‍රවේශය** | වත්කමක සේවා ධාරිතාව ප්‍රති සම්පාදනය කිරීමට වර්තමානයේදී අවශ්‍ය වියහැකි වටිනාකම පිළිබිඹු වියහැකි තක්සේරු ශිල්ප ක්‍රමයකි. (ප්‍රවර්තන ප්‍රතිසම්පාදන පිරිවැය ලෙස බොහෝවිට හැඳින්වේ.) |
| **ඇතුළත්වීමේ මිල** | හුවමාරු ගනුදෙනුවකදී වත්කමක් අත්කරගැනීමට ගෙවූ හෝ වගකීමක් භාරගැනීමට ලැබුණ මිලයි. |
| **පිටවීමේ මිල** | වත්කමක විකිණීමකට ලැබියයුතු හෝ වගකීමක් පැවරීමට ගෙවියයුතු මිලයි. |
| **අපේක්ෂිත මුදල් ප්‍රවාහ** | වියහැකි අනාගත මුදල් ප්‍රවාහයන්හි සම්භාව්‍යතා භරිත සාමාන්‍ය (උදා: ව්‍යාප්තියේ මධ්‍යන්‍යයයි) |
| **සාධාරණ අගය** | මිනුම් කරන දින වෙළඳපොළ සහභාගි වන්නන් අතර විධිමත් ගනුදෙනුවකදී වත්කමක් විකිණීමකට ලැබියයුතු හෝ වගකීමක් පැවරීමට ගෙවූ මිලය |
| **උසස් හෝ වඩාත් හොඳම භාවිතය** | වත්කම එහි තුළභාවිත කරන ව්‍යාපාරයක වත්කමෙහි හෝ වත්කම් සමූහයෙහි හා වගකීම්වල (උදා: ව්‍යාපාරයක වටිනාකම උපරිම කරන මූල්‍ය නොවන වත්කම් වෙළඳපොළෙහි සහභාගිවන්නන් විසින් භාවිත කිරීම |
| **ආදායම් ප්‍රවේශය** | අනාගත වටිනාකම් (උදා: මුදල් ප්‍රවාහයන් හෝ ආදායම් සහ වියදම්) ප්‍රවර්තන තනි (උදා: වට්ටම් කරන ලද) වටිනාකමකට පරිවර්තනය කරන තක්සේරු කිරීමේ ක්‍රම. සාධාරණ අගය මැනීම නිර්ණය කරනුයේ එම අනාගත වටිනාකම් පිළිබඳව ප්‍රවර්තන වෙළඳපොළ අපේක්ෂාවන් ඉඟි කෙරෙන වටිනාකම් පදනම මතය. |
| **යෙදවුම්** | වත්කමක් හෝ වගකීමක් මිල කිරීමේදී වෙළඳපොළ සහභාගිවන්නන් භාවිත කරනු ලබන උපකල්පනයන් අවදානම් පිළිබඳ උපකල්පනයක්ද ඇතුළුව පහත දෑ වැනි.<br>(අ) සාධාරණ අගය මැනීමට භාවිත කළ විශේෂ තක්සේරු ශිල්ප ක්‍රමය තුළ වූ ආවේණික අවදානම (මිල කිරීමේ ආදර්ශයවැනි), සහ<br>(ආ) තක්සේරු ශිල්පක්‍රමවලට කරන යෙදවුම් වලට ආවේණික වූ අවදානම යෙදවුම් නිරීක්ෂණය කළහැකි හෝ නිරීක්ෂණය කළ නොහැකි හෝ විය හැකිය. |
| **1 වන මට්ටමේ යෙදවුම්** | මිනුම් කරන දිනදී අස්තිත්වයට ප්‍රවේශ වියහැකි සර්ව සම වත්කම් සහ වගකීම් සඳහා සක්‍රිය වෙළඳපොළවල් වල ප්‍රකාශිත මිල ගණන් (ගැළපුම් නොකළ) |

**2 වන මට්ටමේ යෙදවුම්** එක්කෝ සෘජුව හෝ වක්‍රව වත්කම් හෝ වගකීම් සඳහා නිරීක්ෂණය කළ හැකි 1 වන මට්ටම ඇතුළත වන ප්‍රකාශිත මිල ගණන් හැර වෙනත් යෙදවුම්.

**3 වන මට්ටමේ යෙදවුම්** වත්කම් සහ වගකීම් සඳහා නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම්.

**වෙළඳපොළ ප්‍රවේශය** ව්‍යාපාරයක් වැනි සර්වසම හෝ සමාන කළහැකි (උදාඃ එක හා සමාන) වත්කම් හෝ වගකීම් හෝ වත්කම් සහ වගකීම් සමූහයක් සම්බන්ධ කරගත් වෙළඳපොළ ගනුදෙනුවලින් ජනනය වන මිල ගණන් සහ වෙනත් අදාළ තොරතුරු භාවිත කරන තක්සේරු කිරීමේ ශිල්ප ක්‍රමයකි.

**වෙළඳපොළ සනාථ කෙරෙන යෙදවුම්** නිරීක්ෂණය කළහැකි වෙළඳපොළ දත්ත, සහ සම්බන්ධතාවය මගින් හෝ වෙනත් විධිවලින් වන හෝ සනාථ කර ගතහැකි ප්‍රධාන වශයෙන් හටගන්නා යෙදවුම්.

**වෙළඳපොළ සහභාගිවන්නන්** වත්කම් සහ වගකීම් සඳහා පහත සඳහන් සියළුම ගතිලක්ෂණයන් ඇති ප්‍රධාන (හෝ වඩාත් වාසිසහගත) වෙළෙඳපොළ තුළ සිටින ගැනුම්කරුවන් සහ විකුණුම් කරුවන්.

(අ) ඔවුන් එකිනෙකාගෙන් ස්වාධීනය, උදාඃ ගනුදෙනුවට ඇතුළු වූයේ වෙළඳපොළ කොන්දේසිවලට අනුව බවට අස්තිත්වය සාක්ෂි තිබේනම් එසේ වූවත් සාධාරණ අගය මැනීමට යෙදවුමක් ලෙස සම්බන්ධිත පාර්ශ්වයක ගනුදෙනුවක මිල යෙදවුමක් ලෙස භාවිත කළද LKAS 24 හි නිර්වචනය කරන පරිදි ඔවුන් සම්බන්ධිත පාර්ශ්ව නොවේ.

(ආ) සුලබ හා චාරිත්‍රානුකූල මනාව නියැලුන ප්‍රයත්නයක් මගින් ලබාගත හැකි තොරතුරු ඇතුළත් ලබාගත හැකි සියළු තොරතුරු භාවිත කර ගනුදෙනු සහ වත්කම් සහ වගකීම් පිළිබඳව සාධාරණ අවබෝධයක් තිබෙන ඔවුන් දැනුමැති අයය.

(ඇ) වත්කම් හා වගකීම් සඳහා ගනුදෙනුවක ඇතුල්වීමට ඔවුන්හට හැකියාව ඇත.

(ඈ) වත්කම් හා වගකීම් සඳහා ගනුදෙනුවකට ඇතුල්වීමට ඔවුන්හට කැමැත්තක් ඇත.

උදාඃ එසේ කිරීමට ඔවුන් අභිප්‍රේරණය වී ඇති අතර අන්වශයෙන් බලකිරීමකින් හෝ බලෙන් යොමුකිරීමකින් එසේ නොකරයි.

**වඩාත් වාසිසහගත වෙළඳපොළ** ගනුදෙනු කිරීමේ පිරිවැයන් සහ ප්‍රවාහන පිරිවැයන් සැලකිල්ලට ගත්පසු වත්කම විකිණීමකදී ලැබියයුතු වූ වටිනාකම උපරිම කරන සහ වගකීම පැවරීමකදී වටිනාකම අවම කරන වෙළඳපොළයි.

**කාර්යඵල නොමැති අවදානම** අස්තිත්වයක් බැඳීමක් ඉටු නොකරනු ඇතැයි වන අවදානම කාර්යඵල නොමැති අවදානමට ඇතුළත්, එහෙත් එයට පමණක් සීමා නොවිය හැකි, අස්තිත්වයේ ස්වකීය ණය අවදානම්

**නිරීක්ෂණය කළහැකි යෙදවුම්** සත්‍ය සිදුවීම් හෝ ගනුදෙනු පිළිබඳ ප්‍රසිද්ධියේ ලබාගත හැකි තොරතුරු, සහ වත්කමක් හෝ වගකීමක් මිල කිරීමේදී වෙළඳපොළ සහභාගිවන්නන් භාවිත කරනු ඇතැයි පිළිබිඹු වන උපකල්පනයන් වැනි, වෙළඳපොළ දත්ත භාවිත කර සංවර්ධනය කළ යෙදවුම්

**විධිමත් ගනුදෙනුව** එවන් වත්කම් හෝ වගකීම් සම්බන්ධවන ගනුදෙනු සඳහා සුලභ සහ චාරිත්‍රානුකූල වන අලෙවි ක්‍රියාකාරකම් සඳහා මැනීම කරන දිනට පෙර කාලපරිච්ඡේදයක් සඳහා වෙළඳපොළට අනාවෘතවීම උපකල්පනය කරන ගනුදෙනුවක්, එය බලෙන් කරන ගනුදෙනුවක් නොවේ. (උදාඃ බලෙන් කරන ඈවර කිරීමක් හෝ ආපදා විකිණීමක්).

**ප්‍රධාන වෙළඳපොළ** වත්කම හෝ වගකීම සඳහා විශාලතම පරිමාව සහ සක්‍රිය මට්ටම ඇති වෙළඳපොළ.

**අවදානම් වාරිකය** වත්කමක හෝ වගකීමක මුදල් ප්‍රවාහවල ආවේණික අවිනිශ්චිතතාවය අවදානමට නොකැමති වෙළඳපොළ සහභාගිවන්නන් දැරීම සඳහා ඉල්ලුම්කරන, වන්දිය / (හානිපූරණය) "අවදානම් ගැලපුම" ලෙසද හැඳින්වේ.

**ගනුදෙනු පිරිවැයන්** පහත සඳහන් නිර්ණායකයන් දෙකම ඉටුකරන සහ ප්‍රධාන (හෝ වඩාත්ම වාසිසහගත) වෙළඳපොළ තුළදී වත්කමක් බැහැර කිරීමේදී හෝ වගකීමක් පැවරීමේදී එම වත්කම හෝ වගකීම සඳහා ඍජුව ආරෝපණය වන වත්කම විකිණීමට හෝ වගකීම පැවරීමට වන පිරිවැයන්

(අ) ප්‍රතිඵලය ඍජුව ගනුදෙනුවෙන්ම එම ගනුදෙනුවට අත්‍යවශ්‍ය විය යුතුය.

(ආ) වත්කම විකිණීමට හෝ වගකීම පැවරීමට තීරණයක් නොගන්නේ නම් අස්තිත්වය විසින් ඒවා දැරිය යුතු නොවේ. (SLFRS 5 නිර්වචිත විකිණීම සඳහා වන පිරිවැය හා සමානව)

**ප්‍රවාහන පිරිවැයන්** වත්කමක් එහි ප්‍රවර්තන පිහිටීමේ සිට ප්‍රධාන (වඩාත් වාසිසහගත) වෙළඳපොළ දක්වා ප්‍රවාහනය කිරීමේදී දැරියයුතු වන පිරිවැයන්

**ගිණුම් ඒකකය** හඳුනාගැනීමේ අරමුණු සඳහා වත්කමක් හෝ වගකීමක් සමාහරණය කිරීම හෝ සමාහරණය ඉවත් කිරීම වන මට්ටම.

**නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම්** වත්කම හෝ වගකීම මිල කරන විට වෙළඳපොළ සහභාගිවන්නන් උපකල්පනයන් පිළිබඳව ලබාගැනීමට ඇති හොඳම තොරතුරු භාවිත කරමින් සංවර්ධනය කරන දේ සහ වෙළඳපොළ දත්ත නොමැති යෙදවුම්.

**ආ පරිශිෂ්ඨය**

**ව්‍යවහාරකරන මගපෙන්වීම්**

මෙම පරිශිෂ්ඨය මෙම SLFRS හි සංකලිත කොටසකි. එය 1 - 99 දක්වා වන ඡේද ව්‍යවහාරකරණය විස්තර කරන අතර, මෙම SLFRS හි වෙනත් කොටස්වල ඇති හා සමාන අධිකාරියක් ඇත.

ආ1. වෙනස් තක්සේරු අවස්ථාවන්හිදී ව්‍යවහාර කළ විනිශ්චයන් වෙනස්විය හැකිය. වෙනස් තක්සේරු අවස්ථාවන්හිදී අස්තිත්වයක් සාධාරණ අගය මැනීමේදී අදාළ කරගත හැකි විනිශ්චයන් මෙම පරිශිෂ්ඨය විස්තර කරයි.

**සාධාරණ අගය මැනීමේ ප්‍රවේශය**

ආ2 සාධාරණ අගය මැනීමේ පරමාර්ථය වනුයේ ප්‍රවර්තන වෙළඳපොළ තත්ත්වයන් යටතේ මනිනු ලබන දිනයේදී වෙළඳපොළ සහභාගිවන්නන් අතර සිදුවන විධිමත් ගනුදෙනුවකදී වත්කම විකිණීමට හෝ වගකීම පැවරීමට වියයුතු මිල ඇස්තමේන්තු කිරීමයි. සාධාරණ අගය මැනීමක් අස්තිත්වය පහත සඳහන් සියලුම දෑ නිර්ණය කිරීමක් අවශ්‍ය කෙරේ.

(අ) මැනීමට (එහි ගිණුම් ඒකකයට සංගතව) විෂය වන විශේෂ වත්කම හෝ වගකීම.

(ආ) මූල්‍ය නොවන වත්කමක් සඳහා මැනීම (සංගතව උසස්ම එහි සහ වඩාත් හොඳම භාවිතය) මැනීම සඳහා උචිතවන තක්සේරු පූර්වායවය.

(ඇ) වත්කම හෝ වගකීම සඳහා ප්‍රධාන (හෝ වඩාත් වාසිසහගත) වෙළඳපොළ

(ඈ) වත්කමක් හෝ වගකීමක් මිල කරන විට වෙළඳපොළ සහභාගිවන්නන් භාවිත කරනු ලැබිය හැකි උපකල්පන නියෝජනය කිරීමට සංවර්ධනය කළයුතු යෙදවුම් සඳහා ලබාගත හැකි දත්ත සලකා බලමින් සහ සාධාරණ අගය අනුපිළිවෙළේ යෙදවුම් වර්ගීකරණය ඇතුළත වන මට්ටම මැනීම සඳහා උචිතවන තක්සේරු ශිල්පක්‍රමය(ක්‍රම)

**මූල්‍ය නොවන වත්කම් සඳහා තක්සේරු කිරීමේ පූර්වායවය**

ආ3 වෙනත් වත්කම් සමග සමූහයක් ලෙස සංයෝජිතව (භාවිතය සඳහා ස්ථාපිත හෝ අන්වශයෙන් ආකෘති කරන ලද) හෝ වෙනත් වත්කම් සහ වගකීම් සමග සංයෝජිතව භාවිත කරන මූල්‍ය නොවන වත්කමක සාධාරණ අගය මැනීමේදී තක්සේරු කිරීමේ පූර්වායවය බලපෑම රඳා පවත්නේ තත්ත්වයන් මතය. උදාහරණයක් වශයෙන්

(අ) වත්කම වෙනස්ව පෙනෙන පදනම මත හෝ වෙනත් වත්කම් සමග සංයෝජනයක් ලෙස හෝ වෙනත් වත්කම් සහ වගකීම් සමග භාවිත කළද වත්කමේ සාධාරණ අගය එකම විය හැකිය. වත්කම වෙළඳපොළ සහභාගිවන්නන් දිගටම ක්‍රියාත්මක කරන ව්‍යාපාරයක් නම් එසේ විය හැකිය. එම අවස්ථාවේදී ගනුදෙනුව ව්‍යාපාරයේ මුලුමනින්ම ගෙන තක්සේරු කිරීමට සම්බන්ධ වියහැකිය. වත්කම් සමූහයක් වශයෙන් දිගටම පවත්නා ව්‍යාපාරයක භාවිත කිරීමෙන් සහ ක්‍රියාකාරකම් උපදවන අතර එය වෙළඳපොළ සහභාගිවන්නන් හට ලබාගත හැකිය. (උදා: එය වෙළඳපොළ සහභාගිවන්නන්ගේ සහක්‍රියාවන්, එම නිසා සහක්‍රියාවක් එක්කෝ වෙනස්ව පෙනෙන පදනම මත හෝ අනෙක් වත්කම් සමග හෝ අනෙක් වත්කම් හා වගකීම් සමග සංයෝජනයක් ලෙස වත්කමේ සාධාරණ අගයට බලපෑම් ඇතිවේ.)

(ආ) වෙනත් වත්කම් සමග හෝ වෙනත් වත්කම් හා වගකීම් සමග සංයෝජිතව භාවිත කරන වත්කමේ සාධාරණ අගය මැනීම ගැලපුමක් හරහා වෙනස්ව පෙනෙන පදනම මත භාවිත වන වත්කම්වල වටිනාකම්වලට සංයුක්ත කළ හැකිය. එය අවස්ථාවක් වියහැක්කේ වත්කම යන්ත්‍රයක් නම් සාධාරණ අගය නිර්ණය කරනුයේ ප්‍රවාහන සහ සවිකිරීමේ පිරිවැයට ගැලපුම් කළ ඒ හා සමාන යන්ත්‍රයක (සවි නොකළ සහ අන්වශයෙන් භාවිතයට ආකෘතිමය නොකළ) නිරීක්ෂණය කළ මිල භාවිත කිරීමෙන් නම් එසේ ඒ විධියට සාධාරණ අගය මැනීමෙන් පිළිබිඹු වන්නේ යන්ත්‍රයේ ප්‍රවර්තන තත්ත්වයන් එහි පිහිටීමත්ය.

(ඇ) වෙනත් වත්කම් සමග හෝ වෙනත් වත්කම් හා වගකීම් සමග සංයෝජිතව වත්කමේ භාවිතය වත්කමේ සාධාරණ අගය මැනීමට වෙළඳපොළ සහභාගිවන්නන් භාවිත කළ උපකල්පනයන් මගින් සාධාරණ අගය මැනීමට සංයුක්ත කළහැකිය. උදාහරණ වශයෙන් සර්වසම වත්කම නොනිමි වැඩ තත්ත්වයේ වනවිට, වෙළඳපොළ සහභාගිවන්නන් නොනිමි වැඩ නිමි භාණ්ඩ බවට පරිවර්තනය කිරීමේදී වෙළඳපොළ සහභාගිවන්නන් තොග නිමි භාණ්ඩ බවට පරිවර්තනය කිරීමට අවශ්‍ය විශේෂ හැකියාවක් ඇති යන්ත්‍රයක් අත්කර ගෙන හෝ අත්කර ගන්නා බවට සාධාරණ අගය මැනීම උපකල්පනය කළ හැකිය.

(ඈ) වෙනත් වත්කමක් සමග හෝ වෙනත් වත්කම් සහ වගකීම් සමග වත්කමක භාවිතය වත්කමේ සාධාරණ අගය මැනීමට භාවිත කළ තක්සේරු ශිල්පක්‍රමයට සංයුක්ත කළ හැකිය. එවැනි අවස්ථාවක් විය හැක්කේ අස්පෘශ්‍ය වත්කමක සාධාරණ අගය මැනීමට බහු-කාලපරිච්ඡේද අතිරික්ත ඉපයීම් ක්‍රමය භාවිත කරනවිට එම තක්සේරු ශිල්ප ක්‍රමය විශේෂිතව යම් අනුපූරක වත්කම්වල සහභාගය සැලකිල්ලටගෙන සහ සමූහයේ වන ආශ්‍රිත වගකීම් එවැනි අන්දමේ අස්පෘශ්‍ය වත්කමක් භාවිත කරන නිසාය.

(ඉ) වඩාත් සීමිත අවස්ථාවන්හිදී අස්තිත්වයක් වත්කමක් වත්කම් සමූහයක් ඇතුළත භාවිත කරනවිට අස්තිත්වය අස්තිත්වයේ වත්කම් සමූහයේ සාධාරණ අගය සමූහයේ තනි තනි වත්කම්වලට වෙන් කරන විට සාධාරණ අගයේ වටිනාකම ආසන්නතම වන වටිනාකමට අස්තිත්වය වත්කම මැනිය හැකිය. මේ සඳහා අවස්ථාව වියහැක්කේ තක්සේරු කිරීම නිශ්චල දේපළ තක්සේරු කිරීමට සම්බන්ධ වන්නේ නම් සහ වැඩිදියුණු කළ දේපළ (උදාඃ වත්කම් සමූහය) වල සාධාරණ අගයඑහි වත්කම්වල සංරචකයන්ට (ඉඩම් සහ වැඩිදියුණු කිරීම් වැනි) වෙන්කරන විටය.

**මූලික හඳුනාගැනීමේදී සාධාරණ අගය (57 - 60 ඡේද)**

ආ4. මූලික හඳුනාගැනීමේදී සාධාරණ අගය ගනුදෙනුවල මිලට සමාන දැයි නිර්ණය කිරීමේදී අස්තිත්වය විසින් ගනුදෙනුවට සහ වත්කම හෝ වගකීම වෙන්වූ විශේෂිත සාධක සැලකිල්ලට ගත යුතුය. උදාහරණ වශයෙන් මූලික හඳුනාගැනීමේ පහත සඳහන් තත්ත්වයන්ගෙන් එකක් හෝ පවතීනම් ගනුදෙනුවක මිල වත්කමේ හෝ වගකීමේ සාධාරණ අගය නියෝජනය විය නොහැකිය.

(අ) ගනුදෙනුව සම්බන්ධිත පාර්ශ්වයන් අතරේය. සාධාරණ අගය මැනීමට යෙදවුමක් ලෙස සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනුවක මිල භාවිත කළ හැකි නමුත් ගනුදෙනුවට ඇතුළත් වූයේ වෙළඳපොළ කොන්දේසි නිසා යයි අස්තිත්වයට සාක්ෂි තිබේ නම්,

(ආ) සංත්‍රාසනය යටතේ හෝ ගනුදෙනුවේ මිල පිළිගැනීමට විකුණුම්කරුට බලකිරීම යටතේ ගනුදෙනුව සිදුවීම. මේ අවස්ථාව සඳහා උදාහරණයක් වියහැක්කේ විකුණුම් කරු මූල්‍ය දුෂ්කරතා අත්විඳින්නේ නම්ය.

(ඇ) ගනුදෙනු වූ මිල මගින් නියෝජනය වන ගිණුම් ඒකකය, සාධාරණ අගයට මනින ලද වත්කම හෝ වගකීම සඳහා වන ගිණුම් ඒකකයන් වෙනස්වීම. උදාහරණයක් වශයෙන් ඒ සඳහා අවස්ථාව වියහැක්කේ සාධාරණ අගයට මනින වත්කම හෝ වගකීම ගනුදෙනුවේ එකම මූලිකාංගයක් වන්නේ නම් (උදාඃ ව්‍යාපාර සංයෝජනයකදී) ගනුදෙනුවට වෙනත් SLFRS මගින් වෙනම මනිනු ලබන සඳහන් නොකළ හිමිකම් සහ වරප්‍රසාද සහ ගනුදෙනු වූ මිලට ගනුදෙනු පිරිවැය ඇතුළත් වීම.

(ඈ) ගනුදෙනුව සිදුවන වෙළඳපොළ ප්‍රධාන (හෝ වඩාත් වාසිසහගත) වෙළඳපොළෙන් වෙනස් වේ. සිල්ලර වෙළඳපොළ ගනුදෙනුකරුවන් ගනුදෙනුවලට ඇතුල්වන ගනුදෙනු කරන්නා අස්තිත්වය නම් එම වෙළඳපොළ වෙනස් විය හැකිය. එහෙත් ඉවත්වීමේ ගනුදෙනු සඳහා ප්‍රධාන (වඩාත් වාසිසහගත) වෙළඳපොළ ගනුදෙනු කරන්නන්ගේ වෙළඳපොළේ වෙනත් ගනුදෙනු කරන්නන් සමගය.

**තක්සේරු කිරීමේ ශිල්පක්‍රමයන් (61 - 66 ඡේදයන්)**

**වෙළඳපොළ ප්‍රවේශය**

ආ5. සර්වසම හෝ සැසඳිය හැකි (උදාඃ එක හා සමාන) වත්කම් වගකීම් හෝ ව්‍යාපාරයන් වැනි වත්කම් සහ වගකීම් සමූහයක් මගින් වෙළඳපොළ ගනුදෙනු සම්බන්ධ වීමෙන් ජනනය වන මිල ගණන් සහ අදාළ වෙනත් තොරතුරු වෙළඳපොළ ප්‍රවේශය භාවිතා කරයි.

ආ6. උදාහරණ වශයෙන් වෙළඳපොළ ප්‍රවේශය සමග සංගතවන තක්සේරු ශිල්ප ක්‍රමයක් සැසඳිය හැකි කට්ටලයකින් උපදවා ගන්නා වෙළඳපොළ ගුණකයන් බොහෝවිට භාවිත කරයි. එක් එක් සැසඳීමකට වෙනස් ගුණකයක් සමග වන පරාස වල ගුණකයන් තිබිය හැකිය. මැනීමට විශේෂිත වූ ගුණාත්මක සහ ප්‍රමාණාත්මක සාධක සැලකිල්ලට ගෙන පරාසය ඇතුළත වන උචිත ගුණකය තෝරාගැනීමට විචාර බුද්ධිය අවශ්‍ය වේ.

ආ7. වෙළඳපොළ සමග සංගත වන තක්සේරු කිරීමේ ක්‍රමවලට න්‍යාස මිල කිරීමේ ක්‍රමය ඇතුළත්වේ. න්‍යාස මිල කිරීම ප්‍රධාන වශයෙන් සමහර වර්ගවල මූල්‍ය සාධන පත්‍ර මිල කිරීමට භාවිත කරන ගණිතමය ශිල්ප ක්‍රමයකි. එය ණය සුරැකුම්පත්වැනි වූ නිශ්චිත සුරැකුම්පත් සඳහා ප්‍රකාශිත මිල මත අනන්‍ය ලෙස විශ්වාසය නොතබා එහෙත් ඒ වෙනුවට සුරැකුම්පතේ සම්බන්ධතාවය වෙනත් පාදක මිමි ප්‍රකාශිත සුරැකුම්පත් මත විශ්වාසය තබා මිළ කරයි.

**පිරිවැය ප්‍රවේශය**

ආ8. වත්කමක සේවාධාරිතාව (වර්තමාන ප්‍රතිසම්පාදන පිරිවැය ලෙස බොහෝවිට හැඳින්වෙන) ප්‍රතිසම්පාදනය කිරීමට වර්තමානයේදී අවශ්‍ය වියහැකි වටිනාකම පිරිවැය ප්‍රවේශයෙන් පිළිබිඹු වේ.

ආ9. වෙළඳපොළ සහභාගිවන විකුණන්නෙකුගේ සාපේක්ෂ වැදගත්කම පැත්තෙන් ගත්කළ වත්කම සඳහා ලැබියයුතු මිල පදනම් වන්නේ, වෙළඳපොළ සහභාගිවන ගැනුම්කරුට ඒ හා සමාන උපයෝගිතාවයක් ඇති වත්කමක් අත්පත් කරගැනීමට හෝ ආදේශ වත්කමත් තැනීමට වන පිරිවැයෙන් භාවිතයෙන් ගිලීයාම සඳහා ගැලපුම් කළ පිරිවැය මතය. එයඑසේ වන්නේ වෙළඳපොළ සහභාගිවන ගැනුම්කරු එම වත්කමේ සේවාධාරිතාව ප්‍රතිසම්පාදනය කිරීමට වන වටිනාකමට වඩා වත්කමට නොගෙවිය හැකි නිසාය.

භෞතිකව පිරිහීම, කාර්ය බද්ධ (තාක්ෂණික) භාවිතයෙන් ගිලිහීයාම, සහ ආර්ථික (බාහිර) භාවිතයෙන් ගිලිහීයාම සහ මූල්‍ය වාර්තා කරන අරමුණු (ඓතිහාසික පිරිවැය වෙන්කිරීම) හෝ බදු අරමුණු සඳහා (නිශ්චය කරනු ලබන සේවා ජීවකාලයක් භාවිත කරමින්) එය කිරීමට වඩා පුළුල් දෙයක් භාවිතයෙන් ගිලීයාම ආවරණය කරයි. අනෙක් වත්කම් සමග හෝ අනෙක් වත්කම් හා වගකීම් සමග සංයෝජිතව භාවිත කරන ස්පෘශ්‍ය වත්කම්වල සාධාරණ අගය මැනීමට බොහෝ අවස්ථාවලදී වර්තමාන ප්‍රතිසම්පාදන පිරිවැය ක්‍රමය භාවිත කෙරේ.

**ආදායම් ප්‍රවේශය**

ආ10. ආදායම් ප්‍රවේශය අනාගත වටිනාකම් (උදා: මුදල් ප්‍රවාහ හෝ ආදායම් සහ වියදම්) තනි වර්තමාන (උදා: වට්ටම් කළ) වටිනාකමකට පරිවර්තනය කරයි. ආදායම් ප්‍රවේශය භාවිත කරනවිට සාධාරණ අගය මැනීම එම අනාගත වටිනාකම්වල වර්තමාන වෙළඳපොළ අපේක්ෂාවක් පිළිබිඹු වේ.

ආ11. උදාහරණ වශයෙන් එම තක්සේරු ශිල්පක්‍රමවලට පහත දෑ ඇතුළත් වේ.

(අ) වර්තමාන අගය ශිල්පක්‍රමය (ආ12- ආ30 ඡේද බලන්න)

(ආ) විකල්පයක වර්තමාන අගය ශිල්පක්‍රමය සංයුක්ත කරන සහ කාල අගය සහ නෛසර්ගික අගය යන දෙකම පිළිබිඹු වන බ්ලැක්-ස්ෂෝල්ස්-මර්ටන් (Black-Scholes-Merton) සූත්‍රය හෝ ද්විපද ආකෘතිය (එනම් ලැටිස් - lattice ආදර්ශය) වැනි විකල්ප මිල කිරීමේ ආකෘතීන් සහ

(ඇ) සමහර අස්පෘශ්‍ය වත්කම් වල සාධාරණ අගය මැනීම සඳහා භාවිත කරන බහු-කාලපරිච්ඡේද අතිරික්ත ඉපයීම් ක්‍රමය.

**වර්තමාන අගය ශිල්ප ක්‍රමය**

ආ12. සාධාරණ අගය මැනීමට වර්තමාන අගය ශිල්පක්‍රමය භාවිත කිරීම ආ13 - ආ30 ඡේද විස්තර කරයි. එම ඡේද වට්ටම් අනුපාතික ගැලපුම් ශිල්පක්‍රමය සහ අපේක්ෂිත මුදල් ප්‍රවාහ (අපේක්ෂිත වර්තමාන අගය) ශිල්පක්‍රමය පිළිබඳව අවධානය කරයි. එම ඡේදයන් තනි නිශ්චිත වර්තමාන අගය ශිල්පක්‍රමයක් භාවිත කිරීම හෝ සාකච්ඡා කළ ශිල්පක්‍රමවල සාධාරන අගය මැනීමට වර්තමාන අගය ශිල්පක්‍රමය භාවිත කිරීම සීමාකිරීමද නියම කරයි. සාධාරණ අගය මැනීමට භාවිත කළ වර්තමාන අගය ශිල්පක්‍රමය රඳා පවත්නේ මනිනු ලබන වත්කමේ හෝ වගකීමට නිශ්චිත වූ කරුණු සහ තත්ත්වයන් සංසන්දනය කළහැකි වත්කම් සහ වගකීම් වල මිල වෙළඳපොළෙන් ලබාගත හැකිද සහ ප්‍රමාණවත් දත්ත ලබාගැනීමේ හැකියාව මතය.

**වර්තමාන අගය මැනීමේ සංරචකයන්**

ආ13. වට්ටම් අනුපාතිකයක් භාවිත කර අනාගත වටිනාකම් වර්තමාන වටිනාකම්වලට (උදා: මුදල් ප්‍රවාහයන් හෝ වටිනාකම්වලට) ඈඳීමට භාවිතා කරන මෙවලමකි. වර්තමාන අගය (උදා: ආදායම් ප්‍රවේශය ව්‍යවහාරකරනයෙන්) වර්තමාන අගය ශිල්ප ක්‍රමය භාවිත කර වත්කමක හෝ වගකීමක වර්තමාන අගය මැනීම, මැනීම කරන දින වෙළඳපොළ සහභාගිවන්නන්ගේ සාපේක්ෂ වැදගත්කම පැත්තෙන් ගත්කළ පහත සඳහන් සියලුම මූලිකාංගයන් නිරූපණය කරයි.

(අ) මනිනු ලබන වත්කම් හෝ වගකීම් සඳහා අනාගත මුදල් ප්‍රවාහවල ඇස්තමේන්තුවක්.

(ආ) මුදල් ප්‍රවාහවල ආවේණික අවිනිශ්චිතතාවයන් නියෝජනය කරමින්, මුදල් ප්‍රවාහවල වටිනාකම සහ කාලනිර්ණය පිළිබඳ වෙනස්වීම්වල අපේක්ෂාවන්.

(ඇ) කාලය යන්නෙහි අස්ථිරතාවක් නොවන පැහැර හැරීම පිළිබඳ අවදානමක් දරන්නාට නොමැති වන (උදාඃ අවදානම් රහිත පොලී අනුපාතිකයක්) වේශයක් මවාපාන මුදල් ප්‍රවාහ මගින් ආවරණය වන කාලපරිච්ඡේදය සමග සමපාත ලෙස පවතින කාලය හෝ පරිණත දිනයක් ඇති අවදානම් රහිත පොලී අනුපාතිකයක් නියෝජනය කරන මූල්‍ය වත්කම්වල මුදලේ කාල වටිනාකම

(ඈ) මුදල් ප්‍රවාහවල පවතින ආවේණික අවිනිශ්චිතතාවය දැරීම සඳහා මිල (උදාඃ අවදානම් වාරිකයක්)

(ඉ) තත්ත්වයන් යටතේ වෙළඳපොළ සහභාගි වන්නන් සැලකිල්ලට ගන්නා වෙනත් සාධක

(ඊ) වගකීමක් සඳහා, අස්තිත්වයේ (අනුග්‍රහය දක්වන්නා) ස්වකීය ණය අවදානමද ඇතුළුව එම වගකීමට සම්බන්ධ කාර්යඵල නොමැති අවදානම

*පොදු මූලධර්ම*

ආ14. ආ13 ඡේදයේ මූලිකාංගයන් ඔවුන් නිරූපණය කරන්නේ කෙසේද යන්න කෙරෙහි වර්තමාන අගය ශිල්පක්‍රමය එකඟ නොවේ. කෙසේ වෙතත් සාධාරණ අගය මැනීම සඳහා භාවිතාකරන ඕනෑම සාධාරණ අගය මැනීමේ ශිල්පක්‍රමයකට පහත සඳහන් සියලුම පොදු මූලධර්ම ව්‍යවහාරකරණය බලපායි.

(අ) වත්කමක් හෝ වගකීමක් මිලකරන විට වෙළඳපොළ සහභාගීවන්නන් විසින් භාවිත කරන උපකල්පනයන් මුදල් ප්‍රවාහයන්ගෙන් සහ වට්ටම් අනුපාතික වලින් පිළිබිඹු විය යුතුය.

(ආ) මනිනු ලබන වත්කමට හෝ වගකීමට ආරෝපණය වියහැකි සාධක පමණක් මුදල් ප්‍රවාහයන් සහ වට්ටම් අනුපාතික සැලකිල්ලට ගතයුතුය.

(ඇ) අවදානම් සාධකයන්ගේ බලපෑම ද්වි ගණනය හෝ අත්හැරීම වැළැක්වීමට මුදල් ප්‍රවාහ තුළ ආවේණික වන එම උපකල්පනයන් වට්ටම් අනුපාතිකයෙන් පිළිබිඹු විය යුතුය. ණයක ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් භාවිත කරන්නේ නම් (උදාඃ වට්ටම් අනුපාතිකය ගැළපුම් කිරීම් ශිල්පක්‍රමය) අනාගත පැහැර හැරීම්වල අපේක්ෂිත අවිනිශ්චිතභාවය පිළිබිඹු වන වට්ටම අනුපාතිකය උචිත වේ. අපේක්ෂිත (උදාඃ බරතැබූ - සම්භාව්‍යතා) මුදල් ප්‍රවාහ (අපේක්ෂිත වර්තමාන අගය ශිල්ප ක්‍රමයක්) එම අනුපාතිකයම යොදානොගත යුතුය. එයට හේතුවන්නේ අපේක්ෂිත මුදල් ප්‍රවාහවල දැනටමත් අනාගත පැහැරහැරීම්වල අවිනිශ්චිතතාවය පිළිබිඹුවන නිසාය. ඒ වෙනුවට අපේක්ෂිත මුදල් ප්‍රවාහවල ආවේණික අවදානම සමග ප්‍රමාණයෙන් සහ අනුපාතිකයෙන් අනුරූපීවන වට්ටම් අනුපාතිකයක් යොදාගත යුතුය.

(ඈ) මුදල් ප්‍රවාහ සහ වට්ටම් අනුපාතික පිළිබඳව උපකල්පනයන් අභ්‍යන්තරව සංගත විය යුතුය. උදාහරණ වශයෙන් උද්ධමනයේ බලපෑම ඇතුළත්වන නාමමාත්‍ර මුදල් ප්‍රවාහ උද්ධමනයේ බලපෑම ඇතුළත් අනුපාතිකයකින් වට්ටම් කළ යුතුය. නාමමාත්‍ර අවදානම්- රහිත පොලී අනුපාතිකය උද්ධමනයේ බලපෑම ඇතුළත් වේ. උද්ධමනයේ බලපෑම රහිත මුදල් ප්‍රවාහයන් වට්ටම් කළ යුතුවන්නේ උද්ධමනයේ බලපෑම රහිත මුදල් ප්‍රවාහයන් වට්ටම් කළ යුතු වන්නේ උද්ධමනයේ බලපෑම රහිත අනුපාතිකයෙනි. ඒ හා සමානව බදුවලට පසු මුදල් ප්‍රවාහ වට්ටම් කළයුත්තේ බදුවලට පසු අනුපාතිකයෙනි. බදුවලට පෙර මුදල් ප්‍රවාහයන් වට්ටම් කළ යුත්තේ එම මුදල් ප්‍රවාහයන් සමග සංගත වන අනුපාතිකයෙනි.

(ඉ) මුදල් ප්‍රවාහයන් නම් කරන ලද ව්‍යවහාර මුදල පාදක කරගත් ආර්ථික සාධක සමග වට්ටම් අනුපාතික සංගත වියයුතුය.

*අවදානම සහ අවිනිශ්චිතතාවය*

ආ15. වර්තමාන අගය ශිල්පක්‍රමය භාවිත කරමින් සාධාරණ අගය මැනීම කරනුයේ අවිනිශ්චිතතාවය පිළිබඳ කොන්දේසි යටතේය. එසේවන්නේ භාවිත කරන මුදල් ප්‍රවාහයන් ඇස්තමේන්තු කළ මිස දන්නා වටිනාකම් නොවන නිසාය. බොහෝ අවස්ථාවලදී මුදල් ප්‍රවාහවල වටිනාකම සහ කාල නිර්ණය යන දෙකම අවිනිශ්චිතය. පැහැර හැරීම් පිළිබඳ අවදානමක් තිබේනම් ණයක් ආපසු ගෙවීම වැනි ගිවිසුම්ගත ස්ථාවර වටිනාකම් ඒවා අවිනිශ්චිතය.

ආ16. වත්කමක හෝ වගකීමක මුදල් ප්‍රවාහවල ආවේණිකවූ අවිනිශ්චිතතාවය දැරීම වෙනුවෙන් සාමාන්‍යයෙන් වෙළඳපොළ සහභාගිත්වන්නන් හානිපූර්ණයක් (උදාඃ අවදානම් වාරිකයන්) ඉල්ලයි. මුදල් ප්‍රවාහවල ආවේණික වන අවිනිශ්චිතතාවය සඳහා හානිපූර්ණයන් වශයෙන් වෙළඳපොළ සහභාගී වන්නන් ඉල්ලුම්කළ හැකිවටිනාකම පිළිබිඹු වන පරිදි අවදානම් වාරිකයන් සාධාරණ අගය මැනීමට ඇතුළත් කළ යුතුය. සමහර අවස්ථාවලදී උචිත අවදානම් වාරිකයක් නිර්ණය කිරීම අපහසු විය හැකිය. කෙසේ වෙතත් අපහසුතාවයේ මට්ටම පමණක්ම අවදානම් වාරිකයක් බැහැර කිරීමට ප්‍රමාණවත් හේතුවක් නොවේ.

ආ17. අවදානම් සඳහා උචිත ආකාරයෙන් ඔවුන් සකස්වන්නේ කෙසේද සහ ඔවුන් භාවිත කරන මුදල් ප්‍රවාහ වර්ග අනුව වර්තමාන ඇගයීමේ ශිල්ප ක්‍රම වෙනස් වේ. උදාහරණයක් වශයෙන්

(අ) වට්ටම් අනුපාතික ගැළපුම් ශිල්ප ක්‍රමය (ආ 18 ආ22 ඡේදයන් බලන්න) අවදානම් - ගැළපුම් කල වට්ටම් අනුපාතිකයන් සහ ගිවිසුම්ගත. පොරොන්දු වූ හෝ වඩාත්ම වියහැකි මුදල් ප්‍රවාහයන් භාවිත කරයි.

(ආ) අපේක්ෂිත වර්තමාන අගය ශිල්පක්‍රමයේ 1වන ක්‍රමයෙන් (ආ25 ඡේදය බලන්න). අවදානම්- ගැලපුම් අපේක්ෂිත මුදල් ප්‍රවාහයන් සහ අවදානම් රහිත අනුපාතිකයක් භාවිත කරයි.

(ඇ) අපේක්ෂිත වර්තමාන අගය ශිල්පක්‍රමයේ 2වන ක්‍රමයෙන් (ආ26 ඡේදය බලන්න) අවදානමට ගැලපුම් නොකළ අපේක්ෂිත මුදල් ප්‍රවාහයන් සහ වෙළඳපොළ සහභාගිවන්නන්ට අවශ්‍ය කරන අවදානම් වාරිකයක් ඇතුළු කිරීමට ගැළපුම් කළ වට්ටම් අනුපාතිකයක් භාවිත කරයි. එම අනුපාතිකය වට්ටම් අනුපාතික ගැළපුම් ශිල්පක්‍රමය සඳහා භාවිතා කළ අනුපාතිකයෙන් වෙනස් වේ.

**වට්ටම් අනුපාතික ගැළපුම් ශිල්පක්‍රමය**

ආ18. ගිවිසුම්ගත, පොරොන්දු වූ (බැඳුම්කරයක් වන අවස්ථාවකදී) බොහෝදුරට වියහැකි හෝ වූවත්, වට්ටම් අනුපාතික ගැළපුම් ශිල්පක්‍රමය වියහැකි ඇස්තමේන්තු කළ වටිනාකම් පරාසයකින් එක් තනි මුදල් ප්‍රවාහ කට්ටලයක් භාවිත කරයි. මෙම සියලුම අවස්ථාවලදී එම මුදල් ප්‍රවාහ නිශ්චය කරන ලද සිදුවීමක් සිදුවීම අනුව කොන්දේසියක් මත රඳාන ඒවාය. (බැඳුම්කරයක් සඳහා වූ ගිවිසගත් හෝ පොරොන්දු වූ මුදල් ප්‍රවාහයන් ණයගැතියා පැහැර හැරීම් නොකරනු ඇතැයි යන සිද්ධිය අනුව වන කොන්දේසි මත වේ.) වට්ටම් අනුපාතික ගැළපුම් ශිල්පක්‍රමය භාවිත කරන වට්ටම් අනුපාතික ලබාගන්නේ වෙළඳපොළේ විකිණෙන සැසඳීම් කළහැකි වත්කම් හෝ වගකීම් සඳහා නිරීක්ෂණය කළ ප්‍රතිලාභ අනුපාතික වලිනි. ඒ අනුව ගිවිසුම්ගත, පොරොන්දු වූ හෝ බොහෝදුරට වියහැකි මුදල් ප්‍රවාහ, එවැනි කොන්දේසි සහිත මුදල් ප්‍රවාහ (උදා: වෙළඳපොළ ප්‍රතිලාභ අනුපාතිකය) නිරීක්ෂණය කළ හෝ ඇස්තමේන්තුකළ අනුපාතිකයකින් වට්ටම් කරනු ලැබේ.

ආ19. සංසන්දනය කළහැකි වත්කම් සහ වගකීම් සඳහා වෙළඳපොළ දත්ත විශ්ලේෂණය කිරීමක් වට්ටම් අනුපාතික ගැළපුම් ශිල්ප ක්‍රමය සඳහා අවශ්‍ය වේ. සංසන්දනාත්මකභාවය පිහිටුවන්නේ මුදල් ප්‍රවාහ වල ස්වභාවය (මුදල් ප්‍රවාහයන් ගිවිසුම්ගතද හෝ ගිවිසුම්ගත නොවන්නේද ආර්ථික තත්ත්වයන්ගේ වෙනස්වීම්වලට සමාන ලෙස ප්‍රතිචාර දැක්වීම වියහැකි බව) මෙන්ම වෙනත් සාධකයන් සලකා බැලීමෙනි. (ණයවල තත්ත්වය, අතිරේක ඇප, කාලසීමාව, සීමාකාරී ප්‍රඥප්ති සහ ද්‍රවශීලතාවය) විකල්ප වශයෙන් තනි සංසන්දනය කළහැකි වත්කමක හෝ වගකීමක මනිනු ලබන වත්කමේ හෝ වගකීමේ ආවේණික වූ අවදානම සාධාරණව පිළිබිඹු නොවන්නේ නම්, සංසන්දනය කළහැකි බොහෝ වත්කම් හෝ වගකීම්වල දත්ත භාවිත කර අවදානම් රහිත ඵලදා වක්‍රයක් ගොඩනැගීමේ ප්‍රවේශය භාවිත කර) හා එකට බැඳුන වට්ටම් අනුපාතිකයක් ලබාගැනීමේ හැකියාව විය හැකිය.

ආ20. ගොඩනැගීමේ ප්‍රවේශය නිදර්ශනාත්මකව පැහැදිලි කරදීමට, A යනු එක අවුරුද්දකදී රු. 800)* ලැබීමට ගිවිසුම්ගත අයිතියක් ඇති වත්කමක් බව උපකල්පනය කරන්න. (උදා: කාලනිර්ණය පිළිබඳව අවිනිශ්චිතතාවයක් නොමැත) සංසන්දනය කළහැකි වත්කම් සඳහා පිහිටුවාගත් වෙළඳපොළක් ඇති අතර එම වත්කම් මිල පිළිබඳ තොරතුරු ඇතුළත් තොරතුරු ලබාගත හැකිය. එම සංසන්දනය කළහැකි වත්කම් වලින්

(අ) වෙළඳපොළ මිල රු. 1,083 ක් වන වත්කම් B අවුරුදු එකකදී රු. 1,200 ලැබීමට වන ගිවිසුම්ගත අයිතියකි. ඒ අනුව ගම්‍ය වාර්ෂික ඵලදා අනුපාතිකය (උදා: එක් අවුරුද්දක වෙළඳපොළ ඵලදා අනුපාතිකය) සියයට 10.8 කි. [(රු. 1,200 / රු. 1,083)-1]

(ආ) වෙළඳපොළ මිල රු. 566 ක් වන වත්කම් C (අවුරුදු දෙකකදී රු. 700 ලැබීමට වන ගිවිසුම්ගත අයිතියකි. ඒ අනුව ගම්‍ය වාර්ෂික ඵලදා අනුපාතිකය (උදා: අවුරුදු දෙකක ඵලදා අනුපාතිකය) සියයට 11.2 කි. [(රු. 700 / රු. 566) 0.5-1]

(ඇ) අවදානම පැත්තෙන් සියළු වත්කම් තුනම සංසන්දනය කළ හැකිය. (උදා: වියහැකි සසම්භාව්‍ය ගෙවීම් සහ ණයවල අපකිරණය)

* මෙම SLFRS මූල්‍ය, වටිනාකම් නම් කරනුයේ "ව්‍යවහාර මුදල් ඒකක (රු.) වශයෙනි.

ආ21. වත්කම් B සහ C කාල නිර්ණයට (වත්කම් B හි අවුරුදු එකකට එරෙහිව වත්කම් C සඳහා අවුරුදු දෙකක්) සාපේක්ෂව වත්කම් A සඳහා ලැබියයුතු ගිවිසුම්ගත කාල නිර්ණය පදනම මත වත්කම් B වඩාත්ම වත්කම් A සමග සැසඳිය හැකි බව සැලකේ. වත්කම් A (රු. 800) සඳහා ලැබියයුතු ගිවිසුම්ගත ගෙවීම සහ වත්කම් B (10.8%) සඳහා ලබාගත් එක අවුරුද්දක වෙළඳපොළ අනුපාතිකය භාවිත කරමින් වත්කම් A සඳහා වන සාධාරණ අගය රු. 722 කි. (රු. 800 / 1.108). විකල්පයක් වශයෙන් වත්කම් B සඳහා වෙළඳපොළ තොරතුරු නොමැතිකම නිසා ගොඩනැගීමේ - ප්‍රවේශය භාවිත කරමින් වත්කම් C සඳහා අවුරුදු එකක වෙළඳපොළ අනුපාතිකය ලබාගත හැකිය. එම අවස්ථාවේදී වත්කම් C මගින් දක්වන අවුරුදු දෙකක වෙළඳපොළ අනුපාතිකය (11.2%) අවදානම් රහිත ඵලදා වක්‍රයේ කාලසීමා ව්‍යුහය භාවිත කරමින් එක් අවුරුදු අනුපාතිකයකට ගැළපුම්කළ හැකිය. අවුරුදු එකක සහ අවුරුදු දෙකක වත්කම් සඳහා අවදානම් වාරිකයන් එක සමානදැයි නිර්ණය කිරීම සඳහා අතිරේක තොරතුරු සහ විශ්ලේෂණයක් අවශ්‍යවිය හැකිය. එක් අවුරුද්දක සහ අවුරුදු දෙකක අවදානම් වාරික එකහා සමාන නොවේයයි නිර්ණය කරන්නේ නම් අවුරුදු දෙකක වෙළඳපොළ ඵලදා අනුපාතිකය එම බලපෑම සඳහා තවදුරටත් ගැලපුම්කළ යුතුය.

ආ22. වට්ටම් අනුපාතික ගැලපුම් ශිල්ප ක්‍රමය ස්ථාවර ලැබීම් හෝ ගෙවීම්වලට ව්‍යවහාර කරනවිට මනින ලබන වත්කමේ හෝ වගකීමේ මුදල් ප්‍රවාහවල ආවේණිකවන අවදානම සඳහාවන ගැලපුම වට්ටම් අනුපාතිකයේ ඇතුලත් වේ. සමහර ව්‍යවහාර කරන වලදී ස්ථාවර ගෙවීම් ලැබීම් නොවන මුදල් ප්‍රවාහවලට වට්ටම් අනුපාතික ගැලපුම් ශිල්ප ක්‍රමයට, නිරීක්ෂණය කළ වත්කම් වලින් හෝ වගකීම්වලින් ලබාගත් වට්ටම් අනුපාතිකය සමග සංසන්දනය කිරීමේ කාර්යය ඉෂ්ඨකර ගැනීම සඳහා මුදල් ප්‍රවාහවලට ගැලපුමක් කිරීම අවශ්‍ය විය හැකිය.

**අපේක්ෂිත වර්තමාන අගය ශිල්පක්‍රමය**

ආ23. අපේක්ෂිත වර්තමාන අගය ශිල්ප ක්‍රමය ආරම්භක තැනක් වශයෙන් සියලුම වියහැකි මුදල් ප්‍රවාහයන්ගේ (අපේක්ෂිත මුදල් ප්‍රවාහයන්) හරිත සම්භාව්‍යතා සාමාන්‍ය දක්වෙන මුදල්ප්‍රවාහ කට්ටලයක් භාවිත කරයි. ප්‍රතිඵලයක් වන ඇස්තමේන්තුව අපේක්ෂිත අගයට සර්ව සම වේ. සංඛ්‍යාලේඛණාත්මක භාෂිතය අනුව බර වශයෙන් අදාළ සම්භාව්‍යතාවය සමග එය වියයුතු සසම්භාවී විචල්‍යන් වියහැකි වටිනාකම්වල බැරතැබූ සාමාන්‍යයයි. සියලුම මුදල් ප්‍රවාහයන් හරිත සම්භාව්‍යතා නිසා ප්‍රතිඵලයක් වන අපේක්ෂිත මුදල් ප්‍රවාහ යම් නිශ්චිත සිද්ධියක් සිදුවීම උඩ කොන්දේසි සහිත නොවේ.

ආ24. ආයෝජන තීරණයක් ගැනීමේදී අවදානමට අකමැති වෙළඳපොළ සහභාගිවන්නෙක් තත්‍ය මුදල් ප්‍රවාහ අපේක්ෂිත මුදල් ප්‍රවාහවලින් වෙනස් විය හැකි වීමේ අවදානම සැලකිල්ලට ගනී. කළඹ න්‍යාය අවදානම් වර්ග දෙක අතර එකිනෙක වෙන්කොට හඳුනා දක්වයි.

(අ) ක්‍රමානුකුල නොවන (විවිධාංගිකරණය කළ හැකි) අවදානම මෙය විශේෂ වත්කමකට හෝ වගකීමකට විශේෂිත වූ අවදානමකි.

(ආ) ක්‍රමානුකුල (විවිධාංගිකරණය කළ නොහැකි) අවදානම මෙය පොදු අවදානමක් වන අතර වත්කම හෝ වගකීම විවිධාංගීකරණය කළ කළඹේ අන් අයිතමයන් සමග බෙදාගනී. කළඹ න්‍යාය දරන්නේ සමතුලිතව ඇති වෙළඳපොළකය. මුදල් ප්‍රවාහවල ක්‍රමානුකුල අවදානම දැරීම සඳහා පමනක් වෙළඳපොළ සහභාගිවන්නන් හානිපූරණය කරනු ලැබේ. (අකාර්යක්ෂම හෝ සමතුලිතතාවයෙන් පිටත වන වෙළඳපොළවල් සඳහා වෙනස් ස්වභාවයේ ප්‍රතිලාභ හෝ හානිපූරණ ලබාගත හැකිය.)

ආ25. අපේක්ෂිත වර්තමාන අගය ශිල්ප ක්‍රමය 1වන ක්‍රමය වත්කමක අපේක්ෂිත මුදල් ප්‍රවාහවල ක්‍රමානුකුල (වෙළඳපොළ) අවදානම මුදල් අවදානම් වාරිකයක් (උදා: අවදානම්-ගැළපූ අපේක්ෂිත මුදල් ප්‍රවාහයන්) අඩු කිරීමෙන් ගලපනු ලැබේ. එම අවදානමට ගලපන ලද අපේක්ෂිත මුදල් ප්‍රවාහ නියතතා-සමක මුදල් ප්‍රවාහ නියෝජනය කරන අතර, ඒවා අවදානම් තොර පොලී අනුපාතිකයක් යටතේ වට්ටම් කරනු ලැබේ. නියතතාවයට - සමානවන මුදල් ප්‍රවාහ ලෙස දක්වෙන්නේ කිසියම් මුදල් ප්‍රවාහයක් අපේක්ෂිත මුදල් ප්‍රවාහයන් වෙනුවෙන් ගනුදෙනු කිරීමට වඩා වෙනස් වෙළඳපොළ සහභාගීවන්නෙක් ලෙස අවදානම් සඳහා ගලපන (නිර්වචනය කර ඇති) අපේක්ෂිත මුදල් ප්‍රවාහයකටය.

උදාහරණ වශයෙන් වෙළඳපොළ සහභාගිවන්නෙක් අපේක්ෂිත රු. 1,200 ක මුදල් ප්‍රවාහයක් නියත රු. 1,000 ක මුදල් ප්‍රවාහයකට විකිණීමට කැමති නම්, රු. 1,000, රු. 1,200 නියතතා සමකයක්වේ. (උදා. රු. 200, මුදල් අවදානම් වාරිකය නියෝජනය කරයි). එම අවස්ථාවේදී දරන වත්කම වෙත වෙළඳපොළ සහභාගිවන්නන් උදාසීන විය හැකිය.

ආ26. මෙයට විසංසන්දනයක් වශයෙන් අපේක්ෂිත වර්තමාන අගය ශිල්ප ක්‍රමයේ 2වන ක්‍රමය අවදානම් රහිත පොලී අනුපාතිකයට, අවදානම් වාරිකයක් යොදාගනිමින් ක්‍රමානුකුල (උදා: වෙළඳපොළ) අවදානම ගැළපුම් කරයි. ඒ අනුව සම්භාව්‍යතා-හරිත මුදල් ප්‍රවාහ (උදා: අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතිකය) සමග ආශ්‍රිත අපේක්ෂිත අනුපාතිකයට අනුරූපී වන අනුපාතිකයකින් අපේක්ෂිත මුදල් ප්‍රවාහයන් වට්ටම් කරනු ලැබේ. ප්‍රාග්ධන වත්කම් මිල කිරීමේ ආකෘතිය වැනි අවදානම් වත්කම් මිල කිරීමට භාවිත කරන ආකෘතිය, අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතිකය ඇස්තමේන්තු කිරීමට භාවිත කළ හැකිය. වට්ටම් අනුපාතික ගැළපුම් ශිල්ප ක්‍රමයේ භාවිත කළ වට්ටම් අනුපාතිකය කොන්දේසි සහිත මුදල් ප්‍රවාහවලට සම්බන්ධ ප්‍රතිලාභ අනුපාතිකයන් වන නිසා එය අපේක්ෂිත වර්තමාන අගය ශිල්ප ක්‍රමයේ, 2වන ක්‍රමයේ භාවිත කළ වට්ටම් ක්‍රමයට වඩා වැඩිවිය හැකි අතර, එය අපේක්ෂිත හෝ සම්භාව්‍යතා-හරිත මුදල් ප්‍රවාහවලට සම්බන්ධිත අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතිකයකි.

ආ27. 1වන සහ 2වන ක්‍රම නිදර්ශන මගින් පැහැදිලි කිරීමට වියහැකි පහත දැක්වෙන මුදල් ප්‍රවාහයන් සහ සම්භාව්‍යතාවයක් මත පදනම් කර නිර්ණය කළ වර්ෂයක් තුළ රු. 780 ක අපේක්ෂිත මුදල් ප්‍රවාහයන් වත්කමකට ඇතැයි උපකල්පනය කරන්න. එක අවුරුද්දක කාලසීමාව සඳහාවන මුදල් ප්‍රවාහයන්ට අදාළ කරගත හැකි අවදානම් රහිත පොලී අනුපාතිකය 5% ක් වන අතර ඒ හා සමාන අවදානමක් පැතිකඩක් ඇති වත්කමක ක්‍රමානුකූල අවදානම් වාරිකය 3% කි.

| *වියහැකි මුදල් ප්‍රවාහයන්* | *සම්භාව්‍යතාවය* | *සම්භාව්‍යතා-හරිත මුදල් ප්‍රවාහයන්* |
|---|---|---|
| රු. 500 | 15% | රු. 75 |
| රු. 800 | 60% | රු. 480 |
| රු. 900 | 25% | රු. 225 |
| අපේක්ෂිත මුදල් ප්‍රවාහයන් | | රු. 780 |

ආ28. මෙම සරල නිදර්ශයෙන් අපේක්ෂිත මුදල් ප්‍රවාහවල (රු. 780) සම්භාවිතා-හරිත වියහැකි ප්‍රතිඵලයන් තුනේ සාමාන්‍ය නියෝජනය කරයි. වඩාත් තාත්වික තත්වයන්හිදී වියහැකි බොහෝ ප්‍රතිඵලයන් තිබිය හැකිය. කෙසේ වෙතත් අපේක්ෂිත වර්තමාන වටිනාකම ශිල්පක්‍රමය ව්‍යවහාර කිරීමට සංකීර්ණ ආකෘති සහ ශිල්පක්‍රම භාවිත කරමින් වියහැකි සියලු මුදල් ප්‍රවාහවල ව්‍යාප්තිය සැමවිටම සැලකිල්ලට ගැනීම අවශ්‍ය නොවේ. ඒ වෙනුවට සීමිත සංඛ්‍යාවක වියයුතු සිදුවේ යයි හැඟෙන සිදුවීම් පෙළක් සහ සම්භාවතාවයන් නිරූපණය කෙරෙන මුදල් ප්‍රවාහ පෙළක් සංවර්ධනය කළ හැකිය. උදාහරනයක් වශයෙන් වෙළඳපොළ සහභාගිවන්නන්ගේ උපකල්පන සැලකිල්ලට ගෙන පසුව සිදුවන තත්ත්වයකට ගැළපුම් කළ (උදාඃ ආර්ථික හෝ වෙළඳපොළ තත්ත්වයන් වෙනස්වීම් ඇතුළුව බාහිර සාධකයන්ගේ වෙනස්වීම්, කර්මාන්තයේ උපනතීන් සහ තරඟකාරිත්වයේ මෙන්ම වඩාත් විශේෂිතව අස්තිත්වයට බලපාන අභ්‍යන්තර සාධකයන්ගේ වෙනස්වීම්) පසුගිය කාලයක අදාළ සමහර උපලබ්ධි වූ මුදල් ප්‍රවාහ අස්තිත්වයක් භාවිත කළ හැකිය.

ආ29. පහත දැක්වෙන පරිදි වත්කමක මුදල් ප්‍රවාහවල වර්තමාන අගය (උදාඃ සාධාරණ අගය) 1වන හෝ 2වන ක්‍රමය භාවිතකර නිර්ණය කළත් න්‍යායික වශයෙන් එක සමාන වේ.

(අ) 1වන ක්‍රමය භාවිතකර අපේක්ෂිත මුදල් ප්‍රවාහයන් ක්‍රමානුකූල (වෙළඳපොළ) අවදානමට ගලපනු ලැබේ. අවදානම ගැලපීමේ වටිනාකම සෘජුව සඳහන් කරන වෙළඳපොළ දත්ත නොමැතිවීම නිසා එම ගැළපුම ලබාගත හැකිවන්නේ නියතතා-සමක සංකල්පය භාවිත කර වත්කමක් මිලකිරීමේ ආකෘතියෙනි. උදාහරණයක් ලෙස අවදානම් ගැලපුම (උදාඃ මුදල් අවදානම් වාරිකයවන රු. 22) ක්‍රමානුකූල අවදානම් වාරිකය වන 3% භාවිත කරමින් නිර්ණය කළහැකිය. (රු. 780 - [රු. 780 × (1.05/1.08)], එය ප්‍රතිඵලයක් වන්නේ අවදානම් ගැලපූ අපේක්ෂිත මුදල් ප්‍රවාහය වන රු. 758. (රු. 780 - රු. 22). රු. 758 නියතතා සමකය වන අතර, එය අවදානම් රහිත පොලී අනුපාතිකයෙන් වට්ටම් කරනු ලැබේ. (5%). වත්කමේ වර්තමාන අගය (උදාඃ සාධාරණ අගය) වනුයේ රු. 722 (රු. 758/1.05)

(ආ) 2වන ක්‍රමය භාවිත කර මුදල් ප්‍රවාහයන් ක්‍රමානුකූල (උදාඃ වෙළඳපොළ) අවදානමට ගලපනු නොලැබේ. ඒ වෙනුවට එම අවදානම සඳහා වන ගැලපුම වට්ටම් අනුපාතිකයේ ඇතුළත් වේ. ඒ අනුව අපේක්ෂිත මුදල් ප්‍රවාහයන් අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතිකයවන 8% බැගින් වට්ටම් කරනු ලැබේ. (උදාඃ අවදානම් රහිත පොලී අනුපාතිකය වන 5% ට එකතු කළ ක්‍රමානුකූල අවදානම් වාරිකය වන 3% එකතු කළ). වත්කමේ වර්තමාන අගය (උදාඃ සාධාරණ අගය) වනුයේ රු. 722. (රු. 780 / 1.08).

ආ30. සාධාරණ අගය මැනීමට අපේක්ෂිත වර්තමාන අගය ශිල්පක්‍රමය භාවිත කරනවිට එක්කෝ 1වන ක්‍රමය හෝ 2වන ක්‍රමය භාවිත කළ හැකිය. 1වන ක්‍රමය හෝ 2වන ක්‍රමය තෝරාගැනීම රඳා පවත්නේ මනිනු ලබන වත්කමට හෝ වගකීමට විශේෂිත වූ කරුණු සහ තත්ත්වයන් සහ ප්‍රමාණවත් දත්ත ලබාගත හැකි ප්‍රමාණය ව්‍යවහාර කළ විනිශ්චයයන් යන කරුණු මතය.

**වගකීම්වලට සහ වෙනත් පාර්ශ්වයන් වත්කම් ලෙස (40 සහ 41වන ඡේදයන්) රඳවාගෙන නොමැති අස්තිත්වයේ ස්වකීය ස්කන්ධ සාධන පත්‍රවලට සාධාරණ අගය ශිල්ප ක්‍රමය ව්‍යවහාර කිරීම.**

ආ31. වෙනත් පාර්ශ්වයන් වත්කමක් වශයෙන් තබාගෙන නොමැති වගකීමක (උදාඃ වත්කමක් අවසන් කිරීමකදී) සාධාරණ අගය මැනීමට වර්තමාන අගය ශිල්පක්‍රමය භාවිත කරනවිට අස්තිත්වය වෙනත් දේවල් අතර වෙළඳපොළ සහභාගි වන්නන් බැඳීම ඉටු කිරීමේදී දැරීමට අපේක්ෂා කරන අනාගත මුදල් ප්‍රවාහ වල ගලායාම් ඇස්තමේන්තු කළ යුතුය. බැඳීම ඉටුකිරීමට වෙළඳපොළ සහභාගිවන්නන්ගේ පිරිවැය පිළිබඳ අපේක්ෂාවන් බැඳීම භාරගැනීම සඳහා වෙළඳපොළ සහභාගී වන්නන්හට අවශ්‍ය වියහැකි හානිපූරණය එම අනාගත මුදල් ප්‍රවාහවල ගලායාම් වලට ඇතුළත් වියයුතුය. එවැනි හානිපූරනයකට වෙළඳපොළ සහභාගිවන්නෙක් අවශ්‍ය කෙරෙන ප්‍රතිලාභවලට පහත දෑ ඇතුළත් වේ.

(අ) වගකීම භාරගැනීමේ ක්‍රියාකාරකම් (එනම් බැඳීම ඉටුකිරීමේ වටිනාකම උදාඃ වෙනත් ක්‍රියාකාරකම්වලට භාවිත කළහැකි වන සම්පත් වෙනත් ක්‍රියාකාරකම් සඳහා භාවිත කිරීම)

(ආ) බැඳීම සමග ආශ්‍රිත අවදානම භාරගැනීම (උදාඃ තත්‍ය මුදල් ප්‍රවාහවල ගලායාමේ අපේක්ෂිත මුදල් ප්‍රවාහවල ගලායාම් වලින් වෙනස්වීමට හැකි අවදානම පිළිබිඹුවන *අවදානම් වාරිකයක්*) ආ33 ඡේදය බලන්න.

ආ32. උදාහරණ වශයෙන් මූල්‍ය නොවන වගකීම නම් ගිවිසුම්ගත ප්‍රතිලාභ අනුපාතිකයක් අඩංගු නොවන අතර එම වගකීම සඳහා නිරීක්ෂණය කළහැකි වෙළඳපොළ ඵලදාවක් නොමැත. සමහර අස්ථාවලදී වෙළඳපොළ සහභාගිවන්නන්ට අවශ්‍ය කරන ප්‍රතිලාභයේ සංරචක එකකින් අනෙකකට වෙන්කොට හඳුනාගත නොහැකිය. (ස්ථාවර ගාස්තු පදනම මත තුන්වන පාර්ශ්වයක කොන්ත්‍රාත්කරුවෙකු අයකරන මිල භාවිත කරමින්). අනෙක් අවස්ථාවලදී එම සංරචකයන් වෙනම අස්තිත්වය ඇස්තමේන්තු කිරීම අවශ්‍ය වේ. (උදාඃ අනාගතයේ පිරිවැයට වන වෙනස්වීම්වල අවදානම කොන්ත්‍රාත්කරු නොදරන නිසා කොන්ත්‍රාත් කරුගේ මිල භාවිතකරන විට එය පිරිවැයට එකතු කළ පදනම යටතේ මිලක් ඇතුළත් වේ.)

ආ33. වෙනත් පාර්ශ්වයක් වත්කමක් වශයෙන් දරා නොසිටින වගකීමක හෝ අස්තිත්වයේ ස්වකීය ස්කන්ධ සාධන පත්‍රයක සාධාරණ අගය මැනීමේදී පහත සඳහන් විධිවලින් එක විධියක් අනුව අස්තිත්වයකට අවදානම් වාරිකයක් ඇතුළත් කළ හැකිය.

(අ) මුදල් ප්‍රවාහ ගැලපුම් කිරීමෙන් (උදාඃ මුදල් ප්‍රවාහ ගලායාම් වලට වටිනාකම වැඩිකිරීමක් ලෙස), හෝ

(ආ) ඒවායේ වර්තමාන වටිනාකම්වලට අනාගත මුදල් ප්‍රවාහයන් වට්ටම් කිරීමට භාවිත කළ අනුපාතිකය ගැලපුම් කිරීමෙන් (උදාඃ වට්ටම් අනුපාතිකය අඩුකිරීමක් ලෙස)

අවදානම සඳහා ගැලපුම් ද්විගණනය නොකිරීමට හෝ අත් නොහැරීම අස්තිත්වය සහතික විය යුතුය. උදාහරණයක්වශයෙන් බැඳීම සමග ආශ්‍රිත අවදානම භාරගැනීමට වන හානි පූරණය සැලකිල්ලට ගැනීමට ඇස්තමේන්තු කළ මුදල් ප්‍රවාහයන් වැඩිකරන්නේ නම් එම අවදානම පිළිබිඹුවීමට වට්ටම් අනුපාතිකය ගැලපිය යුතුය නැත.

**තක්සේරු කිරීමේ ශිල්පක්‍රමවලට යෙදවුම් (67 - 71 ඡේද)**

ආ34. සමහර වත්කම් සහ වගකීම් (උදාඃ මූල්‍ය සාධන පත්‍ර) සඳහා යෙදවුම් නිරීක්ෂණය කළ හැකි වෙළඳපොළවල් සඳහා උදාහරණ වලට පහත දෑ ඇතුළත්ය.

(අ) *විනිමය (හුවමාරු) වෙළඳපොළවල්* - විනිමය වෙළඳපොළක් තුළ අවසාන මිල ගණන් කරදරයක් නොමැතිව ලබාගත හැකි මෙන්ම සාමාන්‍යයෙන් සාධාරණ අගයේ නියෝජනයක් වේ. එවැනි වෙළඳපොළක් සඳහා උදාහරණයක් වන්නේ ලන්ඩන් ව්‍යාපාර වස්තු හුවමාරුය.

(ආ) *ගනුදෙනුකරන්නන්ගේ වෙළඳපොළවල්,* ගනුදෙනු කරන්නන්ගේ වෙළඳපොළක ගනුදෙනුකරුවන් විකිණීමට ඉදිරිපත්ව සූදානම්ව සිටී. (ඔවුන්ගේ ස්වකීය ගිණුම්වලින් එක්කෝ විකුණයි හෝ මිලට ගනී), ඒ අනුව එහි ප්‍රතිඵලයක් වශයෙන් ඔවුන්ගේ ප්‍රාග්ධනය යොදවා ඔවුන් වෙළඳපොළ තනන අයිතමයන්ගේ තොග රඳවාගෙන ද්‍රවශීලතාවය සපයයි. දර්ශීය ලෙස අවසාන මිල ගණන් වලට වඩා ලංසු අර්පණ මිළ ගණන් (ගණුදෙනු කරන්නෙක් මිලදී ගැනීමට කැමති මිල සහ ගනුදෙනුකරුවෙකු විකිණීමට කැමති මිල) වඩා පහසුවෙන් ලබාගත හැකිය. අත්පිට විකුණුම් කවුළුව යනු (මිළ ගණන් ප්‍රසිද්ධියේ වාර්තා කරන) ගනුදෙනුකරන්නන්ගේ වෙළඳපොළ වේ. සමහර මූල්‍ය සාධන පත්‍රයන්, වෙළඳ ද්‍රව්‍ය, භෞතික වත්කම් (උදාඃ පාවිච්චි කළ උපකරණ) වැනි සමහර වෙනත් වත්කම් සහ වගකීම් සඳහන් අලෙවිකරන්නන්ගේ වෙළඳපොළවල් පවතී.

(ඇ) *තැරැව්කරන වෙළඳපොළවල්,* තැරැව්කරන වෙළඳපොළකදී විකුණුම්කරුවන් හා ගැනුම්කරුවන් එකඟකරවා ගැනීමට තැරැව්කරන්නා උත්සාහ කරන අතර ඔවුන්ගේ ස්වකීය ගිණුම් වලින් වෙළඳාම් කිරීමට ඉදිරිපත්ව සූදානමින් නොසිටී. වෙනත් වචන වලින් කිවහොත් තැරැව්කරුවන් ඔවුන් වෙළඳපොළ තනන අයිතමයන් තොග වශයෙන් රඳවාගැනීමට ඔවුන්ගේ ප්‍රාග්ධනය නොයොදවයි. අදාළ පාර්ශ්ව ලංසු අර්පණ මිළ ගණන් තැරැව්කරු දන්නා අතර, එහෙත් එක් එක් පාර්ශ්වය දර්ශීයව අනෙක් පාර්ශ්වයේ මිල අවශ්‍යතාවයන් දැන නොසිටී. සමහර අවස්ථාවලදී නිමකළ ගනුදෙනුවල මිල ගණන් ලබාගත හැකිය. මිලදී ගැනීම සහ විකිණීම සඳහාවන ඇණවුම් ගලපන විද්‍යුත් සංනිවේදන ජාල වාණිජ සහ නේවාසික මූර්ත දේපළ වෙළඳපොළ තැරැව්කරන වෙළඳපොළවලට ඇතුළත් වේ.

(ඈ) *ප්‍රධානියාට - ප්‍රධානියා වෙත වෙළඳපොළවල්* - ප්‍රධානියා - ප්‍රධානියා වෙත වෙළඳපොළකදී ගනුදෙනු ආරම්භවීම් සහ යළි විකුණුම් යන කරුණු දෙකම සාකච්ඡා කෙරෙනුයේ අතර මැදියෙකු නොමැතිව ස්වාධීනවය. එමගනුදෙනු පිළිබඳ ඉතා ස්වල්පයක ප්‍රසිද්ධ කළ තොරතුරු ලබාගත හැකිවිය හැකිය.

**සාධාරණ අගය අනුපිළිවෙළ (72 - 90 ඡේද)**

**2වන මට්ටමේ යෙදවුම් (81 - 85 ඡේද)**

ආ35. විශේෂ වත්කම් හෝ වගකීම් සඳහා 2වන මට්ටමේ යෙදවුම් සඳහා උදාහරණවලට පහත දෑ ඇතුළත්ය.

(අ) *ස්ථාවරව ලැබීම - ලන්ඩන් අන්තර් බැංකු (LIBOR) ඉදිරිපත් වන හුවමාරු අනුපාතික පදනම මත විචල්‍ය පොලී අනුපාතික හුවමාරු ගෙවීම.* හුවමාරුවේ සම්පූර්ණ කාලසීමාවෙන් සැලකිය යුතු අන්දමේ කාලසීමාවන් සඳහා එම අනුපාතිකය පොදුවේ ප්‍රකාශිත කාල අන්තර සඳහා නිරීක්ෂණය කළ හැකි නම්, 2වන මට්ටමේ යෙදවුමක් වියහැක්කේ ලයිබෝර් හුවමාරු අනුපාතිකයයි.

(ආ) *ස්ථාවරව ලැබීම - විදේශ ව්‍යවහාර මුදලකින් නම්කළ ඵලදා වක්‍රය මැනීම මත විචල්‍ය පොලී අනුපාතික හුවමාරු ගෙවීම,* 2වන මට්ටමේ යෙදවුමක් වියහැක්කේ හුවමාරුවේ සැලකිය යුතු අන්දමේ කාලසීමාවක් සඳහා එය පොදුවේ ප්‍රකාශිත කළ කාල අන්තරයන් සඳහා නිරීක්ෂණය කළහැකි විදේශ ව්‍යවහාර මුදලකින් නම් කළ ඵලදා වක්‍රයක් පදනම මත වන හුවමාරු අනුපාතිකයයි. එයට අවස්ථාවක් වන්නේ හුවමාරුවේ කාලසීමාව අවුරුදු 10ක් නම් සහ පොදුවේ ප්‍රකාශිත කාල අන්තරයන් සඳහා එම අනුපාතිකය නිරීක්ෂණය කළ හැක්කේ අවුරුදු 9ක් සඳහා නම් හුවමාරුවේ සාධාරණ අගය මැනීම එහි මුළුමනින්ම ඵලදා වක්‍රයේ අවුරුදු 10ක් සඳහා යම් සාධාරණ බහිර් නිවේශනයක් සැලකිය යුතු තරම් නොවන්නේ නම්ය.

(ඇ) *ස්ථාවරව - ලැබීම - නිශ්චය කරන ලද බැංකුවක ප්‍රාථමික අනුපාතිකය මත විචල්‍ය පොලී අනුපාතික හුවමාරුව ගෙවීම.* 2වන මට්ටමේ යෙදවුමක් වන්නේ බහිර්නිවේශනය කළ වට්නාකම් නිරීක්ෂනය කළහැකි වට්නාකම් සමග සනාථ වන්නේ නම් බහිර් නිවේෂනය මගින් ලබාගත් බැංකුවේ ප්‍රාථමික අනුපාතිකයයි. උදාහරණයක් වශයෙන් හුවාමාරුවේ සම්පූර්ණ කාල සීමාව පුරා සැලකියයුතු තරම් අන්දමින් නිරීක්ෂණය කළහැකි පොලී අනුපාතිකයේ සහසම්බන්ධතාවය.

(ඈ) *හුවමාරුව - වෙළඳාම් කොටස් මත අවුරුදු තුනක විකල්පයක්* 2වන මට්ටමේ යෙදවුමක් වන්නේ, පහත දැක්වෙන කොන්දේසි දෙකම පවතින්නේ නම් වසර 3 දක්වා බහිර්නිවේශනය මගින් කොටස් සඳහා ලබාගන්නා ව්‍යංග නශ්‍යතාවයයි.

(i) අවුරුදු එකක සහ අවුරුදු දෙකක කොටස් මත වන විකල්පයන් සඳහා වන මිල ගණන් නිරීක්ෂණය කළ හැකිය.

(ii) බහිර් නිවේශනයකළ තුන් අවුරුදු විකල්පයක ව්‍යංග නශ්‍යතාවය විකල්පයේ සම්පූර්ණ කාල සීමාව සඳහා සැලකියයුතු තරම් අන්දමක නිරීක්ෂණය කළ වෙළඳපොළ දත්ත සමග සනාථ විය යුතුය.

අවුරුදු එකක සහ අවුරුදු දෙක ව්‍යංග නශ්‍යතාවය සමග වන සහසම්බන්ධතාවය තහවුරු කරන්නේ නම්, එම අවස්ථාවේ ව්‍යංග නශ්‍යතාවය කොටස් මත වන අවුරුදු එකක සහ අවුරුදු දෙකක විකල්පවල ව්‍යංග නශ්‍යතාවයන් බහිර් නිවේශයකළ හා සංසන්දනය කළහැකි අස්තිත්වයක සනාථ කළ අවුරුදු තුනක විකල්පයක ව්‍යංග නශ්‍යතාවය මගින් ලබාගත හැකිය.

(ඉ) *බලපත්‍ර දීමේ එකඟවීම්* - බලපත්‍ර දීමේ ඒකඟවීමක් එනම් ව්‍යාපාර සංයෝජනයකදී අත්පත් කරගත් සහ අත්පත් කරගත් අස්තිත්වය (බලපත්‍රයට එකග වූ පාර්ශ්වය) සම්බන්ධිත නොවන පාර්ශ්වයක් සමග සාකච්ඡා කරගත් 2වන මට්ටමේ යෙදවුමක් වියහැකි වන්නේ එකඟවීම ආරම්භයේදී සම්බන්ධිත නොවන පාර්ශ්වය සමග වන ගිවිසුමේ පුරස්කාර අනුපාතිකයයි.

(ඊ) *සිල්ලර වෙළඳපොළක නිමි භාණ්ඩ තොග,* ව්‍යාපාර සංයෝජනයකදී අත්පත් කරගත් නිමි භාණ්ඩ තොග සඳහා 2වන මට්ටමේ යෙදවුමක් වන්නේ එක්කෝ සිල්ලර වෙළඳපොළක ගනුදෙනුකරුට වන මිල හෝ තොග අයිතමවල තත්ත්වය පිහිටීම අතර සහ සංසන්දනය කළහැකි (ඒ හා සමාන) තොග අයිතම වල වෙනස්කම්වලට ගැලපූ තොග වෙළඳපොළ සිල්ලර වෙළෙන්දෙකුට වන මිලයි. ඒ අනුව අවශ්‍යකරන විකුණුම් පරිශ්‍රමයන් සම්පූර්ණ කරනු ලබන වෙනත් සිල්ලර වෙළෙන්දෙකුට තොග විකිණීමකදී වන ගනුදෙනුවකදී ලැබිය හැකිවන මිල සාධාරණ අගය මැනීමෙන් පිළිබිඹු වේ. ගැලපිළි සිල්ලර මිලට (පහතට) කලාවූවද හෝ තොග මිලට (ඉහළට) කලා වූවද සංකල්පමයවශයෙන් සාධාරණ අගය මැනීම එයම වනු ඇත. සාධාරණ අගය මැනීම සඳහා අඩුම වට්නාකමකින් යුත් පුද්ගල නිශ්‍රිත ගැලපුම් අවශ්‍ය කෙරෙන මිල සාමාන්‍යයෙන් භාවිත කළ යුතුය.

(උ) *දරාසිටින සහ භාවිතකල ගොඩනැගිල්ලක්* - නිරීක්ෂණය කළහැකි වෙළඳපොළ දත්ත මගින් ලබාගන්නා ගොඩනැගිල්ලේ වර්ග මීටරයක් සඳහා වන මිල (තක්සේරු කිරීමේ ගුණිතයක්) 2වන මට්ටමේ යෙදවුමක් වනු ඇත. උදා: ඒ හා සමාන

පිහිටීමක වන සංසන්දනය කළහැකි (සමාන) ගොඩනැගිල්ලක නිරීක්ෂණය කළහැකි ගනුදෙනු සම්බන්ධිත මිල ගණන් ලබාගන්නා ගුණිතයන්.

(ඌ) *මුදල් උත්පාදන ඒකකය* නිරීක්ෂණය කළහැකි වෙළඳපොළ දත්ත මගින් ලබාගන්නා තක්සේරු කිරීමේ ගුණිතයන් (සමාන කාර්යසාධන මැනීමක ඉපයීම් හෝ ආදායම් ගුණිතයන්) 2වන මට්ටමේ යෙදවුමක් වනු ඇත. උදාඃ මෙහෙයුම්, වෙළඳපොළ මූල්‍ය සහ මූල්‍ය නොවන සාධක සැලකිල්ලට ගෙන නිරීක්ෂණය කළහැකි සංසන්දනය කළහැකි (සමාන) ව්‍යාපාර වල ගනුදෙනු සම්බන්ධ වන මිල ගණන් වලින් ලබාගන්නා ගුණිතයන්

**3වන මට්ටමේ යෙදවුම් (86 - 90 ඡේද)**

ආ36. විශේෂ වත්කම් සහ වගකීම් සඳහා 3වන මට්ටමේ යෙදවුම් සඳහා උදාහරණවලට පහත දෑ ඇතුළත් වේ.

(අ) *දිගු-දින සහිත ව්‍යවහාර මුදල් හුවමාරු* නිරීක්ෂණය කළ නොහැකි සහ වෙළඳපොළ දත්ත පොදුවේ ප්‍රකාශිත කාල අන්තරයන්හි නිරීක්ෂනය කළහැකි වෙළඳපොළ දත්ත හෝ ව්‍යවහාර මුදල් හුවමාරුවේ සම්පූර්ණ කාලසීමාවෙන් සැලකිය අන්දමේ කාලසීමාවන් සඳහා සනාථ කළ නොහැකි නිශ්චය කරන ලද ව්‍යවහාර මුදලකින් වන පොලී අනුපාතිකයන් 3වන මට්ටමේ යෙදවුමක් විය හැකිය. ව්‍යවහාර මුදල් හුවමාරුවක පොලී අනුපාතික වන්නේ අදාළ රටවල් වල එලදා වක්‍ර වලින් ගණනය කර ලබාගන්නා හුවමාරු අනුපාතිකයන්ය.

(ආ) *හුවමාරු - විකිණෙන කොටස් මත අවුරුදු 3ක විකල්ප.* ඓතිහාසික නශ්‍යතාවය 3වන මට්ටමේ යෙදවුමක් විය හැකිවේ. උදාඃ කොටස්මිල ඓතිහාසික මිල ගණන් වලින් ලබාගන්නා කොටස්වල නශ්‍යතාවය - විකල්පයක් මිල කිරීම සඳහා ලබාගත හැකි එකම තොරතුර එයවුවත් අනාගත නශ්‍යතාවය පිළිබඳ වෙළඳපොළ සහභාගිවන්නන්ගේ අපේක්ෂාවන් ඓතිහාසික නශ්‍යතාවය දර්ශීයව නියෝජනය නොකරයි.

(ඇ) *පොලී අනුපාතික හුවමාරුඃ* නිරීක්ෂණය කළහැකි වෙළඳපොළ දත්ත අන්ලෙසකින් සනාථ කළ නොහැකි හා ඍජුව නිරීක්ෂනය කළනොහැකි දත්ත භාවිත කරමින් හුවමාරුවක් සඳහා සංවර්ධනය කළ වෙළඳපොළ - මැදි පොදු එකඟතාවයෙන් (අනුගම්‍ය නොවන) ලබාගත් මිලට ගැළපුමක් කිරීම 3වන මට්ටමේ යෙදවුමක් විය හැකිය.

(ඈ) *ව්‍යාපාර සංයෝජනයකදී භාරගත් වගකීමක් අක්‍රිය කිරීම.* වගකීම අවසන් කිරීමට (වගකීම අවසන් කිරීම සඳහා වන පිරිවැය පිළිබඳව වෙළඳපොළ සහභාගිවන්නන්ගේ අපේක්ෂාවන් සහ වත්කම කොටස්වලට ගලවා වෙන්කිරීමට වන බැඳීම භාරගැනීම වෙනුවෙන් වෙළඳපොළ සහභාගි වන්නන්ට අවශ්‍යකෙරෙන හානිපූරණය ඇතුළුව ගෙවියයුතු අනාගත මුදල් ප්‍රවාහවල ගලායාම් පිළිබඳව අස්තිත්වය ස්වකීය දත්ත භාවිත කරමින් කරන ප්‍රවර්තන ඇස්තමේන්තුව වෙළඳපොළ සහභාගි වන්නන් වෙනස් උපකල්පන භාවිත කරන්නේ යැයි ඉඟිකෙරෙන සාධාරණ ලෙස ලබාගත හැකි තොරතුරු නොමැති නම් 3වන මට්ටමේ යෙදවුමක් විය හැකිය. එම 3වන මට්ටමේ යෙදවුම් වෙනත් යෙදවුම් සමග එක්ව වර්තමාන අගය ශිල්ප ක්‍රමයේ භාවිත කරනු ඇත. උදාඃ අනාගත මුදල් ප්‍රවාහ ගලායාම්වල ඇස්තමේන්තුවක් වෙනුවට වට්ටම් අනුපාතිකයෙන්, වගකීමේ සාධාරණ අගය මත අස්තිත්වයේ ණය තත්ත්වයේ බලපෑම පිළිබිඹු වන්නේනම්, අවදානමින් තොර පොලී අනුපාතිකය හෝ ණය-ගැළපුම් අවදානම් - රහිත පොලී අනුපාතිකය.

(ඉ) *මුදල් උත්පාදන ඒකකය* වෙළඳපොළ සහභාගිවන්නන් වෙනස් උපකල්පන භාවිත කරන්නේ යයි ඉඟිකෙරෙන සාධාරණ ලෙස ලබාගත හැකි තොරතුරු නොමැති නම් අස්තිත්වයේ ස්වකීය දත්ත භාවිත කර සංවර්ධනය කළ මූල්‍ය පුරෝකථන (උදාඃ මුදල් ප්‍රවාහයන් හෝ ලාභාලාභ) 3න් වන මට්ටමේ යෙදවුමක් වියහැකිය.

**වත්කමක හෝ වගකීමක පරිමාව හෝ ක්‍රියාකාරී මට්ටම සැලකිය ලෙස අඩුවී ඇතිවිට සාධාරණ අගය මැනීම**

ආ37. වත්කමට හෝ වගකීමකට (හෝ ඒ හා සමාන වත්කම් සහ වගකීම්) සාමාන්‍ය වෙළඳපොළ ක්‍රියාකාරකම් වලට සාපේක්ෂව එම වත්කමේ හෝ වගකීමේ සැලකිය යුතු අන්දමින් පරිමාවේ හෝ ධාරිතාවයේ අඩුවීමක් සිදුවී ඇතිවිටෙක වත්කමේ හෝ වගකීමේ සාධාරණ අගයට බලපෑ හැකිය. තිබෙන සාක්ෂි පදනම මත වත්කමේ හෝ වගකීමේ පරිමාවේ හෝ මට්ටමේ අඩුවීමක් සිදුවී තිබේදැයි නිර්ණය කිරීමට අස්තිත්වයක් විසින් පහත දක්වෙන වැනි සාධකයන්හි වැදගත්කම සහ අදාළත්වය ඇගයිය යුතුය.

(අ) මෑතකදී වූ ගනුදෙනු සංඛ්‍යාව සුළුවීම.

(ආ) වර්තමාන තොරතුරු භාවිත කර මිල ගණන් කැඳවීම් සංවර්ධනය නොකිරීම.

(ඇ) එක් එක් කාලය පුරාම හෝ වෙළඳපොළ තත්ත්වයන් අතර මිල ගණන් කැඳවීම් සැහෙන තරම් දුරට වෙනස්වීම

(ඈ) වත්කම හෝ වගකීම සමග කලින් ඉතා උසස් ලෙස සහසම්බන්ධ වූ දර්ශකයක් එම වත්කමේ හෝ වගකීමේ සාධාරණ අගයේ වර්තමාන ඇගයීම් මැනීම පැහැදිලි ලෙස සහසම්බන්ධතාවයක් නොමැතිවීම.

(ඉ) වත්කම හෝ වගකීම සඳහා ණය සහ කාර්යඵල නොමැති අවදානම සඳහා ලබාගත හැකි සියළු වෙළඳපොළ දත්තයන් සැලකිල්ලට ගැනීමේදී අස්තිත්වයේ අපේක්ෂිත මුදල් ප්‍රවාහවල ඇස්තමේන්තු සමග සංසන්දනය කරන විට ව්‍යංග

ද්‍රවශීලතා අවදානම් වාරිකය, එළදා හෝ කාර්ය සාධන දර්ශකයක් (යුතුකම පැහැරහැරීමේ අනුපාතික හෝ සම්බන්ධතා බිඳවැටීම) නිරීක්ෂණය කළ දත්තයනට හෝ ප්‍රකාශිත මිල ගණන් වලට සැලකිය යුතු අන්දමේ වැඩිවීමක් තිබීම.

(ඊ) පුළුල් ලංසු-අර්පණ විහිදීමක් තිබීම හෝ ලංසු-අර්පණ විහිදීමේ සැලකියයුතු අන්දමේ වැඩිවීමක් තිබීම.

(එ) ක්‍රියාකාරකම්වල සැලකිය යුතු අන්දමේ අඩුවීමක් තිබීම හෝ වත්කමට හෝ වගකීමට හෝ සමාන වත්කම් හෝ වගකීම්වල නව නිකුතු සඳහා (උදා: ප්‍රාථමික වෙළඳපොළ) වෙළඳපොළක් නොතිබීම.

(ඒ) ප්‍රසිද්ධියේ ඉතා සීමිත තොරතුරු ලබාගැනීමට හැකිවීම (උදා: ප්‍රධානියා ප්‍රධානියා වෙත වෙළඳපොළේ වන ගනුදෙනු)

ආ38. වත්කම හෝ වගකීම සඳහා (ඒ හා සමාන වත්කම් හෝ වගකීම්) සාමාන්‍ය වෙළඳපොළ ක්‍රියාකාරකම්වලට සාපේක්ෂ වත්කම් හෝ වගකීමේ පරිමාවේ හෝ ක්‍රියාකාරී මට්ටමේ සැලකියයුතු අන්දමේ අඩුවීමක් තිබේ යයි අස්තිත්වය විසින් නිගමනය කරන්නේ නම් ගනුදෙනුවල හෝ ප්‍රකාශිත මිල ගණන් වල අතිරේක විශ්ලේෂණයක් කිරීම අවශ්‍ය වේ. පරිමාවේ හෝ ක්‍රියාකාරී මට්ටම තමන් විසින්ම අඩුකිරීම මගින් ගනුදෙනුවන මිල හෝ ප්‍රකාශිත මිල, සාධාරණ අගය නියෝජනය නොකරන බව හෝ එම වෙළඳපොළේ සිදුවූ ගනුදෙනුව විධිමත් නොවන බව නොඇඟවේ. කෙසේ වෙතත් ගනුදෙනුව හෝ ප්‍රකාශිත මිල සාධාරණ අගය නියෝජනය නොකරන බව නිගමනය කරන්නේ නම් (විධිමත් නොවන ගනුදෙනු තිබිය හැකිනිසා) එම මිල ගණන් සාධාරණ අගය මැනීම සඳහා අස්තිත්ත්වය භාවිත කරගන්නේ නම් සහ එහි සම්පූර්ණයෙන්ම සාධාරණ අගය මැනීම සඳහා එම ගැලපුම සැලකිය යුතු තරමේ වියහැකි නම් ගනුදෙනුවලට හෝ ප්‍රකාශිත මිල ගණන් වලට ගැළපුමක් කිරීම අවශ්‍ය වනු ඇත. ගැලපුම අස්තිත්වයන් යටතේද අවශ්‍ය විය හැකිය.

(මනිනු ලබන වත්කම සමග සංසන්දනය කිරීමට හෝ මිල අලුත් නොවනවිට ඒ හා සමාන වත්කමක මිලට සැලකියයුතු අන්දමේ ගැලපුමක් අවශ්‍ය කරන විට)

ආ39. මෙම SLFRS ය ගනුදෙනුවලට හෝ ප්‍රකාශිත මිල ගණන්වලට සැලකියයුතු අන්දමේ ගැළපුම් කිරීම සඳහා ක්‍රමවේදයක් නියම නොකරයි. සාධාරණ අගය මැනීමේදී තක්සේරු ශිල්පක්‍රම භාවිතය පිළිබඳ සාකච්ඡා කිරීමක් සඳහා 61 - 66 සහ ආ5 - ආ11 ඡේද බලන්න. භාවිත කළ තක්සේරු ක්‍රමය ගැන නොසලකා අස්තිත්වය විසින් වත්කමේ හෝ වගකීමේ (ආ 17 ඡේදය බලන්න) මුදල් ප්‍රවාහවල ආවේණික වූ අවිනිශ්චිතතාවය සඳහා හානිපූර්ණයක් ලෙස වෙළඳපොළ සහභාගිවන්නන් ඉල්ලා සිටින වටිනාකම පිළිබිඹුවන අවදානම් වාරිකයක් ඇතුළුව උචිත අවදානම් ගැලපුම් ඇතුළත් කළ යුතුය. එසේ නොවුවහොත් මැනීම විශ්වාසදායක ලෙස සාධාරණ අගය නියෝජනය නොකරයි. සමහර අවස්ථාවලදී උචිත අවදානම් ගැලපුමක් නිර්ණය කිරීම අපහසු වියහැකිය. කෙසේ වෙතත් අපහසුතාවයේ මට්ටම පමණක් අවදානම් ගැළපුම බැහැර කිරීමට ප්‍රමාණවත් පදනමක් නොවේ. ප්‍රවර්තන වෙළඳපොළ තත්ත්වයන් යටතේ මැනීම් කරන ලද වෙළඳපොළ තත්ත්වයන් යටතේ විධිමත් ගනුදෙනුවක් පිළිබිඹු කිරීමකි අවදානම් ගැලපුම.

ආ40. වත්කමේ හෝ වගකීමේ පරිමාවේ හෝ ක්‍රියාකාරී මට්ටමේ සැලකියයුතු අන්දමේ අඩුවීමක් සිදුවී ඇත්නම් තක්සේරු ශිල්පක්‍රමය වෙනස් කිරීම හෝ බහුආංශික තක්සේරු ක්‍රම භාවිත කිරීම උචිත වියහැකිය. (උදා: වෙළඳපොළ ප්‍රවේශය හෝ වර්තමාන අගය ශිල්ප ක්‍රමය භාවිත කිරීම). බහුවිධ තක්සේරු ක්‍රමයක් භාවිත කිරීමේ ප්‍රතිඵලයක් ලෙස වන සාධාරණ අගයේබර තැබීම් ඇඟවීම් වනවිට අස්තිත්වය සාධාරණ අගය මැනීම්වල පරාසයේ සාධාරණත්වය සලකා බැලිය යුතුය. මෙහි පරමාර්ථය වන්නේ වර්තමාන වෙළඳපොළ තත්ත්වයන් යටතේ පරාසය ඇතුළත සාධාරණ අගය වඩාත්ම නියෝජනය වන තැන නිර්ණය කිරීමයි. පුළුල් පරාසයක සාධාරණ අගය මැනීම අමතර විශ්ලේෂණයන් අවශ්‍ය කරන බවට ඉඟිකිරීමක් විය හැකිය.

ආ41. වත්කම හෝ වගකීම් සඳහා පරිමාවේ හෝ ක්‍රියාකාරී මට්ටමේ සැලකිය යුතු අන්දමේ අඩුවීමක් සිදුවී ඇති වූයේ වුවද සාධාරණ අගය මැනීමේ පරමාර්ථය වෙනස් නොවී එලෙසම පවතී. වර්තමාන වෙළඳපොළ තත්ත්වයන් යටතේ මැනීම කරන දින වෙළඳපොළ සහභාගිවන්නන් අතර විධිමත් ගනුදෙනුවකදී (බලනොකළ හෝ ආපදා විකිණීමක් නොවන) වත්කමක් විකිණීම සඳහා ලැබියයුතු හෝ වගකීමක් නිරවුල් කිරීමකදී ගෙවියයුතු මිල සාධාරණ අගය.

ආ42. ප්‍රවර්තන වෙළඳපොළ තත්ත්වයන් යටතේ මැනිම කරන දින වෙළඳපොළ සහභාගිවන්නන් ගනුදෙනුවට ඇතුල්වීමට කැමති වන මිල ඇස්තමේන්තු කිරීමේදී මැනීම් කරන දින කරුණු සහ තත්ත්වයන් යටතේ වත්කමේ හෝ වගකීමේ පරිමාවේ හෝ ධාරිතා මට්ටමේ සැලකියයුතු අන්දමේ අඩුවීමක් සිදුවී ඇත්නම් විනිශ්චයන් අවශ්‍ය කෙරේ. වත්කම දරා සිටීමට හෝ නිරවුල් කිරීමට හෝ අන්වශයෙන් බැඳීම අවසන් කිරීම අස්තිත්වයේ අභිප්‍රාය වූවත් සාධාරණ අගය මැනීමට එය අදාළ නොවේ. එසේ වන්නේ සාධාරණ අගය වෙළඳපොළ පදනම් මැනීමක් මිස අස්තිත්ව විශේෂිත මැනීමක් නොවන නිසාය.

**විධිමත් නොවන ගනුදෙනු හඳුනාගැනීම**

ආ43. වත්කම හෝ වගකීම (හෝ ඒ හා සමාන වත්කම් හෝ වගකීම් වල) සඳහා වෙළඳපොළ සාමාන්‍ය ක්‍රියාකාරකම්වලට සාපේක්ෂව වත්කමේ හෝ වගකීමේ පරිමාවේ හෝ ක්‍රියාකාරී මට්ටමේ සැලකියුතු අන්දමේ අඩුවීමක් සිදුවී ඇති විටෙක ගනුදෙනුව විධිමත්ද (හෝ විධිමත් නොවේද) යන්නනිරීක්ෂණය කිරීම වඩාත් අපහසු වේ. එවැනි තත්වයන්හිදී එම වෙළඳපොළේ සියලුම ගනුදෙනු විධිමත් නොවන (උදා: බලකරන ඇවර කිරීම හෝ ආපදා විකිණීමක්) බව නිගමනය කිරීම උචිත නොවේ. ගනුදෙනුවක් විධිමත් නොවියහැකි බව ඉඟිකෙරෙන තත්ත්වයකට පහත දෑ ඇතුළත් වේ.

(අ) වර්තමාන වෙළඳපොළ තත්ත්වයන් යටතේ එවැනි වත්කම් සහ වගකීම් සඳහා සම්බන්ධකර ගන්නා ගනුදෙනු සඳහා සුලභ සහ චාරිත්‍රානුකූල වන අලෙවි කරන ක්‍රියාකාරකම් සඳහා ඉඩදීමට මිනුම්කරන දිනට පෙර කාලපරිච්ඡේදයක් සඳහා වෙළඳපොළට ප්‍රමාණවත් අනාවෘත කර පෑමක් නොතිබීම.

(ආ) සුලභ සහ චාරිත්‍රානුකූල අලෙවි කරන කාලපරිච්ඡේදයක් තිබුනේවූ නමුදු විකුණන්නා වත්කම හෝ වගකීම තනි වෙළඳපොළ සහභාගිවන්නකුට අලෙවි කිරීම.

(ඇ) විකුණන්නා බුන්වත් වීමෙන් බුන්වත්වීමට හෝ භාරකාරිත්වය ලැබීමට ආසන්න වීම (විකුණන්නා ආපදාවකට පැමිණ ඇත)

(ඈ) නියාමන හෝ නෛතික අවශ්‍යතාවයන් ඉටුකිරීමට විකුණන්නාට විකිණීම අවශ්‍යවීම (විකුණන්නාට බලෙන් කිරීමට සිදුවීම)

(ඉ) සමාන හෝ එම වත්කමම හෝ වගකීම සඳහා මෑතකදී වූ වෙනත් ගනුදෙනු සමග සංසන්දනය කිරීමේදී ගනුදෙනු මිල බැහැරින් වූවක් වීම.

තිබෙන තොරතුරුවල බරතැබීම අනුව ගනුදෙනුව විධිමත්ද යන්න නිර්ණය කිරීමට අස්තිත්වය තත්ත්වයන් ඇගැයිය යුතුය.

ආ44. සාධාරණ අගය මැනීමේදී හෝ වෙළඳපොළ අවදානම් වාරිකයක් ඇස්තමේන්තු කිරීමේදී අස්තිත්වයන් පහත සඳහන් සියලුම දේ සලකා බැලිය යුතුය.

(අ) ගනුදෙනුව විධිමත් නොවන බව සාක්ෂි මගින් ඇඟවීමක් කෙරෙන්නේ නම් යම් වෙතොත්, ඉතාසුළු බරතැබීමක් (සාධාරණ අගයේ වෙනත් ඉඟිකිරීම් සමග) එම ගනුදෙනු මිල කෙරෙහි තැබිය යුතුය.

(ආ) ගනුදෙනුව විධිමත් බව සාක්ෂිමගින් ඇඟවෙන්නේ නම් අස්තිත්වය එම ගනුදෙනු මිල සැලකිල්ලට ගතයුතුය. සාධාරණ අගයේ වෙනත් ඉඟි කිරීම්වලට සාපේක්ෂව එම ගනුදෙනුවන මිල මත තැබූ බර තැබුම රඳා පවත්නේ පහත සඳහන් කරුණු සහ තත්ත්වයන් මතය.

(i) ගනුදෙනුවේ පරිමාව
(ii) මනිනු ලබන වත්කමට හෝ වගකීමට ගනුදෙනුවේ සංසන්දනාත්මකභාවය
(iii) මැනීම කරන දිනට ගනුදෙනුවේ ආසන්නතාවය

(ඇ) ගනුදෙනුව විධිමත්ද යන්න නිගමනය කිරීමට අස්තිත්වයට ප්‍රමාණවත් තොරතුරු නොමැති නම් ගනුදෙනු වූ මිල සැලකිල්ලට ගත යුතුය. කෙසේ වෙතත් එම ගනුදෙනු වූ මිල සාධාරණ අගයේ නියෝජනය කළ නොහැකි වියහැකිය. (උදා: ගනුදෙනු වන මිල අවශ්‍යයෙන්ම වෙළඳපොළ සාධාරණ අගය මැනීම හෝ වෙළඳපොළ අවදානම් වාරිකය ඇස්තමේන්තු සඳහා වන එකම හෝ ප්‍රාථමික පදනම නොවේ) විශේෂ ගනුදෙනු විධිමත්ද යන්න නිගමනය කිරීමට ප්‍රමාණවත් සාක්ෂි අස්තිත්වයට නොමැති විට, විධිමත් යයි දන්නා වෙනත් ගනුදෙනු සමග සංසන්දනය කිරීමේදී, එම ගනුදෙනු සඳහා අස්තිත්වය අඩු බර තැබීමක් තැබිය යුතුය. ගනුදෙනුවක් විධිමත්ද යන්න නිර්ණය කිරීමේදී අස්තිත්වය සවිස්තරාත්මක පරිශ්‍රමයක් භාර නොගත (නොදැරිය) යුතු අතර, එහෙත් සාධාරණ ලෙස ලබාගතහැකි තොරතුරු නොසලකා හැරිය යුතු නැත. අස්තිත්වය ගනුදෙනුවට පාර්ශ්වයක් වනවිට, ගනුදෙනුව විධිමත්දැයි නිගමනය කිරීමට ප්‍රමාණවත් තොරතුරු තිබේයයි අනුමාන කෙරේ.

**තුන්වන පාර්ශ්වයන් ලබාදෙන ප්‍රකාශිත මිල ගණන්**

ආ45. තුන්වන පාර්ශ්වයන් විසින් ලබාදුන් ප්‍රකාශිත මිල ගණන් සංවර්ධනය කර ඇත්තේ මෙම SLFRS අනුව යයි අස්තිත්වයක් විසින් නිර්ණය කර ඇත්නම්, මිල කිරීමේ සහ තැරැව්කරුවන් වැනි තුන්වන පාර්ශ්වයක් ලබාදෙන ප්‍රකාශිත මිල ගණන් භාවිතකිරීම මෙම SLFRS මගින් වළක්වාලනු නොලැබේ.

ආ46. වත්කමක් හෝ වගකීමක් සඳහා පරිමාවේ හෝ ක්‍රියාකාරී මට්ටමේ සැලකිය යුතු අන්දමේ අඩුවක් සිදුවී ඇත්නම්, තුන්වන පාර්ශ්වයන් ලබාදුන් ප්‍රකාශිත මිල ගණන් සංවර්ධනය කර ඇත්තේ වර්තමාන තොරතුරු පිළිබඳව විධිමත් ගනුදෙනු වෙළඳපොළ සහභාගිවන්නන්ගේ උපකල්පනයන් (අවදානම පිළිබඳව උපකල්පනයන්ද ඇතුළුව) පිළිබිඹු වන වෙළඳපොළ ශිල්ප ක්‍රමයක් භාවිත කර ඇත්දැයි යන්න අස්තිත්වය ඇගයිය යුතුය. සාධාරණ අගය මැනීමට යෙදවුමක් වශයෙන් ප්‍රකාශිත මිල ගණන් බරතැබීමේදී ගනුදෙනුවේ ප්‍රතිඵල පිළිබිඹු නොවන මිල ගණන් කෙරෙහි අස්තිත්වය අඩුබර තැබීමක් තැබිය යුතුය. (වෙනත් ඇගයීම් සමග සංසන්දනය කිරීමේදී ගනුදෙනුවල ප්‍රතිඵල පිළිබිඹු වන සාධාරණ අගය)

ඇ 47. අමතරව තිබෙන සාක්ෂි සඳහා බරතැබීමේදී අනුගම්‍ය අර්පණයක් නියෝජනය වන තුන්වන පාර්ශ්වයක් ලබාදුන් මිල ගණන් වලට වඩා වැඩි බර තැබීමක් කර මිල ගණන් වල ස්වභාවය (මිල ගණන්) සඳහන් කරන මිලක්ද හෝ අනුගම්‍ය අර්පනයක්ද සැලකිල්ලට ගතයුතුය.

**ඇ පරිශිෂ්ඨය**

**බලාත්මක දිනය සහ සංක්‍රාන්තිය**

මෙම පරිශිෂ්ඨය මෙම SLFRS හි අත්‍යාවශ්‍ය කොටසක් වන අතර, වෙනත් SLFRS කොටස්වලට ඇති හා සමාන අධිකාරියක් මෙහිද ඇත.

ඇ1. 2014 ජනවාරි 1 දින හෝ ඉන්පසුව ආරම්භවන වාර්ෂික කාල පරිච්ඡේද සඳහා අස්තිත්වයක් විසින් මෙම SLFRS ව්‍යවහාර කළ යුතුය. කලින් ව්‍යවහාර කිරීමට අවසර ඇත. කලින් කාලපරිච්ඡේද සඳහා මෙම SLFRS ව්‍යවහාර කරන්නේ නම් අස්තිත්වය එම කරුණ හෙළිදරව් කළ යුතුය.

ඇ2. මුලින්ම ව්‍යවහාර කරන වාර්ෂික කාලපරිච්ඡේදය ආරම්භයේ සිට මෙම SLFRS අනාගතයේදී වියහැකි පරිදි ව්‍යවහාර කළ යුතුය.

ඇ.3 මෙම SLFRS මුලින්ම ව්‍යවහාර කරන කාලපරිච්ඡේද වලට පෙර කාලපරිච්ඡේද සඳහා සැපයිය යුතු සංසන්දනාත්මක තොරතුරු සඳහා මෙම SLFRS හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන් ව්‍යවහාර කිරීම අවශ්‍ය නොවේ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.